ආතර් කොනන් ඩොයිල්ගේ

# දියමන්ති ඔටුන්න



ෂර්ලොක් හෝම්ස්ගේ
මාන්විත පරීක්ෂණ

චන්දන මෙන්ඩිස්

# U EDGE

Reading Purpose Only.. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# දියමන්ති ඔටුන්න

## ෂර්ලොක් හෝම්ස්ගේ වික්‍රමාන්විත පරීක්ෂණ

## ii



Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# දියමන්ති ඔටුන්න

## ෂර්ලොක් හෝම්ස්ගේ

## වික්‍රමාන්විත පරීක්ෂණ ii

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්ගේ

**THE ADVENTURES OF SHERLOCK HOLMES**

අසංක්ෂිප්ත පරිවර්තනය

**චන්දන මෙන්ඩිස්**


**චන්දන මෙන්ඩිස් ප්‍රකාශන**

141/2, දූව පාර, බැද්දගාන, කෝට්ටේ


http://sherlockholmesinvestigations.blogspot.com

මෙම ග්‍රන්ථයට ඇතුළත් කර ඇත්තේ පහත සඳහන් ෂර්ලොක් හෝම්ස් කථාවල පරිවර්තනයි.
(පරිච්ඡේද අනු පිළිවෙළින්)


1. THE ADVENTURE OF THE ENGINEER'S THUMB
2. A CASE OF IDENTITY
3. THE ADVENTURE OF THE BERYL CORONET
4. THE MAN WITH THE TWISTED LIP
5. THE ADVENTURE OF THE SECOND STAIN
6. THE ADVENTURE OF THE SPECKLED BAND


http://sherlockholmesinvestigations.blogspot.com

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | ඉංජිනේරුවෙකුගේ අත්දැකීමක් | 8 |
| 2. | අතුරුදන්වීමේ සිද්ධියක් | 47 |
| 3. | දියමන්ති ඔටුන්න | 81 |
| 4. | අතුරුදන් වූ ව්‍යාපාරිකයා | 126 |
| 5. | දෙවැනි ලේ පැල්ලම | 166 |
| 6. | තිත් වැටුණු පටිය | 216 |


Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

# ඉංජිනේරුවෙකුගේ අත්දැකීමක්

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# ඉංජිනේරුවෙකුගේ අත්දැකීමක්

ෂර්ලොක් හෝම්ස් සහ මා අතර දීර්ඝ කාලයක් තිස්සේ සමීප මිත්‍රත්වයක් තිබිණි. මේ කාලය තුළදී ගැටලුවක් ඔහු වෙත ගෙන යාමට, මට ඉඩකඩ සැලසුණේ අවස්ථා දෙකකදී පමණි. ඉන් එකක් හාදර්ලි මහතාගේ මහපටැඟිල්ල හා බැඳුණු ගැටලුවයි; අනෙක කර්නල් වෝබර්ටන් ගේ උන්මාදය පිළිබඳ ගැටලුවයි. මෙයින් පසුව සඳහන් කළ ප්‍රශ්නය තියුණු ලෙස නිරීක්ෂණවල යෙදෙන්නන්ට ක්ෂේත්‍රයක් විවෘත කරන බව සැබෑය. එහෙත් මුලින් සඳහන් කළ ගැටලුවේ ඇති අද්භූත ස්වභාවය නිසාම එය ඔබට ඉදිරිපත් කිරීම වඩාත් සුදුසු වේ යයි සිතමි.

ඒ 1889 වසරේ ගිම්හාන සෘතුවයි. මගේ විවාහයෙන් මඳ කලකට පසු, හෝම්ස් බේකර් වීථියේ තනිකර දමා මම බිරිඳ සමඟ වෙනත් නිවසක පදිංචියට ගියෙමි. එහි සිටම පෞද්ගලික වෛද්‍යවරයෙකු ලෙස වෛද්‍ය වෘත්තියේ යෙදුණෙමි. එහෙත් නිතිපතා මගේ මිත්‍රයා හමුවීමට යාමට ද මම අමතක නොකෙළෙමි. සමාජශීලී ජීවිතයෙන් බැහැර වී, අවිවාහකව, ගේ මුල්ලට වී කාලය ගත කළ හෝම්ස්, සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒමට, මා නිරතුරුවම දැරූ උත්සාහය අපමණය. ඉඳහිට ඔහු මගේ නිවසට කැඳවාගෙන යාමට ද මට හැකිවිණි.

මා පදිංචිව සිටියේ පැඩිංටන් දුම්රිය පොළට නුදුරු නිවසකයි. මගෙන් ප්‍රතිකාර ගැනීමට පැමිණි රෝගීන් සංඛ්‍යාව ද ක්‍රමයෙන් වැඩිවී තිබිණි. මොවුන් අතර දුම්රිය පොළේ නිලධරයන් කිහිප දෙනෙකු ද විය. මෙයින් එක් අයෙකු දීර්ඝ කාලයක් තිස්සේ පීඩා විඳි, සුව කළ නොහැකි යයි සිතූ අසනීපයක්,මම සනීප කළෙමි. එතැන් පටන් මගේ ගුණ වර්ණනා කරමින් ඔහු මා වෙත එවූ රෝගීන් සංඛ්‍යාව අපමණය.

http://sherlockholmesinvestigations.blogspot.com

එක් උදෑසනක අපේ කාමරයේ දොරට කිසිවකු තට්ටු කළ හඬින් මම අවදිවීමි. උදේ හතටත් පෙර අප අවදි කර ඇත්තේ අපේ මෙහෙකාරිය විසිනි.

"දොස්තර මහත්තයගෙන් ප්‍රතිකාර් ගන්න කියල දෙන්නෙක් ඇවිල්ල ඉන්නව, පැඩිංටන් දුම්රිය පොළේ ඉඳල. අන්න ලෙඩුන් බලන කාමරයේ බලාගෙන ඉන්නවා" ඇය කීවාය.

මම ඉක්මනින් හැඳ පැළඳ ගෙන ගෙදර පහළ තට්ටුවට බැස ආවෙමි. අන්තරායන්ට ගොදුරු වී තුවාල ලැබීම නිසා දුම්රිය පොළේ සිට මා වෙත ආ රෝගීන් බොහෝය. ඔවුන්ගේ තුවාල බොහෝවිට සුළුපටු ඒවා නොවන බව මම අත්දැකීමෙන් ම දැන සිටියෙමි. මා රෝගීන් බලන කාමරයට පිවිසීමටත් පෙර, එහි දොර වසාගෙන එළියට ආවේ මා කලින් සඳහන් කළ මගේ මිත්‍රයා වූ දුම්රිය ගාඩ්වරයාය.

"අන්න ඔහු ඉන්නවා කාමරේ."

මගේ මිත්‍රයා කීවේ. වම් අත උරහිසට ඉහළින් ඔසවා, පිටුපසට මහපටැඟිල්ල දිගුකරමිනි. "දැන් ඔහුට හොඳයි."

"හොඳයි? මොකක්ද ඔහුට ඇතිවෙලා තියෙන ප්‍රශ්නෙ?" මා ඇසුවේ, මගේ මිත්‍රයා කථා කළ පිළිවෙළේ තිබූ අමුත්ත නිසයි. ඔහු කථා කළේ මගේ චිකිත්සාගාරය තුළට අද්භූත සතෙකු කූඩු කළා යයි හඟවන්නාක් මෙනි.

"මේ අලුත් රෝගියෙක්. මං හිතුවා මම ම ඔහු මෙහාට කැඳවාගෙන එන්න ඕනය කියල්. එහෙම කළාම ඔහුට මඟහැරල පැන යන්න බැහැ . . . . ඔය ඉන්නෙ මිනිහ කිසි කලබලයක් නැතුව . . . . ඉතින් දොස්තර මහත්තයා. ඔබට වගේම මටත් රාජකාරි තියෙනව නේ. මං දැන් යන්න ඕනෙ"

මගේ මිත්‍රයා වහා පිටවී ගියේ ඔහුට ස්තුති කිරීමටවත් මට ඉඩක් නොතබමිනි.

මම රෝගීන් පරීක්ෂා කරන කාමරයට ඇතුළු වූයෙමි. මගේ මේසයට සමීපයෙන් මහත්මයෙක් අසුන්ගෙන සිටියේය. ට්වීඩ් රෙද්දෙන් නිම කළ වාම් ඇඳුම් කට්ටලයක් හැඳ සිටි ඔහුගේ, රෙදි කැප්තොප්පිය මගේ පොත් මත තබා තිබිණි. ඔහු එක් අතක් වැසෙන සේ ලේන්සුවක් ඔතාගෙන සිටි බැව් මම දුටුවෙමි. මේ

ලේන්සුවේ හැම තැනකම ලේ තැවරී තිබිණි. ඔහු තරුණයෙකි. වයස අවුරුදු විසිපහකට වැඩි නැත. ඔහුගේ මුහුණෙන් විදහා දක්වුණේ ප්‍රබල පෞරුෂත්වයකි. එහෙත් මේ අවස්ථාවේ නම් ඔහු අධික ලෙස සුදුමැලි වී සිටියේය. කුමක් හෝ කරුණක් නිසා ඔහු තදබල ලෙස කැලැඹීමට පත්ව සිටි බවත්, දත් සිත සන්සුන් කර ගැනීමට උත්සාහ දරමින් සිටි බවත් මම වටහා ගතිමි.

"මේ තරම් උදැසනින් ඔබ අවදි කිරීම ගැන මට සමාවෙන්න දොස්තර මහත්මයා. ඊයේ රාත්‍රියේ මට බරපතල අන්තරායකට මුහුණ පාන්න සිදුවුණා. මං ආවෙ උදේ පාන්දරින්ම එන දුම්රියෙන්. පැඩිංටන් වලදී මං අහල බැලුවා, දොස්තර මහත්මයෙක් හමුවෙන්න පුළුවන් කොහේද්ද කියලා. එක් කරුණාවන්ත මහත්මයෙක්, මාව මෙතැනට කැඳවාගෙන ආවා. මං ඔබේ සේවිකාවට මගේ ආගන්තුක පත්‍රය දුන්නා. නමුත් ඇය ඒක අර මේසය මත අමතක කර දමා ගොස් ඇති බව මට පෙනෙනවා."

ආගන්තුක පත්‍රය අතට ගෙන, මම එය කියවා බැලීමි.

වික්ටර් හාදර්ලි
හයිඩ්‍රොලික් ඉංජිනේරු
16A වික්ටෝරියා වීථිය
(තුන්වන මහල)

"ඔබව මේ තරම් වේලා රඳවා තැබීමට සිදුවීම ගැන මට කණගාටුයි. ඔබ රාත්‍රිය තිස්සේම දුර ගමනක් ගිහින් අවසන් කළා විතරයි වගේ. ඒ වගේ ඒකාකාරී දෙයක්ම ඇති කෙනෙකුව විඩාවට පත් කරන්න."

"අපොයි නෑ! රාත්‍රිය නම් මට කොහොමටවත් ඒකාකාරී වුණේ නෑ"

මගේ අමුත්තා කීවේ සිනාසෙමිනි. ඔහු මීළඟට දිගින් දිගටම සිනාසෙන්නට පටන්ගත්තේය. පුටුවේ පිටුපසට හේත්තු වුණු ඔහු මුළු සිරුරම සොලවමින් සිනාසුණේ උමතුවෙන් මෙනි. මෙය ඉතාමත් අප්‍රසන්න විය. ඉවසීම වෛද්‍යවරයකු තුළ තිබිය යුතු උතුම්

ගුණාංගයකි. එහෙත් අමුත්තාගේ අප්‍රසන්න සිනාව නිසා මගේ ඉවසීමේ සීමාව ද ඉක්මවා ගියේය. මම කෝපයට පත්වීමි.

"නවත්වනව ඔය හිනහව!" මට කෑගැසිණ.

"ඉස්සර වෙලා තමන්ගේ හැඟීම් පාලනය කරගෙන සිටින්න." මම වතුර ජෝගුවකින් වීදුරුවකට වතුර ස්වල්පයක් වත්කොට ඔහුට බීමට දුන්නෙමි. එහෙත් එයින් පලක් නොවීය. ඔහුගේ සිනහව නැවතුණේ නැත. ප්‍රශ්න රැසකට මැදි වී සිටි පුද්ගලයෙකුට ඒවා එක්වරම අවසන් වූ පසු සිතේ ඇතිවන්නේ සැහැල්ලු ගතියකි. එවිට සිතේ ඇතිවන සොම්නස ඉවසාගත නොහැකිව ඔහු මඳ උන්මාද තත්ත්වයකට පත්වීම ස්වභාවයකි. නොනවත්වාම සිනාසුණු ඉංජිනේරුවා මිනිත්තු කිහිපයකට පසු යථා තත්ත්වයට පත්විය. මෙවර ඔහු වඩාත් දුර්වලව, වඩාත් සුදුමැලිව සිටියේය.

"මං හැසිරුණේ මහ මෝඩයෙක් වගේ නේද?" ඔහු අපහසුවෙන් ඇසීය.

"අපොයි නැහැ. දැන් මේක බීල හිටින්න."

මම වතුර වීදුරුවට බ්‍රැන්ඩි ස්වල්පයක් වත්කොට ඔහුට බීමට දුන්නෙමි. සුළු වේලාවක් ගතවෙද්දී සුදුමැලිව තිබූ දෙකම්මුල් යළිත් රත්පැහැයට හැරිණි.

"ඔන්න දැන් ටිකක් හරි. ඉතින් දොස්තර මහත්තයා මගේ මහපටැඇඟිල්ලේ තුවාලය ගැන . . . . නෑ නෑ මහපටැඇඟිල්ල තිබුණු තැන ගැන බලන්න."

එසේ කිව් ඔහු අතේ ඔතා තිබූ ලේන්සුව දිග හැරීමට පටන් ගත්තේය. ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස මා ලබා තිබූ පළපුරුද්ද නිසා මගේ ස්නායු එතරම් පහසුවෙන් කම්පනයට පත් නොවේ. එහෙත් මේ අමුත්තාගේ ලේන්සුව ඉවත් කළ පසු දුටු දර්ශනය නිසා මම භීතියෙන් තිගැස්සුණෙමි. එහි තිබුණේ ඇඟිලි හතරක් සහ . . . . . මහපටැඇඟිල්ල තිබූ තැන විශාල ලේ කැටියකි! මහ පටැඇඟිල්ල සහමුලින්ම කැපී හෝ ඉදිරීගොස් තිබිණි.

"දෙවියන්ට ඔප්පු වෙච්චාවෙ!" මට කෑගැසිණ. "මේක මහා බරපතල තුවාලයක් නේ. මේකෙන් සෑහෙන්න ලේ ගලායන්න ඇති?"

http://sherlockholmesinvestigations.blogspot.com



13. "දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. හුඟක් ලේ ගියා. මේක කළ වහාම මාව ක්ලාන්ත වුණා. මට සිහිය එද්දි තවමත් ලේ ගලනවා. ඉතින් මම ලේන්සුව තුවාලය වටේ ඔතල, පුංචි ලී කෝටු කෑල්ලක් එතැනට තද කරල තියාගත්තා.

"විශිෂ්ටයි. ඔබ වෙන්න තිබුණේ ශල්‍ය වෛද්‍යවරයෙක්."

"මං කටයුතු කළේ හයිඩ්‍රොලික් (ද්‍රවශක්ති) විද්‍යාවේ සිද්ධාන්තයක් අනුව කියල කියන්නත් පුළුවනි. ඒක මගේ ක්ෂේත්‍රය නේ."

"මේ තුවාලය සිදුකරල තියෙන්නේ බොහොම මුවහත්, ඒ වගේම බර ආයුධයකින්."

"ඔව්. මස් කැපීමට ගන්නා යෝධ පිහියකින්"

"වැරදීමකින් හදිසියේ සිදුවූ අන්තරායක් වෙන්න ඇති?"

"කොහොමටවත් නෑ."

"දෙයියෝ සාක්කි! එහෙනම් ඔබ කියන්නේ මේක මිනීමැරීමට තැත්කිරීමක් කියලද?"

"ඇත්තම කියනවා නම් සිතා මතා එල්ල කළ දරුණු මාරාන්තික ප්‍රහාරයක්."

"ඔබ මාව භය කරනවා."

මම තුවාලය පිරිසිදු කොට විෂබීජ නාශක කාබොලික් අම්ලය සහිත වෙළුම් පටි සහ පුළුන් තට්ටු කිහිපයකින් ආවරණය කළෙමි. කිසිදු වේදනාවක් දැනෙන ආකාරයක් නොපෙන් වූ ඔහු පුටුවේ පිටුපසට හේත්තු වී සිටියේය. කෙසේ වෙතත් ඔහු වරක් දෙකක් තොල් තදින් සපාගත් අයුරු මම දුටුවෙමි.

"දැන් කොහොමද?" මා ඇසුවේ තුවාලය වෙලා අවසන් කළ පසුයි.

"විශිෂ්ටයි. ඔබේ තුවාලය වෙළීමෙන් මට දැනෙන්නේ අලුත් ජීවයක් ලැබුණා වගෙයි මං හරිම දුර්වලවයි හිටියේ. ඒ ඉතින් මට හුඟාක් කරදර වලට මුහුණ දෙන්න සිද්ධ වුණු නිසා."

"එක අතකින් ඔබ ඒ ගැන කථා කරන්න පටන් නොගන්නවා නම් හොඳයි. ඒ මොකද ඒ ගැන කථා කිරීම ඔබේ ස්නායු වලට දැඩි කම්පනයක් වෙන්න පුළුවනි."

http://...investigations.blogspot.com

"නෑ නෑ. දන් මම කොහොමටවත් ඒ ගැන කියන්නෙ නෑ. මගේ කථාව කියන්න ඕන පොලිසියට. ඒ වුණත් දොස්තර මහත්මයා ඔබට කියන්න, මගේ මේ තුවාලය නිසා නොවෙයි නම්, ඔවුන් මං කරන පැමිණිල්ල විශ්වාස කරාවිද කියලත් මට සැකයි. ඒ මොකද ඒක එතරම්ම අසාමාන්‍ය, අද්භූත කථාවක්. ඊළඟට මගේ ඒ කථාව ඔප්පු කරන්න මං ළඟ කිසිම සාක්ෂියක් නැති තරමයි. බාග වෙලාවට ඔවුන් මගේ කථාව විශ්වාස කළා කියල හිතමු. ඒත් ඊළඟට නීතියෙන්, යුක්තියක් සාධාරණයක් ඉටුකරන්න හැකි වේවිද කියන එකත් සැකයි. ඒ මොකද මට දීමට හැකි පැහැදිලි හෝඩුවාවල් කිසිවක් නෑ."

"හො හෝ! මේක ඔබට විසඳා ගැනීමට අවශ්‍ය ගැටලු සහගත ප්‍රශ්නයක්ද? එහෙම නම් මං ඔබෙන් ඉල්ලා සිටින්නේ අපි යමු ෂර්ලොක් හෝම්ස් මහත්මයා ළඟට. ඔහු මගේ මිත්‍රයෙක්. පොලිසි යන්න කලින් ඔහු හමුවෙලා බලමු."

"මං ෂර්ලොක් හෝම්ස් ගැන අහල තියෙනවා. ඔහු මේක විසඳන්න භාර ගන්නවා නම්, මං ඒ තරම්ට කැමතියි. නමුත් කොහොමටත් මම මේ ගැන පොලිසියටත් පැමිණිලි කරන්න ඕන. ඔබට පුළුවන්ද මට ෂර්ලොක් හෝම්ස් මහත්මයා හමුවෙන්න ඉඩ සලස්වා දෙන්න?"

"මට පුළුවනි ඊට වැඩි දෙයක් කරන්න. මං ඔබව ඔහු ළඟට කැඳවාගෙන යන්නම්."

"එහෙම කළ හැකි නම් මං ඔබට අතිශයින්ම ණය ගැතියි මහත්මයා."

"කුලී රියක් කැඳවාගෙන අපි දෙන්න පිටත්වෙල යමු. හෝම්ස් උදේ ආහාරය ගනිද්දි ඔහුට එකතුවෙන්න අපි තවමත් ප්‍රමාද නැහැ. මේ ඉක්මනින් ඔබේ කථාව ඔහුට විස්තර කරන එක ඔබට අපහසුවෙන එකක් නැද්ද?"

"මං ඒකට සූදානම්. මේ කථාව කියලා ඉවර කරන තුරු මගේ හිතට සැනසීමක් නෑ."

"එහෙම නම් ඔහොම ඉන්න. මගේ සේවකයා කුලීරියක් අරගෙන ඒවි. මං ඉක්මනට සූදානම් වෙලා එන්නම්."

http://...blogspot.com

මම වහා උඩ තට්ටුවට දිව ගියෙමි. මගේ බිරිඳට කරුණු කෙටියෙන් පහදා දී ඉක්මනින් හැඳ පැළැඳ ගෙන පහළ තට්ටුවට බැසීමි. මිනිත්තු පහක් ගතවෙද්දී අප දෙදෙනා කුලී රියකින් බේකර් වීථිය දෙසට ගමන් කරමින් සිටියෙමු.

මා බලාපොරොත්තු වූ ලෙසම හෝම්ස් විසිත්ත කාමරයේ පුටුවකට වී "ටයිම්ස්" පුවත්පත කියවමින් සිටියේය. ඔහු සිරිත් පරිදි අමතක නොකොට කියවන "පෞද්ගලික දැන්වීම්" තීරය පරීක්ෂා කරමින් සිටි හැටි මට දකගන්නට ලැබිණි. සිරිතක් වශයෙන් හෝම්ස් උදේ ආහාරයට පෙර පයිප්පයක් ඉරූ අතර, ඒ සඳහා වෙනම පයිප්පයක් තබාගෙන සිටියේය.

"ශුභ උදෑසනක් වොට්සන්! ශුභ උදෑසනක් මහත්මයා!"

හෝම්ස් අප පිළිගත්තේ කලබලයකින් තොර, ප්‍රසන්න අයුරෙනි.

උදේ ආහාරය සඳහා අප වෙනුවෙන් බේකන් සහ බිත්තර ඇණවුම් කළ හෝම්ස්, එය සතුටින් අනුභව කිරීමට අප සමඟ හවුල් විය. එය අවසන් වූ පසු අමුත්තාට සෝෆාවේ හිඳ ගැනීමට සලස්වා, වතුර අඩංගු වීදුරුවක් ඔහු සමීපයේ තැබුවේය.

"ඔබට මුහුණ දෙන්න වෙලා තිබෙන අත්දැකීම සාමාන්‍ය එකක් නොවන බව අපට පහසුවෙන් ම තේරුම් ගන්න පුළුවනි. මහත්මයා කරුණාකරලා ඔය සෝෆාවේ හාන්සි වෙන්න. ඔබට කැමැතිම ඉරියව්වකින් එහි හාන්සි වී ඉන්න. ඔබට පුළුවන් තරමක් හොරතුරු අපට කියන්න. නමුත් ඔබට මහන්සි දැනුණොත් කථාව නවත්වන්න."

"ඔබට ස්තූතියි හෝම්ස් මහත්මයා. නමුත් දොස්තර මහත්මයා මගේ තුවාලය වෙළුවට පස්සේ මට දැනුණේ අලුත් ජීවයක් ලැබුණා වගෙයි. ඔබේ උදේ ආහාරය බඩට වැටුණට පස්සේ ප්‍රතිකාරය සම්පූර්ණ වුණා. ඔබේ වටිනා කාලය හැකි තරම් අඩුවෙන් යොදා ගන්න මං උත්සාහ කරන්නම්. ඒ නිසා මං කෙලින්ම මගේ පුදුමාකාර අත්දැකීම වලින්ම කථාව පටන් ගන්නම්.

මගේ දෙමව්පිය දෙන්නාම කිසිවෙක් දැනට ජීවතුන් අතර නැහැ. ඒ නිසා මම අනාථව සිටින එකෙනෙක් කිව්ව හැකි. ඒ වගේම මං තවමත් අවිවාහකයෙක්. මම ලන්ඩනයේ නේවාසිකව ඉන්නෙත් තනිවමයි. වෘත්තියෙන් මම ද්‍රවශක්ති (හයිඩ්‍රොලික්) ඉංජිනේරුවෙක්.

ග්‍රීනිච් හි සුප්‍රසිද්ධ වෙනර් සහ මැතිසන් සමාගමේ, මම අවුරුදු හතක කාලයක් පුහුණුව ඇබුවා. ඒ මගින් මට මේ වෘත්තියේ හොඳ පළපුරුද්දක් ලබාගන්න අවස්ථාව සැලසුණා.

අවුරුදු දෙකකට කලින් මගේ තාත්තා මියගියා. ඔහුගෙන් මට සුළු මුදලක් උරුම වුණා. ඒ මුදලත් උපයෝගී කරගෙන, උපදේශක පෞද්ගලික ඉංජිනේරුවරයෙක් ලෙස මගේම රැකියාවක් අරඹන්න මම තීරණය කළා. ඒ අනුව වික්ටෝරියා වීථියේ ගොඩනැගිල්ලක මගේ කාර්යාලය විවෘත කළා.

මං හිතන්නේ තනිවම තමන්ගේම ව්‍යාපාරයක් අරඹන ඕනෑම කෙනෙකුට, මුල් වරට බොහොම නිසරු කාලයකට මුහුණ දෙන්න සිදුවෙනවා. මට ඒක අනික් අයටත් වඩා බලපෑව වෙන්න ඇති. පහුගිය අවුරුදු දෙකටම උපදේශකත්වය ලබාදෙන්න මට ලැබුණේ අවස්ථා තුනක් පමණයි, එයින් මට උපයාගන්න ලැබුණු සම්පූර්ණ මුදල පවුම් විසිහතයි සිලිං දහයක් පමණයි. හැමදාම උදේ නවයේ ඉඳල සවස හතර වෙනතුරු මගේ කාර්යාලයට වෙලා මං බලාගෙන හිටියා. අන්තිමට මගේ හිතේ ලොකු කලකිරීමක් ඇතිවෙන්න පටන් අරගෙනයි තිබුණේ. මං පෞද්ගලික ඉංජිනේරුවෙක් ලෙස මෙහෙම රැකියාව ඇරඹූ එක මහ මෝඩ කමක් ලෙස මගේ සිතට වැටහුණා.

ඊයේ හවස මං මගේ කාර්යාලයෙන් පිටවී යන්න හිතුවා පමණයි. මගේ ලිපිකරුවා ඇවිත් කිව්වා ව්‍යාපාරික කටයුත්තකට මා හමුවෙන්න මහත්මයෙක් පැමිණ ඇති බව. ලිපිකරුවා අතේ තිබුණා ආගන්තුක පතක්.

"කර්නල් ලයිසැන්ඩර් ස්ටාක්" යනුවෙන් එහි සඳහන්ව තිබුණා. ලිපිකරුවා පිටුපසින්ම වගේ මේ අනුග්‍රාහක මහත්මයාත් ආවා.

ඔහු මධ්‍යම ප්‍රමාණයටත් වඩා උසින් වැඩි, කෙට්ටු පුද්ගලයෙක්. මං හිතන්නේ ඒ තරම් කෙට්ටු මිනිහෙක් මං කවදාවත් දැකල නැහැ. ඔහුගේ නාසයේ තුඩ හා නිකටේ ඉදිරි කෙළවර ඉතා තියුණු ලෙස ඉදිරියට උල් වී තිබුණා. මුහුණේ හම හිස් කබලටම ඇලී තිබුණේ යටින් මස්පිඩු කිසිවක් නැති විධියටයි. නමුත් මේ කෙට්ටු බව අසනීපයක් නිසා නොව, ඔහුගේ සාමාන්‍ය ස්වභාවය බව මට හිතාගත හැකිවුණා. ඇස් වල තිබුණේ හරි දීප්තිමත් බවක්. ඔහු බොහොම කඩිසරව එහා මෙහා ඇවිද්දා. විනත් වාම

නමුත් සම්පූර්ණ ඇඳුම් කට්ටලයකින් සැරසී සිටියා. ඔහුගේ වයස මං හිතන්නේ තිහකට වඩා හතළිහකට කිට්ටු ඇති.

"මේ හාදර්ලි මහත්මයාද?"

ඔහු ඇසුවේ ජර්මන් ජාතිකයින් ඉංග්‍රීසි කථාකරන උච්චාරණයකින්."

"ඔව්."

"ඔබේ වෘත්තීය කටයුතු ඉතාම හොඳ බවට මට රෙකමදාරුවක් ලැබිල තියෙනවා. හාදර්ලි මහත්මයා වෘත්තියෙන් පමණක්ම නොමෙයි, රහසක් ආරක්ෂා කරදීමටද හැකියාවක් ඇති, අපේ පෞද්ගලික බව සුරකින කෙනෙක් හැටියට තමයි, ඒ රෙකමදාරුවෙ සඳහන් වුණේ."

ඒ වගේ වර්ණනාවක් කළාම ඕනෑම තරුණයෙකුගෙ හිතේ ලොකු සතුටක් ඇතිවෙනවා. මම ඒ සන්තෝෂයෙන් ඔහුට හිස නමා ආචාර කළා.

"මගේ හපන්කම් හා චරිතය ගැන කවුද ඔය වර්ණනාව කළේ?" මං ඇහුවා.

"ඒක කිව්වේ කවුද කියන එක මේ වෙලාවෙ මං ඔබට කියන්නේ නැහැ. ඔවුන් තවත් කිව්වා ඔබ අනාථයෙක් තනිකඩයෙක්, ලන්ඩන් නගරයේ පදිංචි වෙලා ඉන්නේ තනිවම කියලා."

"ඔව්. ඒක ඇත්ත. ඒ වුණත් මං අහනවාට අමනාප වෙන්න එපා. මගේ අවිවාහක බව, කාන්තාවුරුත් නැතිකම මගෙන් කෙරෙන්න තියෙන වෘත්තීය කටයුත්තකට බලපාන්නෙ කොහොමද? මං හිතන හැටියට ඔබ මේ ඇවිත් ඉන්නේ ඉංජිනේරු කටයුත්තක් ගැන මගෙන් උපදෙස් ගන්න. එහෙම නේද?"

"ඇත්තටම ඔව් මහත්මයා. නමුත් මං අර දේවල් හෙව්වේ මොකටද කියලා ඔබට කතාබහ කරගෙන යද්දි තේරේවි. මෙතැනදි අපි අතිශයින්ම රහසිගත භාවය අපේක්ෂා කරනවා - අතිශයින්ම රහසිගත! ඔබට තේරෙනවා නේද? පවුලේ සාමාජිකයන් නැඳෑ හිතමිත්‍රයන් සිටින කෙනෙකුගෙන් ලැබෙනවාට වඩා රහසිගත බවක්, ඔබ වැනි කෙනෙකුගෙන් ලබා ගන්න පුළුවනි. එහෙම නේද මහත්මයා?"

"රහසක් ආරක්ෂා කරන්න මං පොරොන්දු වුණොත්, මං ඒක ඒ අයුරින්ම ඉටුකරන්නම්."

lmesinvestigations.blogspot.com

මං එහෙම කිව්වාම මේ කර්නල් වරයා මා දිහා තියුණු බැල්මක් හෙළුවා. කිසි දවසක කිසිකෙනෙක්, ඒ විටියේ සැක සහිත, ප්‍රශ්නාර්ථ බැල්මක් මා වෙත හෙළා නැහැ.

"ඔබ පොරොන්දු වෙනවද එහෙනම්?" ඔහු ඇසුවා.

"ඔව් මං පොරොන්දු වෙනවා."

"කටයුත්ත කිරීමට පෙරත්, එහි යෙදෙද්දීත්, ඊට පසුවත් රහසිගත බව සුරකින්න ඔබ පොරොන්දු වෙනවා එහෙනම්? මේ ගැන කටින් එක වචනයක්වත් පිට නොකරන බවට, අකුරක් හෝ නො ලියන බවට ඔබ පොරොන්දු වෙනවා?"

"මං ඒ බව ඔබට සහතික කරලා කිව්ව නේ."

"බොහොම හොඳයි." ඔහු එක්වරම පුටුවෙන් නැගිට්ටා. ඊළහට ඊයක් වගේ විදුලි වේගයෙන් කාමරය හරහා ගිහින් දොර ඇරල බැලුවා. එළියේ බරාඳයේ කිසිකෙනෙක් හිටියේ නැහැ.

"ප්‍රශ්නයක් නෑ. මං මේ බැලුවෙ ඔබේ ලිපිකරුවා අපේ කථාවට සවන් දීගෙන ඉන්නවද කියලා. මං දන්නවා සමහර ලිපිකරුවො තමන්ගේ ස්වාමියාගේ රහස්‍ය වැඩකටයුතු වලට හොරෙන් කන් දෙනවා. දන් අපට ආරක්ෂා සහිතව නිදහසේ කථා කරන්න පුළුවනි."

ඔහු තමන්ගේ පුටුව, මගේ පුටුව ළඟටම කිට්ටු කර ගත්තා. ඊට පස්සේ යලිත් වරක් මා දිහා බලාගෙන හිටියේ සැකසහිත විධියට. මේ වෙලාව වෙනකොට මේ පුද්ගලයා ගැන මගේ හිතේ එක්තරා අප්‍රසන්න වගේම බියකරු හැඟීමක් ඇතිවෙන්න පටන් අරගෙනයි තිබුණේ. මට අනුග්‍රාහකයෙක් අහිමි වී යාමේ පාඩුව එක් පැත්තකින් සිතට නැඟෙද්දී, අනෙක් පැත්තෙන් අර අප්‍රසන්න හැඟීම හිතේ මතුවෙලා ආවා. ඒ නිසාම මට ඇතිවුණේ හරිම නොඉවසිලිමත් බවක්.

"මහත්මයා මගේ කාලය මට හුඟක් වටිනවා. කරුණාකරල කියන්න මගෙන් ඔබට කෙරෙන්න උවමනා කටයුත්ත මොකක්ද කියලා"

"එක රාත්‍රියක් වැඩෙහි යෙදීම වෙනුවෙන් ඔබට ගිනි පනහක මුදලක් ලැබුණොත් ඇහේවිද?" ඔහු ඇසුවා.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. බොහොම හොඳයි."

"රාත්‍රියක වැඩක් කියලා මං කිව්වට, පැයක පමණ කාලයක් ගතවෙන වැඩක් කිව්වොත් වඩාත් නිවැරදියි. අපේ යන්ත්‍රයක් අක්‍රිය වෙලා තිබෙනවා. ඒක ද්‍රවශක්ති තාක්ෂණයෙන් වැඩ කරන යන්ත්‍රයක්. මට උවමනා කරන්නේ ඒක නිවැරදි කරගන්නට ඔබේ අදහස. මේ යන්ත්‍රයේ වැරැද්ද ඇත්තේ කොතැනද කියලා ඔබට පෙන්වා දෙන්න පුළුවන්ද? එහෙම පෙන්නුවොත් ඒක ඉක්මනින් හදාගන්න අපට පුළුවනි. මේ වගේ කටයුත්තක් ඔබට භාරදීම ගැන ඔබ මොනවද හිතන්නේ?"

"මට පෙනෙන හැටියට නම් කරන්න තියෙන වැඩේ බොහොම සුළුයි. ගෙවීම අතිවිශාලයි."

"අන්න හරියටම හරි. අපි බලාපොරොත්තු වෙනවා, අද රෑ අන්තිම දුම්රියෙන් ඔබ මේ කටයුත්ත සඳහා ඒවි කියලා"

"කොහේටද?"

"ඔබ එන්න ඕනෙ බර්ක්ෂයර් ප්‍රාන්තයේ අයිෆඩ් ගමටයි. මෙක ඔක්ස්ෆඩ්ෂයර් ප්‍රාන්ත මායිමට සමීපව තිබෙන කුඩා ගමක්. රෙඩිං ඉඳලා හැතැක්ම හතක දුර. ලන්ඩනයේ පැඩිංටන් දුම්රිය පොළෙන් පිටත් වී යන අන්තිම දුම්රිය, රෑ 11.15ට පමණ අයිෆඩ් වලට ළඟාවෙනවා."

"බොහොම හොඳයි."

"මං ඔබව හමුවෙන්න අශ්වකරත්තයෙන් දුම්රිය පොළට එන්නම්."

"අපට අශ්වකරත්තයක යන්නත් තියෙනවද?"

"ඔව්. අපේ තැන තිබෙන්නේ ටිකක් ගම්බදට වෙන්න. අයිෆඩ් දුම්රියපොළේ ඉඳල එතැනට හැතැක්ම හතක් පමණ තියෙනවා."

"එහෙම නම් ඔය රාජකාරිය තියෙන තැනට අපට මැදියම් රැයට කලින් ළඟාවෙන්න බැරිවේවි. ඒ විධියට බැලුවොත් මට රෑම ආපහු එන්න දුම්රියකුත් නැතිවේවි. මට අනිවාර්යයෙන්ම ඔබගේ තැන රාත්‍රිය ගතකරන්න සිදුවෙනවා."

"ඔව්. අපට ලේසියෙන්ම පුළුවනි ඒ සඳහා ඔබට සැපපහසුකම් සලස්වන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක මට ටිකක් නුහුරුයි. මේ වැඩේ සඳහා අපට වෙනිං වෙලාවක් යොදා ගන්න පිළිවෙළක් නැද්ද?"

"අපි තීරණය කරලා තියෙනවා, ඔබව ගෙන්වාගන්න හොඳම වෙලාව, මේ වෙලාවයි කියල. ඔබට මුහුණපාන්න වෙන නොයෙක් දුෂ්කරතා ගැනත් හිතල බලලයි, අපි මේ වගේ මුදලක් ගෙවන්න තීරණය කළේ. ඔබේ වෘත්තියේ ඉහළම තත්ත්වයට පැමිණි පළපුරුදු ඉංජිනේරුවෙකුගෙන් වුණත්, අපි මේ ගෙවන මුදලට උපදෙසක් ගන්න පුළුවනි. නමුත් ඔබ වගේ තරුණ, අප්‍රසිද්ධ කෙනෙකුට අපි ඒ ගාස්තුව ගෙවන්නෙ මේ අපහසුකම් නිසයි. කොහොම වුණත් ඔබ මේ වැඩේට කැමැති නැත්නම් දන් වුණත් පුළුවනි අත්හැර දාන්න!"

එක්වරම මගේ හිතට ආවෙ ගිනි පනහක මුදල ගැනයි. මට ඒක මොන තරම් ප්‍රයෝජනවත් වේවිද යන්න සිහිවුණා.

"නැහැ. නැහැ. ප්‍රශ්නයක් නැහැ. ඔබේ වැඩ පිළිවෙළට මං කැමැතියි. ඒ වුණත් මගෙන් කෙරෙන්න තියෙන වැඩේ මොකක්ද කියලා වැඩි විස්තර දැනගන්න මං කැමතියි."

"ඔව් ඒක හරි. මේක බොහොම රහසිගත කාරණයක් කියලා මං කිව් දෙයින්ම ඔබේ හිතේ කුතුහලයක් ඇතිවෙන්න ඇති.

ඒකෙ පුදුමයක් නෑ. මේකට සම්බන්ධ හැමදෙයක්ම ඔබට පහදා දෙන්නෙ නැතුව, ඉංජිනේරු කටයුත්තකට ඔබව යොදවා ගන්න මගේ බලාපොරොත්තුවක් නැහැ. අපේ මේ කතාවට කවුරුවත් හොරෙන් කන්දෙන එකක් නැහැ නේද?"

"කිසිසේත් නැහැ."

"එහෙනම් මෙන්න මේකයි ප්‍රශ්නය. ඔබ අහලා ඇති "ෆුලර්ස් අර්ත්" නම් වටිනා ඛනිජ වර්ගය ගැන? කර්මාන්ත ක්ෂේත්‍රයේ නොයෙකුත් නිෂ්පාදන කටයුතු වලදී ෆුලර්ස් අර්ත් අවශෝෂකයක් හැටියට යොදා ගන්නවා. මේ මැටි වැනි ඛනිජ වර්ගය මුළු එංගලන්තයේම තියෙන්නෙ නැත් එකක හෝ දෙකක පමණයි"

"මං ඒ බව අහල තියෙනවා."

"හරි. ටික කාලෙකට ඉස්සර වෙලා මං රෙඩිං නගරයෙන් හැතැක්ම දහයක් ඇතුළත පොඩි ඉඩම් කෑල්ලක් මිලදී ගත්තා. මේ

ඉඩමේ පස හාරද්දී, එහි පුලර්ස් අර්ත් ඉල්ලමක් ඇති බව සොයා ගැනීමට මට හැකිවුණා. මෙවැනි දෙයක් සොයා ගන්න ලැබීම ලොකු වාසනාවක්. තවදුරටත් පරීක්ෂා කර බැලීමේදී මට පෙනී ගියා, මගේ ඉඩමේ තිබෙන්නේ ඉල්ලම් ඉතා ස්වල්පයක් බව. ඇත්තෙන්ම ඉල්ලමේ විශාල ප්‍රමාණ තිබුණේ මගේ ඉඩමට වම් පැත්තෙන් හා දකුණු පැත්තේ ඇති ඉඩම්වල. මගේ ඉඩමේ තිබුණේ ඒ දෙක එකට සම්බන්ධ කරන කුඩා කොටසක් පමණයි. නමුත් මේ දෙපැත්තේම ඉඩම් අයිති මිනිස්සු කිසි කෙනෙක් දන්නෙ නෑ, ඔවුන්ගේ ඉඩම්වල තිබෙන, රත්තරන් ඉල්ලම් හා සමාන පුලර්ස් අර්ත් ගැන. ඉතින් මං මොකක්ද කළ යුත්තේ? මං කල්පනා කරල බැලුවා. මට කරන්න තියෙන්නේ, ඒ ඉඩම් කෑලි වල නියම වටිනාකම ඒ අයට පැහැදිලි වෙන්න කලින් ඒ ඉඩම් මිලට ගැනීම. නමුත් අවාසනාවකට වගේ ඒ තරම් දෙයක් කරන්න මා ළඟ විශාල මුදලක් නැහැ. මං මගේ හිතවත්ම යහළුවන් කීපදෙනෙකුට මේ රහස එළි කළා. ඔවුන්ගේ අදහස වුණේ අපි බොහොම නිශ්ශබ්දව, රහසිගතව අපේ ඉඩමේ තියෙන ඉල්ලම හාරා ගත යුතු බවයි. ඊට පස්සේ එය විකුණා මුදල් හොයාගෙන එයින් අසල්වාසීන්ගේ ඉඩම් මිලට ගන්න එක වඩා හොඳ බව අප තීරණය කළා.

අපි දන් සෑහෙන කාලයක් තිස්සේ මේ ඉල්ලම් හෑරීම කරනවා. මේ කටයුත්ත පහසුකර ගැනීම සඳහා අපි හයිඩ්‍රොලික් තෙරපුම් යන්ත්‍රයක් යොදා ගන්නවා. මෙන්න මේ තෙරපුම් යන්ත්‍රය තමයි, මං ඔබට කලින් කීව විධියට ක්‍රියා විරහිත වෙලා තියෙන්නේ. ඒක අලුත්වැඩියා කරගැනීම සඳහා අපට ඔබේ උපදෙස් අවශ්‍යයි. බොහොම ප්‍රවේසමෙන් දනට අපි මේ රහස ආරක්ෂා කරගන ඉන්නවා. හයිඩ්‍රොලික් ඉංජිනේරුවරයෙක් අපේ පුංචි ගෙදරට ආවා කියල ආරංචියක් ගියොත්, අවට මිනිස්සු ඒ ගැන විපරම් කරන්න පටන් ගනීවි. එහෙම වුණොත් අප කරන මේ කටයුත්ත මොකක්ද කියලා සත්‍යය හෙළි වෙනවා. එතකොට අපි අල්ලපු ඉඩම් මිලට ගෙන එහි ඉල්ලම් හාරා ගැනීමට කළ හැකි සැලසුම් ඔක්කොම වතුරේ යනවා. අන්න ඒ නිසයි මං ඔබෙන් මෙහෙම දෙයක් ඉල්ලා හිටින්නේ. අද රෑට ඔබ අයිෆඩ් බලා යන බව වත් කිසිම කෙනෙකුට කියන්න එපා. ඔබට දන් කාරණය පැහැදිලි ඇති මං හිතන්නේ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"හොඳින් පැහැදිලියි. මට තේරුම් ගැනීමට අපහසු එක කරුණක් තියෙනවා. ෆුලර්ස් අර්ත් ඉල්ලම් හාරා ගැනීමට හයිඩ්‍රොලික් බලයෙන් වැඩකරන තෙරපුම් යන්ත්‍රයක් උවමනා වුණේ ඇයි? ෆුලර්ස් අර්ත් කියන්නේ පොළොවේ හෑරූ වළවල් වලින් ගරාගත හැකි බොරළු වගේ ඉල්ලමක් කියලයි මං අහල තියෙන්නේ."

"ආහ්!" ඔහු පිළිතුරු දුන්නේ නොසැලකිල්ලෙන්.

"අපට අපේම ක්‍රම තියෙනවා. අප කරන්නේ ඉල්ලම් හාරා ගත් පසු ඒකට තෙරපුම් යන්ත්‍රයෙන් පීඩනයක් යොදලා, ගඩොල් වැනි ස්වභාවයකට සකස්කර ගන්නවා. ඒ මාර්ගයෙන් කාටවත් සැක හිතෙන්නේ නැති විධියට ඉල්ලම් ටික ඉඩමෙන් ඉවතට ගෙනියන්න පුළුවනි. ඒක ඉතින් අමතර විස්තරයක් පමණයි. දන් මං ඔබ ගැන සම්පූර්ණ විශ්වාසය තබලයි ඉන්නේ හාදර්ලි මහත්මයා. මං මගේ රහස ඔබට හෙළි කළා. එයින් මං පෙන්නුවේ මං ඔබ ගැන විශ්වාසය තබා ඇති ආකාරය."

මෙහෙම කිව් අමුත්තා පුටුවෙන් නැගිට්ටා.

"එහෙම නම් අද රෑ එකොළහයි කාලට අයිෆඩ් දුම්රියපොළේදී ඔබව හමුවෙන්න මං බලාපොරොත්තු වෙනවා."

"මං නොවරදවාම එන්නම්."

"හැබැයි කිසිකෙනෙකුට එක වචනයක් වත් කියන්න එපා." එහෙම කිව් ඔහු මා දිහා අවසන් වරටත් ඇසිපිය නොහෙළා බලාගෙන හිටියේ අර කලින් විධියට. තත්පර කිහිපයක් නොසෙල් වී එහෙම බලාගෙන හිටි ඔහු, සීතල අතකින් මගේ අත ග්‍රහණය කරලා කාමරයෙන් පිටවෙලා ගියා.

හිතේ තිබුණු කලබල ගතිය අඩුවෙලා යද්දී, මං නිව්හැනහිල්ලෙ මේ ගැන කල්පනා කළා. මට හාරවුණු මේ කටයුත්ත මහ පුදුම සහගත එකක්. ඔබ දෙදෙනාටත් ඒක පැහැදිලිවම පෙනෙනවා ඇති. එක් අතකින් ඔහු ගෙවන්න පොරොන්දු වුණු ගාස්තුව, මං ඉල්ලන ගාස්තුව වගේ දහගුණයක්. ඒ වගේම මං මේ කටයුත්තේ යෙදුණොත්, ඉදිරි කාලයේදී මට මෙවැනි සේවා අවස්ථා ලැබෙන්නත් ඉඩ තියෙනවා. අනෙක් අතට මගේ අනුග්‍රාහකයාගේ මුහුණෙන් ප්‍රකාශවුණු හැඟීම් සහ කථා විලාසය, මගේ හිතේ ඇති කාලේ හරි අප්‍රසන්න බවක්. ෆුලර්ස් අර්ත් ඉල්ලම් හාරා ගැනීමට ඇති උවමනාව

http://sinhalaebooks.blogspot.com



24. "සීතල අත්තින් මගේ අත ග්‍රහණය කරලා . . . ."

http://sherlockholmesinvestigations.blogspot.com

සහ මධ්‍යම රාත්‍රියේ මා එහි පැමිණීමට ඇති අවශ්‍යතාවය ගැන ඔහු දීර්ඝ පැහැදිලි කිරීමක් කළ බව ඇත්තයි. නමුත් මට ඒ ගැන සෑහීමකට පත්වෙන්න පුළුවන් කමක් තිබුණේ නැහැ. අනෙක ඔහු මගේ පැමිණීම කිසිවෙකුට නොදැන්විය යුතු බව කියමින් දැක්වූ කැලඹිලි ස්වභාවය. මේ කරුණු මගේ හිතේ ඇති කළේ සැක සහිත බවක්. නමුත් අන්තිමේ දී මේ සැක සංකා ඔක්කොම අමතක කර දමන්න මං තීරණය කළා. හොඳ කෑම වේලක් කාලා මං කුලීරියකින් පැඩිංටන් දුම්රියපොළ වෙත ආවා. ඔහුට පොරොන්දුවුණු පිළිවෙළ අකුරටම අනුගමනය කරමින්, මං මේ ගමන ගැන කාටවත් දැනුම් දුන්නේ නැහැ.

පැඩිංටන් සිට මා පිටත්වී ගිය දුම්රියෙන් රෙඩිං වලදී බැස්සා. ඒ මොකද අයිෆඩ් බලායන්න මට වෙනත් දුම්රිය මාර්ගයක ගමන් කරන දුම්රියක යන්න සිදුවුණු නිසා. කොහොම හරි අයිෆඩ් බලා පිටත්වෙන අන්තිම දුම්රිය අල්ලා ගැනීමට මට හැකිවුණා.

අයිෆඩ් දුම්රියපොළෙන් බහින කොට රෑ එකොළහත් පහුවෙලා. තැනින් තැන ආලෝකය දල්වා තිබුණත් එතැන තිබුණේ මහ අන්ධකාර ගතියක්. එතැනදී දුම්රියෙන් බැස්ස එකම මගියා මමයි. වේදිකාවේ කිසිම කෙනෙක් පෙනෙන්න හිටියෙ නැහැ. දුම්රිය පොළ ගොඩනැගිල්ලේ ලන්තෑරුමක් අතැතිව නිදි කිරමින් පෝටර් වරයෙකු හිටියා. ලෑලි පට්ටවලින් තැණූ ගේට්ටුවෙන් පිටවී මං එළියට ආවා. උදේ මා හමුවීමට ආ අමුත්තා එක්වරම අඳුරු සෙවණැලි අතරේ ඉඳලා ඉස්සරහට ආවා. වචනයක්වත් කථා නොකර මගේ අතින් අල්ලාගත් ඔහු, මාව ඉක්මනින් අශ්වකරත්තයක් වෙත කැඳවාගෙන ගියා. එහි දොර ඇරලයි තිබුණේ. අපි එයට නැඟුණු වහාම දොරවසා, ජනේල ආවරණය කර දමූ ඔහු, ලෑල්ලට තට්ටුකොට සංඥාවක් කළා. ඒ සමගම අශ්ව කරත්තය ඉතා වේගයෙන් ගමන් කරන්න පටන් ගත්තා."

"එක් අශ්වයද කරත්තයට බැඳල හිටියේ?" හෝම්ස් ඇසීය.

"ඔව්, එකයි."

"ඔබ දුටුවද ඌ මොන පාටද කියල?"

"ඔව්. මං කරත්තයට නගිද්දී පැති ලාම්පුවල එළියෙන් දුටුවා. ඌ දුඹුරු පාට අශ්වයෙක්."

investigations.blogspot.com

"අශ්වයා බොහොම වෙහෙස මහන්සි වෙලා හිටි බවක් පෙනුණාද? නැත්නම් එහෙම දෙයක් පෙනුණේ නැද්ද?"

"නෑ. බොහොම නැවුම් ගතියෙන් හිටියේ. මහන්සිවී හිටි බවක් පෙනුණේ නෑ."

"ස්තුතියි. කථාවට බාධා කිරීම ගැන මට කණගාටුයි. ඔබේ රසවත් කථාව දිගටම කියන්න."

"ඉතින් අපි දුම්රිය පොළෙන් පිටත් වී ගියා. අපි පැයක් විත් අශ්වකරත්තයේ ගමන් කරන්න ඇති. කර්නල් ලයිසැන්ඩර් ස්ටාක් මට කිව්වෙ හැතැක්ම හතක් කියලයි. නමුත් අපට ගතවුණු කාලයේ හැටියටත්, ගිය වේගයේ හැටියටත් මං හිතන්නේ අපි හැතැක්ම දොළහක්වත් ගමන් කරන්න ඇති. ඔහු මගේ පැත්තකින් වාඩිවෙලා දිගටම නිශ්ශබ්දව හිටියා. නමුත් ඔහු මා දෙස තියුණු ලෙස නෙත් හෙලාගෙන සිටි බව මං කිහිප වාරයක්ම දුටුවා. ඒ පැත්තේ පාරවල් නම් තිබුණේ ඉතාම අසතුටුදායක තත්ත්වයකයි. පාරේ තිබූ වළ ගොඩැලි නිසා කරත්තය ගැස්සෙද්දී දිගින් දිගටම අප ගැස්සුණා, උඩ විසිවුණා. අප යන්නේ මොන වගේ පැත්තකටද කියල බලන්න මම ජනෙල් වීදුරු වලින් එළිය බැලීමට තැත් කළා. නමුත් ඒ වීදුරු සුදුපැහැ ගැන්වූ ඒවා නිසා කිසිවක් බලාගන්න බැරිවුණා. ගමනේ ඒකාකාරී බව නැතිවෙන්න මං ඉදහිට යමක් කිව්වා. නමුත් කර්නල් ඊට පිළිතුරු දුන්නේ එක වචනයකින් හෝ දෙකකින්. ඒ නිසා කතාබහ එහෙමම නැවතුණා. වළවල් වල වැටි වැටී ගිය අපි අන්තිමට බොරළු පාරකට පිවිසුණා. එහි ටික දුරක් ගිය පසු, අපේ ගමන අවසන් වුණා.

කර්නල් ස්ටාක් ඉක්මනින් කරත්තයෙන් එළියට බැස්සා. ඊළඟට ඔහු මාවත් ඇදගෙන, ඉස්තෝප්පුව හරහා ගෙට ඇතුළු වුණා. ඒ නිසා නිවසේ ඉදිරිපස පෙනුම මොකුත් මට හරිහැටි බලාගන්න බැරිවුණය. මා ඇතුළු වුණු වහාම ඔහු ගෙදර දොර මහ හඬින් වසා දැම්මා. ඊළඟට කරත්තය ඉවත් වී යන හඩ මට ඇසුණා.

ගෙය ඇතුළේ තිබ්බ කළුවරයි. කර්නල් ගිනිපෙට්ටියක් සොයමින් කළුවරේ අතපත ගෑවා. ඒ කරදරය ගැන ඔහු මොනවාදෝ තොල්මතුරමින් කිව්වා. මීළඟට බරාඳයේ අනෙක් කෙළවරේ දොරක්

http://sherlockholmesinvestigations.blogspot.com

ඇරුණා. පහනක දීප්තිමත් රන්වන් ආලෝකය අප සිටි පැත්තට වැටුණා. ආලෝක කදම්බය ක්‍රමයෙන් පුළුල් වුණා. පහන රැගෙන ආවේ කාන්තාවක්. අතේ තිබූ පහන, ඇය හිසටත් උඩින් සිටින සේ ඔසවා ගෙනයි සිටියේ. ඇය රූමත් කාන්තාවක් බව මං පහන් එළියෙන් දුටුවා. ඇගේ ගවොමට වැටුණු ආලෝකයෙන් එය බැබළුණා. ඒ නිසා එය වටිනා රෙද්දකින් නිමවුණු එකක් බව මට හිතාගන්න හැකිවුණා.

ඇය කුමක්දෝ විදේශීය භාෂාවකින් කර්නල්ගෙන් ප්‍රශ්න වගයක් ඇහැව්වා. ඔහු ඒවාට වචනයකින් දෙකකින් පිළිතුරු දුන්නේ ඉතාම රළු ආකාරයට. එයින් ඈ කොතරම් කලබල වුණාද කිව්වොත් තව ටිකෙන් ඇය අතින් පහනත් බිමට වැටෙනවා. කර්නල් ස්ටාක් ඇය ළඟට ගිහින් ඇගේ කනට කොඳුරා මොනවාදෝ කිව්වා. ඊළඟට ඔහු ඇයව ආ පැත්තටම තල්ලුකරගෙන ගිහින් දොරක් ඇරලා, ඇයව ඒ කාමරයට දාලා, දොර වැහුවා. ඊට පස්සේ ඔහු මා දෙසට ආවේ පහනත් අතේ ඇතිව.

"මහත්මයා. කරුණාකර මිනිත්තු කීපයක් මෙන්න මේ කාමරයේ රැඳී ඉන්න." එහෙම කිව් ඔහු දොරක් විවෘත කරගෙන මා තවත් කාමරයකට කැඳවාගෙන ගියා. එය ලී බඩු ස්වල්පයක් පමණක් තිබූ කුඩා කාමරයක්. එහි මැද රවුම් මේසයක් තබා තිබුණා. ජර්මන් භාෂාවෙන් ලියැවුණු පොත් කිහිපයක් ඒ මත විසුරුවා තිබුණු හැටි මා දුටුවා. දොර අසල පියානෝවක් තිබුණා. කර්නල් ස්ටාක් ලාම්පුව ඒ මත තැබුවා.

"මං ඔබව මොහොතක්වත් රස්තියාදු කරන්නේ නෑ" එහෙම කිව් ඔහු අඳුරේ නොපෙනී ගියා.

මේසය උඩ තිබූ පොත් මොනවාද කියා මං නිකං පෙරළා බැලුවා. ඒවා ජර්මන් භාෂාවෙන් ලියැවුණු පොත්. එයින් දෙකක් විද්‍යාව පිළිබඳව ලියැවුණු ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක් බවත්, අනෙක්වා කාව්‍ය සංග්‍රහයන් බවත් මට තේරුම් ගැනීමට හැකිවුණා. ඊළඟට මම ගියේ ජනේලය ළඟට. මට උවමනා වුණේ නිවසෙන් එළිය - ගෙවත්ත මොන වගේද බලන්න. නමුත් ජනේලයේ වීදුරුව ආවරණය වනසේ ඝන ඕක් ලෑලි තහඩු ජනෙල් පියනට සවිකොට තිබුණා. මේ නිවස පුදුමාකාර විදියට නිශ්ශබ්දතාවයක් තිබුණු නිවසක්.

http://sherlockholmesinvestigations.blogspot.com

බරාඳයේ කොහේ හරි පැරැණි ඔරලෝසුවක් ශබ්ද නගා ක්‍රියාත්මක වෙන හඬ ඇසුණා. ඒ ඇරෙන්න හැම තැනකම තිබුණේ නිහඬ බවක්.

යම්කිසි භයක්, චකිතයක් වැනි හැඟීමක් මගේ සිරුර පුරා දිවයන්න පටන් ගත්තා. කවුද මේ ජර්මන් ජාතිකයෝ? රටේ, අප්‍රසිද්ධ පාළු පළාතක ජීවත්වෙමින් ඔවුන් මොනවද කරන්නෙ? මේ පළාත ඇත්තටම කොහේද? අයිෆර්ඩ් ඉඳලා හැතැක්ම දහයක් පමණ රට ඇතුළට ගමන් කළ බව පමණයි මං දන්නෙ. නමුත් ඒ ගමන් කළේ උතුරටද දකුණටද නැගෙනහිරටද බටහිරටද කියන්න මං දන්නෙ නැහැ. එම පුර ඇතුළත රෙඩිං සහ තවත් වැදගත් නගර තිබීමට ඉඩ තියෙනවා. එහෙම නම් මේක ඒ තරම් පාළු පළාතක් වෙන්න බෑ. ඒ වගේම එහි තිබුණු පුදුමාකාර නිශ්චල භාවය නිසා, අප හිටියේ රට ඇතුළත පිහිටි ගම්බද ප්‍රදේශයක බව මට හිතාගත හැකිවුණා. මං කාමරයේ ඉහළ පහළ ඇවිදින්න පටන් ගත්තේ සිවුරුහන් කරමින්. මං එහෙම කළේ මගේ කඩා වැටෙමින් තිබූ ආත්ම විශ්වාසය යළි ගොඩ නංවා ගන්නයි. කොහොම වුණත් ගිනි පනහක මගේ ගාස්තුව උපයාගැනීම වෙනුවෙන් මට සෑහෙන වෙහෙසක් දරන්න සිදුවූ බව පෙනුණා.

මේ දැඩි නිශ්චලතාවය මැද්දේ මගේ කාමරයේ දොර සෙමින් සෙමින් විවෘත වුණා. දොරටුව අසල සිටගෙන සිටියේ අර කාන්තාව. ඇගේ අතේ තිබූ ලාම්පුවේ කහ පැහැති ආලෝකය ඇගේ ශෝභා සම්පන්න මුහුණට වැටී තිබුණා. ඊට පිටුපසින් සාලයේ දැඩි අන්ධකාරය.

බැලූ බැල්මට මට පෙනුණේ ඇය අතිශයින්ම භයට පත්වී සිටිය බව. එයින් මගේ හදවත සීතල වී ගියා. ඇය අත මසවා නිහඬව සිටින මෙන් ඇඟිල්ලකින් මට සංඥා කළා. ඊළඟට කැඩුණු ඉංගිරිසියෙන් වචන කීපයක් කොඳුරා කිව්වා. මේ විදියට අනතුරු අඟවමින්, පිටුපසින් තිබූ අන්ධකාරය දෙස ඇය වරින් වර හැරී බැලුවේ භයවුණු ගෙළණක් වගෙයි.

"යා යුතුයි! යා යුතුයි! මෙහෙ ඉඳීම හොඳ නැහැ. ඔබ මෙහෙන් යා යුතුයි" ඇය කිව්වා.

http://sherlockholmesinvestigations.blogspot.com



29. "යා යුතුයි! යා යුතුයි! ඔබ මෙහෙන් යා යුතුයි" ඇය කිව්වා.

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ වුණත් නෝනා, මං මෙහේට ආවේ යම් කටයුත්තකට. ඒ වැඩේ තවමත් මගෙන් ඉටුවුණේ නැහැ. යන්ත්‍රය බලනතුරු මට මෙහෙන් යන්න හැකියක් නැහැ."

"ඔබ මෙහේ තවත් ඉඳීමෙන්, ඔබට ලැබෙන ප්‍රයෝජනයක් නැහැ. ඔය දොරෙන් පිටවෙලා වහාම යන්න. කවුරුවත් ඔබට බාධා කරන්නේ නැහැ."

ඇය මෙහෙම ඉල්ලා හිටියත් මං කළේ සිනාසෙමින් මගේ හිස දෙපසට සැලීම පමණයි. ඇගේ කීමට මා අවනත නොවුණු බව දුටු කාන්තාව අඩියක් ඉදිරියට තබා මට ආයාචනා කරන්න පටන්ගත්තේ, ඇගේ දෑත් අඹරවමින්

"දෙවියන්ගේ නාමයෙන් මෙහෙන් යන්න. ප්‍රමාද වුණොත් ඔබට මෙහෙන් යන්න ලැබෙන්නේ නෑ. ඊට කලින් යන්න"

මම ස්වභාවයෙන්ම ටිකක් මුරණ්ඩු කෙනෙක්. යම් වැඩකට බාධාවක් ඇති බවක් දුටුවොත්, මං උත්සාහ කරන්නේ ඒක කොහොම හරි කරන්නයි. මං එතැනට ගියේ බොහොම දුෂ්කර ගමනක යෙදිලයි. මට ගිනි පත්තක් ලැබීමට නියමිතයි. රාත්‍රියේ ඉතිරි කොටසේ මට නොයෙක් දුෂ්කරතා වලට මුහුණ දෙන්න සිදුවෙන්නත් පිළිවන්. මෙච්චර මහන්සි වෙලා හිස් අතින් ආපහු යන්නේ කොහොමද? මට ලැබිය යුතු මුදල නොගෙන මං ආපහු යා යුත්තේ ඇයි? මේ කාන්තාව බාග වෙලාවට මානසික විකෘතියක් ඇති කෙනෙකු විය හැකියි. ඇගේ ඒ හැසිරීමෙන් මං තැතිගත් බව ඇත්තයි. නමුත් එහි රැඳී සිටීමට මං දඩිවම තීරණය කළ බව මං කීවා.

ඇය සූදානම් වුණේ ඇගේ ආයාචනය යළිත් පටන් ගන්නයි. එතකොටම ඉහළ තට්ටුවේ දොරක් වහන ශබ්දයත් තරප්පු පෙළේ සිහිප දෙනෙකු ගේ අඩිශබ්ද ඇහෙන්නට වුණා. ඇය ඊට කන්දීගෙන මොහොතක් හිටියා. ඊට පස්සේ සියලු බලාපොරොත්තු කඩවුණු බව හඟවන ආකාරයට දෑත් දෙපසට විහිදුවලා ඇය අඳුරේ අතුරුදන් වී ගියා.

මොහොතකින් කර්නල් ස්ටාක් සහ තවත් මිටි තරබාරු මිනිහෙක් එතැනට ආවා. ඔහුගේ නිකටේ කුඩා එළු රැවුලක් තිබුණා.

"මේ තමයි, මගේ ලේකම් සහ කළමනාකාර ෆර්ගියුසන් මහත්මයා. ඒක හොඳයි. මං [illegible] කලින් මෙතැනින් යද්දී මං

මේ දොර සම්පූර්ණයෙන්ම වහගෙන ගියා කියලයි මං හිතාගෙන හිටියෙ. . . . දැන් දොර ඇරල තියෙන්නේ . . . . මට කණගාටුයි, මේකෙන් කාමරය ඇතුළට සීතල සුළං හමන්න ඇති?"

"නෑ. සිද්ධ වුණේ ඒකෙ අනික් පැත්තයි මහත්මයා. කාමරය ඇතුළේ හරි උණුසුම්, අවහිර ගතියක් දැනුණා. ඒක නිසා මම දොර ඇරලා දැම්මා."

මං පිළිතුරු දුන්නා. ඒ කතාවට ඔහු මං දිහා තියුණු ආකාරයේ බැල්මක් හෙළාගෙන සිටියා.

"එහෙම නම් අපි කෙළින්ම ඔබ ආව වැඩේට බහිමු. ෆර්ගියුසන් මහත්මයත් මමත් ඔබට යන්ත්‍රය පෙන්වන්න එක්ක යන්නම්."

"ඔහොම ඉන්න මගේ හිස්වැස්ම දමාගන්න තුරු."

"උවමනා නැහැ. යන්ත්‍රය තියෙන්නෙ ගේ ඇතුළෙ."

"මොනවා? ඔබ ෆුලර්ස් අර්ත් ඉල්ලම් හාරන්නෙ ගේ ඇතුළෙ ඉඳගෙනද?"

"නෑ නෑ. ඒව සම්පීඩනය කිරීම අපි කරන්නෙ ගේ ඇතුළෙ සිට. ඒකෙන් කමක් නැහැ. අපි ඔබෙන් බලාපොරොත්තු වෙන්නේ යන්ත්‍රය සෝදිසි කර බලලා, ඒකෙ වැරැද්ද මොකක්ද කියලා අපට පෙන්වා දීමයි."

අපි උඩ තට්ටුවට නැඟුණා. කර්නල් ස්ටාක් පහනත් අරගෙන ඉදිරියෙන්ම ගියා. තරබාරු කළමනාකාරයත් මාත් ඒ පිටුපසින් ගියා.

ඒක මහ විශාල ආදි කාලෙ ගෙයක්. කාමර මහා රාශියක් තිබෙන්න ඇති. ඒවා එකට සම්බන්ධ කරන, බරාඳ, කොරිඩෝර්, පුංචි පුංචි දොරවල්, පටුරවුම් තරප්පු පේළි රැසක් මේ ගෙදරට අඩංගු වුණා. පරම්පරා ගණනාවක් මේ නිවස පාවිච්චි කරන්න ඇති. උඩතට්ටුවේ ගෘහ භාණ්ඩ හෝ බුමුතුරුණු කිසිවක් තිබුණේ නැහැ. බිත්ති වල බදාම කඩා හැලෙන්න පටන් අරගෙන තිබුණා. ඒ වගේම සමහර තැන්වල බිත්තියේ කොළ පැහැයට පාසි හැදෙන්න අරගෙන තිබුණේ, වැහි වතුර කාන්දුවීම නිසා.

අර කාන්තාව මට කළ අනතුරු ඇඟවීම මං ගණන් ගත්තේ නැති බව ඇත්තයි. නමුත් ඒකෙන් මගේ හිතේ සැහෙන කැළඹීමක් ඇතිවුණා. කොහොමත් වුණත් ඒ ගතියක් පිටතට නොපෙන්වා මම

නිර්භය, නොසැලෙන කෙනෙක් වගේ පෙන්වාගෙන හිටියා. මේ පුද්ගලයන් දෙදෙනා ගැනම හොඳ කල්පනාවෙන් හා සෝදිසියෙනුයි මං හිටියේ. පර්ගියුසන් නම්, අනෙක් අය නුරුස්සන, ඒ වගේම නිග්ගඩ්ඩ මනුස්සයෙක් බවයි පෙනුණේ. නමුත් අඩු වශයෙන් ඔහු අපේ රටේ මිනිහෙක් - ඉංග්‍රීසි ජාතිකයෙක් බව එත් මට කතාබහෙන් තේරුම් ගතහැකි වුණා.

කර්නල් ලයිසැන්ඩර් ස්ටාක් අන්තිමට මිටි දොරටුවක් ළඟ නැවතුණා. යතුරක් අරගෙන ඔහු දොරේ අගුළ විවෘත කළා. දොර ඇරියාම පෙනුණේ ඒක ඉතාම කුඩා කුටියක් බවයි. අපි තුන්දෙනාටම එක පැරේ ඒක ඇතුළෙ හැරෙන්නවත් ඉඩක් තිබුණෙ නැහැ. පර්ගියුසන් එළියෙ නැවතුණා. කර්නල් මාව කාමරය ඇතුළට කැඳවා ගත්තා.

"ඇත්තෙන්ම දැන් අපි ඉන්නේ යන්ත්‍රයේ ද්‍රව බල ශක්තියෙන් තෙරපීම කරන කොටස මතයි. වැරදීමකින් හෝ කවුරු හරි යන්ත්‍රය ක්‍රියාත්මක කළොත් අපි පිස්ටනයෙන් තැලී, ඇඹරී, මිරිකී යාවි. මේ කුටියේ සිවිලිම වගේ ඔය උඩින් පෙනෙන්නේ පිස්ටනයේ යට පැත්තේ කෙළවරයි. යන්ත්‍රය ක්‍රියාත්මක කළාම ටොන් ගණනක බලයක් අරගෙන පිස්ටනය පහළට එන්න පටන් ගන්නවා. ඒ ඇවිත් මේ අප සිටගෙන ඉන්නා ලෝහමය වේදිකාව මත හැපෙනවා. මේ ලෝහ වේදිකාවට සම්බන්ධව ද්‍රව ගමන් කරන කුවීර රාශියක් විසිරී තිබෙන බව ඔබට පෙනෙනවා ඇති. පිස්ටනයෙන් ගෙන එන පීඩනය අරගෙන ද්‍රවය වැඩි පීඩනයකින් ඉවතට ගමන් කළ යුතුයි. අපේ ප්‍රශ්නය තියෙන්නේ අන්න එතැනයි. ස්වීච්චය දැමුවාම පිස්ටනය පහළට ගමන් කරන්න පටන් ගන්නවා. නමුත් ඒ ක්‍රියාව සිද්ධවෙන්නේ බොහොම දුර්වල අයුරින්. ඒකෙන් අප බලාපොරොත්තු වෙන සම්පීඩන ශක්තිය ලැබෙන්නෙ නැහැ. යන්ත්‍රයෙන් ලැබෙන තෙරපුම සෑහෙන්න අඩුයි. මේක පරීක්ෂා කර බලල කරුණාකරල ඔබට කියන්න පුළුවන්ද මෙහි වැරද්ද තියෙන්නෙ කොහේද කියල? එහෙම කිව්වොත් අපට ඒක නිවැරදි කරගත හැකියි."

කර්නල්ගේ අතින් පහන අරගෙන මම ඉතාම හොඳින් යන්ත්‍රය පරීක්ෂා කරල බැලුවා. ඒක ඉතාම යෝධ යන්ත්‍රයක් බව ඇත්තයි. ඒ නිසාම යෝධ පීඩනයක් එල්ල කිරීමේ ශක්තියක් ඊට තිබුණා. මං එතැනින් එළියට ඇවිත් යන්ත්‍රය ක්‍රියාත්මක කරන ලීවරය

පහතට දම්මා. එවිට හුළං පිටවෙනවා වගේ ශබ්දයක් මට අහන්න ලැබුණා. ඒ වාතය කාන්දු වෙන තැනක්. ඒ නිසා ජලය පැති සිලින්ඩර දිගේ ඉහළට විදින්න පටන් ගන්නවා. තවදුරටත් සෝදිසි කිරීමේදී මේ වරදට හේතුව සොයා ගැනීමට මට හැකිවුණා. තෙරපුම් කුටිය මුද්‍රා සහිත වෙන්නට රබර් ගැස්කට් තිබෙනවා. නමුත් මෙම යන්ත්‍රයේ තිබූ එම රබර් මුද්‍රා හැකිළී පළුදු වී යාම නිසා කාන්දු වීම සිදුවෙන බව මට පෙනී ගියා. මං මේ බව අර දෙන්නාට පෙන්වා දුන්නා.

මං කී දේවල් බොහොම හොඳින් සිහියට ගත් ඔවුන් ඒක නිවැරදි කිරීමට ගතයුතු ක්‍රියාමාර්ගය ගැන, ප්‍රායෝගික ප්‍රශ්න ගණනාවක් ඇහැව්වා. ඔවුනට කාරණා සියල්ල පැහැදිලි කළාට පස්සේ මම යළිත් කුටිය තුළට ගිහින් යන්ත්‍රය දිහා බැලුවා. ඒ මගේ හිතේ ඇති වූ කුතුහලය නිසා. මේ ෆුලර්ස් අර්ත් ගැන ඔවුන් කිව් කථාව, ඔවුන් ගෙතූ අමූලික බොරුවක් බව මට බැලූ බැල්මටම පෙනී ගියා. මේ තරම් ප්‍රබල යන්ත්‍රයක් එවැනි සුළු කටයුත්තක් සඳහා යොදා ගන්නවා කියන එක විකාර කතාවක්.

ඒ කුටියේ බිත්ති සාදා තිබුණේ ලෑලි වලින් නමුත් බිම - විශාල යකඩ වේදිකාවක් නැත්නම් ද්‍රෝණියක්. එහි තැන්පත් වෙලා තිබුණු දේවල් පරීක්ෂා කර බලන්න මට හිතුණා. ලෝහමය අවක්ෂේපයකින් සෑදුණු කබොල්ලක් එහි තිබුණා. මං පහත් වෙලා එයින් ස්වල්පයක් සූරාගෙන බලන්න හිතුවේ, හරියටම මොකක් ද කියල දැනගන්න. එතකොටම මට ඇහුණා ජර්මන් බසින් කළ කෑගැසීමක්. ආපසු හැරී බැලූ මා දුටුවේ මළමිනියක් වගේ සුදුමැලි, භීතියට පත් මුහුණෙන් කර්නල් මා දිහා බලාගෙන ඉන්න හැටි.

"තමුසෙ මොකද ඔතන කරන්නේ?"

ඔහු ඇසුවා.

මේ වගේ සංකීර්ණ බොරු කතාවක් ගොතා මා රැවටීම ගැන මට කෝන්ති ගිහින් හිටියේ.

"මං මේ බැලුවේ ඔබේ ෆුලර්ස් අර්ත් වල අපූරු පෙනුම. ඔබ මේ යන්ත්‍රය යොදාගන්නේ මොන වැඩේටද කියල මට කල් ඇතුව කිව්වා නම්, ඒක පිළිසකර කරගැනීම සඳහා මට වඩාත් හොඳින් උපදෙස් දෙන්න තිබුණා" මං කිව්වා

http://sherlockholmesinvestigations.blogspot.com

ඒක මගේ කටින් පිටවුණු මොහොතෙම මං තේරුම් ගත්තා මං කරගත් මෝඩකම. මගෙ ඒ කථාවට ඔහුගේ මුහුණ දරදඬු වුණා. හෝපයේ ගිනිපුපුරු දැස් වලින් පිටවෙන්න ගත්තා.

"බොහොම හොඳයි. එහෙම නම් තමුසෙට මේ යන්ත්‍රය ගැන හොඳහැටි දැනගන්න සලස්වන්නම්." අඩියක් පිටුපසට ගිය ඔහු මා සිටි අර කුටියේ දොර වසා, යතුරු කරකවා අගුළු දැම්මා. මං වහාම එතැනට පැනලා දොර අරින්න උත්සාහ කළත් එය සාර්ථක වුණේ නැහැ. මං දොරට පයින් ගැහුවත්, උරහිසෙන් තල්ලු කරන්න හැදුවත් එය සෙලවුණේවත් නැහැ. මං පුළුවන් තරම් ශබ්දෙට කෑගැහුවා.

"ඒයි කර්නල්! මට එළියට එන්න ඉඩදෙන්න!

එයට කිසිම පිළිතුරක් වත් වෙනත් ශබ්දයක් වත් ඇසුණේ නැහැ. ඒත් ඊළඟ මොහොතේ මට අහන්න ලැබුණු ශබ්දයෙන් මගේ මුළු ඇඟම හිරි වැටිගෙන ගියා. ඒ ලීවර ක්‍රියාත්මක වී සිලින්ඩර වලට ජලය පිරෙන ශබ්දය. ඔහු යන්ත්‍රය ක්‍රියාත්මක කරලා! මම ලෝහ ද්‍රෝණිය පරීක්ෂා කිරීම සඳහා තැබූ තැනම තවමත් ලාම්පුව තිබුණා.

ලාම්පුවේ එළියෙන් මට තවත් දෙයක් පෙනුණා. ඒ තමයි අර කුටියේ සිවිලිම - එනම් පිස්ටනය පහතට එන හැටි. අනික් කාටත් වඩා මං ඒ ගැන හොඳින් දැනගෙන හිටියා. මේ පිස්ටනය පහතට ඇවිත් මහා වේගයකින් ලෝහ තහඩුව මත හැප්පෙන බවට කිසිම සැකයක් නැහැ. ඊළඟට මාව කිසිම හැඩයක් නැති එකම පාප්ප ගොඩක් බවට අඹරා දමන්නට එයට එක විනාඩියක් ගතවෙන්නෙ නෑ. මං විලාප නගා කෑ ගැසුවා. වේගයෙන් දොරේ හැපී එය ඇරීමට උත්සාහ කළා. ඇඟිලි වලින් අගුළ කඩන්න හැකිද බැලුවා. මට එළියට එන්න ඉඩ දෙන මෙන් කර්නල්ට ආයාචනා කළා. එහෙත් යන්ත්‍රයේ ලීවර ක්‍රියාත්මක වෙන හඬට, මගේ කෑ ගැසීමේ හඬ යටපත් වුණා. දැන් පිස්ටනය හුහක් පහතට ඇවිත්. එය තිබුණේ මගේ හිසට අඩියක් දෙකක් දුරින්. මගේ දිගු කළ අතට එහි මතුපිට රළු බව දැනුණා. මේ වෙලාවෙ වැදගත් කරුණක් එක්වරම මගේ සිහියට ආවා. එනම් මරණයේදී මට දැනෙන වේදනාව තීරණය වෙන්නේ, මං මරණයට මුහුණ දෙන ඉරියව්ව මත.

http://sherlockholmesinvestigations.blogspot.com



35. "ඔහුගේ මුහුණ දරදඬු වුණා. කෝපයේ ගිනිපුපුරු දෑස්වලින් පිටවෙන්න ගත්තා.

Reading Purpose Only. Not For Print
...holmesinvestigations.blogspot.com

යටිකුරු අතට හිටියොත් එක්වරම මගේ කොඳු නාරටිය බිඳිලා සිහිසන් නැතිව යාවි. එවිට ඇතිවන දැඩි වේදනාව ගැන හිතිලා මාව වෙව්ලා ගියා. ඊට වඩා හොඳ වේවි උඩුබැලි අතට හිටියොත්. ඒ වුණත් මේ බියකරු කළු හෙවනැල්ල මා වෙතට ළඟාවෙන හැටි බලා ඉන්න මට හැකිවේවිද? මේ වන විට මට කෙළින් හිටගෙන ඉන්න බැරි විධියට පිස්ටනය පහතට ඇවිත් තිබුණේ. මගේ හදවතේ යම් බලාපොරොත්තුවක් ඇති කරවන දෙයක්, මේ මොහොතේ මට එක්වරම දකින්න ලැබුණා.

මං ඔබට කිව්වා කුටියේ පොළොවත්, සිවිලිමත් ලෝහ වුණාට බිත්ති ලෑලිවලින් තැනූ ඒවා කියල. ලෑලි දෙකක් අතර තිබූ හිඩැසකින් කහ පැහැති ආලෝකයක් මට අහම්බෙන් දකින්න ලැබුණා. එම ලෑල්ල අතින් තල්ලු කරද්දී හිඩැස විශාල වුණා. මේ තියෙන්නේ මගේ ජීවිතය ගළවා ගත හැකි කුඩා දොරටුවක්. මට එක් නිමේෂයකට මේක අදහාගන්න බැරිවුණා. ඊළඟ මොහොතේ මං මගේ සම්පූර්ණ ශක්තිය යොදලා එය මතට කඩා පැන්නා මා අනික් පැත්තට ඇද වැටුණේ අඩක් ක්ලාන්ත ගතියෙන්. එළියට තල්ලු වුණු ලෑල්ල ආපසු වැටී හිඩැස වැසී ගියා. තත්පර කිහිපයකින් ලාම්පුව බිඳුණු ශබ්දය ඇහුණා. ඊළඟට යකඩ තහඩු දෙක එකට වැදුණේ මහා ශබ්දයක් නගමින්. මං ජීවිතය බේරා ගත්තේ අනූ නවයෙන් බව මං එතකොට තේරුම් ගත්තා.

මට සිහිය ආවේ කවුදෝ මගේ අතින් අල්ලා අදින බව දැනිලා. මා වැටී හිටියේ පටු කොරිඩෝවක ගල් පොළොව මත බව මට පෙනුණා. මා දෙසට පහත් වී සිටි කාන්තාව ඇගේ වම් අතෙන්, මගේ මැණික් කටුවෙන් අල්ලා අදිමින් සිටි අතර, ඇගේ දකුණු අතේ දල්වෙන ඉටිපන්දමක් තිබුණා. මේ අර මට අනතුරු ඇඟවූ කාන්තාව බව මං දුටුවා. මං මෝඩයෙක් වගේ ඇගේ අවවාද ප්‍රතික්ෂේප කළ හැටි!

"නැගිටින්න. නැගිටින්න" ඇය කිව්වේ හති දමමින් "ඔවුන් තව මොහොතක් යන්න කලින් මෙතැනට ඒවි. ඉක්මන් කරන්න. ඔබ එහි නොමැති බව ඔවුන් දකීවි. වටිනා කාලය නාස්ති කරන්න එපා. ඉක්මන් කරන්න!" ඇය ආයාචනා කළා.

මේ පාරේ නම් මම ඇගේ අවවාද ප්‍රතික්ෂේප කළේ නැහැ. අමාරුවෙන් නැගිටගෙන ඇය සමඟ කොරිඩෝව දිගේ ඉදිරියට



37. "මං මගේ සම්පූර්ණ ශක්තිය යොදලා ඒ මතට කඩාපැන්නා."

http://sherlockholmesinvestigations.blogspot.com

දිවගියා. ඊළඟට රවුමට කැරකී තිබුණු තරප්පු පෙළක් දිගේ පහළට බැස්සා. එතැනින් අප වැටුණේ පුළුල් බරාඳයකට. අප ඒකෙ ඉදිරියට දිව යද්දී, දෙදෙනෙකුගේ කටහඬ සහ ඔවුන් ඉදිරියට දිව එන අඩි ශබ්දය ඇහුණා. එක්කෙනෙක් අප සිටි තට්ටුවේමයි. අනෙකා පහළ තට්ටුවේ වෙන්න ඇති. මට මඟ පෙන්වූ තැනැත්තිය එක්වරම නැවතී වට පිට බැලුවා.

මීළඟට කළ යුත්තේ කුමක්ද කියා ඇයට හිතාගන්න බැරි වෙන්න ඇති. ඊළඟට ඇය දොරක් විවෘත කළා. ඒක නිදන කාමරයක්. ඒකෙ ජනේලය ළඟට ඇය මාව ඇදගෙන ගියා. දීප්තියෙන් බබළන හඳේ එළිය මට ජනේලයෙන් පෙනුණා.

"මේ ඔබට පණ බේරාගන්න තියෙන එකම විධිය. මේකෙන් පැන ගන්න. ජනේලය තියෙන්නෙ හුඟක් ඉහළින් නමුත් ඔබට පහළට පැන ගන්න හැකි වේවි"

ඇය එහෙම කියද්දීත්, බරාඳය කෙළවරේ පහනක ආලෝකය වැටුණා. මට පෙනුණා කර්නල් ලයිසැන්ඩර් ස්ටාක්ගේ කෙට්ටු උස සිරුර. ඔහුගේ එක් අතක ලන්තෑරුමක්. අනෙක් අතේ මස් කපන යෝධ පිහියක්. මං කාමරය හරහා දුව ගිහින් ජනේලය ඇරලා එබී බැලුවා. හඳඑළියේ උද්‍යානය පෙනුණේ මොන තරම් සුන්දරවද. එතැනින් පහළට මට පැනීමට තිබුණු ප්‍රමාණය අඩි තිහකට වැඩි වෙන්න බැහැ. මම ජනේලයට නැගලා අත් දෙකෙන් ජනෙල් පඩියේ එල්ලුණා. මාව බේරාගත් ඒ කාන්තාව හා අර තිරිසනා අතර ඇතිවුණු කතාබහ මොකක්ද කියල අහගන්න මං මොහොතක් හිටියා. ඔහු ඇයට වධ හිංසා කළොත්, මොන තරම් අවදානම් වුණත් ඇයව බේරා ගන්න ආපසු යන්න මම තීරණය කළා. මේ අදහස මගේ හිතට එද්දී ඔහු දොරෙන් කාමරයට ඇතුළුවුණා විතරයි. ඇයව පැත්තකට තල්ලුකර දමූ ඔහු, ජනේලය වෙතටයි ආවෙ. නමුත් ඇය දෑත් දෙපසින් දමා ඔහුව බදාගත්තා.

"ෆ්‍රිට්ස් ෆ්‍රිට්ස්" ඇය කෑගැසුවේ ඉංග්‍රීසියෙන් "මතකද ඔබ ගිය වාරයේ පොරොන්දු වුණේ? ඔබ කිව්වා ඒ දේ තවත් කරන්නේ නැහැ කියලා. ඔහු කාටවත් කියන එකක් නැහැ. ඔහු නිශ්ශබ්දව ඉඳීවි!"

http://sherlockholmesinvestigations.blogspot.com

"උඹට පිස්සුද එල්සි?" ඔහු ඝෝෂයෙන් කෑගැසුවේ ඇගේ ග්‍රහණයෙන් මිදෙන්න උත්සාහ කරමින්.

"උඹ තමයි අපව විනාශ කරන්නේ. ඌ අපේ දේවල් දුටුව ප්‍රමාණය හොඳටම වැඩියි. මට යන්න දීපන්" ඔහු ඇයව පැත්තකට තල්ලුකර දමා ජනේලය වෙත පනින ගමන් ආයුධයෙන් පහරක් එල්ල කළා. ඔහු ඒ පහර එල්ල කළේ මං ජනේලය අතහැර පහතට පනින්න ඔන්න මෙන්න කියා සිටියදී. මට තද වේදනාවක් දැනුණා. මගේ ග්‍රහණය බුරුල් වී මාව පහළ වූ ගෙවත්තට ඇද වැටුණා.

ඇද වැටුණු පාරට මට ලොකු තුවාලයක් සිදුවුණේ නැහැ. මම නැගිටලා පඳුරු අතරින් මට හැකි වේගයෙන් පැන දිව්වා. ඒ මොකද මේ භයානක තත්ත්වයෙන් මං තවමත් බේරී නැති බව මට වැටහුණා. මෙහෙම දුවන අතරේ එක්වරම මට ක්ලාන්ත ගතියක් ආවා. වේදනාවක් දැනුණු අත දිහා මං බැලුවේ එවිටයි. මගේ මහපටැඟිල්ල කැපී ගිහින් ඇති බවත් එතැනින් වේගයෙන් ලේ ගලා යමින් තිබූ බවත් මං පළවෙනි සැරේට දුටුවේ ඒ වෙලාවේ. මං ලේන්සුව අරගෙන තුවාලය වටේ බැඳගන්න උත්සාහ කළා. නමුත් ඊළඟ මොහොතේ මං සිහි නැතුව රෝස පඳුරු අතරේ බිම ඇදගෙන වැටුණා.

කොයිතරම් වෙලාවක් මං සිහිනැතුව හිටියාද කියන්න මං දන්නෙ නෑ. කොහොම වුණත් සෑහෙන වෙලාවක් මං එහෙම ඉන්න ඇති. ඒ මොකද හඳ බැසයන හැටිත්, ඉර පායාගෙන එන හැටිත් සිහි ලැබෙද්දි මං දුටුවා. මගේ ඇඳුම් හැම එකක්ම පිනි වලින් තෙත් වී තිබුණා. තුවාලය වේදනාවෙන් පුපුරු ගසමින් තිබුණා. කලින් දා රාත්‍රියේ මා මුහුණදුන් බිහිසුණු අත්දැකීම, එක්වරම මගේ මතකයට ආවා. මාව ලුහුබැඳ එන්නන්ගෙන් ආරක්ෂා විය හැකි තැනකට තවමත් මා ගිහින් නැහැ කියන හැඟීමෙන් එක්වරම හිටි තැනෙන් නැගිට්ටා. වට පිට බැලුවාම මට දකින්න ලැබුණු දෙයින් මං පුදුමයට පත්වුණා. ගෙයක් වත් මල් උයනක්වත් පේන තෙක් මානයක තිබුණේ නැහැ. මං වැටිලා හිටියේ ප්‍රධාන පාරකට නුදුරුව මල් වැටක් අයිනෙයි. තවත් ටිකක් බලද්දී තරමක් ඈතින් දිගු ගොඩනැගිල්ලක් ඇති බව පෙනුණා. එහි ගියාම මට දැනගන්න ලැබුණේ ඒ කලින් දා රාත්‍රී මා [illegible] අයිලන්ඩ් දුම්රිය

පොළ බව. මගේ අතේ තියුණු බිහිසුණු තුවාලය නොවෙන්න රාත්‍රියේ අත්දැකීම වියරු සිහිනයක් විමට ඉඩ තිබුණා.

මම අඩසිහියෙන් වගේ දුම්රිය පොළට ගිහිං උදේම යන්න තිබෙන දුම්රිය ගැන විමසුවා. තව පැයක් යන්න කලින් රෙඩිං බලා යන දුම්රියක් ඇති බව ඔවුන් කිව්වා. රාජකාරියේ යෙදී හිටියේ මා කලින් දා රාත්‍රියේ එහි පැමිණෙද්දී හිටි පෝටර්වරයාමයි. මං ඔහුගෙන් ඇහුවා කර්නල් ලයිසැන්ඩර් ස්ටාක් කියල කෙනෙක් අඳුනනවාද කියල. ඔහු එහෙම නමක් කවදාවත්ම අහල තිබුණෙ නැහැ. කලින් දා රාත්‍රියේ අන්තිම දුම්රියේ පැමිණි මා කැඳවාගෙන යන්න අශ්වකරත්තයක් ආ බව දුටුවාද කියල ඇහුවාම, ඔහු එය දැක තිබුණෙත් නැහැ.

"මේ කිට්ටුව පොලිසියක් තියෙනවද?" මා ඇසුවා.

"ඔව්. හැතැක්ම තුනක් විතර දුරින් තියෙනවා" ඔහු කිව්වා.

මා හුඟක් දුර්වලව අසනීප ගතියෙන් සිටි නිසා, මේ ගැන පැමිණිලි කරන්න එතරම් දුර ඇවිද යාම අපහසු බව මට තේරුණා. පොලිසියට දැනුම් දීම, නගරයට ආවට පස්සේ කරන්න මං තීරණය කළා. මං ලන්ඩනය ළඟාවෙද්දී උදේ හය පහුවුණා විතරයි. මාව ඔබ හමුවට කැඳවාගෙන එන්න, මට ප්‍රතිකාර කළ මේ දොස්තර මහත්මයා කාරුණික වුණා."

මෙම පුදුමාකාර කථාන්තරයට සවන් දුන් අපි මඳ වේලාවක් නිහඬව සිටියෙමු. මීළඟට ෂර්ලොක් හෝම්ස් රාක්කයක තිබූ පොතක් එළියට ගත්තේය. ඒ ඔහු පුවත්පත්වලින් කපාගත් කැබලි අලවා තිබූ පොතකි.

"මෙන්න දැන්වීමක් තියෙනවා. මේක ඔබේ සිත් ඇදගනීවි. අවුරුද්දකට පමණ කලින් මෙය පුවත්පත්වල පළවී තිබුණා.

"ආගිය අතක් නැත. විසිහය හැවිරිදි හයිඩ්‍රොලික ඉංජිනේරුවරයෙකු වූ ජෙරමියා හේලිං මහතා 9 වැනිදා සිට ආගිය අතක් නැත. ඔහු ඊයේ රාත්‍රී දහයට පමණ නැවතී සිටි තැනින් පිටවී ගොස් ඇත. අන්තිම වරට දකින විට ඇඳ සිටියේ . . . ."

"ඔහු ගැන තවත් විස්තර හුඟක් තියෙනවා. මේ අර කර්නල්ගේ යන්ත්‍රය කලින් වාරයේ කැඩිලා, ඒක අලුත්වැඩියා කරන්න ඉංජිනේරුවා ගෙන්වා ගතිපු අවස්ථාව වෙන්න ඇති."

"දෙයියෝ සාක්කි! අර ගෑනු ළමයා කිව්වෙ ඕක තමා" හාදර්ලි මහතා කීය.

"ඔව්. ඒ ගැන කිසි සැකයක් නෑ. කර්නල් කියන්නේ මොන වගේ පුද්ගලයෙක්ද කියන එක පැහැදිලියි. ඔහුගේ ක්‍රීඩාව ගැන ආරංචියක් දිය හැකි එක මිනිහෙක් වත් ඉතුරු කරන්න ඔහු සූදානම් නැහැ. හරියට ඉස්සර කාලේ හිටි දරුණු මුහුදු කොල්ලකාරයින් වගෙයි; ඔවුන් කොල්ල කන නැවෙන්, සාක්ෂියක් දිය හැකි විධියට එක මිනිහෙකුට වත් ජීවිතය ගළවා ගන්න උන් ඉඩ තියන්නේ නැහැ. හොඳයි. දන් සෑම මොහොතක්ම ඉතාම වටිනවා. ඔබට අපහසුවක් නැත්නම්, අපි වහාම ස්කොට්ලන්ඩ්යාඩ් බලා ගිහිං, එතැනින් අයිෆඩ් බලා යමු."

ඊට පැය තුනකට පමණ පසු අපි සියලු දෙනාම රෙඩිං සිට අයිෆඩ් බලායන දුම්රියක ගමන් කරමින් සිටියෙමු. අපේ කණ්ඩායම වූයේ ෂර්ලොක් හෝම්ස්, හාදර්ලි ඉංජිනේරුවරයා, ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට්, සිවිල් ඇඳුමෙන් සැරසුණු පොලිස් භටයෙකු සහ මාය. මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ බර්ක්ෂයර් ප්‍රාන්තයේ සිතියමක් බ්‍රැඩ්ස්ට්‍රීට් දුම්රිය අසුන මත දිග හැරියේය. මීළඟට කවකටුවක් අතට ගත් ඔහු, අයිෆඩ් කේන්ද්‍ර කොට කවයක් ඇන්දේය.

"ඔන්න ඕක තමා අඩවිය. මං මේ කවය ඇන්දෙ හැතැක්ම දහයක අර්ධ විෂ්කම්භයක් සිටින විධියට. අපට උවමනා කරන තැන ඇත්තේ මේ කවය තුළ, රේඛාවට කිට්ටුවෙන්. මහත්මයා, ඔබ කිව්වෙ හැතැක්ම දහයක් කියල නේද?"

"පැයක කාලයක් තිස්සේ අශ්වකරත්තය ගමන් කළා"

"ඉතින් ඔබ හිතන්නේ, ඔබ සිහි නැතුව වැටිලා හිඳිද්දී, ඒ සම්පූර්ණ දුරම ඔවුන් ඔබව ආපසු ගෙනත් දම්මා කියලද?"

"ඔවුන් එහෙම කරන්න ඇති. මට අඩ සිහියෙන් වගේ මතකයි කවුරු හරි මාව ඔසවලා අරගෙන යනවා . . ."

"මට ඔතැන තේරුම් ගන්න බැරි මෙන්න මේ කාරණයයි." මම කීවෙමි. "ඔබ උද්‍යානයේ මල් ගස් අතර වැටිලා ඉන්නවා හමුවුණාම, ඔවුන් ඇයි ඔබව ඉතිරි කළේ? ඒ මිනීමරුවාගේ හිතේ අනුකම්පාවක් හෝ තිබිලද?

බාග වෙලාවට අර ගැහැනියගේ ආයාචනයට තත්කඩියාට අනුකම්පා හිතෙන්න ඇති."

"ඒක ඒ විධියට සිද්ධ වෙන්න ඇති කියල මට කොහොමට වත් හිතන්න බෑ. ඒ වගේ මිනීමරු බිහිසුණු මුහුණක් මං ජීවිතේට දැකල නෑ."

"වැඩිවෙලා යන්න කලින් ඔය ගැටලු ඔක්කොම අපට විසඳගන්න පුළුවනි." බ්‍රැඩ්ස්ට්‍රීට් කීය.

"මං මගේ කවය ඇඳලයි තියෙන්නේ. අපි මේ හොයන පිරිස ඇත්තේ කොතැනද කියලා මට දැනගන්න විධියක් තියෙනවා නම් . . . ."

". . . . මං හිතන්නේ ඒ කොතැනද කියලා මට ඇහිල්ල තියලා පෙන්වන්න පුළුවනි." හෝම්ස් පැවසීය.

"හැබෑට? ඔබ දැනටමත් තීරණයකට ඇවිත් එහෙනම්. අපි බලමු ඔබේ මතයට එකඟවෙන්න ඉන්නේ කවුද කියලා. මගේ මතය නම් ඔවුන් ඇත්තේ කවයේ දකුණු පැත්තට වෙන්න. ඒ හරිය තමයි ගෙවල් දොරවල් අඩු, ජනගහනය අඩු පැත්ත" බ්‍රැඩ්ස්ට්‍රීට් කීය.

"මං හිතන්නේ නැගෙනහිර පැත්ත" ඒ ඉංජිනේරු මහතාය.

"මං හිතන්නේ බටහිර." ඒ සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධරයාගේ අදහසය. "ඒ පැත්තේ තමයි වැඩි ප්‍රසිද්ධියක් නැති ගම්මාන බොහොමයක් තියෙන්නෙ"

"මම නම් හිතන්නෙ උතුර." මම කීවෙමි." ඒ පැත්තෙ තමයි කඳු බෑවුම් මොනවත් නැත්තෙ. කරත්තය කන්දක් නැග්ග බවක් අපේ මිත්‍රයා කිව්වෙ නැහැනෙ."

"හොඳයි හෝම්ස් මහත්මයා. ඔබ මොකක්ද කියන්නෙ?" බ්‍රැඩ්ස්ට්‍රීට් ඇසීය. "විවිධ පුද්ගලයන් විවිධ මත පළකළා. මොකක්ද ඔබේ අදහස?"

"ඔබ හැම දෙනෙක්ම වැරදියි."

"ඒ වුණත් හැම දෙනෙක්ම වැරදි වෙන්න බෑ?"

"ඇයි බැරි? පුළුවන්. මං කියන්නේ මෙන්න මෙතැන හෝම්ස් ඇහිල්ල තැබුවේ කවයේ හරි මැදිනි.

"අප ඔහුව හොයාගත්තවා තමා ඒ මෙන්න මෙතන ඉඳල."

"ඒ වුණත් අපි දුම්රියපොලේ ඉඳල හැතැක්ම දොළහක් අශ්වකරත්තයේ ගමන් කළා. ඒ කොහොමද?"

"හැතැක්ම හයක් ඉවතට ගිහින් හයක් ආපහු ආවා. ඒක බොහොම සරල දෙයක්. ඔබම කිව්වා, ඔබ දුම්රියෙන් බැහැලා යද්දී අශ්වයා කිසිම වෙහෙසකින් තොරව ප්‍රාණවත්ව, නැවුම්ව හිටියා කියල . . ඌ බොහොම අමාරු පාරවල් වලින් හැතැක්ම දොළහක් දුම්රිය පොළට ආවා නම් කොහොමද එහෙම වුණේ?"

"ඇත්තෙන්ම ඔබ හිතන දේ වෙන්න පුළුවනි." බ්‍රැඩ්ස්ට්‍රීට් එකඟ විය.

"මේ කල්ලිය යෙදෙන්නේ මොන වගේ ඉල්ලම් හැරීමකද කියන එක ගැන නම් කිසිම සැකයක් නෑ."

"කිසි සැකයක් නැහැ තමන්නම්. ඔවුන් ඉතා විශාල පරිමාණයෙන් හොරකාසි අච්චු ගහන අය. ඔවුන් යන්ත්‍රය යොදවාගෙන රිදී වෙනුවට මිලෙන් අඩු සංරසය භාවිත කොට හොරකාසි අච්චු ගැහීම සඳහා.

අපි කාලයක් තිස්සේ දනගෙන හිටියා බොහොම දක්ෂ හොර කල්ලියක් හොර කාසි අච්චු ගැහීමේ යෙදී ඇති බව. ඔවුන් තුවුන් භාගයේ කාසි දහස් ගණනින් නිෂ්පාදනය කළා. මොවුන් ක්‍රියාත්මක වෙන්නේ කොහේ සිට ගෙනද කියලා අපි හෙව්වා. රෙඩිං දක්වාම එන්න අපට හෝඩුවාවල් ලැබුණා. නමුත් එතැනින් එහාට යන්න අපට හැකියාවක් ලැබුණේ නෑ. ඒ විධියට ඔවුන්ගේ සලකුණු වසා දැමීමෙන් පෙනෙන්නේ ඔවුන් මේ ක්ෂෙත්‍රයේ හොඳ පුරුදු කාරයන් වගේ. නමුත් දැන් අහම්බෙන් වගේ සැලසුණු මේ අවස්ථාවෙන්, මං හිතන්නේ අපට උන් බෙල්ල ළඟින්ම අල්ලා ගන්න පුළුවන් වේවි."

නමුත් පොලිස් පරීක්ෂකවරයාගේ එම අනාවැකිය වැරදී ගියේය. අපරාධකරුවන්ගේ ඉරණම සැකසී තිබුණේ මෙවර ද ඔවුන් නීතියේ රැහැණට හසුනොවන අයුරෙනි. අපේ දුම්රිය අයිෆර්ඩ් දුම්රියපොලට සේන්දු විය. දුම්රියපොළට නුදුරු තුරු ලතාමඬුල්ලකට ඉහළින් අප දුටුවේ අහස උසට විහිදී ගිය යෝධ දුම් කඳකි. අවට පරිසරය දවැන්ත පැස්බර පිහාටුවකින් මෙන් ආවරණය කරමින්, එම දුම් කඳ අහසේ විසිර ගොස් තිබිණි.

"මොකද මේ? ගෙයක් ගිනි අරගෙනද?"

බ්‍රැඩ්ස්ට්‍රීට් ඇසුවේ දුම්රිය ස්ථානාධිපතිවරයාගෙනි.

"ඔව් මහත්මයා."

"කවදද ගින්න ඇතිවුණේ?"

"මට අහන්න ලැබුණේ ගින්න ඊයේ රාත්‍රී පටන් අරගෙන ඇති බවයි. නමුත් පසුව වඩාත් දරුණු අතට හැරිල තියෙනවා. දැන් ඒ ගෙදර දොර ඔක්කොම එකම ගිනි ජාලාවක් වෙලා."

"කාගෙද ගේ?"

"ආචාර්ය බෙචර්ගේ?"

"මෙන්න මේක මට කියන්න. ආචාර්ය බෙචර් කියන්නේ උස, කෙට්ටු, දිගු උල් නැහැයක් තිබෙන ජර්මන් ජාතිකයෙක්ද?"

දුම්රිය ස්ථානාධිපතිවරයාට සිනා පහළ විය.

"නෑ නෑ මහත්මයා. ආචාර්ය බෙචර් ඉංග්‍රීසි ජාතිකයෙක්: ඒ තරම් තරබාරු වෙනත් කෙනෙක් මේ පළාතක නැහැ. නමුත් ඔහු සමඟ නැවතී ඉන්නවා විදේශිකයෙක්. මං හිතන්නේ ඔහු රෝගියෙක්. ඔහු නම් පෙනුමෙන් කෙට්ටුයි. බර්ක්ෂයර් වල අනර්ඝ හරක් මස් ටිකක් ඔහුගේ ඇඟට වැටුණොත් වරදක් වෙන්නේ නැහැ."

දුම්රිය ස්ථානාධිපති ඔහුගේ කතාව නිම කිරීමටත් පෙර, අපි ඒ ගින්න ඇවිළී තිබුණු දෙසට ගමන් කළෙමු. එම පාර අවසන් වූයේ කුඩා කඳු ගැටයක් මතිනි. පුළුල්ව විහිදුණු, සුදු හුණු ආලේප කළ විශාල නිවසක් අප ඉදිරියේ පිහිටා තිබිණි. එහි වහලෙන්, ජනෙල් වලින් විශාල ගිනිදැල් අහසට විහිදුණු ආකාරය අපි දුටුවෙමු. ගිනි නිවන රථ තුනක් මිදුලේ නවතා තිබිණි. ගින්න මැඩ පැවැත්වීමට ඔවුන් දැඩි උත්සාහයක යෙදුණත්, එය අසාර්ථක වෙමින් තිබූ බව පැහැදිලිවම දිස්විය.

"ඔතන තමයි තැන!" කලබලයට පත් හාදර්ලි මහතාට එක්වරම කෑගැසිණ.

"අර තියෙන්නේ ගොරෝසු අතුරා තිබුණු පාර. අර තියෙන්නේ මං වැටිලා හිටි රෝස පඳුරු ගාල. අන්න අර දෙවැනි ජනේලයෙන් තමයි මං බිමට පැන්නෙ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔවුන් අල්ලා ගන්නට හැකිවේද කියන එක දන්ම කියන්න බැහැ. ඒත් ඔවුන්ගෙන් පළිගන්න නම් ඔබට හැකිවුණා."

හෝම්ස් කීය.

"ඔබ සමග කාමරයේ තිබුණු ලාම්පුව තමා ඔය ගින්නට හේතු වෙන්න ඇත්තේ. යන්ත්‍රයේ සම්පීඩනයෙන් ලාම්පුව කුඩු පට්ටම් වෙලා තෙල් ටික ගලායන්න ඇති. වහාම ඒකට ගිනි ඇවිළෙන්නත් ඇති. සැකයක් නෑ කුටියේ ලෑලි බිත්ති වලට ඒ ගින්න පැතිරෙන්න ඇති. ඒ වෙලාවේ ඔවුන්ගේ එකම අරමුණ වුණේ ඔබව ලුහුබැඳ ගොස් අල්ලා ගැනීමයි. නිවස ගිනිගන්නා බව දකින්න ඇත්තෙ හොඳටම ප්‍රමාද වෙලා. දන් මෙතැන රැස්වෙලා ඉන්න සෙනඟ දිහා හොඳ විමසිල්ලෙන් නෙත් යොමු කරන්න. බලන්න ඊයේ රාත්‍රී ඔබේ මිත්‍රයින් මෙතන ඉන්නවාද කියල. නමුත් මට නම් හිතෙන්නේ ඔවුන් පැන ගිහින්. දනටමත් ඔවුන් හැතැක්ම සිය ගණනක් දුර ගිහින් ඇති."

එදා හෝම්ස් අනුමාන කළ ඒ කරුණු සැබෑවක්ම විය. රූමත් තරුණ කාන්තාව, බිහිසුණු ජර්මන් ජාතිකයා හෝ තරබාරු ඉංග්‍රීසි ජාතිකයා ගැන ඉන්පසු වචනයක් හෝ අසන්නට නො ලැබිණි. එදා උදයේ බර පෙට්ටි සහ කිහිපදෙනෙකු පටවාගත් අශ්වකරත්තයක්, මෙම නිවසේ සිට පිටත් වී යනු ගැමියෙකුට දකින්නට ලැබී ඇත. එය ගමන් කර තිබුණේ රෙඩිං නගරය දිශාවටයි. අපරාධකරුවන් පිළිබඳ සියලුම සලකුණු එතැනින් අතුරුදන් විය. හෝම්ස් තීක්ෂණ නුවණින් කළ පරීක්ෂණ වලින් වත් ඔවුනට සිදුවූයේ කුමක්ද යන්න සොයා ගැනීමට නොහැකි විය.

දෙවැනි මහලේ ජනෙල් පඩියක් මත තිබූ අලුතින්ම කපා වෙන් කළ මිනිස් මහපටැඟිල්ලක් දකීමෙන් ගිනි නිවන්නෝ මවිතයට පත්වූහ. සැන්දෑයාමයට ළං වෙත්ම ගින්න නිවා දමීමට හැකිවිය. නිවසේ වහළ කඩා වැටුණු අතර ඇතුළත තිබූ දෑ සියල්ල ගින්නෙන් විනාශ වී තිබිණි. උණුවී, ඇදවී ගිය යකඩ පයිප්ප සහ ඇඹරී ගිය සිලින්ඩර මිස යන්ත්‍ර සූත්‍ර කිසිවක් දක ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් නිවස තුළ තිබී, නිකල් සහ ටින් ලෝහ විශාල ප්‍රමාණ වලින් හමුවිය. කාසි කිසිවක් දක්නට නොලැබිණි. කරත්තයේ

http://sherlockholmesinvestigations.blogspot.com

පටවාගෙන ගිය බර පෙට්ටි වල තිබුණේ එම හොර කාසි විය යුතුය.

අපේ ඉංජිනේරු වරයා ගෙදර මල්උයනේ සිට සිහි ලැබුණු තැන දක්වා ගමන් කලේ කෙසේද යන්න සැමදා අභිරහසක් වීමට ඉඩ තිබිණි. නමුත් මෘදු මැටි පොලොවේ තදින් සටහන් වී තිබුණු අඩි සටහන් වලින් ඒ අභිරහස හෙළිවිය. හාදර්ලි මහතා ඔසවා ගෙන ගොස් ඇත්තේ පුද්ගලයන් දෙදෙනෙකු විසිනි. එයින් එක් තැනැත්තෙකු ඉතා කුඩා දෙපා තිබූ අයෙකු වූ අතර අනෙකා ඉතා විශාල දෙපා තිබූ අයෙකු බව හඳුනා ගැනීමට හැකිවිය. මේ අනුව අපට නිගමනය කළ හැකිවූයේ, එතරම් මිනීමරු හැඟීම් නොතිබූ ඉංග්‍රීසි ජාතිකයා, ඉංජිනේරුවා ඔසවාගෙන යාමට තරුණ කාන්තාවට උදව් කරන්නට ඇති බවයි.

"මදයි මට මුහුණදෙන්න වුණු ගනුදෙනුව. මහපටැඟිල්ලකුත් අහිමිවුණා. ගිනිපනහක ගාස්තුවත් නොලැබී ගියා. අන්තිමට මොකක්ද මට ලැබුණු වාසිය?"

හාදර්ලි මහතා විමසුවේ අප ආපසු ලන්ඩනය බලා එම සඳහා දුම්රියේ අසුන්ගත් පසුයි.

"පළපුරුද්ද!" හෝම්ස් කීවේ සිනාසෙමිනි.

"මේ අත්දකීම නිසා සෘජුවම නැතත් වක්‍රව ඔබට විශාල වාසියක් ලැබෙනවා. ඔබේ ඉංජිනේරු වෘත්තියේ ඉදිරි කාලයේදී, විශිෂ්ට කීර්ති නාමයක් ලබා ගැනීම සඳහා ඔබට තියෙන්නේ, මේ සිද්ධිය වචනයෙන් විස්තර කිරීම පමණයි."



http://sherlockholmesinvestigations.blogspot.com

# අතුරුදන්වීමේ සිද්ධියක්

Reading Purposes Only, Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# අතුරුදන්වීමේ සිද්ධියක්

"මගේ හිතවත් මිත්‍රයා. . . ."

ෂර්ලොක් හෝම්ස් මා ඇමතුවේ, බේකර් වීථියේ අපේ නිවහනේ ගිනි උදුන දෙපස වූ හාන්සි පුටුවලට වී අප කතාබහ කරමින් සිටියදීය.

". . . . ජීවිතය කියන්නේ හරිම පුදුමාකාර එකක්. මිනිහෙකුට නිෂ්පාදනය කරන්න හෝ ප්‍රබන්ධ කරන්න පුළුවන් දේට වඩා, සත්‍යය අරුම පුදුමයි. එදිනෙදා ජීවිතයේ ඇත්ත වශයෙන්ම සිදුවෙන සමහර දේවල්, අපේ හිත්වල නිර්මාණය කරගන්න නම් කොහොමටවත් බෑ. අපි දෙන්නා දෑත් අල්ලාගෙන, ජනේලයෙන් අහසට ඉගිලී ගිහින් මේ ලන්ඩන් නගරය පරීක්ෂා කරල බැලුවොත් කොහොමට හිටීවිද? නගරය පුරා ගෙවල් වල වහලවල් ඉවත් කරලා, මිනිසුන්ගේ ජීවිත වල සිදුවන සත්‍ය කථා, හැළ හැප්පීම්, අහඹු සිදුවීම්, එකතු කරලා බැලුවොත්? එහෙම වුණොත් ප්‍රබන්ධ සාහිත්‍යයේ එන කථාන්තර කියවන්න බැරිතරම් කම්මැලි බව මිනිසුන්ට පෙනේවි. කිසිකෙනෙක් ඒව මිලට අරගෙන කියවන එකක් නෑ."

"ඒ වුණත් හෝම්ස් ඔබ කියන කථාව මට ඒ තරමට විශ්වාසයට ගන්න බෑ. සිරිතක් වශයෙන් පුවත්පත් වල පළවෙන්නෙ, බොහොම දරුණු නරක සිදුවීම්. පොලිස් වාර්තාවල වුණත් යථාර්ථයට තැනක් දීල නෑ. ඔබ අර විදියට කල්පනා කරන එකේ පුදුමයක් නෑ. ඒ මොකද ඔබ තමයි මහාද්වීප තුනක මහා ගැටලුවලට, ප්‍රහේලිකා වලට මුහුණ දෙන අයට උපදෙස් දෙන්නේ. ඒ කටයුත්ත කරන නිල නොලත් උපදේශකයා ඔබයි. ඔබට නිතරම දකින්න ලැබෙන්නෙ මහා පුදුමාකාර, අද්භූත, ඛේදජනක සිදුවීම්. නමුත් බලන්න පත්තරේ. අපි ප්‍රායෝගික පරීක්ෂණයක් කරල බලමු."


http://sherlockholmesinvestigations.blogspot.com

බිම වැටී තිබූ එදා උදෑසන පුවත්පත මම අහුලා ගතිමි. මෙන්න බලන්න මට දකින්න ලැබෙන පළමුවෙනි සිරස්තලය.

**ස්වාමිපුරුෂයකු සිය බිරිඳට සැලකූ කෲර ස්වභාවය**

කොලමේ භාගයක විතර විස්තරයක් මේක තියෙනවා. නමුත් ඒක කියවන්නෙ නැතුවම මට හිතාගන්න හැකියි තියෙන විස්තර. ඒ තරමටම ඕව කියවලා මට හුරුපුරුදුයි.

. . . . මිනිහා මත්පැන් බීලා බිරිඳව තල්ලු කර දමනවා. පහර දෙනවා. ඇය තුවාල ලබනවා. අනුකම්පා සහගත සොහොයුරිය හෝ ගෙවල් අයිතිකාරිය බිරිඳගේ උදව්වට එනවා. දරුණු හිතක් ඇති පත්තර වාර්තාකාරයින්ටත් මේවා ලියනව මිසක් වෙන ලියන්න දෙයක් නෑ."

"මං කිව්ව දේට විරුද්ධව ඔබ කියන කාරණය ඔප්පු කරන්න ඔය උදාහරණය කොහොමටවත් ගැළපෙන්නෙ නැහැ වොට්සන්." හෝම්ස් කීවේ පුවත්පත මගේ අතින් ගෙන එහි පහළට නෙත් යොමු කරමිනි.

"මේ බලන්න වොට්සන්. මෙතන සඳහන් වෙලා තියෙනවා ඩුන්ඩාස් දික්කසාද නඩුව. මේකට සම්බන්ධ, වැදගත් එහෙත් සියුම් කරුණු හඳුනාගන්න මං උත්සාහයක යෙදුණා. ස්වාමි පුරුෂයා, පුරාසුදු දුම්පානයෙන් තොර කෙනෙක්. වෙනත් ගැහැනියක් මෙතෙන්ට සම්බන්ධත් නෑ. පැමිණිල්ලෙන් ඉදිරිපත් කළ චෝදනාව මොකද්ද? ස්වාමි පුරුෂයා පටන් ගත් අළුත් පුරුද්දක් තියෙනවාලු. මොකද්ද? හැම කෑම වේලාවකින්ම පස්සෙ, ඔහු තමන්ගේ කෘතිම දත් කුට්ටම ගළවා අතට ගෙන බිරිඳගේ ඇහට දමල ගහනවලු. ඔබ පිළිගන්නවා ඇති, සාමාන්‍යයෙන් ලේඛකයෙකුගේ මනසේ මේ වගේ චිත්‍රයක් මැවෙන්නේ නෑ. ඔය දුම්කුඩු ස්වල්පයක් අරගෙන නහයට උරන්න දොස්තර මහත්තයා. පිළිගන්න, උදාහරණ ඉදිරිපත් කිරීමේදී මං ඔබට වඩා ලකුණු ගන්නා බව."

ඔහු තම දුම්කුඩු හෙප්පුව මා දෙසට දිගු කළේය. රන්තරනින් තනා තිබූ එහි පියන මැද, විශාල පුෂ්පරාග මාණික්‍යයක් සවිකොට තිබිණි. සාමාන්‍යයෙන් බොහෝ චාම් දිවි පෙවෙතක් ගතකළ හෝම්ස් සතුව මෙවැන්නක් තිබෙනු දකීම පුදුමයකි. එබැවින් එහි අලංකාරය ගැන යමක් පැවසීමි.

sherlockholmesinvestigations.blogspot.com

"ආ. . . . ඔබ සති ගණනකින් මට හමුවුණේ නැති බව මට අමතක වුණා. අර අයිරීන් ඇඩ්ලර් සිද්ධියේ අප දුන් සහයෝගය ගැන, බොහිමියාවෙ රජතුමා මට දුන් සිහිවටනයක් මේක."

"එතකොට ඔය මුද්ද?"

මා ඇසුවේ ඔහුගේ ඇඟිල්ලක පැළැඳ සිටි බබළන දියමන්තියක් සහිත මුද්ද දෙස බලමිනි.

"ඒක ඕලන්ද රජපවුලෙන් මට ලැබුණු තෑග්ගක්. ඒ කාරණාව නම් ඉතාම රහසිගතයි වොට්සන්. මට ඒක ඔබටවත් හෙළිකරන්න බැහැ."

"මේ දවස්වල ඔබ මොකක් හරි පරීක්ෂණයක යෙදිලද ඉන්නෙ?"

"පරීක්ෂණ නම් දහයක් දොළහක් තියෙනවා මං පටන්ගත්තු. ඒත් ඒ එකක්වත් ඒ තරම් සිත්ගන්නා ඒවා නෙමෙයි. ඒවා වැදගත් බව ඇත්තයි. නමුත් සිත් ඇදගන්නා ආකාරයේ යමක් ඒවායේ නැහැ. මේ ගැන මම තේරුම් අරගෙන තියෙන කාරණාවක් ඔබට කියන්න ද වොට්සන්? විශාල අපරාධ බොහොම වෙලාවට සරලයි. ගැටලු අඩුයි. අපරාධයක් විශාල වෙන්න වෙන්න එහි අරමුණ පැහැදිලියි. නමුත් ඒ තරම් වැදගත් නැති, බරපතල නැති ගැටලු තියෙනවා නේද? ඒවා නිරීක්ෂණයත්, පහසුයි. ඉක්මනින් විශ්ලේෂණය කරලා, නිගමනවලට එන්නත් පුළුවනි. එහෙම වුණාම තමයි, ඒ පරීක්ෂණ වලදී කිසියම් අලංකාරයක් මතුවෙන්නේ.

මේ දවල්වල ලැබී තියෙන ඒවායින්, ප්‍රංශයේ මාසේල්ස් වලින් ලැබී ඇති එකක හැරෙන්න වෙනත් කිසි එකක සිතේ උනන්දුවක් ඇතිකරන ගතියක් නැහැ. ඒ වුණත් තව මිනිත්තු කිහිපයක් ගතවෙන්න කලින් මට වඩාත් හොඳ පරීක්ෂණයක් ලැබෙන්න ඉඩ තියෙනවා. ඒ මොකද වැරදීමක් නෙමෙයි නම්, මේ එන්නේ මට අලුත් අනුග්‍රාහකයෙක්."

පුටුවෙන් නැගිට සිටි ඔහු බේකර් වීථිය දෙස මහත් උනන්දුවෙන් බැලුවේය. පාරේ අනෙක් පැත්තේ පදික වේදිකාව මත තරබාරු කාන්තාවක් සිටගෙන සිටියාය. ඇය රතු පිහාටුවක් ගැසූ පුළුල් වාටියක් සහිත හිස්වැස්මක් පැළැඳ සිටියාය. එය ඩෙවොන්ෂයර් ආදිපාදවරියගේ හිස්පළඳනා මෝස්තරය බව මට එකවරම සිහිවිය.

http://sherlockholmesinvestigations.blogspot.com



51. ඇය පුළුල් වාටිය සහිත හිස්වැස්මක් පැළඳ සිටියාය.

ඇගේ ගෙල වැසෙන සේ ලෝම වලින් නිමකළ විශාල ග්‍රීවාවරණයක් ඔතාගෙන සිටියාය. තරමක් කැළැඹුණු මුහුණකින්, ඇය අපේ නිවහසේ ජනෙල් දෙස බලා සිටියේ ඉදිරියට හා පිටුපසට පැද්දෙමිනි. පිහිනන්නෙකු ගං ඉවුරේ සිට දියට පනින්නාක් මෙන් එක්වරම ඇය පාර හරහා පැන්නාය. මීළඟට අපේ සීනුව නාදවෙනු ඇසිණි.

"මං ඔය රෝග ලක්ෂණ මීට කලින් දකල තියෙනවා." හෝම්ස් පැවසුවේ තම දුම්වැටිය ගිනි උදුනට විසිකරමිනි.

"පදික වේදිකාව උඩ ඉඳන් ඉදිරියට හා පිටුපසට දෝලනය වීමෙන් පේරෙන්නේ ප්‍රශ්නය ටිකක් රහසිගත, පෞද්ගලික එකක් බව. ඒ ගැනයි ඇයට අපෙන් උපදෙස් උවමනා වෙලා තියෙන්නෙ. නමුත් ඇයම දන්නෙ නෑ මේක අපට හෙළිකරලා උපදෙස් ගන්න එක සුදුසුද කියලත්. ඒ මොකද ඒක ඒ තරමටම රහසිගත සියුම් ප්‍රශ්නයක්. ගැහැනියකට මිනිහෙකුගෙන් ලොකු වැරැද්දක් අසාධාරණයක් සිදුවෙලා නම් ඒ ගැනි පාර අයිනට වෙලා දෝලනය වෙවී ඉන්නේ නෑ. සීනුවේ කඹය කැඩිලා යන තරම් වේගයෙන් අපේ සීනුව නාද කරනවා. මෙතැනදී අපට හිතාගන්න තියෙන්නේ ගැටලුව ආදරයට සම්බන්ධ එකක් කියන එකයි. ඇය කෝපයට පත්වෙලා නැහැ; ප්‍රහේලිකාවකට මුහුණදීලා. විසඳගන්න අමාරු ගැටලුවක්. ඔය එන්නෙ ඇය. එතකොට අපට පුළුවනි හිතේ සැකය නැතිකර ගන්න."

හෝම්ස්ගේ කථාව නිමවීමට පෙරම සේවක ළමයා දොරට තට්ටු කළේය.

"මේරි සදර්ලන්ඩ් මෙනෙවිය."

ඔහු පැවසුවේය.

සේවකයා පිටුපසින් ඇය අපේ විසිත්ත කාමරයට ඇතුළු වූයේ, නියමු බෝට්ටුවක් පිටුපසින් වරායට සේන්දු වන විශාල නෞකාවක් පරිද්දෙනි. තමාට පුරුරුදු ආචාරශීලී විලාසයෙන් හෝම්ස් ඇයව පිළිගත්තේය. අනතුරුව දොර වසා, ඇයට සැපපහසු පුටුවක වාඩිවීමට සැලැස්වීය. මිනිත්තුවක් ඇය දෙස බලා සිටි මගේ මිත්‍රයා ඇය පිළිබඳ යම් කරුණු වටහාගත් බවක් පෙනිණි.

"මෙනෙවිය. ඔබේ ඇස්පෙනීම දුර්වල නිසා, ඔබට යතුරු ලියනය පාවිච්චි කිරීමේදී අපහසුවක් දැනෙන්නේ නැද්ද?"

http://sherlockholmesarvasignations.blogspot.com



53. ඇය කාමරයට ඇතුළු වූයේ නියමු බෝට්ටුවක් පිටුපස වරායට ඇතුළුවන නෞකාවක් පරිද්දෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මුලදී නම් මට එහෙම දැනුණා. නමුත් දැන් මට අතුරු තියෙන තැන් පුරුදුයිනේ." ඇය පැවසුවාය. තත්පර කිහිපයක් ගතවෙද්දී හෝම්ස් කිසිවක් නොකීමයා එය කී හැටි ගැන ඇය පුදුමයට පත්වූවාය. නිගැස්සීමට පත් ඇය, මගේ මිත්‍රයා දෙස බලාසිටියේ පුදුමයෙන් මෙන්ම බියෙනි.

"හෝම්ස් මහත්මයා. ඔබ මං ගැන අහලා තියෙනවද? එහෙමත් නැත්නම් ඔබ කොහොමද මය විස්තර දැනගත්තෙ?"

"ඒව ගැන හිතන්න එපා." හෝම්ස් කීවේ සිනාසෙමිනි. "අනෙක් අය නොදන්නා දේවල් දැනගැනීම, මගේ වෘත්තියේ එක් අංගයක්. අනෙක් අයට දැකගැනීමට නොහැකි ඒවා දකින්න, මගේ දෑස් මං පුහුණු කරගෙන ඉන්නවා. එහෙම නොවුණා නම් ඔබ මාව හමුවෙන්න එයිද?"

"හෝම්ස් මහත්මයා. මං ඔබව හොයාගෙන ආවෙ, එදෙරිජ් මහත්මිය ඔබ ගැන තොරතුරු කිව් නිසයි. පොලීසියත් අනෙක් හැමදෙනාමත් ඇයගෙ ස්වාමියා මියගිහින් වෙන්න ඇති කියලා අත්හැරදාලා සිටියදී, ඔබ බොහොම එහැදුවෙන් ඔහුව හොයා දුන්නාලු. අනේ මහත්මයා, ඔබ මගේ ප්‍රශ්නයත් ඒ විදියට විසඳලා දේවි කියල මං බලාපොරොත්තු වෙනවා. මං ලොකු සල්ලි කාරියක් නෙමෙයි. ඒ වුණත් මට අවුරුද්දකට පවුම් සියයක ආදායමක් උරුමයි. ඊට අමතරව යතුරුලියන වැඩවල යෙදිලා තවත් සුළු මුදලක් උපයා ගන්නවා. හොස්මර් ඒන්ජල් මහත්මයාට මොකද වුණේ කියල හොයල දෙන්න පුළුවන් නම්, ඒ ඔක්කොම වුණත් ඔබට දෙන්න මං ලෑස්තියි."

"මාව හමුවෙලා මය ප්‍රශ්නය ගැන කථාකරන්න, ඔබ පිටත් වී ආවෙ බොහොම කලබලයෙන්. ඒ ඇයි?"

හෝම්ස් ඇසුවේ දෑතේ ඇඟිලිතුඩු එකට තබාගෙන, සීලිම දෙස නෙත් යොමුකර ගෙනයි.

මේරි සදර්ලන්ඩ් මෙනෙවියගේ මුහුණේ නිගැස්සීමක සේයාවක් යළිත් පහළවිය.

"ඔව් ඒක ඇත්ත. මං ඔක්කොම දමල ගහල ගෙදරින් පිටවුණේ හරි කේන්තියෙන්. වින්ඩිබෑන්ක් මහත්මයා - ඒ කියන්නේ මගේ පියා, මේක භාරගත්තේ බොහොම සැහැල්ලුවට. ඒ ගැන මට

http://sherlockholmesinvestigations.blogspot.com

හරියට තරහ ගියා. ඔහු මේ ගැන පොලීසියට පැමිණිලි කරන්නෙත් නෑ. මෙහේ ඇවිත් ඔබට කියන්න කැමැතිත් නෑ. ඒ මොකක්වත් කරන්නෙ නැතුව අන්තිමට කියනවා.

"මෙතැන අපරාධයක් සිදුවෙලා නැහැනෙ" කියලා. මට කේන්තිය ඉවසාගන්න බැරුව ගියා. අතට අහුවුණු දෙයක් ඇඳ පැළඳගෙන ඒකයි මං ඉක්මනට ආවෙ ඔබව හමුවෙන්න."

"ඔබේ පියා. . . .? ඔබේ සුළුපියා වෙන්න ඇති. ඒ මොකද නම වෙනස් නේ."

"ඔව්. ඔහු මගේ බාප්පා. ඒත් මං ඔහුට කථාකරන්නෙ තාත්තා කියල. වෙලාවකට මට හිතෙනවා ඒක මහ විහිළුවක් කියල. ඒ මොකද ඔහු මට වඩා වයසින් වැඩි අවුරුදු පහයි මාස දෙකටයි."

"එතකොට ඔබේ මව ජීවත්ව ඉන්නවද?"

"ඔව්. මගේ අම්මා හොඳ සනීපයෙන් ජීවත්ව ඉන්නවා. ඇත්තෙන්ම හෝම්ස් මහත්මයා, මං ඔවුන්ගේ විවාහයට කැමැති වුණේ නැහැ. තාත්තා මිය ගිහින් වැඩිකල් යන්න කලින්, ඇයට වඩා අවුරුදු පහළොවක් බාල කෙනෙක් සමග විවාහ වෙන එක, මට නම් කොහොමටවත් හිතට ඇල්లුවේ නැහැ. මගේ තාත්තා ජලනළ සවිකිරීමේ කර්මාන්ත කරුවෙක්. ඔහුගේ වැඩපොළ තිබුණේ ටොටන්හැම් කෝට් පාරේ. තාත්තා මියයද්දී එහි වැඩ කටයුතු බොහොම සරුවට කෙරෙමින් තිබුණා. එහි ප්‍රධාන සේවකයා හාඩි මහත්මයා. ඔහුගේත් උදව්වෙන් අම්මා ඒ ව්‍යාපාරය සාර්ථකව කරගෙන ගියා. නමුත් වින්ඩිබෑන්ක් මහත්මයා සමග අම්මා විවාහ වුණාම, ජලනළ කර්මාන්තය විකුණා දමන්න කියලා ඔහු බල කළා. ඔහු බොහොම ලොක්කෙක් කියල හිතට ගත් කෙනෙක්. ඔහු රැකියාව කරන්නේ එංගලන්තයට වයින් ආනයනය කරන සමාගමක. ආනයනය කරන වයින් වල තත්ත්ව පරීක්ෂාව හා ඇණවුම් සඳහා ඔහු විදේශ රටවලට සංචාරය කරනවා. ජලනළ කර්මාන්තය විකිණීමෙන් අම්මලාට ලැබුණේ පවුම් 4700 යි. බැංකුවේ තැන්පත් කළ ඒ මුදලෙන් ලැබෙන්නේ සුළු පොලියක්. ඒක තාත්තා ජීවත්වුණා නම් වැඩපොළෙන් ලැබෙන ආදායමේ කිට්ටුවකට වත් එන්නේ නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

කිසියම් පිළිවෙළකින් තොරව මෙන්ම, අදාළ නොවන විස්තර පවසමින්, ඇය කළ විස්තරයෙන්, හෝම්ස් නොඉවසිලිමත් බවට පත්වී ඇතැයි මම සිතුවෙමි. එහෙත් ඔහු නිහඬව මේ සියල්ලට සවන් දුන්නේ දැඩි අවධානයකිනි.

"ඔබේ පෞද්ගලික ආදායම ඔබට ලැබෙන්නේ කොහොමද? ඒකත් එන්නේ මේ ව්‍යාපාරයෙන්මද?"

"අපොයි නැහැ. ඒක සම්පූර්ණයෙන්ම වෙනස් එකක්. මගේ මාමා නෙඩ් ජීවත්වුණේ නවසීලන්තයේ ඕක්ලන්ඩ් නුවර. ඔහු මියගියා. ඔහු නවසීලන්තයේ ව්‍යාපාරවල ආයෝජනය කළ කොටස් මුදලක් තියෙන්නේ මගේ නමට. ඒකෙන් සීයට හතරහමාරක පොලියක් ලැබෙනවා. එහි සම්පූර්ණ වටිනාකම පවුම් දෙදාස් පන්සියයි. ඒත් මට ලැබෙන්නේ පොලිය පමණයි."

"ඔබේ කථාව හරිම සිත් ඇදගන්නා සුළුයි. මට පෙනෙන විධියට ඔබට අවුරුද්දකට පවුම් සියයක පමණ ආදායමක් ලැබෙනවා. ඊට අමතරව ඔබ රැකියාවකින් උපයාගන්නා සුළු මුදලකුත් තිබෙනවා. ඒ නිසා සැකයක් නෑ, ඔබ විනෝද සංචාරයන්හි යෙදෙමින් සතුටෙන් කාලය ගතකරනවා ඇති? ඒ මොකද අවිවාහක කාන්තාවකට බොහොම සැප පහසුවෙන් ජීවත්වෙන්න, පවුම් හැටක් හොඳටම ප්‍රමාණවත් නිසා."

"මට ඊටත් හුඟක් අඩු මුදලකින් සැප පහසුවෙන් ජීවත්වෙන්න පුළුවන් හෝම්ස් මහත්මයා. නමුත් ඔබට තේරෙනවා නේද, ගෙදර පදිංචිව ඉන්න කාලය තුළ, අම්මලාට බරක් වෙන්න මං කැමති නෑ. ඒ නිසා මගේ ඔක්කොම ආදායම පාවිච්චියට ගන්නේ අම්මයි, බාප්පයි. හැබැයි ඒක ඉතින් මං ඒ ගෙදර ජීවත්වෙන තුරු පමණයි. වින්ඩිබෑන්ක් මහත්තයා, හැම කාර්තුවෙදිම මගේ පොලිය බැංකුවෙන් අරගෙන ඇවිත් අම්මා අතට දෙනවා. මං යතුරු ලියනයෙන් උපයාගන්න මුදල් මගේ වියදම්වලට හොඳටම ඇති. එක පිටුවක් යතුරු ලියනය කළාම මට පැන්ස දෙකක් ලැබෙනවා. මට දවසකට පිටු පහළොවක් විස්සක් යතුරු ලියනය කරන්න පුළුවනි."

"ඔබේ වටාපිටාව ගැන ඔබ මට ඉතාම පැහැදිලි විස්තරයක් කළා. මේ ඉන්නේ මගේ හිතවත් මිතුරා, දොස්තර වොට්සන්. මං

http://sherlockholmesinvestigations.blogspot.com

ඉදිරියේ කථාකරන හැමදෙයක්ම, ඔබට නිදහසේ ඔහු ඉදිරියේත් කියන්න පුළුවනි. දැන් අපට කරුණාකරල කියන්න ඔබෙත් හොස්මර් ඒන්ජල් මහත්මයාගේත් සම්බන්ධය ගැන."

සදර්ලන්ඩ් මෙනෙවියගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය. දෙනෙත් පහතට හැරවූ ඇය, හැට්ටයේ පහත වාට්ය නියපොත්තෙන් කොනහමින් කථාව පටන් ගත්තාය.

"මට එයාව හමුවුණේ ගෑස් කර්මාන්ත කරුවන්ගේ බාල් නැටුමේදි. තාත්තා ජීවත්ව ඉඳිද්දි ඔවුන් හැම අවුරුද්දකම අපට බාල් නැටුම සඳහා ටිකට් එව්වා. තාත්තාගේ මරණයෙන් පසුව වත් ඔවුන් අපව අමතක කළේ නැහැ. අම්මාගේ නමට ටිකට් එව්වා. අපි මේ බාල්නැටුමට යනවට වින්ඩිබෑන්ක් මහත්මයා කැමැති වුණේ නැහැ. අපි කොහේවත් යනවට ඔහු කැමැති නැහැ. ඉරිදා දහම් පාසලේ සාදයකට සහභාගි වෙන්න මං යනවා කිව්වමත් ඔහුට හරියට කේන්ති යනවා. ඒ වුණාට මේ සැරේ ටිකට් ලැබුණාම මේ බාල් නැටුමට යන්න මං තීරණය කරගත්තා. අපව ඒකෙනුත් නවත්වන්න ඔහුට තියෙන අයිතිය මොකක්ද?

ඔය බාල් නැටුමට එන හැමෝම වගේ දෙනා තාත්තගෙ යාළුවෝ සහ ඔවුන්ගේ පවුල් වල උදවිය. නමුත් බාප්පා කිව්වෙ ඔය නැටුමට එන්නෙ අපේ තත්ත්වයට ගැළපෙන්නෙ නැති අය කියලයි. ඔහු කිව්වා, ඔය වගේ උත්සවයකට අඳින්න මට හරියකට ඇඳුමක් වත් නැහැ කියලා. ඒ වුණාට මගේ ළඟ තිබුණා දම්පාට ගවුමක්. ඒක කවදාවත් අල්මාරියෙන් එළියට ගත්තෙ නැති තරමයි. අන්තිමට ඔහුගේ කථා වලින් මගේ ගමන නවත්වන්න බැරි වග තේරුණාම ඔහු නිශ්ශබ්ද වුණා. ඔහු සමාගමේ රාජකාරි කටයුත්තක් සඳහා ප්‍රංශයට ගියා. මාත්, අම්මාත්, අපේ කම්හලේ වැඩ කළ හාඩි මහත්මයාත් එක්ක බාල්නැටුමට ගියා. මට හොස්මර් ඒන්ජල් මහත්මයා හමුවුණේ එතැනදී."

"වින්ඩිබෑන්ක් මහත්මයා ප්‍රංශයේ ඉඳල ආපහු ආවට පස්සෙ, ඔබත් අම්මාත් නැටුමට ගිය එක ගැන හරියට කේන්ති ගන්න ඇති?" හෝම්ස් ඇසීය.

"ඔහු ඒ ගැන සතුටක් දක්වූ බවයි පෙනුණෙ. බාප්පා මහ ගඩින් හිනාවුණා. ඊට පස්සේ කිව්වා,

http://sherlockholmesadventuretranslations.blogspot.com

"අනේ මං දන්නෙ නෑ, ඔයාලට කැමැති හැටියකට කරන්න. ගෑනුන්ට කිසිම දෙයක් කරන්න එපා කියල වැඩක් නෑ. ඔවුන් වැඩ කරන්නෙ, ඔවුනට උවමනා හැටියට නේ."

"හැබැට?" ෂර්ලොක් හෝම්ස් ඇසීය.

"එතකොට ගෑස් කර්මාන්තකරුවන්ගේ බාල් නැටුමෙදි ඔබට හොස්මර් එන්ජල් මහත්මයා හමුවුණා?"

"ඔව් මහත්මයා. මුලින්ම මට ඔහුව හමුවුණේ එදා රාත්‍රි. ඊළඟ දවසේ ඔහු මට දුරකතනයෙන් කථා කළා. අපි පරෙස්සමෙන් ගෙදර ආවද කියල ඇහුවා. ඊට පස්සෙත් අපට ඔහුව හමුවුණා හෝම්ස් මහත්තයා. ඒ කියන්නේ මං දෙවරක්ම ඔහු එක්ක ඇවිදින්න ගියා. ඊට පස්සේ බාප්පා ගෙදර ආව නිසා හොස්මර් එන්ජල් මහත්මයාට අපේ ගෙදර එන්න හැටියක් තිබුණේ නැහැ."

"ඔබේ ගෙදරට ආවෙ නැහැ?"

"ඔව්. ඔබට තේරුම් ගන්න පුළුවන් නේ, බාප්පා මොන වගේ කෙනෙක්ද කියලා. ඔහු ඔය වගේ දේට පොඩ්ඩක්වත් කැමැති නැහැ. ඔහු කියන්නේ ගෑහැනියක් වුණාම, තමන්ගේ පවුලේ අය ආශ්‍රය කිරීමෙන් සෑහීමට පත්වෙන්න හැකියාවක් තියෙන්න ඕනෙ කියලයි. ගෙදරට අමුත්තන් කිසිවෙක් එනවට වත් ඔහු කැමැති නැහැ. නමුත් මං අම්මට හැම තිස්සෙම කියන්නෙ ගෑහැනියක් වුණාම, තමන්ට හිතවත්, තමන්ට ආදරය කරන යාළු මිත්‍රයන් පිරිසක් ඉන්න ඕනෙ කියලයි. මට තවමත් එහෙම කිසි කෙනෙක් නැහැ."

"හොස්මර් ඒන්ජල් මහත්මයා ඒ විධියට ඉදිරිපත් වුණේ නැද්ද? ඔබව හමුවෙන්න ඔහු උත්සාහයක් දැරුවෙ නැද්ද?"

"බාප්පා ඊළඟ සතියේ ප්‍රංශය බලා පිටත්වෙලා යන්න සැලසුම් කරගෙනයි හිටියේ. ඔහු ගියාට පස්සේ අප හමුවෙන එක වඩාත් හොඳයි කියලා, හොස්මර් ලියුමකින් දන්නුවා. ඒ අතරේ අපට ලියුම් ගනුදෙනු කරන්න පුළුවන් කිව් ඔහු, හැමදාම මට ලියුම් එව්වා. උදේට ලියුම් බෙදන්නාගෙන් ලියුම් ගත්තේ මම. ඒ නිසා බාප්පට ඒ ගැන දැනගන්න විධියක් තිබුණේ නැහැ."

"මේ දවස් වෙනකොට හොස්මර් මහත්මයා ඔබව විවාහ කරගන්නා බවට පොරොන්දු වෙලාද හිටියේ?"

"ඔව් හෝම්ස් මහත්මයා. අපි ඇවිදින්න ගිය පළමුවෙනි දවසෙම අපි විවාහය ගැන තීරණයකට ආවා. හොස්මර්, ලෙඩින් හෝල් වීථියේ කාර්යාලයක අයකැමි වරයෙක්."

"මොන කාර්යාලයේද?"

"අන්න ඒක තමයි මං අතින් වුණු වැරැද්ද. හරියටම මොන කාර්යාලයෙද කියන එක මම දන්නෙ නෑ. මට ඒක අහගන්න බැරිවුණා හෝම්ස් මහත්මයා."

"එහෙනම් ඔහු පදිංචි වෙලා හිටියේ කොහේද?"

"ඔහු එම කාර්යාල ගොඩනැගිල්ලේම කාමරයකමයි නැවතිලා හිටියේ."

"ඔබ ඔහුගේ ලිපිනයක් දන්නෙත් නැද්ද?"

"නැහැ. ලෙඩින්හෝල් වීථියේ නැවතී ඉන්න බව පමණයි දන්නෙ."

"ඉතින් ඔබේ ලියුම් ඔහුට යැව්වේ කොහොමද?

"මං මේ ලියුම් යැව්වේ ලෙඩින්හෝල් වීථියේ තැපැල් කන්තෝරුව භාරයේ. ඔහු ගිහින් ඒ ලියුම් එතැනින් භාරගත්තා."

"එහෙම කළේ ඇයි?"

"ඒන්ජල් මහත්මයා කිව්වා, ඔහුට තරුණියකගේ ලියුම් ලැබෙන බව දැනගත්තම අනික් ලිපිකරුවො විහිළු කරන්න පටන්ගනීවි කියල. ඉතින් මං කිව්වා ගැහැනු අත්අකුරු කියලා බලාගන්න බැරිවෙන්න, මං ඒවා යතුරු ලියනයෙන් ලියා එවන්නම් කියල. නමුත් ඔහු ඒකටත් කැමැතිවුණේ නැහැ. ඔහු කිව්වා ලියුම් මගේ අතින්ම ලිව්වාම, ඒවා මගෙන්ම ලැබුණා වගේ තේරෙනවා කියල. යතුරු ලියනය කළොත්, හරියට අපි දෙන්නා අතරට යතුරු ලියනය ඇවිත් කියල හිතේවි යනුවෙන්. ඔබට ඒකෙන්ම පෙනෙනවා නේද හෝම්ස් මහත්මයා, ඔහු මට කොයි තරම් ආදරයකින් හිටියද කියල. අනෙක ඔහු ඉතාම සුළු සුළු දේවල් ගැන පවා හිතන හැටි."

"ඔව් මට පැහැදිලිවම පෙනෙනවා. මට පෞද්ගලිකවම පෙනීගොස් තිබෙන කරුණක් තමයි, මේ වගේ සුළු සුළු දේවල් ලෙස පෙනෙන ඒවා හරිම වැදගත් බව. හොස්මර් ඒන්ජල් මහත්මයා ගැන ඔබට කියන්න පුළුවන් අනෙක් සුළු සුළු කරුණු මොනවාද?"

"ඔහු හරි ලැජ්ජාශීලී කෙනෙක්. මා එක්ක දහවල් වෙලාවේ ඇවිදින්න යන්න ඔහු කැමැතිවුණේ නැහැ. ඔහු ඇවිදින්න කැමැති වුණේ, හැන්දෑවෙ ඇඳිරි වැටුණාට පස්සේ. ඒ, අනෙක් අය ඔහුව දකිනවාට අකමැති නිසාලු. ඔහු බොහොම හොඳ මහත්ම ගතිගුණ තිබුණු, අඩුවෙන් කථාකරන, සමාජ ආශ්‍රයෙන් ඈත්වී සිටි කෙනෙක්. ඔහුට තිබුණේ හරිම මෘදු කටහඬක්. ඔහු පුංචි කාලේ උගුරේ සෙම්ගෙඩි ආශ්‍රිත රෝගවලින් හරියට පීඩා විඳල තියෙනවා. ඒකෙන් ඔහුගේ කටහඬේ දුර්වලකම ඇතිවුණාලු. ඒන්ජල් මහත්මයා කථා කළේ කෙඳිරිලි හඬින්, නවත්ත නවත්තා. ඔහු බොහොම ලක්ෂණට හැඳ පැළඳ සිටි කෙනෙක්. ඒ වුණාට ඔහුගේ ඇස් පෙනීමත් මගේ වගේම දුර්වල බව කිව්වා. ඒ නිසා අව්රශ්මියෙන් ඇස් ආරක්ෂා කරගන්න ඔහු කළු උපැස් යුගළක් පැළැඳුවා."

"හොඳයි. ඔබේ බාප්පා, වින්ඩිබෑන්ක් මහත්මයා ප්‍රංශයේ ඉඳල ආපහු ආවට පස්සේ මොකද වුණේ?"

"බාප්පා ආපහු එන්න කලින් හොස්මර් ඒන්ජල් මහත්මයා ගෙදරට ඇවිත්, විවාහ යෝජනාව ඉදිරිපත් කළා. ඔහු හරිම අවංක කෙනෙක්. ඔහු මට කිව්වා බයිබලයේ අත තියලා දිවුරා පොරොන්දු වෙන්න කියලා; ඔහු කිව්වේ කවදා හරි, මොනවා හරි සිදුවුණොත්, ඔහු වෙනුවෙන් කැපවෙලා, ඔහු ගැන විශ්වාසය තියලා, බලාගෙන ඉන්නා බවට මට දිවුරන්න කියලයි. අම්මා කිව්වා, ඔහු එහෙම දිවුරන්න යෝජනා කළ එක හරි, ඒකෙන් පෙනෙන්නේ ඔහු මට දක්වූ ආදරයයි කියල. අම්මා මුල ඉඳලම ඒන්ජල් මහත්මයාට කැමැතිවුණා. මටත් වඩා කැමැති වුණා. ඊළඟට ඔවුන් දෙදෙනා අපේ විවාහය ඒ සතියෙම සිදුකරන එක ගැන සාකච්ඡා කරන්න පටන් ගත්තා.

මං ඒකට විරුද්ධ වුණා. මං කිව්වා අපි මෙව ගැන ඉස්සරවෙලා බාප්පට දැනුම්දීල හිටියොත් හොඳයි කියලා. නමුත් ඔවුන් දෙදෙනාම කිව්වේ, බාප්පාගෙන් මේ ගැන අහන්න උවමනා නැහැ කියලයි. විවාහය කරලා අවසන් වෙලා, ඒ ගැන බාප්පාට දැනුම්දුන්නාම ඇති කියන එකට, අම්මාත් ඒන්ජල් මහත්මයාත් දෙදෙනාම එකඟවුණා. බාප්පා එක්ක ඒක විසඳාගැනීම අම්මා භාරගන්නම් කිව්වා. ඒ වුණත් මං ඒ අදහසට ඒ තරම් කැමැති වුණේ නැහැ. හොම්ස් මහත්මයා, බාප්පා මට වඩා අවුරුදු

සිහිපයකින් පමණක් වැඩිමහලු කෙනෙක් නිසා, ඔහුගෙන් අවසර ගැනීම විහිළුවක් බව ඇත්තයි. ඒ වුණත් කිසිදෙයක් ආවට ගියාට කරන්න මං කැමැති නැහැ. බාප්පා වැඩකළ වයින් සමාගමේ, ප්‍රංශයේ කාර්යාලය තියෙන්නේ බෝඩෝ වල. ඉතින් මං ඒ ලිපිනයට බාප්පාට ලියුමක් යැව්වා. නමුත් විවාහ මංගල්‍යය දවසෙ උදේ ඒක ආපහු ආවා."

"ඒක ඔහුට ලැබිලා නැහැ එහෙනම්?"

"ඔව් මහත්මයා. ලියුම එහෙට ලැබෙන දවසේම, එය ලැබෙන්න කලින් බාප්පා එංගලන්තයට එන්න පිටත්වෙලා."

"අහා! ඒක හරිම අවාසනාවන්ත දෙයක්. ඉතින් ඔබේ විවාහය යොදාගත්තේ සිකුරාදා දවස්ව ද? එය පැවැත්වුණේ දේවස්ථානයේද?"

"ඔව් මහත්මයා. ඒක බොහොම නිහඬ විවා මඟුලක් ලෙස පවත්වන්නයි තීන්දු වුණේ. අප තෝරාගත්තේ කිංස්ක්‍රොස් අසල සාන්ත සේවියර් මුනිඳුන්ගේ දේවස්ථානය. මංගල දේවමෙහෙය අවසන් කරලා, අපි කවුරුත් සැන්පැන්ක්‍රාස් හෝටලයට උදේ ආහාරය සඳහා යන්න නියමිතවයි තිබුණේ.

ඒන්ජල් මහත්මයා උදෙන්ම අශ්වකරත්තයක නැගී අපේ ගෙදරට ආවා. දේවස්ථානයට යාම සඳහා පිටත්වෙන්න බලද්දී ඔහු ආ අශ්වකරත්තයේ තුන්දෙනාටම ඉඩ මදි. එහි ඉඩ තිබුණේ දෙන්නාටයි. ඉතින් ඔහු අම්මාත් මාවත් ඒ කරත්තයට නග්ගවලා දේවස්ථානයට එව්වා. ඔහු පාරේ ගිය, රෝද හතරේ කුලීරියකට නැග්ගා. ඒ වෙලාවේ පාරේ තිබුණේ ඒ කරත්තය පමණයි.

අම්මාත් මමත් ආ අශ්ව කරත්තය දේවස්ථානය ළඟට ඇවිත් නැවැත්තුවා. ඊළඟට අනෙක් රෝද හතරේ රථයත් ආවා. ඔහු එයින් බහිනතුරු අපි බලාගෙන හිටියා. ඔහු බැස්සේ නැහැ. ඊළඟට කුලීරථ රියැදුරා කරත්තය ඇතුළත පරීක්ෂා කර බැලුවා. ඒ තුළ කිසිකෙනෙක් සිටියේ නැහැ. රියැදුරා කිව්වේ ඒ මහත්මයාට කුමක් සිදුවුණාද කියා තමන්ට හිතාගන්න බැරි බවයි. ඒ මොකද ඒන්ජල් මහත්මයා කරත්තයට නගින හැටි රියැදුරා ඔහුගේ දෑසින්ම දැක තිබුණා. හෝම්ස් මහත්මයා. ඔය සිදුවීම වුණේ ගිය සිකුරාදා. ඊට පස්සේ අද වෙන තුරුත් මං ඔහු දුටුවෙත් නැහැ. ඔහු ගැන කිසිම ආරංචියක් ලැබුණෙත් නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com



62. "රියැදුරා කරත්තය ඇතුළත පරීක්ෂා කර බැලුවා. . . ."

Reading Purpose Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"මට නම් පෙනෙන්නේ ඔහු ඔබව ලැජ්ජානැති විධියට අතර මං කරලා බවයි" හෝම්ස් කීය.

"අනේ නැහැ මහත්මයා. ඔහු එහෙම කෙනෙක් නෙමෙයි. ඔහුගේ කරුණාවන්ත හොඳ ගතිගුණ වල හැටියට, මාව එහෙම අත්ඇර දමල යන්නෙ නැහැ. එදා උදේ ඉඳලම ඔහු මට මෙහෙම කිව්වා. මොනවා සිද්ධවුණත් ඔහු වෙනුවෙන් බලාගෙන ඉන්න කිව්වා. අප දෙදෙනා දෙපැත්තකට වෙන්කරන්න මොනවා හරි නොහිතන විධියේ සිදුවීමක් වෙන්න පුළුවනි. නමුත් ඔහු වෙනුවෙන් කැපවෙලා ඉන්න කියලා මාව පොරොන්දු කරවගත්තා. මං ඒ පොරොන්දුව දීපු බව හැමවිටම මතක තියාගන්න කිව්වා. ඒක සම්පූර්ණ කරන්න ඔහු කොයි වෙලාවක හරි, ඉක්මනට බැරි නම් පසුවෙලා හරි ආපහු එනවා කිව්වා. මඟුල් දවසෙ උදේ මනාල ජෝඩුවක් අතරේ මේ වගේ කථාවක් ඇතිවෙනව කියන එක හිතන්නත් පුදුමයි. නමුත් ඊට පස්සේ වුණු සිදුවීම් නිසා, ඒ කතාවේ වැදගත් යමක් ඇති බව දැන් තේරෙනවා."

"ඇත්තෙන්ම ඔව්. ඔබ හිතන්නේ ඔහු බලාපොරොත්තු නොවුණු ආකාරයේ කිසියම් කරදරයකට මුහුණපාන්න ඇති කියලද?"

"ඔව් මහත්මයා. මං හිතන්නේ ඔහු වෙත එල්ල වීමට ඇති අන්තරායක් ගැන ඔහුට ඉවෙන් මෙන් වැටහුණා. එහෙම නැත්නම් ඔය වගේ කථාවක් කියාවිද? ඊළඟට ඒ නොහිතු දේ ඔහුට සිද්ධවෙන්න ඇති."

"නමුත් ඒක මොන විධියේ දෙයක්ද කියලා ඔබට හිතන්න බැරිද?"

"මට නම් කිසිම දෙයක් හිතාගන්න බෑ."

"තව එක ප්‍රශ්නයක් තියෙනවා. මේ සිදුවීමට ඔබේ මව දක්වූ ප්‍රතිචාරය මොකක්ද?"

"ඇය තදබල ලෙස කෝපයට පත්වුණා. මේ ගැන මීට පස්සේ ඇයත් එක්ක කථාකරන්න එපා කිව්වා."

"ඊළඟට ඔබේ බාප්පා? මුහුණපාන්න වුණු සිදුවීම ඔබ ඔහුට කිව්වද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. මා සිතූ දෙයට ඔහුත් එකඟවුණා. ඒන්ජල් මහත්මයාට මොනවා හරි බරපතල කරදරයකට මුහුණ පාන්න වෙන්න ඇති කියලයි ඔහු කිව්වෙ. බාප්පා කිව්වා ටික දවසක් යද්දී ඒන්ජල් මහත්මයා මට ලියුමක් එවාවි කියලා. මාව විවාහ කරගන්නා බවට පොරොන්දු වෙලා, දේවස්ථානයේ දොරටුව ළඟටම ගෙනැවිත්, මඟහැරයාමෙන් කාටවත් ඇති ප්‍රයෝජනය මොකක්ද? බාප්පා කිව්වෙත් එයයි. එක්කෝ හොස්මර් මගෙන් විශාල මුදලක් ණයට අරගෙන තිබුණා නම්, එහෙමත් නැත්නම් මා සමඟ විවාහ වෙලා මගේ දේපොළ ඔහු නමට පවරාගෙන තිබුණා නම්, මේ වගේ මඟහැර යාමක් ගැන හිතන්නවත් පුළුවනි. නමුත් මෙතැන එහෙම දෙයක් සිදුවෙලා නැහැ. හොස්මර් කිසිවිටෙකත් මුදල් ගැන උනන්දුවක් දක්වූයේ නැහැ. ඔහු මගේ සල්ලි එක පිලිමක් දිහා බැලුවේ නැහැ. ඒ වුණත් මොකක්ද ඔහුට සිද්ධවුණේ? මට එක ලියුමක් එවන්න ඔහුට හැකියාවක් නැත්තෙ ඇයි? ඒ ගැන මතක් වෙන කොට මට පිස්සු හැදෙනවා වගෙයි හෝම්ස් මහත්තයා. දැන් මට රෑට එක මොහොතක් නින්ද යන්නෙ නෑ."

ලේන්සුවකින් මුහුණ වසාගත් ඇය ඉකිගසමින් වැළපීමට පටන් ගත්තාය.

"මං මේ ගැන හොයා බලන්නම්."

හෝම්ස් පැවසුවේ පුටුවෙන් නැගිටිමිනි.

"මේ පිළිබඳව නිශ්චිත පැහැදිලි කිරීමකට අපට පැමිණිය හැකි බවට කිසි සැකයක් නෑ. මේ ගැටලුව විසඳීමේ බර මම සම්පූර්ණයෙන්ම භාරගන්නවා සදර්ලන්ඩ් මෙනෙවිය. ඔබ මේ ගැන තවදුරටත් කල්පනා කරන්න එපා. හැමදේකටම කලින් හොස්මර් ඒන්ජල් මහත්මයාව ඔබේ මතකයෙන් ඈත් කරන්න උත්සාහ ගන්න. ඒක හරියට ඔහු ඔබේ ජීවිතයෙන් සමුගත්තා වගෙයි. එහෙම හිතන්න."

"ඔබ හිතන්නේ මට ආයෙ කවදාවත් ඔහුව දකින්න ලැබෙන එකක් නැහැයි කියලද?"

"කියන්න කණගාටුයි. නමුත් සත්‍යය එයයි."

"එහෙනම් මොකක්ද ඔහුට සිද්ධවුණේ."

http://sherlockholmesinsinhala.blogspot.com

"ඒ ප්‍රශ්නය විසඳීම මං භාරගන්නවා. ඒ වැඩේ මට ඉතිරි කරන්න. ඔහුගේ පෙනුම පිළිබඳ සම්පූර්ණ විස්තරයක් මට ඕනෑ. ඔබට ලබාදිය හැකිනම්, ඔහුගේ ලිපි මොනවා හරි ඇත්නම් මට ප්‍රයෝජනවත් වේවි."

"පහුගිය සෙනසුරාදා "ක්‍රොනිකල්" පුවත්පතේ මං ඔහු ගැන දැන්වීමක් පළ කළා. මෙන්න ඒ දැන්වීම. ඔහු මට එවූ ලියුම් හතරක් මේ සමඟ තියෙනවා."

"බොහොම ස්තූතියි. එතකොට ඔබේ ලිපිනය?"

"අංක 31 ලයොන් පෙදෙස, කැම්බර්වෙල්."

"ඒන්ජල් මහත්මයාගේ ලිපිනය ඔබට කවදාවත් නොලැබුණු බව ඔබ මට කිව්වා. ඔබේ බාප්පා රැකියාව කරන්නේ කොහේද?"

"ෆෙන්චර්ච් වීථියේ වෙස්ට් හවුස් සහ මාබෑන්ක් සමාගමේ. ඔවුන් තමයි ක්ලැරට් වයින් විශාල වශයෙන් එංගලන්තයට ආනයනය කරන්නේ. බාප්පා ඔවුන්ගේ කටයුතු සඳහා විදේශ වයින් නිෂ්පාදනාගාර වල සංචාරයේ යෙදෙනවා."

"ස්තූතියි. ඔබේ විස්තරය ඔබ ඉතාම පැහැදිලිවම කිව්වා. මේ කඩදාසි සියල්ල මෙහි තබා යන්න. මං ඔබට දුන්නු උපදේශය හොඳින් සිහියට ගන්න. මේ සිදුවීම ලියූ මතකපොත, දත් මුද්‍රා තබල අවසන් කියල හිතන්න. මේකෙන් ඔබේ ඉදිරි ජීවිතයට බලපෑමක් ඇතිවෙන්න ඉඩහරින්න එපා."

"ඔබ හරිම කරුණාවන්තයි හෝම්ස් මහත්මයා. ඒ වුණාට මං කොහොමද ඔබ කියන දේ කරන්නේ? මං හොස්මර් ගැන බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඔහු ආපසු ආව දවසක ඔහුව පිළිගන්න සූදානමින් මං බලා ඉන්නවා."

ඇයගේ මුහුණෙන් පළවූයේ එතරම් බුද්ධිමත් පෙනුමක් නොවේ. ඇය පැළඳ සිටි හිස්වැස්ම ද විකාර එකකි. ඒවා කෙසේ වෙතත් ඇයගේ උත්තම ගුණාංගය ගැන අපි පැහැදුණෙමු. ලියවිලි මේසය මත තැබූ ඇය පිටත්ව ගියේ, කැඳවන ඕනෑම විටෙක ආපසු පැමිණීමට තමා සූදානම් බව දනුම් දෙමිනි.

තම දෙපා ඉදිරියට දිගු කරගෙන, ඇඟිලි තුඩු එකට තබාගත් හෝම්ස්, සිවිලිම දෙස බලාගෙන කල්පනා කරමින් සිටියේය. මීළඟට ඔහු පයිප්ප [illegible] එළියට

ගත්තේය. විසඳාගැනීමට නොහැකි කාලේ ගැටලුවක් මතුවූ විට උපදේශකයෙක් ලෙස ඔහුට පිහිට වූයේ එම පයිප්පයයි. එහි කෝටුව පිරෙන්නට දුම්කොළ පුරවා දල්වාගත් හෝම්ස්, නිල් පැහැති දුම් වළලු පිටකළේ නව ජීවයක් ලද්දාක් මෙනි.

"අර ගැනු ළමයා හරිම සිත් ඇදගන්නා චරිතයක්." ඔහු කීය. "මට පෙනුණු හැටියට ඇගේ ගැටලුවට වඩා, ඇගේ චරිත ස්වභාවය හැදෑරීම ආසා හිතෙන එකක් වේවි. මගේ සුචිය පෙරළා බැලුවොත් මීට සමාන බවක් දක්වන පරීක්ෂණ වල මං යෙදී ඇති බව ඔබට දකින්න ලැබේවි. 1877 දී ඇන්ඩ්ඕවර් වලත් ගිය අවුරුද්දේ හේග් වලත්, මේ වගේ දේවල් සිදුවුණා. මේ අදහස බොහොම පරණ එකක්. නමුත් නවීන ආකාරයේ වෙනස්වීම් එකක් හෝ දෙකක් මෙතැන ඇතිබව මට දකින්න ලැබුණා. අර තරුණියගේ ස්වභාවය හරිම පැහැදිලියි. ඒ නිසා අපට හැමදෙයක්ම පහදා දෙන සුලුයි කිව්ව හැකි."

"ඇගේ බාහිර පෙනුමෙන්ම, ඔබ කාරණා රැසක් තේරුම් ගත් බවයි පෙනෙන්නේ! නමුත් මට මොකුත්ම පෙනුණේ නැහැ." මම කීවෙමි.

"පෙනුණේ නැතුවා නොවෙයි. ඔබට නිරීක්ෂණය කරගන්න බැරිවුණා වොට්සන්. ඔබ දතගෙන හිටියෙ නැහැ බලන්න ඕනෙ කොහේද කියලා. ඒ නිසා කාරණා රැසක් ඔබට නොපෙනී මඟ හැරුණා. හැඳ සිටින ඇඳුමේ අත් දෙක ගැන ඔබේ අවධානය යොමු කරවන්න මං කොයි තරමක් උත්සාහ කළා ද? ඒත් වැඩක් වෙලා නැහැනේ. ටිළහට අතේ ඇඟිලි වල තියපොතු. සපත්තු ගැටගැසූ නූල්. . . . ඒව ගැන බැලුවද? හොඳයි අර තරුණියගේ පෙනුමෙන් ඔබ තේරුම් ගත් කරුණු මොනවාද? විස්තර කරන්න බලන්න."

"ඔව් මං කියන්නම්. ඇය-පත් වලින් වියූ කොළ පැහැය මිශ්‍ර අළු පැහැති හිස්වැස්මක් පැළැඳ සිටියා. ඒක පුළුල් වාටියක් සහිත එකක්. ඒකෙ ගඩොල් රතුපාට පිහාටුවක් ගසා තිබුණා. ඇගේ හැට්ටය කළු පැහැතියි. ඒකෙ කළු පැහැති පබළු අල්ලා වැඩදමා තිබුණා. ඇගේ ගවොමේ දුඹුරු පාටයි. ඒක රතුමිශ්‍ර දුඹුරට වඩා තද දුඹුරක්. ඒ වගේම ගවොමේ බෙල්ල හා අත් ප්‍රදේශයේ දම් පැහැති සිල්ක් වලින් හොඳින් සකස් කර තිබුණා. ඇගේ අත්වැසුම් අළු

පැහැතියි. දකුණු අතේ දබරැඟිලි තුඩ අත් වැසුමෙ ගෙවී ගොස් තිබුණා. ඇගේ පාවහන් මට පෙනුණේ නැහැ. ඇය පැළැඳ සිටි කරාබු, රන්තරතින් තැනූ එල්ලෙන වසල් වර්ගයේ ඒවා. සෑහෙන වත් පොහොසත් කම් ඇති, ටිකක් නුගත්, නිදහසේ ජීවත්වෙන කෙනෙක්."

මහ හඬින් සිනාසුණු ෂර්ලොක් හෝම්ස් අත්පොළොසන් දීමට පටන් ගත්තේය.

"දෙයියම්පා! ඔබ දන් හරිම පුදුමාකාර විධියට දියුණුයි නේ වොට්සන්. ඔබ බොහොම සාර්ථක ලෙස නිරීක්ෂණ කටයුතු කරල තියෙනවා. ඇත්තමයි; වැදගත් කරුණු නම් සියල්ලක්ම වගේ ඔබට මගහැරී ගිහින්. නමුත් ඔබ නිවැරදි මාර්ගයට පිවිසිලා තියෙනවා. අලංකාර වර්ණ ඔබේ මතකයට ගැනීමට ඔබ හරිම දක්ෂයි. බාහිරව දකිය හැකි පෙනුම ගැන කවදාවත් විශ්වාසය තබන්න එපා, ඉලන්දාරියා.

සියුම් කාරණා ගැන වැඩි අවධානයක් යොමුකරන්න. ගැහැනියකගේ නම් මං මුලින්ම බලන්නේ ඇයගේ හැට්ට අත්දිහා. පිරිමියෙකුගේ නම් කලිසම් කකුල් වල දණහිස් ප්‍රදේශය මුලින් බැලිය යුතුයි. ඔබ දුටුවා වගේ ගවොම් අත් සිල්ක් වලින් නිමකර තිබුණා. අපට වැදගත් වන ලකුණු මේ රෙදි වල හොඳින් සටහන් වෙනවා. අතේ මැණික් කටුවට ඉහලින්, යතුරු ලියන්නිය දෑත් මේසයට තදකරගෙන සිටින තැන, රේඛා යුගලයක් පැහැදිලි ලෙසම රෙද්දේ සලකුණු වී තිබුණා. අතින් කරකවන මහන මැසිමක් ක්‍රියාත්මක කරවන්නියකගේත් මේ ලකුණු දකගත හැකියි. ඒත් ඒ වම් අතේ පමණයි. ඊළඟට මං බැලුවේ ඇගේ මුහුණ දිහා. ඔබ දුටුවද ඇගේ නාසය මුදුනේ දෙපැත්තේ, තිබූ සලකුණු? ඒ උපැස් යුගලන "ක්ලිප්" නිසා සම ඇතුලට එබී ගිය සලකුණු. ඒකෙනුයි මට සිවහැකි-වුණේ ඇගේ ඇස්පෙනීම දුර්වල බවත්, යතුරු ලියන්නියක ...

"ඒ කතාවෙන් මාත් පුදුමයට පත්වුණා."

"ඒක බොහොම පැහැදිලි ලෙසම පෙනුණු දෙයක්. ඊළඟට ඇය පැළැඳ සිටි පාවහන් දෙස බලා මං පුදුමයට පත්වුණා. පෙනුමෙන් සපත්තු දෙක බොහොම දුරට එක සමාන වුණත්, එක් සපත්තුවක ඉදිරි කොටසේ යම්කිසි මෝස්තරයක් තිබුණා. අනෙක් සපත්තුවේ ඒ කිසිවක් නෑ. එක් සපත්තුවක බොත්තම් පහයි ...

පියවලා තිබුණේ දෙකක් පමණයි. අනෙක් එක, තුන, පහ යන බොත්තම් පමණයි. හොඳ වටිනා ඇඳුමෙන් පැළඳුමෙන් සැරසී තරුණ කාන්තාවක් ගෙදරින් එළියට බැහැලා එනවා; නමුත් පාවහන් ටිකක් විකාර විදියට. ඉතින් ඇය ආවේ හරි කලබලයෙන් කිව්වොත් ඒක මහ ලොකු නිගමනයක් නොවෙයි."

"වෙන මොනවද?"

"ඇය ගෙදරින් පිටවී එමට පෙර ඇඳුමෙන් පැළඳුමෙන් සැරසී, යමක් ලියා තිබුණා. ඇගේ දකුණු අතේ අත් වැස්ම ඉරීගොස් තිබුණු බව ඔබ දුටුවා. නමුත් අත්වැස්මේ පමණක් නොවෙයි ඇඟිල්ලෙත් දම් පැහැති තීන්ත ගෑවී තිබුණු බව ඔබ දුටුවේ නැහැ. ඇය බොහොම කලබලයෙන් ලියලා තියෙන්නේ. ඒ නිසා පෑන තීන්ත බෝතලය තුළට උවමනාවට වඩා ඔබල තියෙනවා. ඒක සිදුවෙන්න ඇත්තෙ අද උදේ. ඒ මොකද ඊයේ වුණු දෙයක් නම් තීන්ත පැල්ලම ඔය තරම් පැහැදිලි ලෙස ඇඟිල්ලේ රැඳී තිබෙන්නේ නැහැ. මේවා බොහොම ප්‍රදුමාකාර දේවල් ලෙස ඔබට පෙනෙනවා ඇති. නමුත් වොට්සන් මේවා මූලිකවම කළ යුතු නිරීක්ෂණ. කොහොම වුණත් දැන් අපි වැඩ පටන් ගනිමු. අර හොස්මර් ඒන්ජල් ගැන පළවූ දැන්වීම ඔබට කරුණාකර කියවන්න පුළුවන්ද?"

## "ආ ගිය අතක් නැත

14 වැනිදා උදේ කාලයේ සිට හොස්මර් ඒන්ජල් නම් මහතා ආ ගිය අතක් දැනගන්නට නැත. ඔහුගේ උස අඩි පහයි අඟල් හතක් පමණ වේ. හමේ පැහැය මදක් කහ පැහැයට හුරුයි. හිස කෙස් කළු පැහැතියි. හිසේ ඉදිරිපසින් මදක් තට්ටය පෑදී ඇත. ඝන උඩුරැවුලක් ඇත. මුහුණේ දෙපැත්තේ "සයිඩ් බර්න්ස්" මෝස්තරයට රැවුල වවා ඇත. අන්තිම වරට දකිනවිට හැඳ සිටියේ, සිල්ක් වලින් වැඩ දැමූ කළු කබායක්, කළු ඇතුළු කබායක් සහ අළු පැහැති ට්වීඩ් කලිසමකි. ඇල්බට් මෝස්තරයේ රන්වන් දම්වැලක් ද, පැති වලින් ඉලාස්ටික් දැමූ බූට්ස් සපත්තු ද පැළැඳ සිටියේය. ලෙඩන්හෝල් වීදියේ කාර්යාලයක රැකියාව කළ බව දැනගන්නට ලැබී ඇත. ඔහු පිළිබඳ යම් තොරතුරක් වෙතොත්..."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ ඇති වොට්සන්. දැන් බලමු අර ලියුම් ගැන. . . ." කියූ හෝම්ස් ලියුම් සියල්ල දිගහැර පරීක්ෂාවෙන් කියවා බැලීමට පටන් ගත්තේය.

"ඒන්ජල් මහත්මයා ගැන මේවා වලින් කිසිම හෝඩුවාවක් ලබාගන්න බැහැ. සාමාන්‍ය ආකාරයේ ලියුම් කියන්න පුළුවනි. ඒ වුණත් මේවායේ යම් යම් වැදගත් ලක්ෂණත් තිබෙනවා. ඔබ පැහැදිලිවම ඒවා දකින්න ඇති?"

"ලියුම් සම්පූර්ණයෙන්ම යතුරු ලියනයෙන් ලියලා තියෙන්නේ."

"එච්චර විතරක් නෙමෙයි; අත්සන් කරනවා වෙනුවට නම යතුරු ලියනයෙන් ලියලා. බලන්න ... ඔබ කැපිටල් අකුරෙන් හොස්මර් ඒන්ජල් කියලා යතුරු ලියනය කර ඇති හැටි. දිනයක් දමා තිබෙනවා. නමුත් එය ලියන්නේ කුමන ස්ථානයක සිටද කියලා හැඟවෙන ලිපිනයක් නැහැ. ස්ථානය නිශ්චිත ලෙස නැතුව, "ලෙඩින්හෝල් වීථියේ දීය" කියලා තිබෙනවා. මෙහි අත්සන නොතිබීම ඉතාම වැදගත් කරුණක්. අපට කියන්න පුළුවනි ගැටලුව ගැන අවසන් තීරණය ඒකෙන්ම ලැබෙනවා කියල."

"මොකක්ද ඒ අවසන් තීරණය?"

"මගේ හිතවත් මිත්‍රයා. ඒ කාරණය මේ පරීක්ෂණයේදී ප්‍රබල ලෙස ඉස්මතු වෙන කරුණක් කියන එක ඔබට පෙනෙන්නේ නැද්ද?"

"එහෙම පැහැදිලිව පෙනෙන කරුණක් මට හිතාගන්න අමාරුයි. බාගවෙලාවට විවාහ කරගන්නා බවට වූ පොරොන්දු කඩ කලා කියන චෝදනාවෙන් ගැළවීම සඳහා, ඔහු හිතාමතාම අත්සන නොතබා මගහැරියා වෙන්න පුළුවනි."

"නෑ නෑ. ඒක නෙමෙයි කාරණාව. කොහොම වුණත් දැන් මම ලියුම් දෙකක් ලියන්නයි හදන්නෙ. එකක් ලන්ඩන් නගරයේ ඇති සමාගමකට. අනෙක මේ තරුණ කාන්තාවගේ බාප්පා වන වින්ඩිබෑන්ක් මහත්මයාට. මං ඔහුගෙන් අහල යවනවා හෙට හැන්දෑවේ හයට මෙහේට ඇවිත් අපව හමුවෙන්න පුළුවන්ද කියලා. සදර්ලන්ඩ් මෙනෙවියගේ පිරිමි නෑයන් සමගත් අපි ගනුදෙනු කරන එක හොඳයි. ඉතින් වොට්සන්, මං යවන ලියුම් වලට

http://sherlockholmesinvestigations.blogspot.com

පිළිතුරු ලැබෙනතුරු අපට වෙන කරන්න දෙයක් නෑ. ඒ නිසා ප්‍රශ්නය අපි මදකට කල් තියමු."

මගේ මිත්‍රයාගේ තර්ක කිරීමට ඇති ඥානය සහ අප්‍රමාණ ශක්තියකින් ක්‍රියා කිරීම කෙරෙහි මා තුළ පැවැතියේ දැඩි විශ්වාසයකි. මෙම අසාමාන්‍ය අභිරහස ඔහු දැනටම සැහැල්ලුවෙන් සලකන්නේ එය විසඳා අවසන් අයුරෙනි. එසේ සැලකීමට හේතුව, දැනටමත් එහි කාරණා බොහොමයක් ඔහු තේරුම් ගෙන අවසන් නිසා විය යුතුය. හෝම්ස් පරාජයට පත්වනු මා දැක තිබුණේ එසාම අවස්ථාවක පමණි. ඒ බොහිමියාවේ රජ අයිරීන් ඇඩ්ලර් සම්බන්ධ අභිරහසේදීය. එහෙත් ලෝහිත පරීක්ෂණය හා සිව් රහස් සලකුණ පරීක්ෂණය ඔහු විසඳුවේ විස්මයජනක අයුරෙනි. ඒ ගැන සිතන විට මෙම ගැටලුව ඔහුට විසඳීමට නොහැකි වුවහොත් පුදුමයකි.

හෝම්ස් ඔහුගේ පයිප්පයෙන් දුම්ගුලි පිටකරමින් කල්පනා කරමින් සිටියදී, මම නිවසෙන් පිටවී ගියෙමි. පසුදින හැන්දෑවේ මා එහි පැමිණෙද්දී අභිරහස විසඳීමට, හෝඩුවාවන් සියල්ල ඔහුගේ ග්‍රහණයට හසුවී තිබිය යුතු යයි මම විශ්වාස කළෙමි. මේරි සදර්ලන්ඩ් මෙනෙවියගේ මනාලයා කවරෙක් ද? ඔහු අභිරහස් ලෙස අතුරුදන් වූයේ කෙසේද? මෙම ප්‍රශ්න වලට පිළිතුරු දීම හෙට හෝම්ස්ට අපහසු නොවනු ඇත.

පසුදා මුළු දවසම අසාධ්‍ය රෝගියෙකු වෙනුවෙන් ගතකිරීමට මට සිදුවිය. ඔහුගේ ඇඳ සමීපයටම වී ක්‍රියාත්මකව සිටි බැවින්, අන් කිසිවක් මට සිහිවූයේ නැත. හැන්දෑවේ හයට ළං වෙද්දී මට යළිත් නිදහසක් ලැබිණි. අශ්වකරත්තයකට නැගී හැකි ඉක්මනින් මම බේකර් වීථිය බලා පිටත්වී ගියෙමි. අභිරහස විසඳන ආකාරය නැරඹීමට මා ප්‍රමාද වැඩිවේදැයි මගේ සිතේ සැකයක් ද ඇතිවිය. කෙසේ වෙතත් මා එහි යද්දී ෂර්ලොක් හෝම්ස් හාන්සි පුටුවේ එකුටු වී සිටි ආකාරයෙන් මට පෙනුණේ ඔහුට බාගෙට නින්ද ගොස් ඇති අයුරකි. නොයෙක් හැඩයේ හා වර්ණයේ රසායනික ද්‍රව්‍ය අඩංගු බෝතල් හා පරීක්ෂණ නළ රැසක් මේසය මත විය. හයිඩ්‍රොක්ලෝරික් අම්ලයේ තියුණු ගන්ධය කාමරය හරහා හමා යමින් තිබිණ. මගේ මිත්‍රයා ඔහු ඉතා ප්‍රිය කරන රසායන විද්‍යා පරීක්ෂණයක නියැලී සිටි බව මම එයින් වටහාගතිමි.

http://sherlockholmesinvestigations.blogspot.com

"කෝ ගැටලුව විසඳුවද?" මා ඇසුවේ කාමරයට ඇතුළුවෙමිනි.

"ඔව් විසඳුවා. ඒක බයිසල්ෆේට් ඔෆ් බැරීටා."

"නෑ නෑ ඒක නෙමෙයි. අර සදර්ලන්ඩ් අභිරහස විසඳුවද?"

"ආ ඒකද? මං හිතුවා මං පරීක්ෂණ පවත්වමින් හිටි ලවණය ගැන ඇහුවද කියල. ඒකෙ මොකක්වත් අභිරහසක් නැහැනේ. ඒත් මං ඊයේ ඔබට කිව්වා වගේ, එහි සිත් ඇදගන්නා යම් යම් ලක්ෂණ තිබෙන බව නම් ඇත්තයි වොට්සන්. මට තියෙන ලොකුම හිතේ අමාරුව, ඒ තක්කඩියා උසාවි ගෙනියන්න හරිහැටි නීතියක් නැතිකමයි."

"කවුද ඔය මිනිහා? මොකක්ද මේ විදියට මේරි සදර්ලන්ඩ් මෙනෙවිය රවටලා අතර මඟ තනිකර දමා යාමට හේතුව?"

මේ ප්‍රශ්නය මගේ මුවෙන් පිටවී, හෝම්ස් එයට පිළිතුරු දීමට සූදානම් වූවා පමණි. අපේ තරප්පුව නැග උඩුමහලට එන්නෙකුගේ පියවර හඬ ද, ඉන්පසු දොරට තට්ටු කරන හඬ ද ඇසන්නට ලැබිණි.

"මේ අර ගෑනු ළමයාගේ බාප්පා - ජේම්ස් වින්ඩිබෑන්ක් මහත්මයා. අද හවස හයට මා හමුවීමට එන බව ඔහු ලියා එවා තිබුණා.

ඇතුළට එන්න!"

කාමරයට ඇතුළු වූ පුද්ගලයා මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් තිබූ, අවුරුදු තිහක පමණ කෙනෙකි. රැවුල සම්පූර්ණයෙන්ම මුඩුකර සිටි ඔහුගේ හමේ පැහැය මඳක් කහපැහැයට හුරුය. ඔහු සතුවූයේ තියුණු බැලුම් හෙළන අළු පැහැති නෙත් යුවළකි. "ප්‍රශ්නය කුමක්ද" යන බැල්මක් අප වෙත යොමු කළ ඔහු හිස් වැස්ම මේසය මත තබා, ළඟම තිබූ පුටුවේ වාඩිවිය.

"ශුභ සන්ධ්‍යාවක් ජේම්ස් වින්ඩිබෑන්ක් මහත්මයා. මං හිතන්නේ මේ යතුරු ලියනය කළ ලිපිය එවා තිබුණේ ඔබ. මා සමඟ හවස හයට හමුවීමට වේලාවක් යොදා ගත්තේ ඔබ නේද?"

"ඔව් මහත්මයා. විනාඩි ප්‍රමාද වෙන්න සිදුවීම ගැන මට කණගාටුයි. ඔබට තේරෙනවා නේද, මං වෙනත් කෙනෙක් යටතේ වැඩකරන කෙනෙක්. සදර්ලන්ඩ් මෙනෙවිය මේ සුළු ප්‍රශ්නයක්

සම්බන්ධයෙන් ඔබට කරදර කරනවා නේද. ඒ ගැන මට කණගාටුයි. ඔබ නම් හිතන්නේ අපේ පවුල් වල මේ වගේ ප්‍රශ්න, රටපුරා ප්‍රචාරය කරන්න උවමනා නැහැ කියලයි. ඇය මේ වැඩේට මෙහේ ආවෙ, මං එපා කියද්දි. ඇය බොහොම ඉක්මනට කලබල වෙන, හිතූ දෙයක් කරන ගැනු ළමයෙක්. මොකක් හරි දෙයක් ගැන ඇය තීරණයක් ගත්තොත්, ඊටපස්සේ අපි කියන දෙයක් අහන්නේ නෑ. ඔබ පොලිස් සේවයේ නොවෙන නිසා, මං ඒ හැටි ගණන් ගත්තේ නැහැ. ඒ වුණත් පවුලේ තිබෙන ප්‍රශ්න අනෙක් අයට දනුම් දෙන්නේ මොකටද? ඒ හැරත් මේක මහා අපරාදෙ වියදමක් නේ. මේ හොස්මර් ඒන්ජල් කොහොත් හොයන්නද?"

"මං ඒ කතාවට එකඟවෙන්නෙ නෑ මහත්මයා. මට පුළුවනි හොස්මර් ඒන්ජල්ව හොයාගන්න. ඒක මට විශ්වාසයි" හෝම්ස් කීවේය.

වින්ඩිබෑන්ක් මහතා එක්වරම තිගැස්සුණේය. ඔහුගේ අතේ තිබූ හස්තාවරණ බිම වැටිණි.

"ආ! හැබෑට? ඒක අහන්නත් සන්තෝසයි."

"මේක මහා පුදුමාකාර දෙයක්." හෝම්ස් කථාව පටන් ගත්තේය.

"යතුරු ලියනයක වුණත්, මනුස්සයෙකුගේ අත්අකුරු වල වගේ ඒකටම විශේෂ වූ වෙනස් කම් තියෙනවා. අලුත්ම අලුත් යතුරු ලියන දෙකක් හැරෙන්න, පාවිච්චි කළ ඒවා දෙකක් නම්, කොහොමටවත් එක සමාන වෙන්නේ නැහැ. යතුරු ලියනය දිගින් දිගටම පාවිච්චි කිරීමේදී, වෙනස් අකුරු වල විවිධ පැති, විවිධ අයුරින් ගෙවී යනවා.

මේ බලන්න ඔබ මට එවූ ලියුමේ 'e' අකුරේ උඩ හරියේ මඳ නොපැහැදිලි ගතියක් තිබෙනවා. ඒ වගේමයි r අකුරේ පහළ කොටසෙත්. මේ ආදී වශයෙන් ඔබේ යතුරු ලියනයටම විශේෂ වූ ලක්ෂණ දහහතරක් තියෙනවා. මං ඔය සඳහන් කළේ ඉතාම පැහැදිලි දෙකක් පමණයි."

"අපේ සමාගමේ හැම 'ලියවිල්ලක් සඳහාම යොදාගන්නේ මේ යතුරු ලියනයයි මහත්මයා. සැකයක් නෑ. ඒ නිසා යතුරු ලියනය ටිකක් ගෙවී ගිහින් ඇති."

ඔහු පැවසුවේ හෝම්ස් දෙස තියුණු බැල්මක් හෙළමිනි.

"මං දැන් හදන්නේ මං කළ සිත්ගන්නා සුළු අධ්‍යයනයක් ඔබට පෙන්වන්නයි වින්ඩිබෑන්ක් මහත්මයා." හෝම්ස් කීය.

"මං කල්පනා කරනවා ළඟදීම "යතුරු ලියනය හා එය අපරාධ වලට සම්බන්ධ වෙන අන්දම" කියලා කුඩා පොතක් ලියන්න. මේක මම තරමක අවධානයක් යොමු කළ විෂයයක්. අතුරුදන්වුණු හොස්මර් ඒන්ජල් ලියූ ලියුම් හතරක් මා ළඟ තියෙනවා. ඒ හැම ලියුමක්ම ලියලා තියෙන්නේ එකම යතුරු ලියනයෙන්. පුදුමය කියන්නේ ඒ හැම ලියුමකමත් මං අර කලින් කිව් වෙනස්කම් තියෙනවා. e අකුර, අනෙක් අකුරකට ලංවී නොපැහැදිලිව වැදිලා. r අකුරේ යට කොටසේ අඩුපාඩුවක් තියෙනවා. ඔබ මගේ කාච්ය අරගෙන පරීක්ෂා කරල බැලුවොත් පෙනේවි, ඒ වෙනස්කම් සහ තවත් වෙනස්කම් දහහතරක් මේ හැම ලියුමකම තිබෙන හැටි."

වින්ඩිබෑන්ක් මහතා එක්වරම පුටුවෙන් නැගිට තම හිස්වැස්ම දමාගත්තේය.

"මේ වගේ වැඩකට නැති කථා ගැන මට තවත් කාලය නාස්තිකරන්න බැහැ හෝම්ස් මහත්මයා. ඔබට පුළුවන් නම් ඒ මිනිහව අල්ලා ගන්න එක කරන්න. ඊට පස්සේ මට දැනුම් දෙන්න මිනිහා අල්ලා ගත්තා කියල."

"සත්තකින්ම ඔව්." යයි පැවසූ හෝම්ස් අඩි කිහිපයක් ඉදිරියට තබා දොරේ යතුරු කරකවා අගුළු දැම්මේය.

"එහෙනම් මං ඔබට දැනුම්දෙන්නේ, මිනිහව අල්ලා ගත්තා."

"මොනවා? කෝ කොහේද?"

වින්ඩිබෑන්ක් කෑගැසුවේය. ඔහුගේ මුහුණ සම්පූර්ණයෙන්ම සුදුමැලි වී තිබිණි. ඔහු වටපිට බැලීමට පටන් ගත්තේ උගුලකට අහුවූ මීයෙකු විලසිනි.

"මෙතෙන් ඒ තරම් ලේසියෙන් බේරෙන්න බැහැ වින්ඩිබෑන්ක් මහත්මයා. මේක බොහොම විනිවිද පෙනෙන දෙයක්. මේ සරල ප්‍රශ්නය මට විසඳන්න බැහැ කියලා ඔබ කිව්වා නේද? ඒක මට කළ අපහාසයක් ගණනයි. කමක් නෑ! වාඩිවෙන්න ඔය පුටුවෙන්. අපි කථාකරමු ඒ ගැන."

holmesinvestigations.blogspot.com



74. ඔහු වටපිට බැලීමට පටන්ගත්තේ උගුලකට අසුවූ මීයෙකු විලසිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

අපේ අමුත්තා පුටුවක් මතට ඇදවැටුණේ ක්ලාන්ත වූ අයුරෙනි. අවතාරයක් දුටු කලක මෙන් ඔහුගේ මුහුණේ හිනිය ප්‍රභාග විය. ඔහුගේ නළල ඩහදියෙන් තෙත් වී තිබිණි.

"ඒක. . . . ඒකට විරුද්ධව නීති මාර්ගයෙන් කටයුතු කරන්න බෑ."

"ඔව්. මටත් හරි කණගාටුයි එහෙම කරන්න බැරි එක ගැනයි. ඒ වුණත් වින්ඩිබෑන්ක් මං තමුසෙට කියන්නම්. මට මේ තරම් කාලයකට දකින්න ලැබුණු කෲරේ, ආත්මාර්ථකාමී, අනුකම්පා විරහිත ප්‍රයෝගයක් මේක. තමුසෙ ඒක කළේ කොහොමද කියල මං කියන්නම්. මං වැරදි නම් ලපන්වා දෙනවා."

පුටුවේ හැකිළී, මුහුණ බිමට යොමුකරගත් අමුත්තා නිහඬව සිටියේය. හෝම්ස් කථා කළේ අනුන්ට නොව තමාටම කියාගන්නා ආකාරයෙනි.

"මිනිහා තමන්ට වඩා බොහොම වයසින් වැඩි ගෑනු කෙනෙක් කසාද බැන්දා. මොකටද? ඇයගේ සල්ලි වලට තියෙන තණ්හාව නිසා. බිරිඳගේ විතරක් නෙමෙයි, ගෙදර ඉන්න ඇයගේ දුවගේ මුදලුත් ඔහු සතුටින් වියදම් කළා. ඒක සෑහෙන මුදලක්. ඔවුන්ගේ තත්ත්වයේ හිටි අයට මෙම මුදල අහිමි වී ගියොත් ඒකෙ පාඩුව විශාල වශයෙන් දනෙන්න ඉඩ තිබුණා. ඒ හින්දා ඒක හැමදාම තමාටම තබාගන්න උත්සාහයක් දරන එක වටිනවා.

තරුණ දුවණිය අනුන්ට ප්‍රියමනාප, හොඳ පෙනුමක් ඇති මිත්‍රශීලී කෙනෙක්. ඒ නිසා ඇය වැඩි කාලයක් විවාහ නොවී ඉඳීවි කියල හිතන්න අමාරුයි. නමුත් ඇය විවාහ වුණොත් මොකද වෙන්නෙ? බාප්පටයි අම්මටයි අවුරුද්දකට පවුම් සියයක මුදලක් අහිමි වෙනවා. ඒක වළක්වාගන්න බාප්පා මොකද කරන්නේ? ඔහු ඒකට පහසුම ක්‍රියාමාර්ගය අනුගමනය කරනවා. ඇයට කොහේවත් යෑම, ඇයගේ වයසේ අය ආශ්‍රය කිරීම තහනම් කරනවා. ඇයව ගෙදරම රඳවාගන්නවා. නමුත් ඔහුට ඉක්මනටම තේරුම් යනවා, මේ විධියට හැමදාමත් ප්‍රශ්නය විසඳන්න බැරි බව. තමන්ගේ අයිතිවාසිකම් ගැන ඇය හඬගා කියනවා. තමන් බාල්නැටුමට සහභාගි වෙන එක අන් අයට නවත්වන්න බැරි බව ඇය දනුම් දෙනවා.

http://sherlockholmesinvestigations.blogspot.com

මේව ඇහුණාම බාප්පා මොකද කරන්නේ? ඔහු බොහොම දක්ෂයෙක්, ඔහුට එනවා අදහසක්. මේක බොහොම කෲර තින්දින වැඩක්. ඒත් තමන්ට වාසියි. තමන්ගේ බිරිඳගේ උදව්වෙන් ඔහු වෙස්මාරු කරගන්නවා. කපටි ඇස් දෙක වැහෙන්න අව්කණ්ණාඩි යුගලක් පැළඳ ගන්නවා. බොරු උඩුරැවුලක් සහ "සයිඩ් බර්න්ස්" මුහුණේ අලවා ගන්නවා. කටහඬ අඳුනාගන්න ඉඩ තියෙන නිසා කෙඳිරිල්ලක ප්‍රමාණයට ඒක වෙනස් කරගන්නවා. ඔහු පෙනී ඉන්නවා හොස්මර් ඒන්ජල් නමින්. අර තරුණියගේ ඇස් පෙනීමේ දුර්වලකම ප්‍රයෝජනයට අරගෙන, ඇයට ආදරය කරන්න ඉදිරිපත් වෙනවා. මොකටද? වෙනත් පිරිමියෙකු ඇයට ආදරය ප්‍රකාශ කරලා විවාහ කරගන්න එක නවත්වන්න."

"ඒක අපි මුලින් කළේ විහිළුවක් විදියට. ඇය ඒක මේ තරම් හිතට ගනීවි කියල අපි හිතුවේ නැහැ."

"නැතිවෙන්න පුළුවන්. නමුත් ඇය ඒක හිතට ගත්තා. ඇගේ බාප්පා ප්‍රංශයේ ඇති කියන විශ්වාසය නිසා, මේ කූට ප්‍රයෝගය ගැන යන්තමින් හෝ සැකයක් ඇගේ හිතට පහළ වුණේ නැහැ. තමන් විවාහ කරගන්නා අදහසින් ආ මහත්මයා පෙන්වූ උනන්දුව නිසා, ඇය හරි සතුටට පත්වුණා. අම්මත් එළිපිටම කැමැත්තක් දැක්වූ නිසා ඒ සතුට දෙගුණ තෙගුණ වුණා. ඊළඟට ඒන්ජල් මහත්මයා ගෙදරට යන්න එන්න පටන් ගත්තා. ඒ මොකටද? මේ රහපෑමෙන් සම්පූර්ණ ප්‍රයෝජනය අත්වෙන්න නම්, වංචාව තවත් ඉදිරියට ගෙන යා යුතුයි. ඊළඟට විවාහ ගිවිස ගැනීමක් මගින් තරුණියගේ හිත වෙනත් අතකට ඇදීයාම වැළැක්වූවා.

නමුත් මේ කූට වංචාව හැමදාමත් කරගෙන යන්න පුළුවන් එකක් නෙමෙයි. බොරුවට ප්‍රංශයට යනවා කිව් ගමන් බොහොම කරදර වැඩ. මේකෙ මොනවා හරි සතුටුදායක කෙළවරක් දකිය යුතුයි. ඒ කෙළවරකට පැමිණීම තරුණියගේ හිතට බොහොම හැඟීම් දනවන ආකාරයට කළ යුතුයි. ඇගේ සිතේ දැඩි වේදනාවක් ඇතිවී, විවාහය ගැන සදාකාලිකවම කලකිරීමක් ඇතිවෙන ආකාරයට කළ යුතුයි. එතකොටයි, තව සෑහෙන කලකටවත් ඇය ගෙදර රඳවාගෙන, මුදල් ටික වංචා කළ හැක්කේ. ඒ නිසා තමයි බයිබලයේ අතගසා දිවුරන්න කීවෙත්; මහුල් දවසේ මොනවා හරි අන්තරායකට මුහුණ පෑමට ඉඩ ඇති බව හැඟවූයෙන්.

ජේම්ස් වින්ඩිබෑන්ක්ගේ උවමනාව වුණේ සදර්ලන්ඩ් මෙනෙවියගේ හිත සැහෙන කාලයකට හොස්මර් ඒන්ජල්ට බන්දවල තියන්නයි. තමන්ගේ අවිනිශ්චිත ඉරණම ගැන කියලා, යළිත් එන බව ඇයගේ හිතට දාලා, තමා වෙනුවෙන් බලා ඉන්න ඇයව පොරොන්දු කරගත්තා. එතකොට තවත් අවුරුදු දහයකට ඇය වෙන මිනිහෙකුගේ වචනයට කන් දෙන්නේ නෑ. විවාහ මංගල්‍යයක් හිතේ මවලා ඇයව දේවස්ථානයේ දොරටුව දක්වා යන්න සැලැස්වුවා. ඊළඟට පරණ ප්‍රයෝගයක් යොදලා තමන් ගිය අශ්වකරත්තයෙන් අතුරුදන් වුණා. අශ්වකරත්තයේ එක දොරකින් ඇතුළු වී අනෙක් දොරෙන් පිටවී ගියා. මං හිතන්නේ කටයුතු ටික සිද්ධවුණේ ඒ පිළිවෙළටයි. එහෙම නේද වින්ඩිබෑන්ක් මහත්මයා?"

හෝම්ස් කථාකරගෙන යන අතරතුරදී තම සිතට ධෛර්ය ගත් අමුත්තා පුටුවෙන් නැගිට්ටේය. ඔහු කථාව පටන්ගත්තේ උපහාසාත්මක සිනාවක් ද පාමිනි.

"ඒක එහෙම වෙන්නත් පුළුවනි, නොවෙන්නත් පුළුවනි. හෝම්ස් මහත්තයෝ. ඔහේ ඔය තරම් දේවල් දන්නවා නම් මේ ටිකත් දන්නවා ඇති. මෙතැන දත් නීති විරෝධී දෙයක් කරන්නෙ කවුද ඔහේද මමද? නීති විරෝධී දෙයක් මං මුල ඉඳලම කරල නෑ. නමුත් මෙතැන දොර යතුරු දමාගෙන මාව බලෙන් හිරකර ගෙන සිටීම නීතියට එකඟද? බලෙන් රඳවා තබාගැනීමත් පහරදීමට තැත් කිරීම වගේම නීති විරෝධී දෙයක්."

"ඔහේ කියන්න වගේ නීතියෙන් ඔහේට දඬුවම් කරන්න බැරි බව ඇත්තයි."

හෝම්ස් පැවසුවේ දොරේ අගුළු විවෘත කරමිනි.

"ඒ වුණත් දැඩි දඬුවම් ලැබීමට ඊට වඩා සුදුසු පුද්ගලයෙක් අපට හොයාගන්න බෑ. මේ තරුණියට සහෝදරයෙක් හෝ මිත්‍රයෙක් සිටියා නම් තමුසෙට ලැබෙන්නෙ කස පහර. දෙයියම්පා! මගේ අනුග්‍රාහකයා වෙනුවෙන් වරදකරුවන්ට දඬුවම් ලබාදීමට මට බලතල නෑ. ඒ වුණත් මා ළඟ තියෙනවා දඩයමේ කසයක්. ඒ හින්දා මං හිතන්නේ. . . ."

හෝම්ස් අඩියක් දෙකක් ඉදිරියට තබද්දීම ජේම්ස් වින්ඩිබෑන්ක් විදුලි වේගයෙන් කාමරයෙන් එළියට පැන දිව්වේය. සැනෙකින්

http://allbooksfromsavindumdulbooks.blogspot.com



78. හෝම්ස් අඩියක් ඉදිරියට තබද්දීම ඔහු කාමරයෙන් පැන දිව්වේය.

http://sherlockholmesinvestigations.blogspot.com

තරප්පු පෙළ බැසගිය ඔහු, පාර දිගේ වේගයෙන් දිවයනු අපි ජනේලයෙන් දුටුවෙමු.

"නින්දා සහගත අධමයෙක්."

හෝම්ස් සිනාසෙමින් කීවේ, යළිත් පුටුවේ හිඳගනිමිනි.

"ඔය යක්ෂයා අපරාධ එකින් එක කර කර ඉදිරියට ගිහින් එල්ලුම් ගහේ තමා අන්තිමට නවතින්නේ. මේ පරීක්ෂණයේ යම් තරමකට සිත් ගන්නා සුළු ලක්ෂණ නැත්තේම නැහැ."

"හෝම්ස් ඔබ මේ නිගමන වලට ආ හැටි හැම තැනක්ම මට ඒ තරම් පැහැදිලි නෑ."

"මට මුල ඉඳලම තේරුණා වොට්සන්, හොස්මර් ඒන්ජල්ගේ පුදුමාකාර හැසිරීමේ යම් අරමුණක් ඇති බව. ඒ වගේම මට වෙනත් කරුණකුත් පැහැදිලි වුණා. මේ සිදුවීමෙන් වැඩි වාසි සැලසෙන්නේ වෙන කාටවත් නොවෙයි, ඇගේ බාප්පාටයි. ඊළඟට මිනිසුන් දෙදෙනා කිසිවිටෙක එකට නොසිටීම සැකයට තවත් කාරණයක් වුණා. එක්කෙනෙක් මතුවෙන්නේ අනෙකා ගියාට පස්සේ. ඒකෙන් යමක් පැවසෙනවා. කළුපැහැ උපැස් යුගලත්, වෙනස් වූ කෙඳිරිලි කටහඬත් වෙස්වලා ගැනීමේ ලක්ෂණ. ඒ වගේමයි රචවට වැඩුණු "සයිඩ් බර්න්ස්." ලිපි හැම එකකම අත්සන වෙනුවට නම යතුරු ලියනය කර තිබුණු එකෙන්, මගේ සැකයන් හැම එකක්ම තහවුරු වුණා. වින්ඩිබෑන්ක්ගේ අත්අකුරු සදර්ලන්ඩ් මෙනෙවිය හොඳින් දන්නවා. ඒ නිසා ඔහු ලිපි ලියන්න යතුරු ලියනය යොදාගන්න තීරණය කළා. ඔබට පෙණෙනවා නේද හෝඩුවාවන් සියල්ල අප යොමු කරන්නේ එක් දිසාවකට බව."

"ඔබ කොහොමද ඒවා සත්‍ය බව සැකහැර දනගත්තේ?"

"මිනිහා කවුද කියල හොයාගත්තට පස්සේ, කාරණා වල ඇත්ත නැත්ත තහවුරු කරගැනීම ඒ තරම් අපහසු නැහැ. ඔහු සේවය කළ සමාගම මොකක්ද කියල මං දන හිටියා. පුවත්පතේ පළවූ දන්වීම අරගෙන, ඒකෙ තිබුණු ප්‍රධාන පුද්ගල ලක්ෂණ ටික මං තෝරා ගත්තා. වෙස්මාරු කර ගැනීමකින් ලබාගත හැකි කළු උපැස්යුගළ රැවුළ වගේ ඒවා මං ඉවත්කළා. ඊළඟට එවැනි පෙනුම ඇති කෙනෙක්, වයින් පරීක්ෂා කිරීම සඳහා යන නියෝජිතයෙක් ලෙස ඔබ ආයතනයේ සේවය කරනවාද කියල මං

ඒ සමාගමට ලිපියක් යැව්වා. මේ වනවිටත් ඒන්ජල්ගේ ලියුමේ තිබුණු යතුරු ලියනය මගින් සටහන් වූ "විශේෂ අඩුපාඩු" මං නිරීක්ෂණය කරලයි තිබුණේ. මං වින්ඩිබෑන්ක්ටත් ලියුමක් යැව්වා මෙහේට ඇවිත් මාව හමුවෙන්න කියලා. මං බලාපොරොත්තු වූ විධියටම ඔහු පිළිතුරු එව්වේ යතුරු ලියනයෙන් ලියලා. හොස්මර් ඒන්ජල්ගේ ලිපිවල මං දුටු ඒ විශේෂ අඩුපාඩු වින්ඩිබෑන්ක්ගේ ලියුමෙත් ඒ විධියටම තිබුණා. ඒ තැපෑලෙන්ම මට ආවා වෙස්ට්හවුස් සහ මාබෑන්ක් සමාගමෙන් ලියුමක්. ඔවුන් කියා එව්වේ, මා අසා යැවූ විස්තරය, ඔවුන්ගේ සේවක ජේම්ස් වින්ඩිබෑන්ක්ට හොඳින් ගැළපෙන බව. තවත් මොනව තහවුරු වෙන්නද?"

"දන් සදර්ලන්ඩ් මෙනෙවිය මොනවා කියාවිද?"

"මං මේ දේ ඇයට කිව්වොත් ඇය ඒක විශ්වාස කරන එකක් නැහැ. ඔබට මතක තියෙනවද වොට්සන් පර්සියාවේ පුරාණ ආප්තෝපදේශයක් තියෙනවා. ව්‍යාඝ්‍ර පැටියෙක් ළං කරගන්නා මිනිහෙක් තමන්ට කරගන්නේ මහා අන්තරායක්. ඒ වගේම ගැහැනියකගේ සිතේ ඇතිවූ මිථ්‍යා අදහස් නැතිකරන්න හදන පුද්ගලයාටත් ඇත්තේ එවැනිම අන්තරායක්."

http://sherlockholmesinvestigations.blogspot.com

# දියමන්ති ඔටුන්න

Reading Purpose Only - Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# දියමන්ති ඔටුන්න

එක් උදෑසනක අපේ නිවහනේ උඩුමහලේ, ඉදිරිපස කවුළුවෙන් වීදිය දෙස බලාගෙන සිටි මම, මගේ මිත්‍රයා ඇමතුවෙමි.

"මේ බලන්න හෝම්ස්, මේ බලන්න. පිස්සු හැදුණු මිනිහෙක් තනියම පාරේ ඇවිදගෙන එනවා. ඔහුගෙ නෑදෑයො ඔහුට මේ විධියට තනියම පාරේ බැහැල යන්න ඉඩ ඇරල තියෙන එක මොනතරම් කණගාටුවට කරුණක්ද?"

මගේ මිත්‍රයා ඔහු හිඳගෙන සිටි හාන්සි පුටුවෙන් නැගිට්ටේ අලස ආකාරයෙනි. පිටකබායේ සාක්කු දෙකට දෑත් රුවාගෙන ඔහු මගේ උරහිසට උඩින් වීදිය දෙස බැලුවේය. ඒ එක් පෙබරවාරි මාසයක පැහැබර කාලගුණයක් පැවැති දීප්තිමත් උදෑසනකි. ශීත සෘතුව නිසා කලින්දා රාත්‍රියේ ද තදින් හිම වැටීමක් පැවැතිණ. ඒ හිම, උදෑසන හිරු එළියේ බැබළෙන අයුරු බැලීමට ආශා උපදවන අපූරු විය. බේකර් වීදියේ මැදට වන්නට, හිම දුඹුරු පැහැයට හැරී, නගුලකින් හාරා දැමුවාක් මෙන් දිස්විය. ඒ අශ්වකරත්ත ගමනාගමනය නිසයි. පාරේ ලිස්සනසුලු ස්වභාවය නිසා, පයින් ගියේ ඉඳහිට කෙනෙක් පමණි. ඇත්තෙන්ම මෙට්‍රොපොලිටන් දුම්රියපොළ දෙසින් ඇවිද ආවේ මා කලින් සඳහන් කළ පුද්ගලයා පමණි.

අවුරුදු පනහක් පමණ වයස් වූ ඔහු, උස මහත සිරුරක් තිබූ අයෙකි. වැදගත් පෙනුමක් තිබූ ඔහුගේ මුහුණ, බොහෝ සෙයින් රළු වැටී තිබිණි. මේ, ජීවිතයේ මුහුණදීමට සිදුවූ අත්දැකීම් සම්භාරය ප්‍රකාශ කළ ආකාරය විය යුතුය. අළු පැහැති කලිසමකින් ද කළු කබායකින් ද සැරසී දිලිසෙන හිස්වැස්මක් පැළඳ සිටි ඔහු, ඇඳුමෙන් නම් චන්පොහොසත්කම් ඇති පුද්ගලයෙකු ලෙස දිස්විය. එහෙත් හැසිරීමේ වූයේ ඊට වෙනස් ස්වභාවයකි. විටෙක ඔහු


http://sherlockholmesinvestigations.blogspot.com

වේගයෙන් පියවර කිහිපයක් ඉදිරියට දුව ආවේය; විටෙක හතිදමමින් නැවතුණේය; දෙපා වෙහෙසා ඇවිදීමට නුහුරු බවක් දක්වමින් අපහසුවෙන් උඩ පැන්නේය. ඔහු, දෑත් ඉහළටත්, පහළටත්, රවුමටත් කැරකුවේ උමතුබවේ ලක්ෂණ පෙන්වමිනි. එම ලකුණු වඩාත් පැහැදිලි වූයේ, නොයෙක් විකාර මුහුණු සාදමින් හිස පැම අතටම සෙලවූ ආකාරය නිසයි.

"මේ මිනිහට මොකක් වෙලාද මං දන්නේ නෑ? ඔහු ගෙවල්වල අංක සෝදිසි කරමිනුයි එන්නෙ"

"මං හිතන්නේ ඔහු එන්නේ මෙහේටයි." හෝම්ස් කීවේ දෑත් එකට පිරිමදිමිනි.

"මෙහේට?"

"ඔව්. මට හිතෙනවා ඔහුගේ ගැටලුවක් නිරාකරණය කර ගැනීමට මාව හමුවෙන්නයි එන්නේ. ඔහුගේ රෝග ලක්ෂණ මට හඳුනාගන්න පුළුවනි. හ හා! මං ඔබට කිව්වෙ නැද්ද?"

හෝම්ස් එසේ කියද්දීම, වීථියේ ඇවිද ආ කැනැත්තා අපේ දොර දෙසට පැන්නේ කටින් පිඹිමිනි. අනතුරුව ඔහු අපේ සීනු ලනුවෙන් ඇද, සීනුව දිගින් දිගටම නාද කළේ, ඒ හඬින් මුළු ගොඩනැගිල්ලම කම්පනය වන අයුරෙනි.

මොහොතකින් ඔහු අපේ කාමරයට පිවිසියේය. ඒ නවමත් කටින් පිඹිමින් හති දමමිනි. විකාර අයුරෙන් මුහුණේ හැඟුම් පළකිරීම තවමත් එසේමය. එහෙත් ඔහුගේ දෑසේ දිස්වූයේ අතිශය කම්පාවට පත් දුක්ඛදායක ස්වභාවයකි. ඒ දුටු සැනින් අපේ මුහුණු වල මතුවූ සිනාරැළි අතුරුදන් වී ගියේය. අපේ සිත්වල ඇතිවූයේ දැඩි අනුකම්පාවකි. ඔහුට එක්වරම කිසිවක් කථාකර ගැනීමට නොහැකි විය. මීළඟට සිරුර ඒ මේ අතට පැද්දීමට පටන්ගෙන, තම හිසකෙස් අතැඟිලි වලින් අදින්නට පටන් ගත්තේ උන්මත්තකයකු මෙනි. අනතුරුව එක්වරම පුටුවෙන් නැගී සිටි ඔහු, තම හිස බිත්තියේ හප්පාගත්තේය.

වහාම එතැනට ඇත, අපි ඔහු කාමරය මැදට ගෙන ආවෙමු. සැපපහසු පුටුවක් ඇද, අමුත්තා එහි වාඩිකළ හෝම්ස් ඒ සමීපයෙන්ම අසුන්ගත්තේය. අනතුරුව ඔහු අමුත්තාගේ අතට තට්ටු

කරමින්, ඔහුගේ හිත සන්සුන් වන අයුරින් සුහද කතාබහක් ඇරඹුවේය.

"ඔබ මෙහේට ආවෙ ඔබේ ප්‍රශ්නයක් ගැන මට කියන්නයි. එහෙම නේද මහත්මයා? හිත කලබල වීම නිසා ඔබ හරි මානසික පීඩාවකට පත්වෙලයි ඉන්නෙ. හිත සන්සුන් වෙනතුරු ටිකක් වෙලා ඉමු. ඊට පස්සේ ඔබේ ගැටලුව ඉදිරිපත් කරන්න. එතකොට ඔබට ඇති ඕනෑම ප්‍රශ්නයක් ගැන කන්දෙන්න මං සූදානම්. එය විසඳීමට මගේ කැමැත්තෙන්ම මං සම්පූර්ණ උත්සාහය යොදන්නම්" හෝම්ස් කිවේ අමුත්තා අස්වසමිනි.

තම හැඟීම්බර සිතේ අවුල් සහගත බව අඩුවන තුරු අමුත්තා මිනිත්තු කිහිපයක්ම සිටියේය. අනතුරුව ලේන්සුව ගෙන නළලේ ඩහදිය පිසදමමින් මුහුණ අප දෙසට හැරවුවේය.

"සැකයක් නෑ. ඔබට හිතෙනවා ඇති මට පිස්සු කියලා?"

"මට පෙනෙනවා ඔබට මහ බරපතල කරදරයකට මුහුණපාන්න සිදුවී තිබෙන බව" හෝම්ස් පිළිතුරු දුන්නේය.

"දෙවියො තමා දන්නෙ මගේ කරදරේ ගැන මහත්මයා. මේක මොන තරම් බරපතල විපතක්ද කිව්වොත් මගේ මොළේ දන් නරක් වෙලා. ජීවිතේටම කාගෙන්වත් නින්දා අපහාසයක් විඳල නැති මට මුළු රටේම ජනතාවගෙන් ලැබෙන්න ඉඩ තියෙන අවමානය ගැන හිතන්න. සිදුවී ඇති අලාභය නිසා මට විඳින්න සිදුවී ඇති සිත්වේදනාව අප්‍රමාණයි. මේ දෙකේ බරපතලකම ගැන හිතනකොට කොයිතරම් වේදනාකාරීද කිව්වොත්, මගේ ආත්මයට නම් ගැලවීමක් නැහැ. මේ නින්දා අපහාස විඳින්න වෙන්නේ මට විතරක් නෙමෙයි. මේ ගැටලුව විසඳුණේ නැත්නම් මේ රටේ ඉන්න උතුම් ම, ශ්‍රේෂ්ඨතම පුද්ගලයාටත් මේකෙන් ලැජ්ජාවට පත්වෙන්න සිදුවෙනවා."

"කරුණාකරලා ඔබේ හිත සන්සුන් කරගන්න මහත්මයා. ඊළඟට මට පැහැදිලිව විස්තර කරන්න ඔබ කවුද, මොකක්ද ඔබට ඇතිවී තිබෙන ප්‍රශ්නය කියලා."

"මගේ නම ඔබ අහල පුරුදු ඇති. මම ත්‍රෙඩ්නීඩ්ල් වීථියේ හෝල්ඩර් සහ ස්ටිවන්සන් බැංකු සමාගමේ ඇලෙක්සැන්ඩර් හෝල්ඩර්" http://sherlockholmesinvestigations.blogspot.com

මෙය ඇත්තෙන්ම අප අසා හුරුපුරුදු නමකි. ලන්ඩන් නගරයේ ප්‍රධානතම බැංකු හා මූල්‍ය සමාගම් අතුරින් අංක දෙකට පිහිටි බැංකුව ඉහත කී ආයතනයයි. මේ මහතා එම බැංකුවේ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂකවරයායි. රටේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයකු මෙවැනි අන්ත අසරණ, දුක්ඛිත, සිහිවිකල් තත්ත්වයට පත්වීමට හේතුව කුමක්ද? ඔහු දැඩි උත්සාහයක් දරා කථාව අරඹන තුරු අපි ඉමහත් කුතුහලයෙන් බලා සිටියෙමු.

"කාලය ඉතාම වටිනා බව මට හොඳින් තේරෙනවා. ඒ නිසාමයි පොලිස් පරීක්ෂකවරයා, ඔබෙන් උදව් ලබාගැනීම වඩා සුදුසුයි කියල මට කිව්ව වහාම මං මේ දුවගන ආවෙ. උමං දුම්රියෙන් බේකර් වීථියට ඇවිත් දුම්රියපොළේ ඉඳල මං ආවෙ පයින්. ඒ මොකද මේ හිම වැටුණු පාර වල කුලී රථ යන්නෙ හරිම හෙමින්. ඒ නිසයි මට මේ තරම් හති. මම ඒ තරම් ඇඟ වෙහෙසෙන ව්‍යායාම කරන කෙනෙක් නෙමෙයි. දැන් නම් මට ඇඟට පහසුයි. කාරණා හැම එකක්ම කෙටියෙන්, නමුත් හැකිතරම් පැහැදිලිව මං ඔබට කියන්නම්.

ඔබ හොඳින් දන්නවා ඇති බැංකු ක්ෂේත්‍රයේ දියුණුවක් ලබන ආකාරය. ගනුදෙනු කරුවන් ඔවුන්ගේ ගිණුම් වල අප ළඟ තැන්පත් කරන මුදල්, අපි වැඩි පොලියට ණයට දෙනවා. මෙහිදී අප ඇපයක් වශයෙන් ළඟ තබාගන්නා දේ සියයට සීයක්ම විශ්වාස කටයුතු වටිනා දෙයක් වියයුතුයි. පසුගිය අවුරුදු කීපය ඇතුළත මේ විධියට මුදල් ණයට දීලා අපි විශාල වශයෙන් ලාභ ලැබුවා. එංගලන්තයේ ඉහළම පෙළේ පවුල් රාශියකටම අපි මේ ආකාරයට මුදල් ණයට දීලා තියෙනවා. ඔවුන් සමහර වෙලාවලදී ඇපයට තියන්නේ වටිනා පෞරාණික චිත්‍ර, පෞද්ගලික පුස්තකාල ආදී දේ.

ඊයෙ උදේ මම අපේ බැංකුවෙ, මගේ කාර්යාලය තුළ වාඩිවෙලා හිටියා. ලිපිකරුවෙක් ආගන්තුක පතක් මා වෙත ගෙන ආවා. එහි සඳහන්ව තිබූ නම දුටු විගස මං තිගැස්සීමට පත්වුණා. ඒ මොකද ඒ වෙන කවුරුවත් නෙමෙයි ............ නෑ .......... ඔබට වුණත් ඒ කවුද කියල මං හෙළිකරන එක වැරැද්දියි. ඔහු කවුරු වුණත් මුළු ලෝකයේම මිනිස්සු ඔහුව හඳුනනවා. ඔහු ඉතාම සුප්‍රසිද්ධ කෙනෙක්. හැම ගෙදරකම හැම කෙනෙකුගේම මුවග රැඳෙන සුප්‍රසිද්ධ නමක්.

http://sherlockholmesinvestigations.blogspot.com

එංගලන්තයේ ඉතාම ඉහළම ප්‍රභූවරයා, ශ්‍රේෂ්ඨතමයා. ඔහු මා ළඟට පැමිණීමෙන් මට දක්වූයේ විශාල ගෞරවයක්. මට ඒ සතුට ඉවසාගන්න බැරිව ගියා. කොහොම වුණත් ඔහු ආව ගමන් කෙළින්ම වැඩේට බැස්සා. අප්‍රසන්න කටයුත්තක් කරන්න තියෙන කෙනෙක්, ඒක ඉක්මනට ඉවරයක් කරල දාන්නයි කැමැති. ඔහු ඒ විධියට කථාව පටන්ගත්තා.

"හෝල්ඩර් මහත්මයා. මට දැනගන්න ලැබුණා ඔබ මුදල් ණයට දෙන බව?"

" ඔව්. ඇපය සතුටුදායක නම් බැංකුවෙන් ණය දෙනවා"

"මට පවුම් පනස්දාහක් මේ දන් උවමනා වෙලා තියෙනවා. මේ වගේ සුළු මුදලක් නෙමෙයි; ඒ වගේ දහගුණයක මුදලක් වුණත් මට මගේ යාළුවෙකුගෙන් ණයට ගන්න පුළුවනි. ඒ වුණත් මං කැමැති නැහැ, ඒ විධියට කාටවත් හිස නමන්න. මං වැඩිය කැමැතියි ගනුදෙනුවක් හැටියට නියම පිළිවෙළට මමම ඒක කරන්න. මං දරන තනතුරේ හැටියට කාගෙන් හරි ඒ විධියට ණය මුදලක් අරගෙන, ඒ පුද්ගලයාට යටත්වෙන එක නුවණට හුරු නැහැ. ඒක ඔබට පැහැදිලිවම පෙනෙනවා ඇති."

"ඔබතුමාට මේ මුදල උවමනා කොයිතරම් කාලෙකටද කියල මං ඇහුවොත්?"

"ලබන සඳුදා මට විශාල මුදලක් ලැබෙන්න නියමිතයි. එතකොට ඔබගෙන් ගන්නා ණය මුදල නොවරදවාම ගෙවනවා. ඒ ණය විතරක් නෙමෙයි, ඒක වෙනුවෙන් මා ගෙවිය යුතු, ඔබ නියම කරන පොලියත් මං ගෙවනවා. කොහොම හරි අර මුදල නම් මට දන් වහාම උවමනායි"

"ඔය ලියකියවිලි මොකුත් නැතිව මගේ පෞද්ගලික මුදල් වලින, බොහොම සන්තෝෂයෙන් ඔබට ණයක් දෙන්න තිබුණා. ඒ වුණත් මේ තරම් විශාල මුදලක් මට එක්වරම දරාගන්න අමාරුයි. අනෙක් අතට බැංකුවෙන් ඒ මුදල ඔබට ලබාදෙනවා නම්, ඒක පෞද්ගලික පිළිවෙළට කරන්න විධියකුත් නැහැ. ඒ මොකද මං මේ බැංකුවේ තනි අයිතිකාරයා නෙමෙයි. මගේ අතික් හවුල්කාරයාට අසාධාරණයක්, නොවෙන්න, සාමාන්‍යයෙන් ණය මුදලක් නිකුත් කරන පිළිවෙළට ඕ ණය කරන්න වෙන්නෙ.

"මං මුදල් ණයට ගන්න කැමැතින් ඒ පිළිවෙළට තමයි හෝල්ඩර් මහත්මයා."

ඔහු කිව්වා. එහෙම කියලා, ළඟ තිබුණු පුටුව මත ඔහු තැබූ කළුපාට සමෙන් නැනූ හතරැස් පෙට්ටියක් අතට ගත්තා.

"සැකයක් නෑ, ඔබ අහල ඇති මාණික්‍ය ඔටුන්න ගැන?" ඔහු ඇසුවා.

"බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේම තිබෙන වටිනාම වස්තුවලින් එකක්?"

"හරියටම හරි" එහෙම කිවූ ඔහු අර පෙට්ටිය විවෘත කළා. ඒ ඇතුළත රෝස පැහැති විල්ලුද මත තැන්පත් කර තිබුණේ ඔහු කිවූ ඉතාම සුවිශේෂ ඒ වගේම අලංකාර ආභරණයයි.

"මේ ඔටුන්නේ සවිකර තිබෙනවා, ලෝකයේ ඉතාම දුර්ලභ, ඉතාම වටිනා වෛවර්ණ මැණික් - දියමන්ති තිස් හවයක්. ඒවා එකට බැඳලා තිබෙන රන්තහඩුවේ වටිනාකම මිල කරන්න බැහැ.

ඔටුන්නේ වටිනාකම අන්තිම අඩුවෙන් තක්සේරු කළත්, මං ඔබෙන් ඉල්ලූ මුදල වගේ දෙගුණයක් වටිනවා. මං කැමැතියි, මං ගන්නා ණය මුදල වෙනුවෙන් ඇපයට මේ ඔටුන්න තියල යන්න"

මං ඔහු දිහා බැලුවේ අවිශ්වාසෙන්.

"මේකෙ වටිනාකම ගැන ඔබට සැකද?" ඔහු ඇසුවා.

"කිසිසේත් නැහැ. මට ඇති එකම සැකය . . . . ."

"ඔව්. මං දන්නවා. මේ වගේ මුළු රටටම අයිති වස්තුවක් මං ඇපයට තබා යාම ගැනයි සැක. එහෙම නේද? ඒ ගැන කිසිම සැකයක් හිතේ ඇතිකර ගන්න එපා. දවස් හතරකින් අර මුදල මා අතට ලැබෙන බව මට හොඳටම විශ්වාසයි. එතකොට මං මුදල අරගෙන ඔබ වෙතට එනවා. ඇවිත් ගෙවිය යුතු මුදල් ගෙවලා ඔටුන්න ආපසු අරගෙන යනවා. මුදල මගේ අතට ලැබෙන එක ගැන මොනවා හරි සැකයක් තිබුණය නම්, දියමන්ති ඔටුන්න ඇපයට තියන්න මං හීනෙකින් වත් හිතන්නෙ නෑ"

"හොඳයි . . . ."

". . . . . හෝල්ඩර් මහත්මයා මෙන්න මේ කාරණෙත් මං ඔබට කියන්න ඕන. මට අහන්න ලැබිල තියෙන්නෙ ඔබ ඉතාම විශ්වාස කටයුතු පුද්ගලයෙක් කියලයි. මං මේ ඔටුන්න ඔබ ළඟට

ගෙනාව එතෙන්ම මත්පු වෙනවා නේද, මං ඒ වචනය කොයිතරම් විශ්වාස කළාද කියන එක. ඉතින් මං ඔබෙන් ඉල්ලා සිටිනවා මේ දෙය; මේ කාරණය ඉතාම රහසිගතව තියාගන්න. ඕපාදූපයක් පැතිර යන්න පුළුවන් විදියට කටින් එක වචනයක් පිටකරන්න එපා. ඒ හැම එකකටම වඩා, මේ වෙනුවෙන් ඔබට යොදන්න පුළුවන් සම්පූර්ණ උත්සාහයම දරලා මේක ආරක්ෂා කරන්න. ඔබට අමුතුවෙන් කියන්න උවමනා නැහැ. මේ මටුන්නට මොකුත් වුණොත් රට පුරා මහා ආන්දෝලනයක් ඇතිවෙන බව. ඒ වගේමයි මේකට පළුද්දක් වුණොත්, එක මැණිකක් හෝ නැතිවුණොත්, මටුන්න සම්පූර්ණයෙන්ම විනාශ වුණා හා සමානයි. ඒ මොකද මේකට හරියන දියමන්තියක් ඔබට ලෝකෙ කොහෙන්වත් හොයාගන්න ලැබෙන්නෙ නැහැ. ඒ සම්පූර්ණ විශ්වාසයෙනුයි, මං මේ මටුන්න ඔබට භාරදීල යන්නෙ. සඳුදා මම පෞද්ගලිකවම ඇවිත් මේක ආපහු අරගෙන යනවා."

මගේ අනුග්‍රාහකයාට ඉක්මනින් පිටවී යාමට උවමනා වී ඇති බව මට වැටහුණා. ඉතින් මං තවත් මොකුත් කථාකරන්න ගියේ නැහැ. මගේ අයකැමියා කැඳවලා, පවුම් දහසේ නෝට්ටු පත්තහක් ගෙනැවිත් මගේ අනුග්‍රාහකයාට ගෙවන්න නියම කළා.

මේ මටුන්න භාරගැනීම නිසා මගේ හිතට ඇතිවුණේ ලොකු බරක්. මේ තරම් වටිනාකමක් ඇති ජාතික වස්තුවක් භාරගැනීමෙන්, මගේ හිස මත පැටවුණේ සුළුපටු වගකීමක් නෙමෙයි.

මගේ ළඟ තිබියදී මෙයට යම් හානියක් වුණොත් ඇතිවෙන ආන්දෝලනයට, අපකීර්තියට, මං මුහුණ දෙන්නේ කොහොමද? නමුත් දැන් ඒ ගැන හිතන්න ප්‍රමාද වුණා වැඩියි. ඉතින් මං මටුන්න මගේ යකඩ සේප්පුවේ දමලා, මගේ සාමාන්‍ය වැඩකටයුතු වල නිරතවුණා.

හවස් කාලය එළඹිලා බැංකුව වහන වෙලාව ආවා. මේ තරම් වටිනා දෙයක් බැංකුවේ සේප්පුවක දමලා ගෙදර යෑම ගැන, මගේ හිතේ ඇතිවුණේ ලොකු භයක්. බැංකු බිඳලා යකඩ සේප්පු කැඩීම, මීට කලින් අනන්තවත් සිදුවී ඇති දෙයක්. මගේ සේප්පුව කවුරු හරි නොකඩාවි කියල හිත සනසාගන්නෙ කොහොමද? එහෙම කඩලා මටුන්න හොරෙන් අරං ගියොත් මට මුහුණ දෙන්න වෙන තත්ත්වය මොකක්ද? ඉතින් මං මේ විදියේ තීරණයකට

ආවා. එදා සිට සඳුදා වෙන තුරු මං ගෙදර යද්දී එය බැංකුවෙන් ගෙන යන්නත්, ගෙදර සිට එද්දී ආපසු ගෙන එන්නත්. එහෙම කළාම ඔටුන්න හැමවිටම තියෙන්නේ මගේ අතේ දුරින්. මේ අරමුණෙන්, කුලීරියක් කැඳවලා ඔටුන්නත් රැගෙන ස්ට්‍රෙදම්හි පිහිටි මගේ නිවස වෙත පිටත්වෙලා ගියා. ගෙදර ගිහිං ඔටුන්න මගේ ඇඳුම් අල්මාරියෙ තැන්පත් කර, යතුරු දමලා අවසන් කරලයි, මං සැනසිල්ලේ හුස්ම කටක් ගත්තේ.

මගේ ගෙදර ඉන්න අය හා ඔවුන්ගේ කටයුතු ගැනත් මං ඔබට සම්පූර්ණ විස්තරයක් කියන්නම්, හෝම්ස් මහත්මයා. ඒ මොකද, මේ ගැටලුව ගැන එතකොටයි ඔබට හොඳ අවබෝධයක් ලබාගත හැකි වෙන්නෙ.

මගේ පෞද්ගලික සේවකයන් දෙදෙනාම නිදන්නේ ගෙදරින් පිටත. ඒ නිසා ඔවුන්ව මේ ප්‍රශ්නයට පටලවා ගන්නේ නැතිව මුලදීම අයින්කරන්න පුළුවනි. අපේ නිවසෙ සේවිකාවො තුන්දෙනෙක් ඉන්නවා. අවුරුදු ගණනාවක් තිස්සේ දිගටම මා ළඟ සේවය කර ඇති ඔවුන්, හොඳ විශ්වාස කටයුතු අය. මට ඔවුන් ගැන කිසිම සැකයක් නැහැ. ඊට අමතරව ලූසී පා නම් අලුත් සේවිකාවක් ඉන්නවා. මීට මාස කිහිපයකට පෙර ගෘහසේවිකාවක් ලෙස සේවයට බැඳුණු ඇය තරුණියක්. ඇය රැකියාවට බැඳුණේ හොඳ චරිත සහතික ඇතිව. තමන්ට භාරවෙන වැඩ කටයුතු ඇය ඉතා හොඳින් ඉටුකරනවා. ඇය ඉතාම ශෝභන තරුණියක්. ඒ නිසා ඇයගේ රූපයට ආකර්ෂණය වෙලා බැලුම් හෙළන කිහිපදෙනෙක් වරින්වර අපේ ගෙදර අවට ගැවසුණා. ලූසී පා ගැන අපට කියන්න තියෙන එකම අඩුපාඩුව එයයි. නමුත් මගේ විශ්වාසය නම් ඇය හැම අතකින්ම හොඳ ගැහැනු ළමයෙක් කියලයි. සේවකයන් ගැන කියන්න තියෙන්නේ එපමණයි.

ඊළඟට මගේ පවුල ගැන. මගේ පවුල බොහොම කුඩා එකක්. මගේ බිරිඳ කාලයකට පෙර මියගියා. මට ඉන්නේ ආතර් නම් එක පුතෙක් පමණයි. ඔහු ගැන නම් මට කියන්න තියෙන්නේ, මගේ පුතා මගේ බලාපොරොත්තු සම්පූර්ණයෙන්ම කඩකළා කියන එකයි. හෝම්ස් මහත්මයා, ඔහු මාව හරිම කලකිරීමකට පත්කළා. කිසිම සැකයක් නෑ; මෙතැන වැරැද්ද මගේ අතේ. මගේ බිරිඳ මිය ගියාම මං හිතුවා, මේ දරුවාට ආදරය කරන්න ඉන්නේ මං

විතරයි හොඳ කියලා. ඔහුගේ මුහුණේ මතුවෙන සිනාව එක මොහොතකට හරි නැතිවෙලා යනව දකින්න මං කැමතිවුණේ නැහැ. ඒ නිසා ඔහු ඉල්ලූ දෙයක් මං කිසි දවසක නොදී හිටියෙ නැහැ. ඇත්තෙන්ම මං ඔහුට ටිකක් තදින් හිටියා නම් හොඳයි කියල දැන් මට හිතෙනවා. නමුත් මං ඒ හැමදෙයක්ම කළේ, මගේ පුතාව සන්තෝෂයෙන් තියන්නයි.

මගේ එකම බලාපොරොත්තුව වුණේ, මගේ ව්‍යාපාරය පවත්වා ගෙන යෑම සම්පූර්ණයෙන්ම ඔහුට භාරදෙන්නයි. නමුත් ඔහු ව්‍යාපාරයක් කරගෙන යන්න පුළුවන් විදියේ කෙනෙක් නෙමෙයි. ඔහු බොහොම සැරපරුෂ, හිතු හිතු දේ කරන කෙනෙක් ඔබට ඇත්තම කියනවා නම්, විශාල මුදලක් සම්බන්ධයෙන් මට ඔහු ගැන විශ්වාසයක් තබන්න පුළුවන් බැහැ.

ආතර් බොහොම තරුණ ගැටයෙක් කාලෙදිම ඉහළ පෙළේ ප්‍රභූ පවුල් වල තරුණයින්ගේ සමාජයට වැටුණා. ඊළඟට ධනවත් පවුල් වල, විසිකරන්න සල්ලි බාගෙ ඇති අය ආශ්‍රය කරන්න පටන් ගත්තා. ඔවුන් සමඟ එකතු වෙලා සල්ලි ඔට්ටුවට කාඩ් සෙල්ලම් කරන්නත්, රේස් ඔට්ටු දමන්නත් පටන් ගත්තා. ඔහුට ලැබෙන සල්ලි ඔක්කොම විනාශ කළා. ඊළඟට නිතර නිතර ඇවිත් මුදල් ඉල්ලා මට කරදර කරන්න පටන් ගත්තා මෙම පාප මිත්‍රයන්ගෙන් ඈත්වෙන්න ඔහු කිපවාරයක්ම උත්සාහ කළා. නමුත් ඔහුගේ හිතවත්ම මිත්‍රයා වන සර් ජෝර්ජ් බර්න්වෙල් නිසා, ආතර්ට පාප මිත්‍රයන්ගෙන් ගැළවීමක් තිබුණේ නැහැ.

සර් ජෝර්ජ් බර්න්වෙල් වගේ කෙනෙකුගේ වසඟයට මගේ පුතා පත්වුණේ කොහොමද කියන එක පුදුමයට හේතුවක් නෙමෙයි. ඔහු පුතා සමඟ නිතර නිතර අපේ ගෙදර ඇවිත් තියෙනවා. සර් ජෝර්ජ් ගෙ ඇති ආකර්ෂණීය කථා විලාසයට, සිරිත් විරිත් වලට, ඕනෑම කෙනෙක් රැවටෙනවා. ඔහු වයසින් ආතර්ට වඩා වැඩියි. සර් ජෝර්ජ් ලෝකෙ පුරා ඇවිදලා, රට රටවල් දැකලා, හැම දෙයක්ම තමන්ගේ අතේ රේඛා ගණනට දන්න කෙනෙක්. කථාවට හරි දක්ෂයි. පෙනුමෙන් බොහොම කඩවසම්. නමුත් අපක්ෂපාතව කල්පනා කරල බැලුවොත් නම් වැටහෙන්නේ වෙනත් දෙයක්. ඔහුගේ ඇස් වලින් යොමු වෙන බැල්ම ගැන සිහි කළොත් මට හිතෙන්නේ, සර් ජෝර්ජ් කියන්නේ කිසිසේත් විශ්වාසය තැබිය හැකි අවංක

කෙනෙක් නොමෙයි කියලයි. මට විතරක් නොමෙයි. මගේ පුංචි මේරිට හිතෙන්නේත් එහෙමයි. ඇයට තියෙනවා මිනිසුන්ගේ ස්වභාවය නිවැරදිව තේරුම් ගන්න පුළුවන්, ගැහැනුන්ට සහජයෙන්ම උරුම වෙන තියුණු නුවණක්.

එතකොට මට කියන්න ඉතිරිව තියෙන්නේ ඇය ගැන පමණයි. මේරි තමයි මගේ ඥාති දියණිය. අවුරුදු පහකට පෙර මගේ සහෝදරයා මියයද්දී මේරි මේ ලෝකෙ තනිවුණා. ඉතින් ඇය පත්වුණේ මගේ භාරයටයි. එදා ඉඳල මං ඇයව හදා වඩා ගත්තේ මගේම දුවක් වගේ. ඇය මගේ නිවසට පැමිණීම අපේ පවුලට හඳක් පැව්ව වගේ වුණා. ඇය ලස්සනයි, නුරුබුහුටියි, ක්‍රියාශීලියි, කරුණාවන්තයි. ගේ දොර පරිපාලනය ඉතාම දක්ෂ අයුරින් ඇය කරගෙන යනවා. ඇය මගේ දකුණු අත වගේ. ඇය නැතුව මගේ වැඩකටයුතු හරිහැටි කරගන්නේ කොහොමද කියල මට හිතාගන්නවත් බෑ.

මගේ බලාපොරොත්තු ඇය ඒ අයුරින්ම ඉටු නොකළේ එකම අවස්ථාවකදී පමණයි. මගේ පුතා ඇයව විවාහ කරගන්නා අරමුණෙන් දෙපාරක්ම ඇගෙන් කැමැත්ත ඉල්ලුවා. නමුත් ඒ දෙවාරයේම ඇය ඔහුව ප්‍රතික්ෂේප කළා. ආතර්ව හරි මාර්ගෙට ගන්න පුළුවන් කෙනෙක් මේ ලෝකෙ ඉන්නවා නම් ඒ ඇය පමණක් ය කියලයි මගේ හැඟීම. මේ විවාහය සිදුවුණා නම් ඔහු හරි මගට වැටෙනවා. නමුත් මොන තරම් කණගාටුවට කරුණක්ද? දන් ඉතින් ඒ ගැන හිතල වැඩක් නෑ. ඒකට ප්‍රමාද වැඩියි.

ඉතින් හෝම්ස් මහත්මයා ඔබ දන්නවා අපේ ගෙදර ජීවත්වෙන උදවිය කවුද කියලා. මං මගේ ශෝකජනක කථාවේ ඉතුරු හරියත් ඔබට කියන්නම්.

එදා රාත්‍රී ආහාරයෙන් පස්සේ අපි විසිත්ත කාමරයේ කෝපි බොමින් සිටියා. එදා බැංකුවේදී මට මුහුණ දෙන්න සිදුවුණු අත්දැකීම ගැන මං ආතර්ටත් මේරිටත් කිව්වා. එය මා වෙත රැගෙන ආ අනුග්‍රාහකයාගේ නම නම් මං ඔවුනට හෙළි කළේ නැහැ. නමුත් මගේ භාරයට පත්වුණු මේ මහා අනර්ඝ වස්තුව ගැන මං ඔවුනට කිව්වා. අපට කෝපි රැගෙන ආ ලුසී පා, ඒ වෙලාවෙ විසිත්ත කාමරයෙන් පිටවෙලා ගිහින් තිව් බව මට හොඳටම විශ්වාසයි. නමුත් එහි දොර හොඳින් වහල තිබුණද කියන එක ගැන මට

විවුරා සහතික වෙන්න බෑ. මෙරිටත් ආතර්ටත් දෙදෙනාටම දියමන්ති මටුන්න බලන්න ලොකු ආසාවක් ඇතිවුණා. නමුත් ඒක සඟවා තිබූ තැනින් එළියට ගන්න මං කැමැති වුණේ නැහැ.

"තාත්තා ඒක අරං තිව්වෙ කොහේද?"

ආතර් ඇහැව්වා.

"මගේ යකඩ අල්මාරියේ"

"හැබැට? එහෙනම් අද රෑට හොරු ගේ නොබින්දොත් හොඳයි" ආතර් කිව්වා.

"මං ඒක අල්මාරියෙ දාල යතුරු දාලයි තියෙන්නෙ"

"අයියෝ. ඕහෙම පරණ යතුරකින් ඔය අල්මාරිය අරින්න පුළුවන්. ගබඩා කාමරයේ පරණ අල්මාරියක යතුරෙනුත් මං තාත්තගෙ යකඩ අල්මාරිය පුංචි කාලෙ ඇරල තියෙනවා"

ආතර් ඔහුගේ හපන්කම ගැන නුහක් වෙලාවට අභියෝක්තියෙන් කථා කළ කෙනෙක්. ඒ නිසා, ඒ වෙලාවෙ ඔහු කිව් දේ මං ඒ හැටි බරපතල ලෙස ගණන් ගත්තෙ නෑ. එදා රෑ මං නිදාගැනීමට කාමරේට යද්දි ආතර් මගේ පස්සෙන් ආවේ හරිම කැලැඹුණු මුහුණෙන්.

"මේ අහන්න තාත්තෙ. මට පවුම් දෙසීයක් දෙනවද?" පුතා මගෙන් ඇහුවෙ මුහුණ අහකට හරවාගෙන.

"බෑ. පුතාට සල්ලි දෙන්න බෑ. මං මීට කලින් ඕනෙ තරම් සල්ලි දීල තියෙනව පුතාට"

"ඔව්. තාත්තා හැමදාමත් මට සල්ලි දෙන්න තරම් කරුණාවන්ත වුණා. ඒ වුණත් මේ පවුම් දෙසීයක් මට ඕනෙමයි. නැත්නම් මට සමාජ ශාලාව පැත්තෙ යන්න බෑ. යාළුවන්ට මුහුණ දෙන්න විධියක් නැහැ."

"ඒක කොච්චර හොඳද" මං කිව්වා.

"ඔව්. ඒ වුණාට තාත්තා කැමති නැහැ නේද මං වංචාකාරයෙක් හැටියට හඳුන්වෙනවට? ඒ මුදල නැතිව මට අවනම්බු විඳින්න බැහැ. මං කොහොම හරි ඒ මුදල සොයාගත යුතුමයි. තාත්තා ඒක මට දෙන්නෙ නැත්නම්, මං වෙනත් ක්‍රමයකින් හරි ඒක හොයන්න උත්සාහයක් යොදන්න ඕන."

ඔහුගේ මේ කථාවෙන් මං හරිම කෝපයකට පත්වුණා. ඔහු මේ විධියට මගෙන් සල්ලි ඉල්ලා හිටි තුන්වෙනි වතාවයි මේ.

"මං උඹට එක ඇන්සයක් දෙන්නෙ නෑ"

මං එහෙම කිව්වාම ආතර් එක වචනයක් වත් කථා නොකර, හිස නමල කාමරයෙන් පිටවෙලා ගියා.

ඔහු ගියාට පස්සෙ මං ගියේ මගේ අල්මාරිය ළඟට. ඔටුන්න එහි සුරක්ෂිතව තිබෙන බව සැකහැර දැනගෙන, අල්මාරිය වහලා යතුරු දැම්මා. ඊළඟට ගෙදර, දොර ජනෙල් හොඳින් වහල තියෙනවද කියල සෝදිසි කරල බලන්න මම ගියා. මේක සාමාන්‍යයෙන් මේරි අතින් ඉටුවෙන වැඩ කොටසක්. නමුත් ඊයෙ රාත්‍රියේ මම ම මේක සෝදිසි කරල බලන එක හොඳයි කියල මට හිතුණා. මම මගේ කාමරයේ සිට පහළට ඒමට තරප්පු පෙළ බැස්සා. ඒ වෙලාවෙ මේරි හිටියේ සාලයේ පැත්තෙන් තිබුණු ජනේලය අසල. මං ළඟාවෙද්දී ඇය ජනේලය වසා අගුළු දැම්මා.

"බාප්පේ. බාප්පා අර ගැහැනු ළමයට - ලුසීට, මේ රෑ වුණු වෙලාවෙ ගෙදරින් එළියට බහින්න අවසර දුන්නාද?"

"කොහොමටවත් නෑ"

"ඇය එළියේ ඉඳල, පිටිපස්සෙ දොරෙන් ගේ ඇතුළට ආවෙ දැනුයි. කිසිම සැකයක් නෑ, ඇය කවුරු හරි හමුවෙන්න, පැත්තෙන් තියෙන ගේට්ටුව ළඟට යන්න ඇති. මේ වැඩේ ඒ තරම් පරෙස්සම් ඇති වැඩක් නෙමෙයි. අපි ඒක ඉක්මනට නැවැත්තුවොත් හොඳයි"

"දුව. හෙට උදේට ඒ ගැන ලුසීට කියන්න. නැත්නම් ඔයා හිතන්නෙ ඒක මං කිව්වොත් වඩා හොඳයි කියලද? එහෙම නම් මං අවවාද කරන්නම්. දොර ජනෙල් ඔක්කොම හොඳින් අගුළු දාලද කියල බැලුවද දුව?"

"ඔව් බාප්පෙ"

"එහෙනම් ශුභ රාත්‍රියක්" එහෙම කියල ඇයට හාද්දක් දීල, මං නිදාගැනීමට මගේ කාමරයට ගියා. වැඩිවෙලා යන්න කලින් මට නින්ද ගියා.

මං උත්සාහ කරන්නේ, මේ සිද්ධියට අදාළ හැමදෙයක්ම විස්තර සහිතව ඔබට කියන්නයි, නමුත් කොතැන හරි ඔබට පැහැදිලි නැත්නම් ඒ ගැන මගෙන් අහන්න

http://sherlockholmesinvestigations.blogspot.com

"නැහැ. ඔබේ කථාව ඉතාම පැහැදිලියි"

දැන් මම එන්නේ මගේ කථාවේ වැදගත්ම කොටසට ඒක තව්දුරටත් හොඳින්, පැහැදිලිව කියන්න මං කැමැතියි. මට සාමාන්‍යයෙන් ඒ තරම් තදට නින්ද යන්නේ නැහැ. සිතේ තිබුණු කැලැඹුණු ගතිය නිසා වෙන්න ඇති ; ඊයෙ රාත්‍රි මට වෙනදා තරම් වත් හොඳින් නින්ද ගියේ නැහැ. ගේ ඇතුළේ මොකක් හරි ශබ්දයක් ඇසී, පාන්දර දෙකට විතර මට ඇහැරුණා. ශබ්දය මේ වෙනකොට නැවතී තිබුණත් මං හොඳ අවදියෙනුයි හිටියේ. මට හිතුණු හැටියට, ඒක ගෙයි කොහේ හරි කෙළවරක ජනේලයක් පරෙස්සමෙන් වහපු හඬක්.

මං හොඳට කන්දී ගෙන හිටියා. ඊළඟට මං හරිම භයකට පත්වුණා. ඒ, මගේ කාමරයට අල්ලපු කාමරයේ කවුරුන් හෝ බොහොම හෙමින් අඩිය තියල ඇවිද යන ශබ්දය ඇහිලයි. මගේ පපුව අප්‍රමාණ භයකින් ගැහෙන්න පටන්ගත්තා. මං බොහොම හෙමින් ඇඳෙන් බැහැලා ගිහිං, මගේ ඇඳුම් අඳින කාමරයේ අඩවන්ව තිබූ දොරෙන් එබී බැලුවා.

"ආතර්!" මට කෑගැසුණා. "උඹ මහා තක්කඩි හොරෙක්. උඹට ලැජ්ජා නැද්ද මිනිහෝ ඔය ඔටුන්න අරගන්න?"

කාමරයේ ගෑස් ලාම්පුව, මං එය රාත්‍රියේ දල්වෙන්න සකස් කර තිබූ විදියටම බාගෙට දල්වී තිබුණා. කලිසමකින් හා කමිසයකින් පමණක් සැරසුණු මගේ පුත්‍රයා ලාම්පුව අසල සිටියා. ඔහුගේ අතේ තිබුණා දියමන්ති ඔටුන්න. ලාම්පු එළියෙන් මට පෙනුණේ, ඔහු පුළුවන් ශක්තිය යොදා ඔටුන්න නමන්න හෝ ඇද කරන්න උත්සාහ දරමින් සිටි අයුරක්. මගේ කෑගැසීම ඇහුණු ගමන්ම ආතර්ගෙ අතින් ඔටුන්න අත හැරුණා. ඔහු මළමිනියක් මෙන් සුදුමැලි වුණා. මං වහාම ඔටුන්න අතට ගෙන පරීක්ෂා කළා. එහි එක් කෙළවරකින් කෑල්ලක් කැඩී ගොස් තිබුණා. මැණික් තුනක් සහිත රත්තරන් කෑබැල්ලක් අඩු බව මට පැහැදිලිවම පෙනුණා.

"කාලකණ්ණියා!" මං කෑගැසුවේ ඉවසාගන්න බැරි කෝපයෙන්. "උඹ මේ ඔටුන්න විනාශ කරලා. උඹ මගේ මූණේ දලි ගෑවා. මාව විනාශ කළා. කෝ උඹ හොරකම් කළ මැණික් ගල්?"

http://sherlockholmesinvestigations.blogspot.com



95. "උඹ මහා තක්කඩි හොරෙක්, උඹට ලැජ්ජා නැද්ද මිනිහෝ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"හොරකම් කළ?" ඔහු කෑගැසුවා.

"ඔව්! හොර තක්කඩියා!" මං කේන්තියෙන් ඔහුගේ උරහිසෙන් අල්ලා සෙලෙව්වා.

"මැණික් ගල් නැතිවෙලා නැහැ. එකක් වත් නැතිවෙන්න විධියක් නැහැ" ඔහු කිව්වා.

"මොකද නැත්තේ? මැණික් ගල් තුනක් අඩුයි. ඒවාට මොකද වුණේ කියල උඹ දන්නවා ඇති. උඹ ඒව හොරකම් කළා. ඒ මදිවට දැන් උඹ බොරුත් කියනවා නේද? උඹ ඔටුන්නේ තවත් කෑල්ලක් කඩාගන්න උත්සාහ කළ හැටි මං දක්කෙ නෑ කියලද හිතන්නෙ?"

"කාලකණ්ණියා, හොර තක්කඩියා කියමින් මං තාත්තගෙන් නින්දා අපහාස ඇහුවා ඇති. මට තවත් ඕව ඉවසන්න බැහැ. තාත්තට ඕන කරන්නේ මට නින්දා කරන්න නේ. ඒ හින්දා මං මේ ගැන තවත් එක වචනයක් කථා කරන්නෙ නෑ. හෙට උදේට මං මේ ගෙදරින් පිටවෙලා යනවා. මට කැමැති විධියට මේ ලෝකේ ජීවත්වෙන්න පිළිවෙළක්, මං සලස්වා ගන්නම්."

"උඹට මේ ගෙයින් එළියට බැහැල යන්න වෙන්නෙ පොලීසියට. මං මේක අඩියටම හාරා අවුස්සලා බලනවා."

මම කෑගැසුවෙ සිත් වේදනාවෙන්, ඒ නිසාම බාගෙට පිස්සුවෙන් වගේ.

"මං කිසිම දෙයක් කියන්නෙ නෑ. තාත්තට ඕන පොලීසිය කැඳවන්න නේ. ඉතින් පොලීසියම ඔවුන්ට පුළුවන් දේ හොයාගන්නෙ නැතැයි." ආතර් පිළිතුරු දුන්නා.

මේ වෙනකොට මගේ කෑගැහිල්ල නිසා මුළු ගෙදරම අය අවදිවෙලා. මගේ කාමරේට ඉස්සර වෙලාම දුවගෙන ආවෙ මේරි. ආතර්ගෙ මුහුණේ හැටිත්, ඔටුන්නත් දුටුව ගමන්ම, මේරි හැම දෙයක්ම තේරුම් ගත්තා. ඇය විලාප නගාගෙන සිහි නැතිවෙලා බිම ඇද වැටුණා. මං ගෘහසේවිකාව යවලා, පොලීසිය කැඳෙව්වා. පරීක්ෂණය ඔවුනට භාරදුන්නා. පොලිස් පරීක්ෂකවරයා සහ පොලිස් භටයෙකු නිවස ඇතුළට ඇවිත් පරීක්ෂණ පටන් ගන්න සූදානම් වුණා. එතකොට මෙතෙක් නිශ්ශබ්දව දෑත් බැඳගෙන සිටි ආතර් මා ළඟට ආවා.

http://sherlockholmesinvestigations.blogspot.com

"මවුන්තේ දියමන්ති හොරකම් කුලේ මම කියල, මාව දැන් පොලිසියට භාර දෙන්නද තාත්තා හදන්නේ?"

"ඒ ගැන මට මොකුත්ම කරන්න බැහැ. මේක දැන් මගේ පෞද්ගලික කටයුත්තක් නොවෙයි. උඹ ඔම් කඩලා විනාශ කරලා තියෙන්නේ මේ රටේ ජාතික වස්තුවක්. මේ වෙලා තියෙන්නේ මහජනයාට අයිති දෙයක හොරකමක්. ඒ නිසා ඒ ගැන නීති මාර්ගයෙන් සුදුසු පියවර ගතයුතුමයි. මගේ තීරණය ඒකයි."

"තාත්තේ. මං කියනදේට කන්දෙන්න. අඩුම ගාණේ මේ දැන්, මේ වහාම මාව හිරභාරයට නොගෙන ඉන්න. මට මේ ගෙදරින් පිටවෙලා, මිනිත්තු පහක් ගතකරලා එන්න ඉඩ දෙන්න. එහෙම කළොත් ඒක මගේ වගේම තාත්තගේත් වාසියට හිටීවි."

"ඔව්. එතකොට උඹට පැනගන්න පුළුවන් නේ. නැත්නං හොරකම් කරපුවා කොහේ හරි හංගල එන්න පුළුවන් නේ."

මං එහෙම කිව්වත්, මං මුහුණදීල ඉන්න තත්වයේ කණගාටුදායක බව මට හොඳහැටි තේරුණා.

"මේ අහපං ආතර්. මේකෙන් මහා විලි ලැජ්ජාවකට පත්වෙන්න සිද්ධ වෙන්නේ මට විතරක් නොවෙයි. මේ රටේ ඉන්න ශ්‍රේෂ්ඨම උත්තමයෙකුටත් මේකෙන් ලැජ්ජාවට පත්වෙන්න සිදුවේවි. උඹ මේ කළ වැඩෙන් ඇතිවෙන අපකීර්තිය මුළු රට පුරාම පැතිර යාවි. රටේම මිනිස්සු කැලඹේවි. මතක තියාගනිං. මවුන්ත උඹගෙ අතේ තියෙද්දිමයි මට උඹව අහුවුණේ. උඹ අර දියමන්ති තුනට මොකද කළේ කියල කිව්වොත්, මට අර ඔක්කොම අමතක කරන්න පුළුවනි. එහෙම කළොත් ඔක්කොම වැරදි අමතක කරලා උඹට සමාවක් ලැබේවි."

"තාත්තගෙ ඔය සමාව පරිස්සම් කරල තියාගෙන ඒක ඉල්ලන අයටම දෙන්නකෝ."

පුතා කිව්වෙ උපහාසාත්මක විධියට. මගේ වචන වලින් නම්මා ගන්න බැරි විධියට ආතර්ගේ හිත දැඩිවෙලා තිබුණු බව මට පෙනුණා. දැන් ඉතින් කරන්න ඉතිරි වෙලා තිබුණේ එකම දෙයයි. මං පොලිස් පරීක්ෂකවරයා කැඳවලා ඔහුට මගේ පුතාව භාරදුන්නා. ආතර්ව හිරභාරයට ගැනුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒ වෙලාවෙ ඔහුගේ ඇඳුම් පැළඳුම් සෝදිසි කරල බැලුවත් කිසිම දෙයක් හමුවුණේ නැහැ. එපමණක් නොවෙයි. ඔහුගේ කාමරයත්, ගෙයි හැමතැනමත් සෝදිසි කරල බැලුවා. නමුත් අහුරුදන් වුණු මැණික් සහිත රන් කැබැල්ල හමුවුණේ නැහැ. අපි කොයිතරම් කාරුණිකව ඉල්ලා හිටියත්, ආයාචනා කළත්, තර්ජනය කළත්, මගේ අකීකරු පුතා එක වචනයක් වත් කථා කළේ නැහැ.

අද උදේ ඔහුව රක්ෂිත බන්ධනාගාරයේ හිරකුඩුවකට දැම්මා. පොලිසියෙන් සිරිත් පරිදි කෙරෙන හැම කටයුත්තක්ම අවසන් වුණාට පස්සෙ, මං මේ පුළුවන් ඉක්මනින් ආවේ ඔබව හොයා ගෙන. හෝම්ස් මහත්මයා. මං ඔබට බැගෑපත්ව ආයාචනය කර සිටිනවා, ඔබ සතු සියලු දක්ෂතා යොදවලා, මේ බැරෑරුම් ප්‍රශ්නය විසඳා දෙන්න කියලා. පොලිසිය එළිපිටම කියනවා, මේක විසඳාගත හැකි ක්‍රමයක් ඒ ගොල්ලන්ට කොහොමටවත් පෙනෙන්නේ නැහැලු. ඔබ හිතන ඕනෑම මුදලක් අයකරන්න. මේ ගැන හරි ආරංචියක් දෙන කෙනෙකුට රන්පවුම් දහසක තෑග්ගක් දෙනවා කියල දැනටම ප්‍රසිද්ධ කරලයි තියෙන්නේ. අනේ දෙවියනේ! වෙන මොනවද දන් මට කරන්න ඉතිරි වෙලා තියෙන්නෙ? එක රැයකින් මට මගේ කීර්තිය, ආත්ම ගෞරවය, මගේ පුතා, මැණික් මේ හැම දෙයක්ම අහිමි වුණා. මං මොනවා කරන්නද?"

දෑතින් හිස බදාගත් බැංකුහිමියා, ශෝකය ඉවසාගත නොහැකිව වැළපෙන කුඩා දරුවකු මෙන්, හිස ඉදිරියටත් පිටිපසටත් දෝලනය කිරීමට පටන්ගත්තේය.

ෂර්ලොක් හෝම්ස් මිනිත්තු කිහිපයක් නිහඬව කල්පනා කළේය. ඔහුගේ දෑස් ගිනි උදුන දෙසට යොමුවී තිබුණු අතර, නළල රැළි වැටී තිබිණි.

"ඔබේ ගෙදර නිතර අමුත්තො ගැවසෙනවද?"

"නැහැ. බැංකුවෙ මගේ අනෙක් හවුල්කරුවා ඔහුගේ පවුලේ අය සමඟ එනවා. ආතර්ගේ යාළුවෙක් දෙන්නෙක් ඉඳහිට එනවා. මෑතක ඉඳන් සර් ජෝජ් බර්න්වෙල් නිතර නිතර යන්න එන්න පටන් අරගෙන තියෙනවා. වෙන කිසි කෙනෙක් නැහැ."

"ඔබ නිවසින් පිටවෙලා, සමාජ කටයුතු වලට සහභාගි වෙන්න යනවද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ වැඩවලට යන්නේ ආතර්. මේරියි මමයි ගෙදරමයි ඉන්නෙ. අපි දෙන්නා ඒවට කැමැත්තක් දක්වන්නේ නෑ."

"ඔබේ ඥාති දියණිය ලාබාල ගැහැනු ළමයෙක් වෙලත්, සමාජයේ ගැවසෙන්න අකමැතියි කියන එක හරි පුදුමයි?"

"ඇය බොහොම නිශ්ශබ්ද තාලේ කෙනෙක්. අනෙක ඇය ඒ හැටිම ලාබාලත් නැහැ. දැන් වයස අවුරුදු විසිහතරයි."

"ඔබ කියන හැටියට මේ සිද්ධියෙන් ඇගේ හිතෙත් දැඩි කම්පනයක් ඇතිවෙලා. එහෙම නේද?"

"ඔව්. බොහොම දරුණු ලෙස. ඇත්තෙන්ම ඇය මටත් වඩා කම්පාවට පත්වෙලයි ඉන්නෙ."

"මේකට වරදකාරයා ඔබේ පුතාය කියන එක ඔබටත් මේරිටත් විශ්වාසද? ඒ ගැන ඔබේ හිතේ සැකයක් නැද්ද?"

"අපේ හිත්වල ඔහු ගැන සැකයක් නැතිවෙන්නෙ කොහොම ද මහත්මයා? ඔහු ඔටුන්න අරගෙන ඉන්න හැටි මම මගේ දෑසින්ම නේ දුටුවෙ?"

"මම නම් හිතන්නෙ නෑ, ඒක හැම දෙයක්ම ඔප්පු කරන සාක්ෂියක් කියලා. ඔටුන්නේ අනික් හරියත් පළුදු වී තිබුණද?"

"ඔව්. එය ඇඹරී ඇද වී තිබුණා."

"එහෙම නම් ඔබට හිතෙන්නේ නැද්ද ඔබේ පුතා ඒකෙ ඇද අරින්න උත්සාහ කරමින් සිටියා කියල?"

"ඔබට දෙවියන්ගෙම පිහිටයි හෝම්ස් මහත්මයා. ඔබ හදන්නේ මගේ පුතාට පිහිට වෙන ගමන් මටත් උදව් කරන්න. ඒ වුණාට ඒක බොහොම බැරෑරුම් වැඩක්. ආතර් මොන එකකටද මගේ කාමරේට ගියේ? ඔහුට මොකක්ද ඒක ඇතුළෙ කරන්න තිබුණු රාජකාරිය? ඔහු මගේ කාමරේට ගියේ වැරැදි වැඩකට නෙමෙයි කියල හිතමු. එහෙම නම් ඇයි ඔහුට කට ඇරලා ඒක කියන්න බැරි?"

"ඇත්තෙන්ම ඔව්. ඒ වගේම මෙහෙම හිතමු. ඔබ කියන විදියට ඔහු අපරාධකාරයෙක් නම් ඇයි ඔහු බොරුවක් ගොතුවෙ නැත්තෙ? ඔහුගේ නිහඬතාවය අපට කොයි අතටත් භාරගන්න පුළුවනි. ඔහු අපරාධකාරයෙක් වෙන්න පුළුවන් වගේම අහිංසකයෙකු

http://sherlockholmesinvestigations.blogspot.com

වීමටත් පුළුවන්. මේ සිද්ධියේ හරිම සුවිශේෂ කාරණා කිහිපයක් මට පැහැදිලිවම පෙනෙනවා. ඔබට අර ශබ්දයක් ඇහිලා ඇහැරුණා කිව්වා නේද? ඒ ගැන පොලිසිය මොකද කියන්නේ?"

"ඔවුන් හිතන්නේ ඒ ශබ්දය ඇහෙන්න ඇත්තේ ආතර් තමන්ගේ නිදන කාමරයේ දොර වහද්දි වෙන්න ඇති කියලා."

"හරිම අපූරුයි! හොරකමක් කරන්න සූදානම් වෙන මිනිහෙක්, මුළු ගෙදරම අය ඇහැරවගන්නා අරමුණෙන් සද්දෙට දොර වහලා! එතකොට මැණික් ගල් අතුරුදහන්වීම ගැන ඔවුන් මොනවද කිව්වෙ?"

"ඔවුන් තවමත් පොළොවට සවිකර තිබෙන ලෑලි වලට තට්ටු කර කර බලනවා, බුරුල් වුණු ලෑල්ලක් හොයා ගන්න පුළුවන්ද කියලා. ඔවුන් හිතන්නේ නැතිවුණු මැණික් බුරුල් වුණු ලෑල්ලකට යටකරලා ඇති කියලා. ඒ අතරෙම ලී බඩුවලත් හැම තැනක්ම සෝදිසි කරලා බලනවා."

"ගෙයින් පිටත පරීක්ෂා කරලා බලන්න ඔවුන් හිතුවේ නැද්ද?"

"ඔවුන් අප්‍රමාණ ශක්තියකින් වැඩකළා. ගෙදර උද්‍යානය, බොහොම සියුම් ලෙස මුළුමනින්ම සෝදිසි කළා."

"මගේ හිතවත් මහත්මයා, මේක ඔබටත් පොලිසියටත් හිතනවාට වඩා බොහොම ගැඹුරට මුල් විහිදුණු ප්‍රශ්නයක්. ඒ බව ඔබට තවමත් පැහැදිලි නැද්ද? ඔබට පෙනෙනවා ඇත්තේ මේක ඉතාම සරල ගැටලුවක් හැටියටයි. නමුත් මට නම් හිතෙන්නේ මේක බොහොම සංකීර්ණ ගැටලුවක් කියලයි. ඔබ මේක උපකල්පනය කරන පිළිවෙළ අපි මුලින්ම හිතල බලමු.

ඔබ කියනවා ඔබේ පුතා ආතර් ඇඳෙන් නැගිටලා ඇවිත්, ඔබේ ඇඳුම් අඳින කාමරයට ඇතුළුවුණා කියල. බොහොම අවදානම් කටයුත්තක් වුණත් ඔහු ඔබේ අල්මාරිය ඇරලා ඔටුන්න එළියට ගන්නවා. ඊළඟට [illegible] ශක්තිය යොදලා ඔටුන්නෙන් කෑල්ලක් කඩාගන්නවා. මැණික් තිස්නවයක් තිබෙන ඔටුන්නෙන්, ඔහු මැණික් තුනක් පමණක් තියෙන කෑල්ලක් කඩාගෙන එළියට යනවා. ගිහින් ඒක කාටවත් හොයාගන්න බැරි ආකාරයට හංගනවා. හංගලා ආපසු ඇවිත්, තාත්තාගේ අතට අහුවීමට අවදානමක් ඇති කාමරයේ ඔටුන්න දිහා බලමින් ඉන්නවා. දැන් මං ඔබෙන් අහන්න කැමැතියි, මේ වගේ දෙයක් ඇත්තටම සිද්ධ වෙන්න පුළුවන්ද?"

"ඒක වෙන්න බැරි නම්, මොකක්ද වෙන්න පුළුවන් එක?" බැංකුකරුවා ඇසුවේය.

"අන්න ඒක තමා අපට හොයන්න සිද්ධ වෙලා තියෙන්නෙ." හෝම්ස් කීය. "හොඳයි හෝල්ඩර් මහත්මයා, ඔබ සූදානම් නම් අපි කැමතියි ඔබත් එක්ක ස්ට්‍රෙදම් බලා යන්න. එහේ ගිහින් පැයක පමණ කාලයක් ඔබ කිව් දේ පිළිබඳව සමීපව විමසලා බලමු"

මා ද ඔහු සමඟ පැමිණිය යුතු බව හෝම්ස් තදින්ම කියා සිටියේය. බැංකුකරුවාගේ කථාවෙන් අතිශය කණගාටුවටත්, කුතුහලයටත් පැමිණ සිට මම, එම ගමනට සහභාගිවීමට කැමැත්තෙන් සිටියෙමි. මට නම් පැහැදිලිව පෙනුණේ මේ අපරාධය සිදුකර ඇත්තේ බැංකුකරුවාගේ පුතුයා විසින් බවයි. එහෙත් හෝම්ස් මේ ගැටලුව විග්‍රහ කළේ, ඊට වඩා වෙනස් අයුරෙනි. හෝල්ඩර් මහතාගේ විසඳුම ගැන හෝම්ස් පැහීමට පත්වූයේ නැත.

අප ගමනේ යෙදෙද්දී හෝම්ස් සිටියේ සම්පූර්ණයෙන්ම නිහඬවයි. තම මුහුණ වැසෙන සේ හිස් වැස්ම ඉදිරියට ඇද, හිස පහතට නමාගෙන ඔහු කල්පනාවේ වෙළී සිටියේය. කෙටි දුම්රිය ගමන අවසානයේ මඳ දුරක් පාගමනින් ගොස්, හෝල්ඩර් මහතාගේ "ෆෙයාබෑන්ක්" නම් නිවස වෙත ළඟාවූයෙමු.

ප්‍රධාන මාර්ගයට මදක් ඇතුළතින් පිහිටි ෆෙයා බෑන්ක්, සුදු ගල් වලින් තැනූ තරමක් විශාල නිවසකි. නිවසේ ඉදිරිපස වූ විශාල මල්උයන, හිමෙන් වැසී තිබිණි. නිවස දක්වා වැටෙන මාර්ගය අශ්වකරත්ත දෙකකට එකවර මාරු විය හැකි පුළුල් එකක් විය. ප්‍රධාන පාරෙන් වත්තට ඇතුළුවීම සඳහා වූ ගේට්ටුව විශාල යකඩ ගේට්ටු පියන් දෙකකින් ආරක්‍ෂා වී තිබිණි.

නිවසේ දකුණු පැත්තේ, එකලන වැවුණු පඳුරු සහිත කුඩා ලන්දක් විය. ඒ ලන්ද මැදින් මහ පාරේ සිට කුස්සියේ දොරටුව දක්වා වැටුණු අඩිපාරකි. ඒ, නිවසට අවශ්‍ය දේ සපයන වෙළෙඳුන් සඳහා වූ අඩිපාර විය යුතුය. නිවසේ වම්පසින් වූයේ පටුමඟකි. එය අවසන් වූයේ ඉස්තාලයකිනි. එහෙත් මෙය හෝල්ඩර් මහතාට අයත් ඉඩමටත් පිටතින් පිහිටි පොදු අශ්වගාලක් බව අපි දුටුවෙමු. නිවසේ ඉදිරිපස අප බලා සිටියදී, හෝම්ස් සෙමින් සෙමින් නිවස වටා රවුමක් ඇවිද්දේය. නිවස ඉදිරිපස වූ මල්උයන හරහා ද,

http://sherlockholmesinvestigations.blogspot.com

වෙළෙන්දන් සඳහා වූ පටුමගේ ද, අස්වගාලට යන පටුමගේ ද ඔහු සෝදිසි ගමනක නිරත විය. ඒ සඳහා ඔහු කොපමණ වේලාවක් ගතකළේ ද යත්, තවත් බලා නොසිට හෝල්ඩර් මහතා සහ මම නිවසට ඇතුළු වූයෙමු. අපි කෑම කාමරයේ ගිනි උදුන අසලට වී හෝම්ස් එනතුරු බලා සිටියෙමු.

අප නිහඬව බලා සිටියදී එක්වරම කෑම කාමරයේ දොර විවෘත විය. එයින් ඇතුළුවූයේ තරුණ කාන්තාවකි. මධ්‍යම ප්‍රමාණයටත් වඩා උස ඇය, කළු පැහැති දෙනෙත් හා කළු පැහැති කේශ කලාපයකට හිමිකම් කීවාය. ඒ කළු පැහැය නිසා හමේ තිබූ සුදුමැලි බව වඩාත් කැපී පෙනිණ. ඇත්තෙන්ම මළමිනියක් මෙන් මේ තරම් සුදුමැලි බවක් ගත් මුහුණක් තිබූ තරුණියක මා මීට කලින් දැක තිබූ බවක් සිහිකිරීමට වත් නොහැකි විය. ලේ බිඳක් හෝ නොමැති අයුරෙන් ඇගේ දෙතොල් පවා සුදුමැලි වී තිබිණි. එහෙත් හැඬීම නිසාදෝ දෙනෙත් රත්පැහැ විය. ඇය කාමරයට ඇතුළුවෙද්දී, මගේ සිතට දැනුණේ දැඩි ශෝකයකි. එය උදේ පාන්දර හෝල්ඩර් මහතාගේ කථාවට සවන් දෙද්දී දැනුණටත් වැඩි එකකි.

ඇය තමන්ගේ සිතේ හැඟීම් පාලනය කර ගැනීමට සමත් දැඩි හිතක් ඇත්තියක සේ මට හැඟිණි. මා එහි සිටියත් ලැජ්ජාශීලී නොවූ ඈ, හෝල්ඩර් මහතා වෙත ගොස් ඔහුගේ හිස අතගෑමට පටන්ගත්තේ, පියා වෙත දරුවකු දක්වන සෙනෙහස පෙන්වමිනි.

"ආතර්ව හිරභාරයෙන් නිදහස් කරන්න කියල පොලීසියට දැනුම් දුන්නද බාප්පෙ?"

"නැහැ නැහැ. මේ ප්‍රශ්නය අපි ගැඹුරටම හොයා බලන්න ඕනෙ දුව."

"ඒ වුණාට මට හොඳටම විශ්වාසයි ආතර් අහිංසකයි කියල. ඔබ දන්නවානෙ, මේ වගේ දේවල් ගැන ගැහැනුන්ට ඉවෙන් වගේ තේරෙනවා. ඔහු අතින් කිසිම වරදක් සිද්ධවෙලා නැහැ. ඉක්මන් වෙලා එහෙම නපුරු විධියට ක්‍රියා කිරීම ගැන බාප්පාට පස්සෙ දුක්වෙන්න සිද්ධ වෙනවා."

"ඔහු අහිංසක නම් ඇයි නිශ්ශබ්ද?"

"කවුද දන්නෙ? බාප්පා ඔහුව සැක කිරීම නිසා බාගවෙලාවට ඔහුට තදින් කේන්ති ගිහින් ඇති."

investigations.blogspot.com

"මං කොහොමද ඔහු ගැන සැකයක් ඇති කර නොගෙන ඉන්නෙ? ආතර් ඔටුන්න අරගෙන ඉන්න හැටි මගේ දෑසින්ම නේ දක්කෙ."

"ඔහු ඒක අතට අරගන්න ඇත්තෙ බලන්න වෙන්න ඇති. ආතර් අහිංසකයි බාප්පෙ. මං කියන එවගෙ විශ්වාසෙට ගන්න. මේක අමතක කරල දාන්න. අපි මේ තරම් ආදරය කරන ආතර් හිරේ ගිහිං කියන එක අපි හිතන්නෙවත් කොහොමද?"

"මං මේක කොහොමටවත් අමතක කරන්නෙ නෑ. නැතිවුණු මැණික් ලැබෙන තුරු ඒක කොහොමවත් කරන්න බෑ. මේරි! ආතර්ට උඹේ හිතේ තියෙන ආදරේ නිසා, මට අත්වෙන්න යන ඉරණම ගැන මොකුත් පේන්නෙ නෑ. මං හදන්නෙ කාරණෙව යටගහන්න නෙමෙයි. ඒක ගැන හාරල අවුස්සල බලන්න. ලන්ඩන් නාගරයෙන් මහත්තයෙක් එක්ක ආවෙ ඒ කටයුත්තටයි."

"මේ මහත්මයද?" ඇය ඇසුවේ මා දෙසට මුහුණ හරවමිනි.

"නෑ. ඔහුගේ මිත්‍රයා. ඔහුට ඕනැ වුණා තනිවම ගිහිං සෝදිසි කරලා බලන්න. ඒ හින්ද බලාගෙන ඉන්නෙ නැතුව අපි ගෙට ආවා. ඔහු අර ඉස්තාලයට යන පටුමඟ පැත්ත බලන්න ගියා."

"ඉස්තාලය පටු මගේ?" ඇය ඇසුවේ කළු පැහැති දෙබැම ඔසවා නළල රැලි කර ගනිමිනි.

"ඔහු ඒ පැත්තේ මොනවා හොයන්නද? ආ! . . . . . මේ එන්නේ ඒ මහත්මයා වෙන්න ඇති . . . . . මහත්මයා. මං හිතනවා මගේ ඥාති සොහොයුරා නිර්දෝෂයි කියන එක ඔප්පු කරන්න ඔබ සමර්ථ වේවි කියල?"

"ඔබේ අදහසට මම සම්පූර්ණයෙන්ම එකඟයි නෝනා. මම විශ්වාස කරනවා එය ඔප්පු කිරීමට මට හැකිවේවි කියල. මං හිතනවා මං මේ කථා කරන්නේ මේරි හෝල්ඩර් මෙනෙවියට, කියල? මං ඔබෙන් ප්‍රශ්නයක් දෙකක් ඇහුවට කමක් නැද්ද?"

"අහන්න මහත්මයා අහන්න. මේ භයානක ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් නම් . . . ."

"ඊයේ රාත්‍රී ඔබට මොකුත් ශබ්දයක් ඇහුණේ නැද්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"බාප්පා ශබ්දෙට කෑ ගැහීම පටන් ගන්නා තුරු මට කිසිවක් ඇහුණෙ නෑ. බාප්පගෙ කෑගැහිල්ල ඇහුණායමයි මං පහළට දුවගෙන ආවෙ"

"ඊයේ රාත්‍රියේ ගෙදර දොරවල් වැසීම කළේ ඔබයි. ඔබ හැම ජනේලයක්ම හොඳින් අගුළු දැම්මාද?"

"ඔව්"

"අද උදේ බලන විටත් ඒ හැම ජනේලයක්ම කලින් අගුළු දැමූ විධියටම තිබුණෙ ද?"

"ඔව්"

"පෙම්වතෙකු සිටින සේවිකාවක් මේ ගෙදර ඉන්නවා. එහෙම නේද?"

"ඔව්"

"මං හිතන්නේ ඇය ඔහු හමුවෙන්න එළියට ගිය බව ඔබ හෝල්ඩර් මහත්මයාට දැනුම් දුන්නා?"

"ඔව්. අපි විසිත්ත කාමරයේ සිටියදී ඒක ඇතුළෙට ආවෙත් මේ සේවිකාවමයි. බාප්පා මටුන්න ගැන කියූ දේවල් ඇයට ඇහෙන්න ඇති."

"මට තේරෙනවා. ඔබ නිගමනය කරන්නේ, ඇය එළියට ගිහින් පෙම්වතාට ඒ ගැන කියන්න ඇති; මටුන්න සොරකම් කිරීම ඒ දෙදෙනා සැලසුම් කරන්න ඇති කියලයි?"

"මේ අභූත කථාවලින් ඇති වැඩේ මොකක්ද?" හෝල්ඩර් මහතා සාකච්ඡාවට බාධා කළේය.

"මං ඔබට කිව්ව නේ, ආතර් මටුන්න අතේ තියාගෙන ඉන්න හැටි මං දුටුවා කියලා" ඔහු කීවේ නොඉවසිල්ලෙනි.

"හෝල්ඩර් මහත්මයා ටිකක් ඉවසන්න. අපි එතැනටත් ආ යුතුයි. අපි අර සේවිකාව ගැන ඉස්සර වෙලා කථාකරමු. හෝල්ඩර් මෙනෙවිය. ඇය කුස්සියේ දොරෙන් ආපහු ගෙට එන හැටි ඔබ දකින්න ඇති මං හිතන්නේ?"

"ඔව්. දොර හරියට වහලද බලන්න මං එතැනට යනකොට, ඇය හෙමින්ම ගෙට රිංගුවා. මං දක්කා මිනිහත් ඉන්නවා අන්ධකාරෙට වෙලා"

"ඔබ ඔහුව හඳුනනවාද?"

stigations.blogspot.com

"අපොයි ඔව්! ඔහු තමා අපට එළවළු අරගෙන එන එළවළු වෙළෙන්දා. නම ෆ්‍රැන්සිස් ප්‍රොස්පර්."

"ඔහු නැගිටලා හිටියේ දොරට ටිකක් වම් පැත්තට වෙන්නට නේද? ඒ කියන්නේ දොර ළඟට ආසන්න අඩි පාරෙන් ඉවතට වෙලා?"

"ඔව් ඒ විධියට තමයි."

"ඔහු ලී වලින් තැනූ බොරු කකුලක් පැළැඳි කෙනෙක්ද?"

තරුණ කාන්තාවගේ දෑසේ එක්වරම පළවූයේ භයට පත්වූ ලක්ෂණයකි.

"ඔබ හරියට ඉන්ද්‍රජාලිකයෙක් වගේ නේ. ඔබ කොහොමද ඒක දැනගත්තේ?"

ඇය ඇසුවේ සිනාමුසු මුහුණෙනි.

එහෙත් ඊට පිළිතුරු ලෙස හෝම්ස්ගේ නොඉවසිලිමත් මුහුණේ නම් සිනාවක් නොවීය.

"මං දැන් හරිම කැමැතියි උඩ තට්ටුවට ගිහිං පරීක්ෂා කරල බලන්න. නමුත් තවත් සැරයක් ගෙයින් එළියට ගිහිං, ගේ වටේ පරීක්ෂා කරල බැලුවොත් හොඳයි කියල මට හිතෙනවා. උඩට යන්න කලින් පහළ තට්ටුවේ ජනෙල් ගැන මුලින් සෝදිසි කරල ඉමු. ඒක සමහර විට වඩාත් හොඳ වේවි." හෝම්ස් කීය.

ඔහු එක් එක් ජනේලය ඉක්මනින් පරීක්ෂා කරගෙන ගියේය. වැඩිවේලාවක් රැඳුණේ ප්‍රමාණයෙන් විශාල ජනේලය ළඟ පමණකි. මෙය විසිත්ත කාමරයේ සිට ඉස්තාලය දෙසට විවෘත වන ජනේලයයි. මෙහි ජනෙල් පියන විවෘත කළ මගේ මිත්‍රයා, පිට පැත්තේ ජනෙල් පඩිය, සියුම් දේ පරීක්ෂාකරන උත්තල කාචයේ ආධාරයෙන් වඩාත් හොඳින් පරීක්ෂාකර බැලුවේය.

"දැන් අපි යමු උඩට."

බැංකු හිමියාගේ ඇඳුම් අඳින කාමරය ලී බඩු ස්වල්පයක් පමණක් තිබූ කුඩා එකක් විය. අළු පැහැති බුමුතුරුණක් එළා තිබූ එහි දිගු කැටපතක් හා විශාල අල්මාරියක් විය. හෝම්ස් එම අල්මාරියේ අගුළ වෙත තම අවධානය යොමු කළේය.

"මේක අරින්න යොදාගෙන තිබෙන යතුර මොකක්ද?"

"මගේ පුතාම කලින් කිව් එක - අනවශ්‍ය බඩු ගබඩා කර තිබෙන කාමරයේ අල්මාරියක යතුර."

"කෝ එය ඔබ ළඟ තියෙනවද දූ?"

"අර කණ්ණාඩි මේසය උඩ තියෙන්නේ."

එය අතටගත් හෝම්ස් අල්මාරිය විවෘත කර බැලීය.

"කිසිම ශබ්දයක් නොනැගෙන අගුලක්. මේක ඇරෙද්දී ඔබට ඇහැරුණේ නැති එකේ පුදුමයක් නෑ. ඔටුන්න ඇත්තේ මෙන්න මේ පෙට්ටියේ වෙන්න ඕනෑද. අපි ඒක සෝදිසි කර බැලිය යුතුයි."

පෙට්ටිය විවෘත කොට ඔටුන්න එළියට ගත් හෝම්ස් එය මේසය මත තැබුවේය. රන්කරුවෙකුගේ ශිල්පීය කුසලතාවය මනාව විදහා දක්වූ එය ඉතා අලංකාර එකක් විය. දියමන්ති හා නොයෙක් වර්ග වල මාණික්‍ය තිස් හයකින් සරසා තිබූ මෙවැන්නක්, මා මීට පෙර කවදාවත් දැක නොතිබිණි. එහි කෙළවරක එක් තැනක් පුපුරා ගොස් තිබූ අයුරු පැහැදිලිව දැකිය හැකි විය. මැණික් ගල් තුනක් සහිත රන් කැබැල්ල ඉවත් කරගෙන තිබුණේ එතැනිනි.

"මේ බලන්න හෝල්ඩර් මහත්මයා" හෝම්ස් කථාව පටන්ගත්තේය.

"ඔටුන්නෙන් කැඩී, අතුරුදන් වී තිබෙන කෙළවරට සමාන තවත් කෙළවරක් තමයි මේ. මං ඔබට ආයාචනය කර සිටිනවා මෙතැනින් කැල්ලක් කඩන්න කියලා."

බැංකුකරුවා තිගැස්සී පිටුපසට පැන්නේය.

"එහෙම දෙයක් කරන්න මං හීනෙකින්වත් හිතන්නෙ නෑ."

"ඔබට බැරි නම් මම කරන්නම්."

එසේ කියූ හෝම්ස් ඔටුන්න අතට ගෙන, ඒ කෙළවරෙන් කැල්ලක් කඩා ගැනීමට දැඩි උත්සාහයක් දැරුවේය. එහෙත් එයින් ප්‍රතිඵලයක් නොවීය.

"යන්තමින් නමන්න පුළුවන් වගෙයි. ඒ වුණත්, කැල්ලක් කඩන්න මට දවසක්ම ගතකරන්න වෙයි. මගේ අතේ ඇඟිලි කොයිතරම් ශක්තිමත් වුණත්.

සාමාන්‍ය මිනිහෙකුට මේක කඩන්න බැහැ. හොඳයි යම් විධියකින් මට මේ ඔටුන්නෙන් කැල්ලක් කඩාගන්න පුළුවන් වුණා

නම්, මොකක්ද හෝල්ඩර් මහත්මයා සිද්ධ වෙන්නෙ? එහෙනම් මහා විශාල ශබ්දයක් ඇතිවෙනවා. හරියට පිස්තෝලයකින් වෙඩිල්ලක් පත්තු කළා වගේ ශබ්දයක් පිටවෙනවා. ඔබ කියන්නේ මේකෙ කෑල්ලක් කැඩෙන එක ඔබ නිදා හිටි ඇඳට යාර කිහිපයක් ඈතින් සිද්ධවුණා; නමුත් ඔබට කිසිම ශබ්දයක් ඇහුණේ නැහැ කියලද?"

"මට මොකුත්ම හිතාගන්න බැහැ මහත්මයා. මට මේකෙ කිසිම දෙයක් තේරුම් ගන්න බැහැ."

"අපි මේකෙ ටික ටික ඉදිරියට යද්දි බාග වෙලාවට තේරුම් ගන්න පුළුවන් වේවි. ඔබට මොනවද හිතෙන්නේ හෝල්ඩර් මෙනෙවිය?"

"බාප්පට වගේම තමයි. මටත් කිසිදෙයක් තේරුම් ගන්න බැහැ."

"හෝල්ඩර් මහත්මයා. ඔබ ඊයේ රාත්‍රියේ ඔබේ පුතාව දකින කොට ඔහු සපත්තු සෙරෙප්පු කිසිවක් පැළැඳ හිටියෙ නැද්ද?"

"නැහැ. ඔහු හැඳ සිටියේ කමිසය සහ කලිසම පමණයි"

"ඔබට ස්තුතියි. මෙම පරීක්ෂණය විසඳීමට ප්‍රයෝජනවත් වෙන හෝඩුවාවල් අසාමාන්‍ය ලෙස ලැබීම අපේ වාසනාවක්. මේක විසඳාගන්න බැරි වුණොත් ඒක අපේම වැරැද්ද. හෝල්ඩර් මහත්මයා. දැන් ඔබ අවසර දෙනව නම් මගේ සෝදිසිය ගෙයින් එළියේ කරන්නම්.

ඔබ කවුරුවත් මා සමඟ එළියට එන්න එපා. ඒ මොකද ඔබේ පා සටහන් පොළොවේ සලකුණු වුණාම, ඒකෙන් මට අනවශ්‍ය කරදරයක් ඇතිවෙනවා."

එළියට ගිය හෝම්ස් පැයක් හෝ ඊට වැඩි කාලයක් තම කටයුත්තේ යෙදී සිටියේය. අන්තිමේ දී ඔහු ඇතුළට එන විට ඔහුගේ පාවහන් සහසාම හිම තට්ටුවලින් වැසී තිබිණ. මගේ මිත්‍රයාගේ මුහුණෙන් ප්‍රකාශ වුණු හැඟීම නම්, තේරුම් ගැනීමට අපහසු අබිරහස් එකකි.

"දකින්න තිබුණු හැම දෙයක්ම මං දුටුවා හෝල්ඩර් මහත්මයා. දැන් ආපසු මගේ නිවහනට යෑමෙන්, මට පුළුවනි ඔබට වඩාත් හොඳ සේවයක් සලසන්න."

…investigations.blogspot.com

"ඒ වුණත් හෝම්ස් මහත්මයා, අර මැණික් ගල්?"

"ඒක මට කියන්න බැහැ."

හෝල්ඩර් තම දැත් ඇඹරීමට පටන් ගත්තේ සියලු බලාපොරොත්තු කඩවී ගිය ආකාරයෙනි.

"මට ඒවා කවදාවත් දකින්න ලැබෙන එකක් නැහැ!" ඔහු වැලපුණේය.

"එතකොට මගේ පුතා? ඔබ කියන්නේ මට බලාපොරොත්තු අත්හරින්න එපා කියලද?"

"මුලින් මගේ සිතේ ඇතිවුණු අදහස මං ඔබට කීවා. ඒකෙ තවමත් කිසිම වෙනසක් වෙලා නැහැ."

"එහෙනම් මහත්මයා දෙවියන්ගේ නාමයෙන් මට කියල දෙන්න! ඊයේ රාත්‍රියේ මගේ ගෙදර සිදුවුණු අපරාධය මොකක්ද?"

"හෝල්ඩර් මහත්මයා. ඔබට පුළුවන්ද හෙට උදේ නවයත් දහයත් අතර බේකර් වීථියේ අපේ නිවහනට එන්න? ඇවිත් මාව හමුවෙන්න? මේ ගැටලුව සම්පූර්ණයෙන්ම තේරුම් කර දෙන්න එවිට මට හැකිවේවි. ඔබේ කටයුත්ත සඳහා, නැතිවූ මැණික් ගල් හොයා දුන්නොත්, ඔබ මට ගෙවනවා කිව් මුදලේ සීමාවක් කළේ නැහැ?"

"ඒ මැණික් තුන සොයා දෙනවා නම් මං මගේ මුළු සේපතම ඔබට දෙන්නම්."

"බොහොම හොඳයි. එහෙම නම් මං ඔබේ ගැටලුව ගැන හොඳින් බලන්නම්. ආයුබෝවන්. අද හැන්දෑවෙන්න කලින් බාග වෙලාවට මට යළිත් වරක් මෙහේ ඇවිත් යන්න සිදුවෙන්න පුළුවනි."

මේ වන විට සිද්ධිය වූ පිළිබඳ මගේ මිත්‍රයා හොඳින් තේරුම් ගෙන, නිරාකරණයකට පැමිණ ඇති බව මම වටහා ගතිමි. එහෙත් මෙහි අවසාන නිගමනය කුමක්දැයි, මට යන්තමින් හෝ සිතාගැනීමට හැකියාවක් නොවීය. ආපසු එන ගමනේදී මේ ගැන ඔහු සමඟ කතාබහක් පටන් ගැනීමට මම කිහිප වරක්ම උත්සාහ දැරුවෙමි. එහෙත් හැම විටකදීම කතාබහ වෙනත් මාතෘකාවකට ඇදී ගියේය. මේ ගැටලුව පිළිබඳ කථාව එතැනම නතර විය.

http://sherlockholmesinvestigations.blogspot.com

අප බේකර් වීථියේ අපේ නිවාසයට පැමිණෙන විට සවස තුන වත් වී නොතිබිණි. ඉක්මනින් තම කාමරයට ගිය හෝම්ස් පිටත යෑමේ අරමුණෙන් වෙස් මාරු කරගත්තේය. මෙවර ඔහු මගතොට නිතර දකින්නට ලැබෙන රස්තියාදුකාරයකු මෙන් සැරසී සිටියේය. ගෙවී ගිය පැරණි කබායක් හැඳ, එහි කොලරය උඩට සිටින සේ දිගහැරගෙන, රතු පැහැති කර ලේන්සුවක් කොලරය වටා ගැටගසා ගත්තේය. මීට අමතරව ඔහු ගෙවීගිය සපත්තු කුට්ටමක් ද පැළඳගත් පසු නියම රස්තියාදුකාර තරුණයෙකු මෙන් දිස්විණි.

"මේ ප්‍රමාණෙට වෙස් මාරු කරගත්තාම ඇතිවේවි" ඔහු කීවේ ගිනි උදුන අසල කැටපතෙන් තවත් වරක් බලමිනි.

"ඔබත් මා සමඟ එන්න යන්න තිබුණා නම් හොඳයි වොට්සන්. නමුත් මට බයයි. ඒකෙන් මගේ වැඩ පිළිවෙළ අසාර්ථක වේවිද කියලා. එක්කෝ මං මේ පිද්ධිය වුණු ආකාරයේ ගමන් මඟට ඇවිල්ලා. එහෙමත් නැත්නම් මට අනුවුණු හෝඩුවාවල් පස්සෙ ගිහිං සම්පූර්ණයෙන්ම අතරමංවෙලා. දෙකෙන් කොයි එකද කියන එක ඉක්මනට මට දැනගන්න පුළුවන් වේවි. පැය කීපයක් යද්දි මට ආපහු එන්න බැරි වෙන එකක් නැහැ."

සයිඩ්බෝඩය මත තිබූ මස් කුට්ටියෙන් පෙත්තක් කපාගත් හෝම්ස්, එය පාන්පෙති දෙකක් අතරට දමා ඔතාගත්තේය. මේ දළ ආහාර වේල සාක්කුවට දමාගත් ඔහු තම ගවේෂණාත්මක කටයුත්ත සඳහා පිටත්වී ගියේය.

මා සැන්දෑවේ තේ පානය අවසන් කළා පමණි. හෝම්ස් ආපසු ආවේය. ඉලාස්ටික් පටි යෙදූ සපත්තුවක් රැගත් ඔහු සිටියේ අතිශය ප්‍රීතිමත් ස්වභාවයකිනි. සපත්තුව කාමරයේ මුල්ලකට විසි කළ ඔහු කෝප්පයකට තේ වත්කර ගත්තේය.

"මං මේ මෙතැනින් යන ගමන් ගෙට ගොඩවුණා. තේ එක බිව්ව ගමන් ආයෙමත් යනවා."

"ඒ කොහේටද?"

"ලන්ඩනයේ බටහිර පැත්තේ අන්තිම කෙළවරට. මං ආපහු එද්දී හුඟක් ප්‍රමාද වෙන්න පුළුවනි. මං එනතුරු බලාගෙන ඉන්න එපා වොට්සන්!"

http://sherlockholmesinvestigations.blogspot.com



110. "මේ ප්‍රමාණයට වෙස්මාරු කරගන්නම ඇතිවේවි."

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබේ පරීක්ෂණය සාර්ථකද?"

"ඔව් ටිකක් ටිකක්. හුඟක්ම අසාර්ථකයි කියන්නත් බැහැ. මං ස්ට්‍රෙදම් වලට ගිහිල්ලයි ආවේ. ඒ වුණත් මං හෝල්ඩර්ගෙ ගෙදරට ගියේ නැහැ. මේක හරිම සිත් ඇදගන්නා ආකාරයේ ගැටලුවක්. කීයක් දෙනවාය කිව්වත් මං මේක නම් අත්අරින්නේ නැහැ. කොහොම වුණත් මෙතැන ඕපදූප කථා කර කර ඉන්නෙ නැතුව මං ඉක්මනට ඇඳුම් මාරු කරගන්නම්. රස්තියාදුකාරයා තනතුරෙන් මිදිලා, මට පුරුදු මහ වැදගත් බවට පත්වෙලා ඉන්න ඕන."

කතාබහේදී හෙළි නොකළත් ඔහු සෑහීමට පත්විය හැකි තරම් කාරණා හොයාගෙන ඇති බවක් මට හැඟිණ. මා ඒ බව තේරුම් ගත්තේ හෝම්ස්ගේ දිදුලන දෑසින් හා රත්පැහැ වූ දෙකොපුලෙනි. කාමරයට ගොස් ඉක්මනින් ඇඳුම් මාරුකරගත් ඔහු යළිත් නිවසින් පිටත් වී ගියේය.

මා මධ්‍යම රාත්‍රිය ගෙවෙන තුරු අවදියෙන් බලා සිටියත් මගේ මිත්‍රයා ආපසු පැමිණියේ නැත. එහෙයින් මම නින්දට යෑමේ අරමුණෙන් මගේ කාමරයට පිවිසුණෙමි. අපරාධකරුවෙකු පිළිබඳව ඉවක් වැටුණු කල, හෝම්ස් රෑ දවල් නොතකා දින ගණන් නිවසෙන් බැහැරව සිටියේය. ඒ නිසා ප්‍රමාදය ගැන මම පුදුමයට පත් නොවීමි. එදින රාත්‍රියේ ඔහු ආපසු ගෙදර පැමිණියේ කීයටද යන්න මම නොදනිමි. එහෙත් මා උදේ තේ පානය සඳහා එද්දී, හෝම්ස් කෝපි කෝප්පයක් අතින් ගෙන මේසය අසල වාඩිවී සිටියේය. රැවුල බා, හොඳින් හැඳ පැළඳ සිටි ඔහුගේ අතේ පුවත්පතක් ද විය.

"ඔබට අවදි නොකර අද උදෙන්ම මං වැඩ පටන් ගත්ත එකට අමනාප වෙන්න එපා වොට්සන්. ඔබට මතක නේද? අපේ අනුග්‍රාහකයා අද උදේ පාන්දරින්ම මෙහේ එන්න පොරොන්දු වුණා නේ."

"නවම නවය පහුවුණා විතරයි නේ. මට ඇහුණා සීනුව නාද වෙන හඬක්. ඒ අපේ අනුග්‍රාහකයා නම් පුදුමයක් නෑ" මම පිළිතුරු දුනිමි.

http://sherlockholmesinvestigations.blogspot.com

ඇත්තෙන්ම ඒ අපේ අනුග්‍රාහකයා වූ හෝල්ඩර් මහතාය. සෙවර ඔහුගේ මුහුණ වෙනස් වී තිබූ හැටි දුටු මම තැති ගත්තෙමි. සාමාන්‍යයෙන් ඔහුට තිබුණේ පළලින් වැඩි විශාල පිම්බුණු මුහුණකි. එහෙත් අද මුහුණ වැහැරී ගොස් හැකිළී රැලි වැටුණු ස්වභාවයක් ගෙන ඇත. හිසකෙස් එදාටත් වඩා සුදු පැහැ වී ඇතැයි මට සිතිණි. ඔහු අතිශයින්ම දුර්වලව, භයානක ලෙස සුදුමැලි වී ඇති බවක් දිස්විය. කලින් දා උදෑසනටත් වඩා අතිශයින් වේදනාවට හා කලකිරීමට පත්වී ඇති බවක් පෙන්නුම් කළ හෝල්ඩර් මහතා, හාන්සි පුටුව මත ඇද වැටුණේය.

"මං දන්නෙ නැ, මං මොන අපරාධයක් කළාටද මට මේ විදියට කරදර සිද්ධ වෙන්නෙ කියල. දවස් දෙකකට කලින් මං සතුටින් කාලය ගෙවූ සාර්ථක ව්‍යාපාරිකයෙක්. දන් මට අත් වේගෙන යන්නෙ හරිම දුක්ඛදායක ඉරණමක්. සමාජයේ නින්දා අපහාස වලට ලක්වෙමින් තනියෙන් කාලය ගෙවන්නයි මට ඉස්සරහට සිද්ධ වෙන්නෙ. කරදර එනකොට එන්නේ, එකක් පස්සේ එකක්. මහත්මයා මගේ ඥාති දියණිය මේරි මාව අත්ඇරලා ගිහින්!"

"ඔබව අත්හැර දමා ගිහින්?"

"ඔව්. ඇය ඊයෙ රාත්‍රී ඇගේ ඇඳේ නිදාගෙන නැති බවයි පෙනුණෙ. අද උදේ බලන කොට කාමරය හිස්. සාලෙ මේසෙ උඩ මට ලියුමක් තබා ගිහින් තිබුණා.

මං ඊයෙ රෑ ඇයට එක් කාරණයක් කිව්වා. ඒක මං තරහින් කියූ දෙයක් නෙමෙයි. මං ඒක කිව්වේ බොහොම දුකෙන්. මං කිව්වා; මේරි ඔබ මගේ පුතා බඳින්න කැමැති වුණා නම්, පුතා මේ වගේ කෙනෙක් වෙන්නෙ නැහැනෙ කියලා. මං ඒ කියූ දෙයින් ඇගේ හිත රිදෙන්න ඇති. මේ ලියුම් කෑල්ලෙ සඳහන් වෙලා තියෙන්නෙ ඒ ගැනයි.

**මගේ ආදරණීය බාප්පේ.**

**මට හිතෙනවා මං නිසා බාප්පාට මහා කරදර රාශියකට මුහුණපාන්න සිදුවුණා කියල. මං මීට වඩා වෙනස් විධියකට කටයුතු කළා නම් මේ අවාසනාවන්ත සිදුවීම කිසිදාක වෙන්නේ නැහැ. ඒ සිතුවිල්ල මගේ හිතේ තියාගෙන, බාප්පාගේ වහල යට මම මීට**

http://sherlockholmesinvestigations.blogspot.com

පස්සෙ සන්තෝසෙන් ඉන්නෙ කොහොමද? ඒ නිසා ඔබෙන් සමුගෙන යා යුතුයි කියල මට හිතෙනවා. මගේ අනාගතය ගැන බාප්පා දුක්වෙන්න එපා. ඒකට වැඩ පිළිවෙළක් සකස් වෙලයි තියෙන්නේ. ඒ ඔක්කොටම වඩා, බාප්පා මාව හොයන්න උත්සාහ දරන්න එපා. ඒ මොකද එක අතකින් ඒක මට කරන හිරිහැරයක්. අනෙක් අතට, ප්‍රයෝජනයක් නොලැබෙන නිෂ්ඵල වැඩක්.

ජීවත් වුණත්, මළත් මං ඔබට හැමදාමත් අදරැති

මේරි"

"ඇය මේ ලියුමෙන් අදහස් කරලා තියෙන්නේ මොකක්ද හෝම්ස් මහත්මයා? ඔබ හිතනවද සියදිවි නසා ගැනීමක් ගැන අදහසක් මෙකෙ තියෙනවා කියල?"

"නෑ නෑ. එහෙම දෙයක් නැහැ. මට හිතෙන්නේ මේක තමයි හොඳම විසඳුම, බාග වෙලාවට ඔබේ කරදර හැම එකක්ම අවසන් වෙගෙනයි එන්නේ, හෝල්ඩර් මහත්මයා."

"හො හෝ! ඔබ එහෙම කියන්නෙ ඇත්තටම ද? එහෙනම් හෝම්ස් මහත්මයා ඔබට මොකක් හරි දැනගන්න ලැබිල ඇති. කෝ මැණික් ගල් ටික?"

"ඔබට හිතෙනවද එක මැණික් ගලකට පවුම් දාහක් විතර ගෙවන්න සිදුවුණොත් ගාණෙ හුඟක් වැඩියි කියලා?"

"මං එක මැණික් ගලකට දහදාහක් දෙන්නම්!"

"එච්චර ගෙවන්න උවමනා නැහැ. පවුම් තුන්දාහක් ගෙව්වාම ඇති. මේක හොයා දුන් කෙනෙකුට ඔබ පවුම් දාහක තෑග්ගකුත් දෙනවා කියල තිබුණ මට මතකයි. ඔබේ චෙක් පොත ළඟ තියෙනවද? මෙන්න පෑන. එහෙනම් මහත්මයා පවුම් 4000 කට චෙක්පතක් ලියන්න."

යම් උත්තේජනයක් ලැබූ පුද්ගලයෙකු මෙන්, හෝල්ඩර් මහතා වහාම චෙක්පත ලියා හෝම්ස් අතට දුන්නේය. තම මේස ලාච්චුව වෙත ගිය හෝම්ස්, එය විවෘත කොට මාණික්‍ය තුනක් සහිත ත්‍රිකෝණාකාර රන් කෑබැල්ලක් ගෙන එය මේසය මතට දැම්මේය.

හෝල්ඩර් එය ඩැහැගත්තේ උතුරා යන සන්තෝෂයෙනි.

"ඔබ ඒක හොයාගත්තා! මං බේරුණා! මං බේරුණා!!"

http://sherlockholmesinvestigations.blogspot.com

ශෝකයෙන් වැළපෙමින් සිටියදී මෙන්ම සතුටේදී ද ඔහු හැඟුම් බර බවක් පළ කළේය. මැණික් සහිත රන් කැබැල්ල හෝල්ඩර් තම පපුවට තබා තද කරගෙන සිටියේය.

"හෝල්ඩර් මහත්මයා. ඔබ විසින් ගෙවිය යුතු තවත් ණයක් තියෙනවා" හෝම්ස් කීය.

"ණයක්? කීයද ගණන? මං ගෙවන්නම්" හෝල්ඩර් කීවේ පෑන අතට ගනිමිනි.

"නෑ නෑ. ඒ ණය ගෙවන්න තියෙන්නේ මට නෙමෙයි, ඔබේ පුතාට. ඔබ ඔහුට නිකරුණේ චෝදනා කර හිරභාරයට පත්කිරීම ගැන, ඔහුගෙන් යටහත්ව සමාව අයැද සිටිය යුතුයි. ඔහු මෙතැන දී කටයුතු කරල තියෙන්නේ ඉතාම ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් විදියට. කවදා හරි මට පුතෙක් හිටියොත් මං කැමැතියි ඔහුත් ඔබේ පුතා වගේ උතුම් අයුරින් ක්‍රියා කරනවා දකින්න. ඔහු එහෙම කළොත් මට ආඩම්බර වෙන්න පුළුවන් බවට සැකයක් නෑ."

"එහෙනම් මේක ගත්තෙ ආතර් නෙමෙයිද?"

"මං ඔබට ඊයෙත් කිව්වා. අදත් කියනවා. ආතර් නෙමෙයි"

"ඔබට හොඳටම විශ්වාසයි? එහෙනම් අපි ඉක්මනින් යමු ආතර් හමුවෙන්න. ගිහිං ඔහුට කියමු සත්‍යය හෙළිවෙලා තියෙන්නෙ කියල."

"ඔහු ඒක දැනටමත් දන්නවා. මං මේ ගැටලුව විසඳුවාට පස්සෙ ඔහු හමු වී කථා කළා. නමුත් ඔහු කිසිදෙයක් හෙළි කරන්න සූදානම් වුණේ නැහැ. එදා රාත්‍රියේ සිද්ධ වුණේ මොකක්ද කියල මං ඔහුට කිව්වා. එතකොට ආතර්ට සිදුවුණා මං කිව් දේ නිවැරදියි, සිද්ධිය වුණේ ඒ ආකාරයට යයි කියල පිළිගන්න. මට විකක් නොපැහැදිලි තැන් කිහිපයක් පැහැදිලි කරල දෙන්න ඔහුට හැකිවුණා. ඔබ මේ උදේ පාන්දර මා වෙත ගෙනා ප්‍රවෘත්තියෙන් ආතර්ගෙ කට ඇරේවි."

"හෝම්ස් මහත්තයා. දෙයියන්ගෙ නාමෙන් මට කියන්න. මොකක්ද මේ මහා පුදුමාකාර අභිරහස?"

"මං ඔබට කියන්නම්. මං පියවරෙන් පියවරට සත්‍යය හොයා ගත්තෙ කොහොමද කියලත් ඔබට කියන්නම්. කථාව පටන් ගනිද්දීම

http://sherlockholmesinvestigations.blogspot.com

ඔබට කියන්න වැදගත් කාරණයක් තියෙනවා. ඒක කියන්න මට හිතට අමාරුයි. ඒක අහලා ඔබේ හිතට අමාරු වේවි. සර් ජෝජ් බර්න්වෙල් හා මේරි අතර හාදකමක් තිබෙනවා. දැන් ඇය ඔහු සමඟ පැන ගිහින්."

"මගේ මේරි? වෙන්න බෑ?"

"අවාසනාවකට වගේ එය වෙන්න පුළුවන්. එච්චර විතරක් නෙමෙයි. ඒක හොඳටම විශ්වාසයි. මේ පුද්ගලයා ඔබේ ගෙදරට වැද්ද ගනිද්දී, ඔහු මොන වගේ චරිතයක් තියෙන කෙනෙක්ද කියලා, ඔබ දැන හිටියෙත් නෑ, ඔබේ පුතා දැන හිටියෙත් නෑ. සර් ජෝජ් බර්න්වෙල් කියන්නේ එංගලන්තයේ ඉන්නා ඉතාම නින්දා සහගත තක්කඩින් කිහිප්දෙනාගෙන් එක්කෙනෙක්. සූදුවට ගිහිං විශාල ධනයක් නාස්තිකරලා, ඔහු අන්තිමටම බංකොලොත් වෙලයි ඉන්නේ. ඔහු හදවතේ කිසිම හෘදසාක්ෂියක් ඇති හෝ අනුකම්පාවක් ඇති කෙනෙක් නෙමෙයි. හෘද සාක්ෂිය කියල දෙයක් නැති වංචාකාර හොරෙක්. ඔබේ දොතිදියණිය මේ වගේ මිනිසුන් හඳුනන්නෙ නැහැ. මීට කලින් ගැහැනු සිය ගණනකට ඔහු පොරොන්දු වුණා වගේ, සර් ජෝජ් ඇයටත් දිවුරා පොරොන්දු වෙන්න ඇති, ආදරේය කියල. ඇය රැවටුණා. ඇය හිතුවා ඔහුගේ අවංක ආදරය දිනාගන්න හැකිවුණු එකම තැනැත්තිය ඇය ය කියල. ඔහු ඇයව රැවැට්ටුවේ මොනවා කියලද කියන එක දන්නේ යක්ෂයා විතරයි. නමුත් ඇය රැවටුණා. ඔහුගේ අතකොලුව වුණා. පුරුද්දක් හැටියට හැමදාම හැන්දෑවට ඔහුව හමුවුණා."

"මට ඔය කතාව විශ්වාස කරන්නත් බෑ. මං ඒක විශ්වාස කරන්නෙත් නෑ!" මුහුණ සුදුමැලි වුණු හෝල්ඩර්ට කෑගැසුවේය.

"මං එහෙනම් කියන්නද ඊයේ රෑ ඔබේ ගෙදර සිද්ධ වුණේ මොකක්ද කියල? ඔබ හිතුවා මේරි ඇයගේ කාමරයට ගියා කියල. නමුත් ඇය ඇත්තටම සෙමින් සෙමින්ම කාමරයෙන් එළියට ආවා. ඉස්තාලය පැත්තට තිබෙන ජනේලය ළඟට ඇවිත්, සර් ජෝජ් සමඟ ඇය හොරෙන්ම කතාබහ කරමින් සිටියා. ඔහු පැහැදිලි වෙලාවක් එතැන රැඳී සිටල තියෙනවා. ඒ මොකද පොළොව මත තිබූ ඝන හිම තට්ටුව, ඔහුගේ පාවහන් වලින්, දිය වී, කැඩී ගිහින් පස් මතුවී තිබුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

මට ගෙදර ගෙන ආ මටුන්න ගැන ඇය ඔහුට කිව්වා. රත්තරන් වලට, අනුන් සතු වස්තුවට ඔහුගේ තියෙන්නේ පුදුම හැදරකමක්. වටිනා දෙයක් තියෙනවා නම්, ඒක කොහොම හරි තමන් සතු කර ගැනීමේ දුෂ්ට චේතනාව ඔහුගේ හිතෙන් මැකුණේ නෑ. මටුන්න කොහොම හරි හොරකම් කර ගන්න එකයි ඔහුගේ අරමුණ වුණේ. ඔහුගේ අදහසට ඇය මුලින් අකමැති වෙන්න ඇති. නමුත් කොහොම හරි ඇයව ඒ සඳහා නම්මා ගැනීමට ඔහුට හැකිවුණා. මේරි ඔබට නුහක් ආදරේ බවට සැකයක් නෑ. නමුත් සමහර ගැහැනු ඉන්නවා; ඔවුන් තමන්ගේ පෙම්වතාට කරන ආදරය ඉස්සරහ අනික් ආදර ඔක්කොම දියවී යනවා. මං හිතන්නේ ඔබේ ඥාති දියණියත් අන්න ඒ වගේ කෙනෙක්.

සර් ජෝජ් සමග ඇය ජනේලයෙන් කතාබහ කරද්දී තමයි, ඔබ තරප්පුව දිගේ පහළට බහින්න පටන්ගත්තෙ. රාත්‍රියේ දී හොරකමට අවශ්‍ය උපදෙස් ඇයට ඔහුගෙන් අහගන්න ලැබුණා පමණයි. ඔබේ අඩි ශබ්දයට ඇය ඉක්මනින් ජනේලය වහල දැම්මා. ඒහෙම කරලා, සේවිකාව ඇගේ ලී කකුලක් තියෙන පෙම්වතා හමුවෙන්න එළියට ගිය හැටි ගැන කතාවක් පටන් ගත්තා. සේවිකාව එහෙම ගිය බවත් සම්පූර්ණ ඇත්තක්.

මගේ පුතා ආතර් ඔබ සමග කළ කතාබහෙන් පස්සේ නිදාගන්න ඇඳට ගියා. නමුත් සමාජශාලාවේ තමන්ට ගෙවන්න සිදුවී ඇති ණය ගැන හිතමින් හිටි ඔහුට හරිහැටි නින්ද ගියේ නැහැ. රෑ දෙගොඩ හරි ජාමේ ඔහුට යන්තමට ඇහුණා, කවුදෝ ඔහුගේ කාමරය ළඟින් බොහෝම ප්‍රවේශමෙන් ඇවිද ගෙන යන අඩි ශබ්දයක්. ඔහු ඇඳෙන් නැගිටලා බැලුවා. ශබ්දයක් නොනැගෙන සේ අඩි තබමින් මේරි බරාදය දිගේ ඇවිද ගෙන ගියා. ඇය ඔබේ ඇඳුම් අඳින කාමරයට යන හැටි දුටු ඔහු පුදුමයට පත්වුණා. ඉක්මනින් ඇඳුම් කිහිපයක් ඇඳගත් ඔහු මොකක්ද මේ වෙන්න යන්නේ කියලා බලන්න අඳුරට වී සැඟවී සිටියා.

බරාදයේ දැල්වුණු ලාම්පුවේ එළියෙන් ආතර්ට දකින්න ලැබුණේ මොකක්ද? අතිශයින්ම වටිනා මටුන්නත් රැගෙන මේරි බරාදය දිගේ ආපහු එන හැටි. මටුන්න රැගෙන ගිය ඇය සෙමින් අඩි තබමින් තරප්පුව බහින්න පටන්ගත්තා. මෙය දුටු ආතර් භීතියෙන් තිලිපොලා ගියා. ඔහු [illegible] මුවා වී

බලාගෙන හිටියා. තරප්පුව බැහැලා ගිහින් සාලයට පිවිසුණු ඇය, ජනේලය ඇරලා පිටත අඳුරේ සැඟවී සිටි කාට හරි ඔටුන්න දෙන හැටි ආතර් දුටුවා. ඊළඟට ජනේලය වසා දැමූ ඇය ඉක්මනින් තමන්ගේ කාමරයට ආපහු ගියේ, ආතර් සැඟවී සිටි තැන අසලින්මයි.

ආතර් ගේ හිතේ තවදත් මේරි ගැන ලොකු ආදරයක් තිබුණා. ඒ නිසා ඇයගේ මේ පාපිෂ්ඨ ක්‍රියාව ගැන ඔබට හෙළි කරන්නත් බැහැ. ඔහුට තවදුරටත් ක්‍රියාත්මක වෙන්න හැටියකුත් නැහැ. දැන් සිද්ධ වෙන්නේ මොකක්ද කියන එක ඔබේ පුතාට එක් ක්ෂණයකින් වැටහුණා. ඒයින් ඔබ පත්වෙන්නේ මොන තරම් අවාසනාවකටද, එය ඔබගේ විනාශය ළඟාකරන හැටි ආතර් තේරුම් ගත්තා. මේ වැරැද්ද වහාම නිවැරදි කිරීමේ වැදගත් කම ඔහුට වැටහී ගියා.

ආතර් වහාම පහළ තට්ටුවට බැස්සා. ඔහු සිටියේ පාවහන් වත් පැළඳගෙන නොවෙයි. ජනේලය ඇරගෙන ඔහු එයින් එළියට පැන්නේ හිම මතට. ඔහු හැකි තරම් වේගයෙන් පටුමාවත දිගේ ඉදිරියට දිව ගියා. ඔහුට හඳ එළියේ පෙනුණා, අඳුරු සෙවණැල්ලක් වගේ කිසිවෙකු පැන දුවන ඡායාව. සර් ජෝජ් බර්න්වෙල් උත්සාහ කළේ ඔටුන්නත් අරගෙන පැනගන්නයි. නමුත් ආතර් ඔහුව අල්ලා ගත්තා.

ඔටුන්න ගැනීම සඳහා දෙදෙනා අතර පොරයක් ඇතිවුණා. එක් අවස්ථාවක ඔබේ පුතා ඔටුන්නේ එක් පැත්තකින් අල්ලාගෙන එය තමන් වෙතට ඇද්දා. සර් ජෝජ් ඔටුන්නේ තවත් පැත්තකින් අල්ලාගෙන ඇද්දා. මේ සණ්ඩුවේදී ඔබේ පුතා, සර් ජෝජ්ට එල්ල කළ ප්‍රහාරෙන් ඔහුගේ ඇහැකට ඉහළින් කැපී තුවාල වුණා. එක් වරම යමක් බිඳී යන ශබ්දයක් ඇහුණා. ඔටුන්න තමන්ගේ අතට ආව බව දුටු ආතර් එය රැගෙන ගෙදර දුව ආවා. ඔහු ජනේලයෙන් ගෙට ඇතුළු වී එය වසා දැම්මා. ඊළඟට ඔහු ඔටුන්න ගෙන ගොස් කාමරයේ ඔබේ අල්මාරියේ දමන්න සූදානම් වුණා. එවිටයි ඔහු දුටුවේ සණ්ඩුවේදී ඔටුන්න ඇද වී ඇති බව. ඔහු එහි ඇදය නිවැරදි කරන්න උත්සාහ දරද්දී තමා ඔබ එතැනට ආවේ.

"මේක වෙන්න පුළුවන් දෙයක්ද?" බැංකුකරු ඇසීය.

"ඔබෙන් ආතර්ට හෘදයාංගම ස්තුතියක් පිරිනැමිය යුතු වෙලේ ඔබ මොකක්ද කළේ? ඔබ දන්නා තරම් නපුරු විධියට දිගින්

http://sherlockholmesinvestigations.blogspot.com



118. "ඔවුන්ව ගැනීම සඳහා දෙදෙනා අතර පොරයක් ඇතිවුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

දිගටම ඔහුට බැණ වැදුණා. ඇත්ත වශයෙන්ම සිදුවුණේ මොකක්ද කියලා ඔහුට හෙළි කරන්න ක්‍රමයක් තිබුණෙත් නැ. ඒ මොකද ඔහු ආදරය කළ තරුණිය මේ අපරාධයට හසුවන නිසා. අන්තිමට ඔහු වීරයෙක් වගේ නිහඬවුණා."

"හෝ හෝ! මටුන්න දුටුව ගමන් මෙරි යටිගිරියෙන් විලාප තියාගෙන ක්ලාන්ත වෙලා ඇද වැටුණේ ඒකයි." හෝල්ඩර් කීය.

"අනේ දෙවියනේ. මං ක්‍රියාකරල තියෙන්නේ කිසිදෙයක් නොපෙනෙන මුරුවෙක් වගේ. ඒ නිසා තමයි ආතර් කිව්වේ, මිනිත්තු පහකට ඔහුට එළියට ගිහින් එන්න ඉඩ දෙන්න කියලා. මගේ කොල්ලට උවමනා වුණා, මටුන්නෙන් කැඩී ගිය කෑබැල්ල සණ්ඩුව වුණු ස්ථානයේ වැටී තිබෙනවද බලන්න. මං ඔහු ගැන පැක කළේ මොන තරම් දරුණු විධියටද?"

"මං ඔබේ ගෙදරට ආව වෙලාවේ පොළොව නිරීක්ෂණය කරමින් ගේ වටේ රවුමක් ගියා. මට උවමනා වුණේ මට ප්‍රයෝජනයක් අත්විය හැකි හෝඩුවාවක් මොනවා හරි හිම මත ඉතිරි වී ඇත්දැයි බලන්න. කලින් දා හැන්දෑවේ හිම වැටුණට පස්සේ යළිත් හිම වැටුණේ නැති බව මං දැන හිටියා. අනෙක වැටී තිබුණු හිම, පා සටහන් වල ලාංඡන පැවැතිය හැකි සවිමත් බවකින් යුතු හිම බව මං දුටුවා.

මං මුලින්ම පරීක්ෂා කරගෙන ගියේ වෙළෙන්දන් සඳහා වූ අඩිපාර. එහි අඩි සටහන් රාශියක් වැදිලා හිම පොඩිවී දියවී ගිහින් කිසිවක් දකගන්න බැරිවුණා. නමුත් ඊට ටිකක් එහායින්, කුස්සියේ දොරට පිටතින් කාන්තාවක් මද වෙලාවක් රැඳී සිට තිබෙනවා. ඒ කියන්නේ කතාබහ කරමින් ඉඳල තියෙනවා. ඒ පිරිමියෙක් එක්ක. නමුත් ඔහුගේ පා සටහන් ලෙස එක් පැත්තක සපත්තුවක ලකුණ වෙනුවට තිබුණේ රවුමක් පමණයි. ඒනෙත් මම තේරුම් ගත්තා ඒ කාන්තාව කතාබහ කරමින් ඉඳලා තියෙන්නේ ලී කකුලක් තිබෙන කෙනෙක් සමඟ බව. ඒ හැරෙන්න මට තවත් කරුණක් පෙනී ගියා. ඔවුන්ගේ කතාබහට එක්වරම බාධා වෙලා තියෙනවා. කාන්තාව ගේ දෙසට දිවගිය අඩි සටහන් තිබුණා. පා ඇඟිලි කොටස හොඳින් හිම මත වැදිලා. විළුඹ කොටස සටහන් වී තිබුණේ යන්තමින්. ඇගේ මිත්‍රයා එතැන මද වෙලාවක් රැඳී සිට පිටවී ගිහින් තියෙනවා. ඒ වෙලාවේ මට වැටහුණා මේ මග කිව

සේවිකාව බව. තවදුරටත් සොයා බලද්දී ඒක නිවැරදි බව තහවුරු වුණා.

ඊළඟට මම උද්‍යානයට ගොස් පරීක්ෂා කළා. එහි දකින්නට ලැබුණේ යම්කිසි ක්‍රියාවකට සම්බන්ධ වුණා යයි සිතිය නොහැකි පා සටහන් සමූහයක්. මේවා අහම්බෙන් පොළොවේ සටහන් වූ ඒවා විය යුතුය කියා මා නිගමනය කළා. ඒ ඔබගේ නිවසට පැමිණි පොලිස් නිලධරයන්ගේ විය යුතුයි. ඊට පසු ඉස්තාලය දක්වා වැටුණු පටුමඟට මගේ අවධානය යොමු කළා. ඒ පටුමඟ වැසී තිබුණු හිම මත, දීර්ඝ ඒ වගේම සංකීර්ණ කතන්දරයක් ලියැවී තිබුණේ මාව පුදුමයට පත්කරමින්.

පාවහන් පැළැඳි කෙනෙකුගේ පා සටහන් පේළි දෙකක් සහ පාවහන් නොපැළැඳි කෙනෙකුගේ පා සටහන් පේළි දෙකක් හිම මත තිබෙනු මට දකින්නට ලැබුණා. ඊළඟට ඔබ කිව් කාරණාව සිහිවුණාම, පාවහන් නොපැළැඳි ඒවා ආතර්ගේ පා සටහන් බව එක් ක්ෂණයකින් මං තේරුම් ගත්තා.

පාවහන් පැළැඳු සටහන් එළියේ සිට නිවස දෙසටත්, ඊළඟට ආපසුත් ගමන් කර තිබුණා. නමුත් පාවහන් නොපැළැඳි ඒවා ගේ පැත්තේ ඉඳලා ඉවතට ගමන් කරද්දී, වේගයෙන් දිව ගිය සලකුණු. ඒ බව මං තේරුම් ගත්තේ පා ඇඟිලි පමණක් හොඳින් සලකුණු වී තිබීම නිසා. ඒවා වැදී තිබුණේ පාවහන් පැළැඳි තැනැත්තාගේ සලකුණු වලට උඩින්. ඒ කියන්නේ ආතර් අනෙක් තැනැත්තා පසු පස දිවගිහින් තියෙනවා.

මීළඟට මම පා සටහන් දිගේ ඔබේ නිවස දෙසට ගමන් කළා. අර ජනේලය ළඟ එළියේ පාවහන් පැළැඳි පුද්ගලයා බොහෝ වේලාවක් රැඳී සිට ඇති බව පෙනුණා. ඒ බව මං තේරුම් ගත්තේ එතැනට වැටී තිබුණු හිම දියවී ගොස්, පොළොවේ පස් මතු වී තිබුණා. ඊළඟට මම අනෙක් දිශාවට ගමන් කළා. ඒ කියන්නේ පාවහන් පැළැඳි තැනැත්තා පිටවී ගිය පැත්තට. පටුමඟ දිගේ මට ඒ පැත්තට යා හැකි වුණේ යාර සියයක දුරක් පමණයි. එතැන හිම සම්පූර්ණයෙන්ම පළුදු වී ශිහින් කැබලි වලට කැඩී තිබුණේ සණ්ඩුවකදී සිදුවෙන අයුරෙන්. මගේ ඒ නිගමනය නිවැරැදි බව තහවුරු වුණේ එතැන වැටී තිබුණු ලේ බින්දු කිහිපයක් දකීමෙන්. ඊළඟට පාවහන් පැළැඳි පුද්ගලයා ඉස්තාලය දෙසට පැන දිවූ

ලකුණුත්. තැන් තැන් වල ලේ පැල්ලම් කිහිපයකුත් දකින්න ලැබුණා. එයින් මට තේරුම් ගතහැකි වුණේ තුවාල ලැබූ පුද්ගලයා, පාවහන් පැළඳ සිටි තැනැත්තා බවයි. ඔහු ප්‍රධාන පාරට පිවිසුණු පසු සලකුණු සියල්ල නොපෙනී ගියා. ඊට හේතු වුණේ පදික වේදිකාව මත තිබූ හිම ඉවත් කර තිබීම.

ඔබේ ගෙදරට ඇතුළුවෙද්දී මං ඔබේ ජනේලයේ රාමුව සහ ජනෙල් පඩිය මගේ උත්තල කාචයෙන් පරීක්ෂා කළ බව ඔබ දකින්න ඇති. කිසිවෙකු මේ ජනේලය මතට නැගලා එතැනින් පිටවී ගොස් ඇති බැව් මට පෙනී ගියා. එපමණක් නොවෙයි පෙන් සහිත අඩියක් ජනෙල් පඩියට තබා, එයට නැග කෙනෙකු ගෙට ඇතුළු වී ඇති ලකුණුත් මා දුටුවා. මන්න සිද්ධ වී තිබෙන්නේ මොකක්ද කියලා යම් අදහසක් ඇතිකරගන්න මට විශේෂ ඊක හැකියාව ලැබුණා.

මිනිහෙක් ජනේලයෙන් එළියේ නැගිටලා හිටියා. කවුරු හරි ඔහු වෙත ඔටුන්න ගෙන ආවා. ඔබේ පුතා මේ සිද්ධිය දුටුවා. ඔහු හොරා පසුපස ගියා. ඔවුන් දෙදෙනා පොර බැදුවා. ඔටුන්න අනෙකාගෙන් උදුරා ගන්නා අරමුණෙන් දෙදෙනාම එයින් අල්ලාගෙන ඇද්දා. ඒ ආකාරයට දෙපැත්තට ඇදීම නිසා, ඔටුන්න කැඩී යාම සිදුවුණා. ඔබේ පුතා ඔටුන්න ආපසු ගෙන ආවා. නමුත් මැණික් ගල් සහිත කැඩීගිය කැබැල්ල ඔහුගේ ප්‍රතිවාදියාගේ අතේ ඉතිරි වුණා. නිගමනයන් මගින් මෙතරම් දුර එන්න මට හැකියාව ලැබුණා. මට ඉතිරි වී තිබුණු එකම ප්‍රශ්නය වුණේ සතුරාගේ අතට ඔටුන්න ගෙනැවිත් දුන්නේ කවුද කියන එකයි.

සත්‍යය සොයා ගැනීමට මා යොදාගන්නා පරණ ක්‍රියා පිළිවෙතක් තිබෙනවා. ඒ තමයි සිදුවිය නොහැකි හැම එකක්ම බැහැර කළාම, ඉතිරි වී ඇති එක තමා සිදුවිය හැකි දේ. කොයිතරම් විශ්වාස කිරීමට අපහසුවුණත් සත්‍යය එතැන බව අපට පිළිගැනීමට සිදුවෙනවා. ඔටුන්න පහළ තට්ටුවට අරගෙන ආවේ ඔබ නොවෙන බව මං දන්නවා. එතකොට ඉතිරි වෙන්නේ ඔබේ ඥාති දියණිය සහ සේවිකාවන්. හොඳයි මේ අපරාධයට සම්බන්ධ වුණේ සේවිකාවක් කියල හිතමු. එහෙනම් ඇයි ඔබේ පුතා ඇය කවුද කියල හෙළි කරන්නෙ නැත්තෙ? ඇයි ඔහු නිශ්ශබ්දවම ඉඳගෙන තමාවම වරදකාරයා කරගන්නෙ? ඒ මොකද ඔහුගේ සිතේ පේර්

ගැන ආදරයක් තිබූ නිසා. ඒ නිසයි ඔහු රහස හංගාගෙන සිටියේ. රහස නින්දා සහගත ඉතාම පිළිකුල් එකක්. ඒ නිසා ආතර් එය හෙළි කලේ නැහැ. ඇය ජනේලය අසල සිටගෙන හිටි සැටින් ඔබ කිව්වා; මටුන්න දකිද්දී ඇය විලාප නගාගෙන ක්ලාන්තවුණු බවත් ඔබ කිව්වා. මේ කාරණා දෙක මට සිහිවුණාම, නිගමන මගින් මං කළ සොයා ගැනීම් නිවැරදි බව තහවුරු වුණා.

කවුද මේ අපරාධයට ඇගේ හවුල් කාරය වුණේ? ඇයගේ පෙම්වතා ලෙස පෙනී සිටිමින්, ඇයව ආදරයෙන් වසඟ කරගත් පුද්ගලයකු විය යුතුයි. ඒ මොකද ඇය ඔබ වෙත තිබූ සෙනෙහස හා පක්ෂපාතිත්වය, පරදවා යා හැකි ප්‍රබල බවක් ඇතිවන්නේ එවැනි ආදරයකට පමණයි. ඔබ සහ ඇය ගෙදරින් පිටත ගියේ කලාතුරකින් බවත්, ආශ්‍රය කලේ සීමාසහිත මිතුරන් පිරිසක් බවත් ඔබම කිව්වා. නමුත් මේ අතරේ සර් ජෝජ් බර්න්වෙල් සිටියා. මට මීට කලින් ඔහු ගැන තොරතුරු අප්‍රමාණ ලෙස අහන්න ලැබිල තියෙනවා. විශේෂයෙන්ම කාන්තාවන් ගැන කටයුතු වලදී ඔහුගේ චර්යාව නිසා ලැබූ අපකීර්තිමත් නාමය ඉතා ප්‍රසිද්ධයි. මේ අනුව පාවහන් පැළඳ සිටි පුද්ගලයා, මැණික් සහිත මටුනු කැබැල්ල හිමිකරගත් පුද්ගලයා විය යුතුයි කියල මං තීරණය කළා. ආතර් ඔහුව හඳුනාගත් බව සර් ජෝජ් හොඳින් දන්නවා. නමුත් ඔහුගේ හිතේ භයක් ඇතිවුණේ නැහැ. ඒ මොකද තමන්ගේ ඥාති සොහොයුරිය මෙතැනට සම්බන්ධ නිසා, පවුලට අපකීර්තියක් ඇතිවෙන මේ සිද්ධිය හෙළිකරන්න ආතර් කැමැති වෙන්නෙ නැහැ.

මං ඊළඟට ගත්තේ මොන වගේ පියවරක්ද කියන එක ඔබේ නුවණට වැටහේවි. මම රස්තියාදු කාරයෙක් වගේ සැරසිලා සර් ජෝජ් ගේ නිවසට ගියා. ඔහුගේ සේවකයා සමඟ මිත්‍රවෙලා වැදගත් කරුණක් එළිකර ගන්න මට පුළුවන් වුණා. ඔහුගේ ස්වාමියාගෙ කලින් දා රාත්‍රියේ හිසේ තුවාලයක් සිදුවී ඇති බව මට දනගන්න ලැබුණා. ඊළඟට සිලිං හයක් ගෙවලා සර් ජෝජ් පාවිච්චියෙන් ඉවත් කළ පරණ පාවහන් යුගළක් මිලට ගන්න මට හැකිවුණා. මේවාත් අරගෙන මම ස්ට්‍රෙදම් වෙත ගියා. හිම මත සලකුණු වී තිබුණු පා සටහන් මා ඒගෙන ගිය පාවහන් වල අඩියට, තුලටම ගැළපුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

"මං ඊයෙ හැන්දෑවෙ දැක්කා, පරණ ඇඳුම් ඇඳගත්තු රස්තියාදු කාරයෙක් ඔය පවුමගේ ගැවසෙනවා."

"හරියට හරි. ඒ මමයි. මට අවශ්‍ය මිනිහා හරියටම හඳුනාගත්තට පස්සේ මං ගෙදර ඇවිත් සාමාන්‍ය ඇඳුමෙන් සැරසුණා. එතැනින් ඉදිරියට කරන්න තිබෙන කටයුත්ත ඉතාම සියුම් එකක් බව, මට තේරුම් ගියා.

සර් ජෝජ් බර්න්වෙල් කියන්නේ අංක එකේ කෙරාටිකයෙක් පමණක් ම නෙමෙයි. ඔහු මහ දුෂ්ට පුද්ගලයෙක්. නීති මාර්ගයෙන් කටයුතු කරලා ඔහුව හිරභාරයට ගන්න පුළුවන් බව ඇත්තයි. නමුත් ඒකෙන් වෙන්නේ මේරිත් මේකට ඇදිලා ඇති බව ප්‍රසිද්ධ වෙනවා. එයින් හෝල්ඩර් පවුලම අපකීර්තියට පත්වෙන මහා ආන්දෝලනයක් ඇතිවෙනවා. බර්න්වෙල් දන්නවා ඒ කරුණ නිසා අපි හිරවී ඇති සැටි.

මං ගිහින් ඔහුව හමුවුණා. මුලදී ඔහු මං කියූ කිසි දෙයක් පිළිගත්තේ නැහැ. හැමදෙයක්ම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා. නමුත් සිද්ධිය වුණු අනු පිළිවෙළට මං හැමදෙයක්ම පියවරෙන් පියවර විස්තර කළා. ඔහු එක්වරම පිස්තෝලයක් එළියට ඇදල අරගෙන, කෝපයෙන් සර්ජනා කරල මාව භයකරගන්න හැදුවා. මොහු මොන වගේ කෙනෙක්ද කියලා මං කලින් දන හිටි බව ඔබට කිව්ව නේ. ඉතින් ඔහු පිස්තෝලය අදින කොට මගේ පිස්තෝලය ඇදල අරගෙන ඔහුගේ හිසට තියලත් ඉවරයි. ඊට පස්සෙයි ඔහු ටිකක් මෙල්ල වුණේ.

මං ඔහුට කිව්වා, එක මැණිකක් පවුම් 1000 ගණනේ මිලට ගන්න අප කැමැති බව.

"අයියෝ! මං මැණික් තුනම එකක් පවුම් හයසීය ගණනේ විකිණුවා." ඔහු කිව්වා.

ඔහු ඒවා විකිණූ පුද්ගලයාගේ ලිපිනය මං ඔහුගෙන් ගත්තේ මේ ගැන උසාවි නොයන බවට පොරොන්දු වෙලා. ඊළඟට ඒ පුද්ගලයා හමුවෙන්න ගිහිං, බොහොම වේලාවක් හෙට්ටු කිරීමෙන් පසු එක මැණික් ගලක් පවුම් දහස ගණනේ ගල් තුනම මං මිලට ගත්තා. ඊළඟට මං ඔබේ පුතා හමුවෙලා දනුම් දුන්නා සියල්ල



124. ". . . . මං පිස්තෝලය ඇදල ඔහුගේ හිසට තියලත් ඉවරයි"

http://sherlockholmesinvestigations.blogspot.com

විපදී අවසන් බව. දවසක් පුරා මේ වැඩ කටයුතු වලට මහන්සි වෙලා මං අන්තිමට නින්දට ගියේ ඊ දෙකට."

"ඔබ මහන්සිවුණු ඒ දවස, මුළු එංගලන්තයම අපකීර්තියෙන් බේරාගැනීමට හැකි වූ දවසක්."

හෝල්ඩර් මහතා කීවේ අසුනෙන් නැගිටිමිනි.

"මහත්මයා. ඔබතුමාට කොයිහාම ස්තූති කරන්නද කියලා මට නම් තේරෙන්නෙ නැහැ. නමුත් ඔබ කළ සේවය වෙනුවෙන් මං මගේ කෘතඥතාවය පුද කරන හැටි ඔබට ඉදිරියේදී දකින්න ලැබේවි. ඔබ දක්ෂයෙක් බව මං අහල තිබුණා. නමුත් ඔබ ඒ කියවුණාට වඩා ඉහළම අතිදක්ෂයෙක් බව මට දැන් පෙනෙනවා.

දැන් ඉතින් මං ඉක්මනට ගිහිං මගේ කොල්ලව හම්බවෙලා, ඔහුගෙන් සමාව ඉල්ලා හිටින්න ඕන. ඔබ මගේ මේරි ගැන කිව් දෙයින් මගේ හිතට දැඩි වේදනාවක් දැනුණා මහත්මයා. දැන් ඇය ඉන්නේ කොහේද කියලා ඔබේ දක්ෂතාවය මගින් අපට කියන්න පිළිවෙළක් නැද්ද?"

"මං හිතන්නේ බය නැතුව මට කියන්න පුළුවන් එක් දෙයක්. ඇය ඇත්තේ කොහේ වුණත්, ඒ සර් ජෝර්ජ් බර්න්වෙල් ළඟ. මේ අපරාධය සඳහා ඇයගෙන් ඔහුට ලොකු සහයෝගයක් ලැබුණා. ඒකට හරියන්න, ඊට වැඩි ප්‍රමාණයක දඬුවම ඇයට ළඟදීම ලැබේවි.



http://sherlockholmesinvestigations.blogspot.com

# අතුරුදන් වූ ව්‍යාපාරිකයා

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# අතුරුදහන් වූ ව්‍යාපාරිකයා

සාන්ත ජෝජ් දේවධර්ම විද්‍යාලයේ අධිපතිව සිට මියගිය ආචාර්ය එලියස් විට්නි ගේ සොහොයුරා අයිසා විට්නිය. ඔහු අබිං කෑමට තදින් ඇබ්බැහි වූ කෙනෙකි. ඩී ක්වින්සි ලියූ "අබිං කෑ ඉංග්‍රීසි ජාතිකයෙකුගේ සිහින." නම් පොත කියවූ අයිසා, එහි සඳහන් යම් යම් දේ අත්හදා බලන්නට යෑමෙන් මේ නරක පිරිතට ඇබ්බැහි වූ බව මට අසන්නට ලැබිණ. නරක පිරිත් වලට පුරුදු වීම බොහොම පහසුවෙන් කළ හැකි බවත්, එයින් අත් මිදීම ඉතාම අපහසු බවත් අනික් බොහෝ දෙනෙකුට මෙන් ඔහුට ද තේරුම් ගියා නිසැකයි. අයිසා විට්නි අබිං වල වහලෙකු වීම නිසා, පවුලේ ඥාතීනට මෙන්ම හිතවතුනට ද වේදනා සහගත කාලයකට මුහුණ දීමට සිදුවිය. ගුණ යහපත් පුද්ගලයෙකුව සිට, මත්ද්‍රව්‍ය නිසා ජීවිතය විනාශ කරගත් අයිසාගේ දිරාගිය සිරුර, පුටුවක් මතට පිම්මාකොට, ඔහු දුක්ඛිතව දිව ගෙවන හැටි දත් මට දකින්නට ලැබේ.

ඒ 1889 වසරේ ජූනි මාසයේ දිනක රාත්‍රී කාලයයි. නිදා ගැනීම සඳහා ඇඳට යාමට මා සිතුවා පමණි. අපේ නිවසේ සීනුව නාද වෙනු මට ඇසිණ. මගේ බිරිඳ, ඇය කරමින් සිටි මැහුම් ගෙතුම් නවත්වා, මා දෙස නොඑවේ බලාපොරොත්තු කඩ වූ බැල්මකි.

"ලෙඩෙක් වෙන්න ඇති. ඔයාට ලෙඩා බලන්න යන්න වෙයි වගේ" ඇය කීවාය.

මට කේදිරි ගෑවිණි. දවස පුරාම රෝගීනට ප්‍රතිකාර කිරීමෙන් වෙහෙසට පත්ව සිටි මා, මඳ විවේකයක් ලැබීමට සිතුවා පමණි.

මීළඟට අපට අසන්නට ලැබුණේ අපේ නිවසේ ඉදිරිපස දොර විවෘතවන හඬයි. ඉන්පසු කිසිවෙකු කතාබහ කරන හඬ ද විසිත්ත කාමරය හරහා ඇවිද එන්නෙකුගේ පා ගැටෙන හඬ ද


http://sherlockholmesinvestigations.blogspot.com

අසන්නට ලැබිණි. එසැණින් විවෘත විය. කළු පැහැති වේල් රෙද්දකින් හිස ආවරණය කරගත් කාන්තාවක් කාමරය ඇතුළට කඩා වැදුණාය.

"මේ රෑ වුණු වෙලාවෙ මෙහෙම කරදර කරනවට මට සමාවෙන්න" කියමින් කථාව පටන් ගත් ඇය, මගේ බිරිඳ දෙසට දිවගියාය. අනතුරුව මගේ බිරිඳගේ ගෙල දෑතින්ම බදාගෙන ඒ කාන්තාව ඉකිගසමින් හඬා වැළපෙන්නට පටන් ගත්තාය.

"මං හරි අමාරුවක වැටිල ඉන්නෙ. අනේ මට උදව් කරන්න."

"දෙවියනේ!" මගේ බිරිඳ කීවේ අමුත්තාගේ හිස ආවරණය කළ රෙදි කැබැල්ල ඉවත් කරමිනි.

"මේ කේට් විට්නි නේ. කේට් ඔයා මාව හය කළ තරමක්! කාමරේ ඇතුළට එද්දි මේ කවුද කියල මට හිතාගන්නවත් බැරිවුණා."

" අනේ මේරි. මං මොකක්ද කළ යුත්තේ කියල මට තීරණය කරගන්න බැරිවුණා. ඒකයි මං කෙලින්ම ඔයා හොයාගෙන ආවෙ."

හැමවිටම සිදුවූයේ එයයි. ප්‍රශ්න වලට මුහුණ දුන් අසල්වැසි කාන්තාවන්, පිහිට පතා, මගේ බිරිඳ වෙත ආවේ ප්‍රදීපාගාරයක් සොයා ඉගිල එන පක්ෂීන් මෙනි.

"ඔයා ආව එක කොයිතරම් හොඳද. මං බොන්න වයින් ටිකක් ගේන්නම්. සුවපහසුවට වාඩිවෙලා අපට කියන්න ඔබේ ප්‍රශ්නය මොකක්ද කියලා. එහෙම නැත්නම් මං ජේම්ස්ව නිදාගන්න පිටත් කරල අරින්නද?"

"අනේ එපා එපා! මට දොස්තර මහත්තයාගේ උපදෙස් වගේම උදවුත් ඕනෑ කරනවා. මට ප්‍රශ්නය මතුවෙලා තියෙන්නේ අයිසා ගැන. එයා දැන් දවස් දෙකකින් ගෙදර ආවෙ නැහැ. ඔහු ගැන මට හරිම හයයි!"

ඇගේ සැමියා සම්බන්ධව කථාකිරීමට මේ කේට් අප හමුවට ආ පළමුවන වතාව නොවේ. විටෙක කේට් මගෙන් වෛද්‍ය උපදෙස් පැතුවාය. විටෙක ඇගේ පැරණි යෙහෙළියක මෙන්ම පාසල් මිතුරියක වූ මගේ බිරිඳගේ උපදෙස් පැතුවාය. හැකි සෑම විටකම කාරුණික වදනින් අපි කේට් විට්නි සනසුවෙමු.

http://sherlockholmesinvestigations.blogspot.com

"අයිසා මේ දවස්වල කොහේ ගිහින්ද කියල කේට් දන්නවද?"

මගේ බිරිඳ ඇසුවාය.

"කේට් හිතන්නෙ මං එතැනට ගියොත් මට ඔහුව ගෙදර කැඳවාගෙන එන්න හැකිවේවි කියලද?" මම ඇසීමි.

"මට ආරංචි විදියට එයා දන් යන්නේ ලන්ඩනයේ නැගෙනහිර කෙළවරේම තියෙන අබිං ගුහාවකට. මෙච්චර කාලෙකට, උදේ ගෙදරින් පිටවෙන මිනිහා, වැනි වැනී මත්වෙලා හරි, හැන්දෑවට ගෙදර ආවා. ඒත් මේ සැරේ; අදට දවස් දෙකක් වෙනවා. කිසිම ආරංචියක් නැහැ. මං මේ කියන තැන තියෙන්නේ ඉහළ ස්වොන්ඩම් පටුමගේ. ඒකෙ නම තියෙන්නේ 'රන් අවන්හල' කියලලු. ඒත් මේරි මං මේ තනි ගැනියෙක් කොහොම ද ඔය වගේ තැනකට යන්නෙ? ගිහිං එතැන ඉන්න චණ්ඩින්, බේබද්දන් අතරින් අයිසාව අරගෙන එන්නෙ කොහොමද?" කේට් විට්නි පැවසුවේ හදපිරි ශෝකයෙනි.

"ඔයාගෙ කතාව ඇත්තයි කේට්. මේ අබිං ගුහාවක් වගේ තැනකට වැදගත් ගෑනු කෙනෙක් තනියම කොහොම යන්නද? මට පුළුවනි ඔයාව එතැනට . . . . නෑ නෑ. මට එතැනට යන්න ඔයා අවශ්‍ය නෑ. අයිසා විට්නිගේ වෛද්‍යවරයා හැටියට ඔහුගේ කටයුතු වලට බලපෑමක් කරන්න මට බැරි ඇයි? ඔයා නැතිව මං තනියම යන්නම්. ඒක මට වඩාත් පහසුයි. භය වෙන්න එපා. මේ කියන තැන අයිසා හිටියොත්, මං පැය දෙකක් ඇතුළත කොහොම හරි කුලී රියකින් ඔහුව ගෙදර ගේනවා."

මිනිත්තු දහයකින් මම නිවසින් පිටවූයෙමි. මගේ නිවසේ සැනසිලිදායක විසිත්ත කාමරය හා සුවදායක හාන්සිපුටුව හැර දමා කුලීරියකින් පිටත්වී ගියෙමි.

මගේ කර්තව්‍යයේ මුල් කොටස එතරම් අපහසු එකක් නොවීය. ලන්ඩන් පාලමට නැගෙනහිරින් පිහිටි ඉහළ ස්වොන්ඩම් පටුමඟ සොයා ගැනීමට මට හැකිවිණි. නාවිකයන්ට මසා නිම කළ ඇඳුම් සපයන අපිරිසිදු සාප්පුවක් හා තැබෑරුමක් අතරින්, මා යායුතු අබිං ගුහාවේ දොරටුව පිහිටියේය. මා එනතුරු රැඳී සිටින මෙන් රියැදුරාට දන්වා ඒ අඳුරු බරාදය වෙත පිය නැගුවෙමි.

අබිං ගුහාව තුළ මගේ නෙත ගැටුණු දසුන එදිනෙදා දකින්නට ලැබෙන්නක් නොවේ. තැනින් තැන නොයෙක් නොයෙක් ඉරියව්

වලින් පිම වැතිරී, වැටී සිටි මිනිසුන් රැසකි. මද අඳුරේ මා දුටුවේ ඔවුන්ගේ සිරුරු වල ඡායාවන් පමණි. අබිං වල විෂධූමයෙන් මත්වී සිටි ඔවුහු අසල සිටියවුනට යමක් කීහ; නැතහොත් තමන්ටම යමක් කියාගත්හ. අඳුරු කුටිය කෙළවරේ දීප්තිමත්ව දල්වෙන ගිනි අඟුරු සහිත උදුනක් විය. ඒ අසල වූ කකුල් තුනේ පුටුවක, උස, කෙට්ටු වයස් ගත මිනිසෙක් වාඩිවී සිටියේය. වැලමිට් දෙක දෙදණ මත තබාගෙන, දෑත් මත නිකට තබාගෙන, ඔහු සිටියේ ගිනි උදුන දෙස මුහුණ යොමු කරගෙනයි.

මා එහි ඇතුළුවෙද්දීම මැලේ ජාතික සේවකයෙක් මා වෙත ලං වූයේ අබිං පිරවූ පයිප්පයක් ද අතැතිවයි.

"ඔබට ස්තූතියි. නමුත් මං මේතන වැඩිවෙලා රැඳෙන්න ආවා නොවෙයි. මං මගේ යාළුවෙක් හොයාගෙනයි ආවෙ. ඔහුගේ නම අයිසා විට්නි. මං කැමතියි ඔහුට ටිකක් කථාකරන්න." මා එසේ කියද්දීම මගේ දකුණු පසින් කිසිවෙකුගේ සෙලවීමක් දුටුවෙමි. එමෙන්ම ඔහු පුදුමයට පත්වී නැගූ හඬ ද අසන්නට ලැබිණි. මොහොතකින් මා දුටුවේ, මා දෙස ඇසිපිය නොහෙළා බලා සිටින විෂ ධූමයෙන් මත්වූ අයිසා විට්නිගේ සුදුමැලි මුහුණයි.

"දෙයියෝ සාක්කි! මේ වොට්සන් නේද?"

මත් ගතිය නිසා අයිසාගේ අත්පාසත වෙව්ලමින් තිබිණි. ඔහුගේ හැටි දකීම පවා සිතට දුක් උපදවන්නක් විය.

"දැන් වෙලාව කීයද වොට්සන්?"

"රෑ එකොළහට කිට්ටුයි."

"අද දවස කවදද?"

"අද ජූනි මාසයේ 19 වැනි සිකුරාදා."

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! මං හිතුවෙ අද බදාදා කියල. ඔයත් මාව භය කරන්න බොරු කියනව නේද මනුස්සයෝ?"

"විට්නි, මං ඔබට ආයෙමත් කියන්නෙ අද සිකුරාදා. තමුසෙගෙ බිරිඳ දැන් දවස් දෙකක් තිස්සේ බලාගෙන ඉන්නවා, තමුසෙ ගෙදර එනතුරු. ඔයාට ලැජ්ජාවක් කියල දෙයක් නැද්ද හැබෑට?"

"ලැජ්ජා හිතෙනවා තමයි. ඒ වුණාට ඔබ මේ හැම දෙයක්ම මට පටලැවිව හේ වොට්සන්. මං මෙහේට ඇවිත් පැය කීපයකට

http://sherlockholmesinvestigations.blogspot.com



131. ඒ අසල උස කෙට්ටු වයස්ගත මිනිහෙක් වාඩිවී සිටියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

වැඩි වුණේ නෑ. මං හිටියේ පයිප්ප තුනද හතරද? මට ඒක හරියට මතක නැහැ. ඒ වුණත් මං ඔබත් එක්ක ගෙදර යන්න එන්නම්. මං කොහොමද මගේ අභිංසක කෝට්ට බය කරන්නෙ? ඔබේ අතින් මාව ඇදල ගන්න වොට්සන්. අපට යන්න කුලී රියක් තියෙනවද?"

"ඔව්. එළියෙ තියෙනවා."

"එහෙම නම් මං ඒකෙන් යන්න එන්නම්. ඒත් මං මෙහේට ගෙවිය යුතු මුදලක් ඇති. මං තව කීයක් ණයද කියලා අහල බලන්න වොට්සන්. මගේ ඇඟට අංකක් කියන නාමයක් නෑ."

අබිං වලින් මත්වී සිටි අය බොහොමයක්, බරාදය දෙපස බිම වැතිර සිටියහ. ආයතනයේ කළමනාකරුවා සොයා, මම බිම තිබූ සිරුරු අතරින් පියනැගුවෙමි. අබිං වල විෂ ධූමයෙන් ඒ පෙදෙසම වැසී තිබිණි. එය ආඝ්‍රාණය නොකර සිටීමේ අරමුණෙන් හුස්ම තදකර අල්ලා ගෙන, මම ඉක්මනින් ගමන් කළෙමි.

මා කලින් ද සඳහන් කළ උස වයස්ගත මිනිසා පසුකොට මම ඉදිරියට ගමන් කරමින් සිටියෙමි. කිසිවෙක් මගේ කලිසමෙන් ක්ෂණිකව ඇද අතහැරියේය. ඊළඟට පහත් හඬින් යමක් කියනු මට අසන්නට ලැබිණි.

"ඒයි! මාව පසුකරලා ඉදිරියට ගිහිං, එක සැරේම ආපසු හැරිලා මං දිහා බලනවා."

මෙම වචන ඉතා පැහැදිලිවම මගේ දෙසවණට වැටුණු බව මට විශ්වාසය. මම ආපසු හැරී බැලුවෙමි. ඒ වචන පිටවන්නට ඇත්තේ ඒ මහලු මිනිසාගේ මුවෙන් විය යුතුය. එහෙත් ඔහු මා දෙසවත් නොබලා දල්වෙන අඟුරු දෙස බලා සිටියේ මහත් උනන්දුවකිනි. වයස නිසා තරමක් කුදු ගැසුණු ඔහු, අප්‍රාණික ඇඟිලි වලින් අතහැරුණු අබිං පයිප්පය දෙපා අතරේ හිර කරගෙන සිටියේය.

මම මෙවර අඩි දෙකක් ඉදිරියට තබා යළිත් එක්වරම ආපසු හැරී බැලුවෙමි.

අතිමහත් විස්මයට පත්වූ මට තව මොහොතෙන් කෑ ගැසෙන්නට ඉඩ තිබිණි! දැඩි ආයාසයක් දරා එය නවත්වා ගත්තෙමි. අන් හැම දෙනාටම පිටුපා ඔහු තමාගේ මුහුණ මට පමණක් පෙන්වීය. මුහුණේ රැළි පිරුණු ගතිය, ඔබේ ඩී ගොස්, මිලානිත දෑස්

වෙනුවට ප්‍රාණවත් දෑසින් මා දෙස බලා සිටියේ අන් කවරෙකුවත් නොව මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්ය! ඔහු වෙතට එන මෙන් මට සංඥා කළ ඔහු, යළිත් තම රැළි වැටුණු මුහුණ අන් අයට යොමු කළේය.

"හෝම්ස්! මේ අබිං ගුහාවෙ ඔබ මොකද කරන්නෙ?" මම කෙඳිරිලි හඬින් ඇසීමි.

"ඔබට හැකිතරම් අඩු ශබ්දයකින් කථා කරන්න වොට්සන්. මගේ කන් ඇසීම ඉතාම හොඳයි. ඔබේ අර බේබදු මිත්‍රයාගෙන් ගැළවෙන්න ක්‍රමයක් තියෙනවා නම්, මං කැමතියි ඔබ එක්ක කතාබහ කරන්න."

"එළියෙ තියෙනවා මං ආව කුලී රිය."

"එහෙනම් ඔහුව ඒකෙ ගෙදර අරින්න. බයවෙන්න එපා. මොකුත් කලබලයක් කරන්න බැරි තරමට මිනිහා හොඳටම මත්වෙලයි ඉන්නෙ. ඒ ගමන්ම ඔබේ බිරිඳට කුලී රියේ රියැදුරා අතේ ලියුම් කෑල්ලක් යවන්න. කියන්න මාව හමුවෙලා මා සමඟ යනවා කියල. එළියේ රැඳී ඉන්න වොට්සන්. මං එන්නම් මිනිත්තු පහෙන්."

ෂර්ලොක් හෝම්ස් විසින් කරන මෙවැනි ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම පහසු කටයුත්තක් නොවේ. මිනිත්තු කිහිපයකින්, ලියුම් කෑබැල්ලක් ලියා රියැදුරාට දී, විට්නි විසින් අබිං ගුහාවට ගෙවිය යුතු මුදල ද ගෙවා, ඔහු කුලී රියෙන් පිටත් කර යැව්වෙමි.

ටික වේලාවක් ගතවෙද්දී මත් ගතියෙන් ඒ මේ අත වැනෙමින්, කුදු ගැසුණු මහල්ලෙක් ලෙස හෝම්ස් එළියට පැමිණියේය. වීථි දෙකක් පසුකර යනතුරු හෝම්ස් ඔහුගේ 'කුදය' දිගහැරියේවත් වැනි වැනී ගිය ගමන වෙනස් කළේ වත් නැත. ඉන්පසු ආපසු හැරී බලා සෑහීමට පත් මගේ මිත්‍රයා මහ හඬින් සිනාසුණේය.

"ඔබ හිතනවා ඇති වොට්සන්, මං අර කොකේන් ශරීරයට විද ගැනීමට අමතරව, දැන් අබිං පානය කරන්නත් පටන් ගෙන කියලා. එහෙම නේද?"

"ඔබ එතැන ඉන්නවා දැකලා මං ඇත්තෙන්ම හරිම පුදුමයකට පත්වුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ වගේමයි. ඔබව එතැනදී දකලා මං ඊට වඩා පුදුම වුණා."

"මං ආවේ යාළුවෙක් හොයාගෙන." මම කීවෙමි.

"මං ආවේ හතුරෙක් හොයාගෙන." ඔහු කීවේය.

"හතුරෙක්?"

"ඔව්. මගේ සාමාන්‍ය හතුරන්ගෙන් කොහොත් කිව්ව හැකි. කොටින් කියනවා නම්, මං මගේ පරීක්ෂණයක වැදගත්ම කොටසක් කරමිනුයි ඉන්නේ. මට උවමනා කරන හෝඩුවාවක් අර බේබද්දන් අතරෙන් හොයා ගන්න මං බලාපොරොත්තු වුණා. මීට ඉස්සරත් මං ඔය තැනින් අවශ්‍ය කාරණා හොයාගෙන තියෙනවා. නමුත් උන් මාව හඳුනාගත්තා නම් මට එක පැයක් මෙලොව ජීවත් වෙන්න ඉඩ ලැබෙන්නේ නෑ. ඒ මොකද මීට ඉස්සරත් ඔතැනට ගිහිං ඔත්තු හොයාගෙන තියෙන නිසා ගුහාව පවත්වාගෙන යන තක්කඩියා මාව අහුවුණොත් මරණ බවට දිවුරලයි ඉන්නේ. ඒ ගොඩනැගිල්ලේ අනෙක් පැත්තේ කෙළවරේ රහස් දොරටුවක් තියෙනවා. ඒක විවෘත වෙන්නේ තේම්ස් ගඟ අයිනේ පාවුළු වාප්පුව ළඟට. ඒ දොරට කථා කරන්න පුළුවන් නම් කියාවි, හඳ නොපෑයූ කළුවර රාත්‍රිවල දී දොරටුවෙන් එළියට ගිය දේවල් ගැන පුදුමාකාර කථා."

"මොනවා? ඔබ අදහස් කරන්නෙ මළසිරුරුද?"

"ඔව්. මළසිරුරු තමයි වොට්සන්. ඔය අභිං ගුහාවේ මැරුම් කෑව එක අභිංසක මිනිහට පවුම් දාහ ගණනේ තැබුවත් මහා ධනස්කන්ධයක් එකතු වෙනවා. තේම්ස් ගඟේ ඉවුර අවට තිබෙන දරුණුම මර උගුල මේකයි. මගේ භය තියෙන්නේ නෙවිල් සෙන්ට්ක්ලෙයා පවා මේකට ඇතුළුවුණා මිසක් පිටවෙලා ගියේ නැහැ කියන එකයි. කොහොම වුණත් . . . . අපේ අශ්ව කරත්තෙ ඇත්තේ මේ ළඟම විය යුතුයි."

එසේ කිව් හෝම්ස් දැතේ දබරඟිලි මුව තුළට රුවා, කන් බිහිරි කරවන තියුණු හඬින් හඬලාවක් පිඹියේය. එයට පිළිතුරු වශයෙන් එවැනිම තලා හඬක් ඇසිණ. ඒ සමඟම අප දෙසට ඇදී එන අශ්වකරත්තයක රෝද හා අශ්වයාගේ කුර ගැටෙන හඬ

http://sherlockholmesinvestigations.blogspot.com

අසන්නට ලැබිණ. පැති ලාම්පුවලින් රත්වන් පැහැති ආලෝක ධාරා විහිදුවමින් කුඩා අශ්ව කරත්තයක් අප වෙත ළඟාවිය.

"වොට්සන් ඔබ එනව නේද මාත් එක්ක යන්න?"

"මගේ පැමිණීමෙන් ඔබට යම්කිසි ප්‍රයෝජනයක් ලැබෙනවා නම් මං එන්නම්."

"විශ්වාසවන්ත මිත්‍රයෙක් ළඟ සිටීම හැමවිටම ප්‍රයෝජනවත්. සිද්ධිය සටහන් කරගෙන, ලේඛන ගතකරන්නෙක් සිටීම, ඊටත් වඩා ප්‍රයෝජනවත්. සෙඩාර්ස්හි මට ලැබිල තියෙන්නේ ඇඳන් දෙකක් තිබෙන කාමරයක්."

"සෙඩාර්ස්හි?"

"ඔව්. ඒක තමයි සේන්ට් ක්ලලයා මහත්මයාගේ නිවස. මේ පරීක්ෂණය අවසාන කරන තුරු මං එහේ නැවතිලයි ඉන්නෙ."

"කොහේද ඒක තියෙන්නේ."

"කෙන්ට් ප්‍රාන්තයේ, ලී නගරයට කිට්ටුව. අපට අශ්ව කරත්තයෙන් ගමන් කරන්න තියෙනවා හැතැක්ම හතක දුරක්."

"ඔබ කියන කාරණාව ගැන, මං කිසිම දෙයක් දන්නෙ නම් නෑ?"

"ඒක ඇත්තයි. වැඩිවෙලා යන්න කලින් ඔබට ඔක්කොම දැනගන්න පුළුවනි. එහෙනම් නගින්න කරත්තෙට . . . . ඔබට බොහොම ස්තූතියි ජෝන්, කරත්තය ගෙන ආවට. ඔබව අපට ඉදිරියට අවශ්‍ය වෙන එකක් නෑ. ඔබේ මහන්සියට මේ ක්‍රවුන් බාගේ කාසිය තියාගන්න. හෙට උදේ අපි හමුවෙමු . . . . උදේ එකොළහට විතර . . . . ආයුබෝවන්."

හෝම්ස් අශ්වයාට සෙමින් කසයෙන් පහර දුන්නා පමණි. ඌ වහා ගමන් ඇරඹීය. වැඩිවෙලා යාමට පෙර අපි පාළු වීථි හරහා ඉතා වේගයෙන් ගමන් කිරීමට පටන් ගත්තෙමු.

හෝම්ස්ට මුහුණ දීමට සිදුවී ඇති අලුත්ම ගැටලුව කුමක් දැයි දැන ගැනීමට මා සිටියේ නොඉවසිල්ලෙනි. එහෙත් ඔහු කරත්තය පැදෙව්වේ නිහඬවයි. ගැඹුරු කල්පනාවක වෙළී, මුහුණ ඉදිරියට නමාගෙන සිටි ඔහු කතාබහ අරඹන ලකුණක් වත් නොතිබිණි. අප සැතපුම් ගණනාවක් ගමන් කොට, නිවාස සහිත තරමක්

http://sherlockholmesinvestigations.blogspot.com

නාගරික පෙදෙසකට පැමිණි පසු හෝම්ස් තම ඉරියව්ව වෙනස් කළේය. ඔහු තම පයිප්පය ද දල්වා ගත්තේ සෑහෙන තරම් තෘප්තියට පත් විලසිනි.

"අවශ්‍ය වෙලාවට නිශ්ශබ්දව බලාගෙන ඉන්න ඔබට ලැබිල තියෙන ගුණාංගය නම් ආශිර්වාදයක් වොට්සන්" ඔහු කීය. "ඒ පිළිවෙළ නිසා මිත්‍රයෙක් හැටියට ඔබේ ඇති වටිනාකම කියල නිම කරන්න බෑ. මගෙ හිතේ මේ වෙලාවෙ ඇති සිතිවිලි, කොහොමටවත් සතුටකට පත්වෙන්න පුළුවන් ඒවා නොවෙයි. ඒ නිසා මේක කතාබහ කරගන්න මිත්‍රයෙක් ඉන්න එක කොයි තරම් දෙයක්ද? මං මේ හුහක්ම කල්පනා කළේ මොකක් ද දන්නවද? තව ටික වෙලාවකින් අර අසරණ ගැහැනු මනුස්සයා හම්බවුණාම, මං මොකක්ද එයාට දෙන උත්තරේ?"

"මේ ගැන මං කිසිම දෙයක් නොදන්නා බව ඔබට අමතකයි හෝම්ස්."

"ඔව්. ලී නගරය කරා ළඟාවෙන්න කලින් ඔබට විස්තර ටික කියන්න වෙලාව යන්තමට ඇතිවේවි. බැලූබැල්මට පෙනෙන්නෙ මේක බොහොම සරල කාරණයක් විදියට. ඒ වුණත් මේ පරීක්ෂණය ඉදිරියට ගෙනියන්න, මට කිසිම හෝඩුවාවක්, කිසිම සාක්ෂියක් නෑ. මට පුළුවන් තරම් පැහැදිලිව, ඒ වගේම කෙටියෙන් මං ඔබට කථාව කියන්නම්. බාගවෙලාවට අන්ධකාරයේ මට නොපෙනෙන ගිනිපුපුරක් ඔබට දකින්න හැකිවේවි."

"හොඳයි කියන්න බලන්න."

"අවුරුදු පහකට පමණ කලින්, හරියටම කියනවා නම් 1884 මැයි මාසයේ, නෙවිල් සේන්ට් ක්ලෙයා නම් මහත්මයෙක් ලී නගරයට ආවා. ඔහු හොඳ වත් පොහොසත්කම් ඇති සල්ලි කාරයෙකු බවයි කාගේත් වැටහීම වුණේ. ඔහු ලොකු ගෙයක් මිලදී අරගෙන, ඒ අවට වත්ත පිටිය ලස්සන උද්‍යානයක් සහිතව සකස් කරගෙන, බොහොම අලංකාර විධියට ජීවත්වුණා. ක්‍රම ක්‍රමයෙන් ඔහු අසල්වාසීන් එක්ක හිතවත්කම් ඇතිකර ගත්තා. 1887 දී ඔහු මේ පළාතේ බීරකම්හල් අයිතිකාරුවෙකුගෙ දුවණිය සමඟ විවාහ වුණා. ඒ විවාහයෙන් දැන් ඔහුට දරුවන් දෙදෙනෙක් සිටිනවා.

http://sherlockholmesinvestigations.blogspot.com

සෙන්ට් ක්ලෙයා මහත්මයා මොකුක්වත් ඒකියාවක් කළේ නැහැ. නමුත් වෙළඳ සමාගම් හිමිපයන් සමඟම ඔහුගේ ගනුදෙනු තිබුණු බවයි පෙනෙන්නෙ. මේ කටයුතු සඳහා සිරිතක් වශයෙන් උදේ දුම්රියෙන් ඔහු ලන්ඩන් නගරය බලා පිටත්වී ගියා. ඊළඟට කැනන් වීථියේ දුම්රියපොළෙන් සවස 5.14ට පිටත්වෙන දුම්රියේ නැගලා ආපහු ගෙදර ආවා. සෙන්ට් ක්ලෙයා මහත්මයාගේ වයස අවුරුදු තිස් හතයි. ඔහු හොඳ ගතිගුණ තිබූ පුද්ගලයෙක්; හොඳ ස්වාමි පුරුෂයෙක් ආදරණීය පියෙක්. මේ මහත්මයා දන්නා හඳුනන කවුරුත් අතරත් ජනප්‍රිය කෙනෙක්. මේ අවස්ථාව වෙනකොට ඔහු පිට වියදම් ඇති මුදල පවුම් අසූ අටයි, සිලිං දහයක් පමණයි. නමුත් කැපිටල් සහ කවුන්ටීස් බැංකුවේ ඔහුගේ ගිනුමේ තිබෙනවා පවුම් දෙසිය විස්සක මුදලක්. ඒ නිසා ඔහුට මුදල් පිළිබඳ ප්‍රශ්නයක් ඇතිවී ඒ නිසා හිතේ කරදරයක් ඇතිවුණා, කියල කොහොමටවත් හිතන්න බෑ.

පහුගිය සඳුදා නෙවිල් සෙන්ට් ක්ලෙයා මහත්මයා නගරයට යෑමට පිටත්වුණේ වෙනදාටත් වඩා කලින්. ඔහු ගෙදරින් යද්දී බිරිඳට කිව්වලු එදා තමන්ට වැදගත් වැඩකටයුතු දෙකක යෙදෙන්න තිබෙන බව. ඊළඟට ඔහු තමන්ගේ කුඩා පුතාට පොරොන්දු වුණාලු හවසට ආපසු ගෙදර එද්දී, සෙල්ලම් බඩුවක් අරගෙන එන්න. ඒ සෙල්ලම් බඩුව තමයි සෙල්ලම් ගෙවල් හැදීමට ගන්නා පාට කළ ලී කැබලි පෙට්ටියක්.

මේ කියන සඳුදාම හරිම අහම්බෙන් වගේ සෙන්ට් ක්ලෙයා මහත්මියට විදුලි පණිවුඩයක් ලැබුණා. එවිට ඇගේ සැමියා ගෙදරින් පිටවී ගිහින් ටික වෙලාවක් ගතවෙලා. එය ලැබුණේ ලන්ඩන් නගරයේ ඇබර්ඩීන් නැව් සමාගමෙන්. ඇගේ නමට එවා ඇති පාර්සලයක් තමන්ගේ කාර්යාලයට ලැබී ඇති නිසා පෞද්ගලිකව පැමිණ එය ලබාගන්නා මෙන් නැව් සමාගම විදුලි පණිවුඩයේ දන්වා තිබුණා. සෑහෙන තරම් වටිනාකමක් ඇති මේ පාර්සලය ඇය හුඟ දවසක් තිස්සේ බලාපොරොත්තුවෙන් සිටි එකක්.

ඔබ ලන්ඩන් නගරය ගැන හොඳින් දන්නවා නම් වොට්සන් ඔබට මතක් වේවි, මේ නැව් සමාගමේ කාර්යාලය තියෙන්නේ ෆ්‍රෙස්නෝ වීථියේ බව. ඒ පාර පිහිටා තියෙන්නේ ඉහළ ස්වොන්ඩම් පටුමඟට සම්බන්ධ වෙන තැනක් ලෙසයි. සෙන්ට් ක්ලෙයා මහත්මිය

දවල් කෑම කාල, ලන්ඩනය බලා යන්න ගෙදරින් පිටත්වුණා. ඇය සාප්පු කිහිපයකට ගිහිං අවශ්‍ය බඩු වගයකුත් අරගෙන, තමන්ගේ පාර්සලය ගන්න නැව් කටයුතු කාර්යාලයට ගියාලු. එය ලබාගත් ඇය දුම්රියපොළට එන අදහසින් ස්වොන්ඩම් පටුමඟ දිගේ ආපහු ඇවිදගෙන ඇවිත් තියෙනවා. එවිට වෙලාව හරියටම හවස 4.35 යි. මේ දක්වා මං කිව දේවල් ඔබට පැහැදිලිද?"

"හොඳට පැහැදිලියි."

"ඔබට මතක ඇති පනුහිය අඳුදා ඉතා උණුසුම් දවසක් බව. ඇයට ගමන් කරන්න තිබුණු පාරේ පරිසරය සෙන්ට් ක්ලෙයා මහත්මියගේ හිතට ඇල්ලුවෙත් නැහැ. මේ නිසා ඇය ඉදිරියට ගියේ කුලීරියක් අල්ලා ගන්නා අදහසින් වටපිට බලමිනුයි.

ස්වොන්ඩම් පටුමඟ දිගේ මෙහෙම ගමන් කරද්දී ඇයට එක්වරම අහන්න ලැබුණා, කිසිවෙකු ඉමහත් පුදුමයෙන් මෙන් කළ කෑගැසීමක්. කෑගැසීම ඇසුණු දෙසට අවධානය යොමු කළ ඇයට දකින්න ලැබුණේ මොකක්ද? අසල තිබූ ගොඩනැඟිල්ලක දෙවැනි තට්ටුවේ ජනේලයකින් එබී බලමින්, ඒ කෑගැසුවේ ඇගේ ස්වාමිපුරුෂයා! ඒ බව දකලා සෙන්ට් ක්ලෙයා මහත්මිය භීතියෙන් ගල්ගැසුණා. ජනේල පියන විවෘතව තිබුණා. ඔහුගේ මුහුණ ඇයට පැහැදිලිවම දකගන්න ලැබුණා. ඇය විස්තර කරන හැටියට ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ වුණේ අතිශයින්ම නැතිගත් නැත්නම් කලබලයට පත් ස්වභාවයක්. ඔහු උමතුවෙන් මෙන් ඇයට අත වැනුවා. ඊළඟට මොහොතකින් ඔහු ජනේලය ළඟින් අතුරුදන් වුණා. එහෙම වුණේ හරියට, ඇයට නොපෙනුණු යම්කිසි කෙනෙක් පිටුපසින් ඉඳල, ඔහුව අහකට ඇද දැම්ම වගේ. මෙහිදී එක් වැදගත් කරුණක් ඇගේ කාන්තා ඇසට ක්ෂණිකව සහිටුහන් වුණා. ඒ තමයි ඔහු අඳුරු පැහැති කබායක් හැඳ සිටියත්, කරවටා ටයිපටියක් හෝ කොලරයක් පැළඳ සිටියේ නැති බව.

ඔහුට මොකක් හෝ කරදරයක් සිදුවී ඇති බව ඇයට වැටහුණා. ඇය වහාම ඒ ගොඩනැඟිල්ල අසලට දිව ගියා. එහි තරප්පු පෙළ දිගේ ඉහළ තට්ටුවට යන අදහසින් ඇය දොරටුවෙන් ඇතුළුවුණා. ඇය මේ ඇතුළුවුණු ස්ථානය තමා, දැන් ටික වෙලාවකට කලින් අප දෙදෙනා මුණ ගැසුණු අබිං ගුහාව.

http://sherlockholmesinvestigations.blogspot.com



139. "අබිං ගුහාව අයිති ලස්කාර් තක්කඩියා ඇයට මඟ අවහිර කළා"

තරප්පු පෙළේ ඉහළට නැඟීමේ අරමුණෙන් සෙන්ට් ක්ලෙයා මහත්මිය ඉදිරියට ගියත්, ඇයට ඊකට ඉඩක් ලැබුණේ නෑ. මං ඔබට කිව් අබිං ගුහාව අයිති තක්කඩියා ඇයට තරප්පු පෙළේ මග අවහිර කළා. ඒ විතරක් නෙමෙයි. ඇයව එතැනින් පන්නා දැම්මා. එතැන දෙවැනියා හැටියට කටයුතු කරන ඩෙන්මාක් ජාතිකයෙකුත් ඊට හවුල්වුණා. ඔවුන් ඇයව මහපාරටම එළවා දැම්මා.

තමන්ගේ ස්වාමිපුරුෂයා මොකක් හරි බිහිසුණු ඉරණමකට මුහුණ දෙනවා වියයුතු යයි ඇයගේ හිතේ සැකයක් ඇතිවුණා. එයින් ඇය අප්‍රමාණ භීතියකට පත්වුණු බව අමුතුවෙන් කිවයුතු නෑ. සෙන්ට් ක්ලෙයා මහත්මිය වීථියේ ඉහළට දිව ගියේ කාගෙන් හරි උදව්වක් ලබාගන්නා අරමුණෙන්.

වාසනාවකට ෆ්‍රේගේ රාජකාරි මුර සංචාරයේ යෙදෙන පොලිස් පරීක්ෂකයෙක් සහ පොලිස් භටයන් කිහිප දෙනෙකු ඇයට හමුවුණා. ඇගේ ඉල්ලීම පරිදි මේ ගැන සොයා බලන්න එන්න පොලිස් නිලධරයන් ප්‍රමාද වුණේ නැහැ.

අබිං ගුහාව වෙත ආවත්, එතැන අයිතිකාරයා පොලිස් නිලධරයන්ටත් උඩ තට්ටුවට නැඟීම අවහිර කළා. ඔහු කොපමණ බාධා කළත් ඔවුන් උඩ තට්ටුවට ගියා. නෙවිල් සෙන්ට් ක්ලෙයා සිටින බව, ඒ මහත්මිය දුටුව කාමරේට ඔවුන් ඇතුළුවුණා. කාමරයේ ඒ මහත්මයාගේ ලකුණක්වත් තිබුණේ නැහැ. ඇත්තෙන්ම එම තට්ටුවේ හිටියේ එකම එක මනුස්සයෙක් පමණයි. ඒ අංගවිකල බවට පත් හිඟන්නෙක්. ඔහු එතැන තාවකාලික නවාතැන් ගැනීමට පුරුදුව සිටි කෙනෙක්. ඔහුත් ස්ථානය අයිතිකරුවාත් දෙදෙනාම දිවුරා කියා සිටියා, එදා දවල් වරුවටම කිසිම කෙනෙක් ඒ කාමරයට නොපැමිණි බව. නැවත නැවතත් දිවුරමින් ඔවුන් එය කියූ තාලයට පොලිස් පරීක්ෂකවරයාට පවා හිතුණේ, මේක සෙන්ට් ක්ලෙයා මහත්මියට සිදු වූ වැරැද්දක් වෙන්න ඇති කියලයි. එම කාරණය ඔහුගේ සිතට නැඟුණු මොහොතේම අර කාන්තාව කෑගසනවා පොලිස් නිලධරයාට ඇසුණා. මේසය මත තිබූ කුඩා පෙට්ටියක් වෙතට පැන්න ඇය, එහි පියන විවෘත කළා. එහි තිබුණේ, සෙන්ට් ක්ලෙයා මහත්මයා තමුන්ගේ පුතාට ගෙනෙන්න පොරොන්දු වුණු සෙල්ලම් බඩුව-සෙල්ලම් ගෙවල් හදන ලී කැලි කට්ටලය.

http://sherlockholmesinvestigations.blogspot.com

මෙම සොයා ගැනීමත්, එවිට අභිබුශාත හිතන්නාගෙන් දකිය හැකි වූ කැලැඹීමත් නිසා පොලිස් පරීක්ෂකවරයාගේ සිතේ තදබල සැකයක් ඇතිවුණා. මෙතැන මොකක් හරි බිහිසුණු සිදුවීමක් ඇතැයි සැකකළ ඔහු, කාමර සියල්ලම සූක්ෂම අයුරින් සෝදිසි කළා. එයින් ලැබුණු ප්‍රතිඵලය වුණේ යම්කිසි අපරාධයක් එහි සිදුවී ඇති බවට සාක්ෂි ලැබීමයි. මෙහි ඉදිරිපස කාමරය ලී බඩු කිහිපයක් තබා තිබුණු, විසිත්ත කාමරයක් ලෙස ප්‍රයෝජනයට ගත් එකක්. මේ විසිත්ත කාමරයට දොරටුවකින් සම්බන්ධ වෙන තවත් කුඩා කාමරයක් තිබුණා. ඒක නිදන කාමරයක්. මේ නිදන කාමරයේ ජනේල වලින් එළියේ දකින්න ලැබුණේ තේම්ස් ගඟේ ගං මෝයේ ඇති, බඩු ගොඩබාල ගබඩා කරන වාප්පු වල පිටුපස පැත්ත. වාප්පු සහ මේ ගොඩනැගිල්ල අතර බිම් තීරයක් තියෙනවා. බාදිය වෙලාවට මේක වියළි බිම් කඩක්. නමුත් වඩදිය ගලන වෙලාවට මේක අඩි හතරහමාරක් පමණ උසට වතුරෙන් යටවෙනවා. නිදන කාමරයේ ජනේලය බොහොම පළල එකක්. එහි පියන උඩින් සවිකළ එකක්. ඒ නිසා විවෘත වෙන්නේ පහළ කෙළවරෙන්.

තවත් හොඳින් පරීක්ෂා කිරීමේදී මේ ජනේලයේ පඩිය මත ලේ පැල්ලම් සොයා ගැනීමට හැකිවුණා. මීට අමතරව කාමරයේ ලෑලි පොළොව මත ද විසිරී තිබුණු ලේ බින්දු කිහිපයක් දකගත හැකිවුණා. ඉදිරිපස කාමරයේ තිර රෙද්දක් පිටුපස ගුළිකර දමා තිබී ඇඳුම් පොදියක් පොලීසියට හමුවුණා. ඒ අතුරුදන් වූ නෙවිල් සෙන්ට් ක්ලෙයා මහත්මයාගේ ඇඳුම්. ඔහුගේ කබාය ඇරෙන්න අනික් සියලුම ඇඳුම් එතැන තිබුණා. ඔහුගේ සපත්තු, මේස්, තොප්පිය සහ ඔරලෝසුව පවා එහි අඩංගු වුණා. සෙන්ට් ක්ලෙයා මහත්මයාට මොනවා හෝ දරුණු තුවාල සිදුවුණු බවක්, ඇඳුම් වලින් නම් දකින්න ලැබුණේ නැහැ. එමෙන්ම ඔහුට අත්වූ ඉරණම පිළිබඳව වෙනත් කිසිම හෝඩුවාවක් දකින්න ලැබුණෙත් නැහැ. ඔහුට එළියට යාමට වෙනත් මාර්ගයක් නොතිබුණු නිසා සෙන්ට් ක්ලෙයා මහත්මයා ජනෙල් කවුළුව තුළින් ඉවතට ගිය බවයි පෙනුණේ. ජනෙල් පඩිය මත තිබුණු ලේ පැල්ලම් වල හැටියට නම් ඔහුට පිහිනා ජීවිතය ගලවාගන්න හැකියාවක් තිබුණා කියල හිතන්න අමාරුයි. ඒ මොකද මේ සිද්ධිය වෙන වෙලාවෙ වඩදිය ගැලීම තිබුණේ බොහොම උච්ච තත්ත්වයේ.

http://sherlockholmesinvestigations.blogspot.com

මේ අපරාධයට කිට්ටුවෙන්ම සම්බන්ධ යයි සිතිය හැකි පුද්ගලයින් ගැන අපි ඊළඟට කථා කරමු. මෙතැන අයිතිකාර තක්කඩියා කළු හම ඇති ඉන්දියන් ජාතික ලස්කාරියෙක්. ඔහු දුශ්චරිතවත් පුද්ගලයෙක් බවට කලිනුත් වාර්තා වී තිබෙනවා. නමුත් සෙන්ට් ක්ලෙයාර් මහත්මියම කියනවා, තමන්ගේ සැමියා ජනේලයෙන් දකලා තත්පර කිහපක් ඇතුළත, ලස්කාරියා තරප්පුව මුල සිට ඇයට අවහිර කළ බව. අපරාධය ගැන ආධාර හා අනුබල දුන් අයෙක් කියනවා ඇරෙන්න, ඊට වඩා චෝදනාවක් ඔහුට විරුද්ධව නගන්න අපට අමාරුයි. ඔහු නිදහසට කිව්වේ තමන් කිසිම දෙයක් නොදන්න බවයි. ඊළඟට අර අබ්බගාත හිඟන්නා කුමක් කළාද කියා තමන් නොදන්නා බවත් ලස්කාරියා කියා හිටිනවා. සෙන්ට් ක්ලෙයාර් මහත්මියාගෙ ඇඳුම් එහි තිබී හමුවුණේ කොහොමද කියන එක ගැන ඔහුට කිසිම නිදහසට කරුණක් කියන්න බැරිවුණා. ඒ තක්කඩියා ගැන එපමණයි.

ඊළඟට අපි කථාකරමු අර අංගවිකල හිඟන්නා ගැන. හියු බූන් නම් ඔහු ජීවත්වෙන්නේ අබිං ගුහාවේ දෙවැනි තට්ටුවේ. නෙවිල් සෙන්ට් ක්ලෙයාව අන්තිම වරට දකින්න ඇත්තෙත් හියු බූන් පමණයි. ඔහුගේ ඉතාම අවලක්ෂණ මූහුණ, ලන්ඩන් නගරයේ ඇවිදින කවුරුත් දකපුරුදු එකක්. ඔහුගේ රක්ෂාව හිඟාකෑම. හිඟාකෑම නීතියෙන් තහනම් නිසා, පොලිස් අත්අඩංගුවට පත්වීමෙන් වළකින්න, ඔහු පෙන්වන්නේ පදික වේදිකාවේ ගිනිකූරු අලෙවි කරමින් සිටින්නෙක් බව. ඔහු නිරතුරුවම දකින්න ලැබෙන්නේ ත්‍රෙඩ්නීඩ්ල් වීථියේ පාර අයිනේ. ඔහු බිත්ති මුල්ලකට වෙලා, එරමිණියා ගොතාගෙන, උකුල මත ගිනිකූරු තබාගෙන හිඟාකන හැටි දිනපතාම දකින්න ලැබෙන දසුනක්. ඔහුගේ විරූපී භාවය නිසා, මඟ යන එන අයගේ සිත්වල ඇතිවෙන අනුකම්පාවට හියු බූන්ට විශාල වශයෙන් සිඟමන් ලැබෙනවා. ඔහු සමඟ හැඳුනුම්කමක් ඇතිකරගත යුතුය යන අපේක්ෂාවෙන්, මං මඟ නැවතිලා ඔහු දිහා කීපවතාවක්ම බලාගෙන ඉඳලා තියෙනවා. කෙටි වෙලාවක් ඇතුළත ඔහුට පිනට ලැබුණු මුදල් ප්‍රමාණය දකලා මට හරි පුදුම හිතුණා වොට්සන්. ඔහුගේ පෙනුමේ ඇති විශේෂත්වය නිසාම, කිසිකෙනෙකුට ඔහු නොදකා එතැනින් ගමන් කරන්නට බැහැ. නැඹිලි පැහැති හිසකෙස්, සුදුමැලි මුහුණ, මුහුණේ එක් පැත්තක



143. "ඔහුගේ විරූපී භාවය නිසා හියු බූන්ට විශාල වශයෙන් හිඟමන් ලැබෙනවා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඇති විශාල තුවාල කැළලක්, එය හැකිළීමේදී උඩුතොල නොපිටට පෙරළී යාමත් නිසා, ඔහුට ලැබී ඇත්තේ කාගේත් සිත්වල කණගාටු උපදවන පෙනුමක්. ඔහුගේ කළු පැහැති තියුණු නෙත් යුවළත්, බුල්ඩෝග් වර්ගයේ බල්ලෙකුගේ හොම්බ වැනි නිකටත් සාමාන්‍යයෙන් මෙවැනි අහිංසක හිඟන්නෙකුගේ දකින්නට ලැබෙන ලක්ෂණ නොවෙයි. අප සොයන මහත්මයාව අන්තිම වරට දකින්න ඇත්තේ අඹිං ගුහාවේ ලැගුම් ගන්නා මෙන්න මේ පුද්ගලයා."

"නමුත් ඔහු අංග විකල පුද්ගලයෙක් එහෙම නේද? තරුණවිය හො ඉසුම් වූ නිරෝගී කෙනෙකුට එරෙහිව මේ අංගවිකල හිඟන්නා තනිවම මොනවා කරන්නද?"

"ඔහු අංග විකලයි කියන්නේ ඇවිදීමේදී කොරගහමින් යන නිසා. නමුත් ශරීර ස්වභාවය බැලුවාම ඔහු හොඳින් වැඩුණු ශක්තිමත් කෙනෙක් බව පෙනෙනවා. ඔබේ වෛද්‍ය විද්‍යාත්මක දැනුමෙන් ඔබට දකින්න ලැබිල ඇති වොට්සන්. එක් අතක හෝ කකුලක දුර්වල කමක් ඇති කෙනෙකුගේ, අනෙක් ගාත් හැම එකක්ම අතිශයින්ම ශක්තිමත් බව."

"ඉතින් ඔබේ කථාව කියන්න."

"ජනෙල් පඩියේ තිබුණු ලේ අටුවාම සෙන්ට් ක්ලෙයා මහත්මිය ක්ලාන්ත වුණා. පොලීසිය ඇයව කුලීරියක නග්ගවා ඇගේ ගෙදරට ගෙනිහින් ඇරලුවා. ඒ මොකද ඇයව තවදුරටත් එහි රඳවා ගැනීමෙන් පොලිස් පරීක්ෂණයට ප්‍රයෝජනයක් නොමැති නිසා.

මෙම පරීක්ෂණය භාරව ඉන්න පොලිස් පරීක්ෂක බාටන්, මෙම ස්ථානය තවදුරටත් තියුණු ලෙස පරීක්ෂණයට ලක් කළා. නමුත් සිද්ධිය තවදුරටත් පැහැදිලි වෙන යමක් හොයාගන්න, ඔහුට හැකිවුණේ නැහැ. පොලීසිය ඒ මොහොතෙම හියු බූන් සිර භාරයට නොගැනීමෙන්, මෙතැන පොඩි වැරැද්දක් සිදුවෙලා තියෙනවා. ඒ ප්‍රමාදයෙන් තමන්ගේ මිත්‍රයා වන ලස්කාරියා සමඟ කතාබහ කිරීමට හියු බූන්ට මිනිත්තු කිහිපයක් ලැබිල තියෙනවා. ඒත් මේ වැරැද්ද ඉක්මනින් හරිගස්සාගන්න පොලීසිය සමත්වුණා. ඔවුන් හියු බූන් අත්අඩංගුවට අරගෙන ඔහුව සෝදිසි කරලා තියෙනවා. නමුත් ඔහුව අපරාධයට පටලැවෙන තාලේ කිසිවක් පොලීසියට හමුවුණේ නැහැ. ඔහුගේ දකුණු කමිස අතේ ලේ

http://sherlockholmesinvestigations.blogspot.com

පැල්ලම් කිහිපයක් තිබුණා. නමුත් ඔහු පෙන්වා දුන්නා, තමන්ගේ වෙදහිල්ලේ නියපොත්ත ළඟින් කැපී ගිය තුවාලයක් ඇති බවත්, කමිස අතේ ලේ ගෑවුණේ එයින් බවත්. ටික වේලාවකට පෙර ඔහු ජනේලය ළඟට ගිහින්, එතැන යමක් කළ නිසා, ජනෙල් පඩියේ තිබූ ලේ සැකයක් නැතිවම ඔහුගේ ඇඟිල්ලේ තුවාලයෙන් ගෑවෙන්න ඇති බවත් හියු බූන් කිව්වා. නෙවිල් සෙන්ට් ක්ලෙයා මහත්මයා තමන් කවදාවත්ම දැක නැති බවත්, ඔහුගේ ඇඳුම් මේ කාමරයට ආවෙ කොහොමද කියන එක පොලීසියට වගේම තමන්ටත් ප්‍රහේලිකාවක් බවත්, හිඟන්නා නැවත නැවතත් කියා හිටියා. තමන්ගේ සැමියා ජනේලය ළඟ සිටින බව සෙන්ට් ක්ලෙයා මහත්මිය දුටුවේ කොහොමද කියන ප්‍රශ්නය හිඟන්නාගෙන් ඇහුවා. ඔහු ඒකට කිව්වේ එක්කෝ ඇයට පිස්සු; නැත්නම් ඇය සිහිනයක් දකින්න ඇති කියලයි. කොහොම වුණත් බලවත් විරෝධතා මධ්‍යයේ හියු බූන් අත්අඩංගුවට ගෙන, පොලිස් ස්ථානයට ගෙන ගියා. නමුත් වඩදිය බැස ගියාම තවත් මොනවා හරි හෝඩුවාවක් දැක ගැනීමට හැකිවේවි කියන බලාපොරොත්තුවෙන්, පොලිස් පරීක්ෂක වරයා එම ගොඩනැගිල්ලේම රැඳී හිටියා.

හිතුවා වගේම වඩදිය බැස යද්දී යමක් දකින්න ලැබුණා. පොළොවේ මඩ තට්ටුව මත ඔවුනට දකින්න ලැබුණේ සෙන්ට් ක්ලෙයා නෙමෙයි. ඔහුගේ කබායයි දකින්න ලැබුණේ. කබායේ සාක්කුවල තිබී ඔවුනට හමුවුණේ මොනවද කියල ඔබට හිතන්න පුළුවන්ද?"

"මට හිතාගන්න බෑ."

"මං හිතන්නෙ නෑ ඔබට අනුමාන කරන්න හැකිවේවි කියලා. කබායේ හැම සාක්කුවක්ම පැන්සයේ හා පැන්ස බාගේ කාසිවලින් පුරවා තිබුණා. පැන්සයේ කාසි 421 ක් හා පැන්ස බාගේ කාසි 270 ක්. වඩදිය බැස යද්දී කබාය වතුරේ ගසාගෙන නොගිය එකේ පුදුමයක් නැහැ. නමුත් මනුෂ්‍ය ශරීරයක් ගැන සලකා බැලුවොත් ඒක වෙනස්. මේ නිවසත් වාප්පුවත් අතරේ බාදිය ඇතිවෙද්දී, වේගවත් දිය සුළි ඇතිවෙනවා. බොහොම වෙලාවට වෙන්න ඇත්තේ කුමක්ද කියල අපට හිතාගන්න පුළුවනි. බර වැඩිකම නිසා කබාය එතැන රැඳී තිබෙද්දී, ඇඳුම් නොමැති සිරුර දිය සුළියක ගසාගෙන ගිහිං ගඟට ඇදී යන්න ඇති."

investigations.blogspot.com

"නමුත් අපට අහන්න ලැබුණා අනික් ඇඳුම් හැම එකක්ම කාමරයේ තිබී හමුවුණාය කියල. ඔබ කියන්නේ මළසිරුරට අන්දලා තිබෙන්න ඇත්තේ කබාය පමණක් කියලාද?"

"නැහැ වොට්සන්. අපි මේ කාරණා ගැන හිතා බලන්න ඕන, මතුපිටට පෙනෙන ආකාරයට නොවෙයි. අපි හිතා බැලිය යුත්තේ එහි යටින් සැඟවිලා තිබෙන අරුත මොකක්ද කියලා. මේ බූන් නම් පුද්ගලයා, නෙවිල් සෙන්ට් ක්ලෙයාව ජනේලයෙන් එළියට තල්ලුකර දැම්මා කියල හිතමු. ඒ ක්‍රියාව කිසිම මිනිස් ඇසකට දකින්න ලැබෙන්නෙ නෑ. ඔහු ඊළඟට මොකද කරන්නෙ? අපරාධය ගැන තොරතුරු හෙළිවිය හැකි ඇඳුම්, වහාම එතැනින් ඉවත් කළ යුතු බව ඔහුට වැටහෙනවා. ඔහු කබාය ගන්නවා එළියට දමන්න. නමුත් ඔහු තේරුම් ගන්නවා කබාය වතුරේ ගිලෙන එකක් නැහැ, පාවෙන්න ඉඩ ඇති බව. හිඟු බූන්ට ඉතිරි වෙලා තියෙන්නෙ බොහොම කෙටි කාලයයි. සෙන්ට් ක්ලෙයා මහත්මිය පහළ දොරටුව ළඟ ලස්කාරියා සමග ඇති ආරවුල ඔහුට ඇහෙනවා. ඊළඟට ඇය පිටත් වී ගියත්, ලස්කාර් මිත්‍රයාගෙන් දැනගන්න ලැබෙනවා, ඇය පොලිස් භටයෙක් කැඳවාගෙන වීථියේ ඇවිද එන බව. හිඟුබූන්ට නාස්ති කරන්න වෙලාවක් නැහැ. ඔහු රහසිගතව මුදල් සඟවා තැබූ තැනකට යනවා. එතැන තිබුණු තඹ මුදල් අරගෙන, කබායේ සාක්කු වල පුරවනවා. ඔහුගේ අරමුණ වුණේ කොහොම හරි ඒක වතුරේ පාවෙන්න ඉඩ අරින්නේ නැතුව දිය යටට බස්සන්න. ඔහු කබාය ඉවතට දමීමට සමත් වුණා. අනෙක් ඇඳුම් පැළඳුම් සියල්ලට කරන්නෙත් ඒ විධිහමයි. නමුත් ඔහුට ඇහෙනවා වේගයෙන් තරප්පුව නැඟගෙන ඉහළට එන අයගේ අඩිශබ්දය. පොලීසිය කාමරයට ඇතුළුවෙන්න කලින්, ජනෙල් පියන වහන්න ඔහුට යන්තමට ඉඩක් ලැබුණා."

"සිදුවීම් වෙන්න ඇත්තේ ඔය ආකාරයටයි කියල හිතන්න පුළුවනි."

"අපේ පරීක්ෂණ කටයුතු ඉදිරියට ගෙනියන්න උපකල්පනයක් ලෙස අපි ඒක දැනට යොදා ගමු, වෙනත් එකක් නොමැති නිසා. මං ඔබට කිව්වා [illegible] අත්අඩංගුවට අරගෙන පොලිස් ස්ථානයට ගෙන ගියා කියල. නමුත් ඔහු මීට කලින් කිසිම වරදකට අත්අඩංගුවට පත්වුණු කෙනෙ[illegible] කිසිම [illegible] නැහැ. අවුරුදු

ගණනාවක් තිබුණත් ඔහු කළ ව්‍යාපාර හිතාකෑම බව කවුරුත් දන්නවා. ඔහු ගතකළ ජීවිතය වැරදිවලට සම්බන්ධ නොවුණු අහිංසක එකක් බවයි පෙනෙන්නෙ. දැනට මේ සිද්ධිය පත්වී තිබෙන්නෙ ඔන්න ඔය තත්ත්වයටයි. එතකොට අපි විසඳිය යුතු ප්‍රශ්න කීපයක්ම මතුවෙනවා.

මුලින්ම නෙවිල් සෙන්ට් ක්ලෙයා අබිං ගුහාවට වෙලා මොකද කළේ? ඔහුට එහේදි අත්වුණු ඉරණම මොකක්ද? දැන් ඔහු සිටින්නේ කොහේද? ඔහුගේ අතුරුදන් වීම ගැන හියු බූන්ගෙ ඇති සම්බන්ධය මොකක්ද? මං මේ ටිකත් කියන්න ඕන වොට්සන්. මුලදී බැලූ බැල්මට පෙනුණෙ මේක බොහොම සරල ගැටලුවක් වගෙයි. නමුත් දුෂ්කරතා මතුවෙන්න පටන්ගන්නේ ඉදිරියට යද්දියි. ඔය ආකාරයේ ගැටලුවක් මං මේ දක්වා කළ පරීක්ෂණවල තිබුණද කියල මට මතක් කරන්නත් අමාරුයි."

ෂර්ලොක් හෝම්ස් මේ කථාන්තරය කියාගෙන යද්දී අපි සෑහෙන දුරක් ඉදිරියට ගමන් කර සිටියෙමු. ජනේල තුළින් ආලෝකය විහිදුණු නිවාස කිහිපයක්ම අපට මඟ දෙපස දකින්නට ලැබිණි.

"ඔන්න අපි ලී නගරයේ මායිමටත් ආවා. අපි එංගලන්තයේ ප්‍රාන්ත තුනක් හරහාම ගමන් කළා. මිඩ්ල්සෙක්ස් වලින් පටන් අරගෙන, සරේ ප්‍රාන්තයේ කොළවරක් හරහා ඇවිත්, කෙන්ට් ප්‍රාන්තයටත් ආවා. අර ඇත එළියක් සහිත නිවසක් ඔබට පෙනෙනවාද වොට්සන්? ඒ තමයි සෙඩාර්ස් මන්දිරය. ඒ පහන ළඟ වාඩිවෙලා කාන්තාවක් බලාගෙන ඇති. සැකයක් නෑ අපේ අශ්වයාගේ කුර ගැටෙන හඬ දැනටමත් ඇගේ දෙසවණට වැටිල ඇති."

"ඇයි ඔබ මේ පරීක්ෂණය බේකර් වීථියේ රැඳී ඉඳගෙන පවත්වන්නෙ නැත්තෙ?"

"ඒ මොකද මට මෙහේ සිට විමසා බැලිය යුතු කරුණු රාශියක් තිබෙනවා. සෙන්ට් ක්ලෙයා මහත්මිය මා වෙනුවෙන් කාමර දෙකක්ම වෙන්කරලයි තියෙන්නෙ. මගේ හිතවත් මිත්‍රයෙක් ආව කියන්නම්. ඇය ඔබව සාදරයෙන් පිළිගනීවි. ඒ වුණත් මං කොහොමද ඇයට මුහුණ දෙන්නෙ? ඇගේ ස්වාමිපුරුෂයා ගැන කියන්න කිසිම ආරංචියක් මා ළඟ නෑ. ඔන්න අපි ගේ ළඟටම ආවා. හෝව්! හෝව්!!"

අලංකාර ගෙවත්තක් මැද පිහිටා තිබූ සුවිසල් නිවසක් ඉදිරියේ අපි අශ්වකරත්තය නැවැත්වීමු. ඉස්තාලයේ සේවකයෙක් පැමිණ අශ්වයාගේ හිස ළඟින් අල්ලා ගත්තේය. අපි කරත්තයෙන් බැස බොරළු ඇතිරූ පාරක් මැදින් නිවස දෙසට පා නැගුවෙමු.

නිවසේ දොර විවෘත විය. කුඩා සිරුරක් තිබූ කාන්තාවක් දොර ඉදිරිපිට නොඉවසිලිමත් මුහුණකින් බලා සිටියාය.

"ඉතින් ඉතින් . . . . ?" ඇය ඇසුවේ උස් හඬිනි. ඉන්පසු අප දෙදෙනෙකු සිටින බව දුක ඇයගේ මුවෙන් බලාපොරොත්තු සහගත හඬක් නිකුත් විය. එහෙත් හෝම්ස් තම හිස සොලවා අරමුණු ඉටුනොවූ බව හඟවද්දී ඇයට කෙඳිරිගෑවිණ.

"හොඳ ආරංචි කිසිම දෙයක් නැද්ද මහත්මයා?"

"මොකුත් නෑ."

"නරක ආරංචිත් නෑ?"

"නැහැ."

"ඒ ගැන දෙවියන්ට ස්තුතිවේවා! ඇතුළට එන්න හෝම්ස් මහත්මයා. ඔබට හුඟාක් මහන්සි ඇති. අද උදේ පිටම මේ කටයුත්තට ඔබ වෙහෙසනවා නොවැ."

"මේ මගේ මිත්‍රයා, දොස්තර වොට්සන්. මගේ පරීක්ෂණ විශාල ගණනකදී ඔහු මට හරියට උදව් කළා. මේ පරීක්ෂණයටත් ඔහුගේ සහයෝගය ලබාගන්න අහම්බෙන් වගේ මට වාසනාව සැලසුණා."

"ඔබ හඳුනාගන්න ලැබීම ගැන සන්තෝෂයි මහත්මයා" ඇය කීවේ අතට අතදී මා සාදරයෙන් පිළිගනිමිනි.

"මෙහේ තියෙන පහසුකම් වල අඩුපාඩු ඇති. ඒ ගැන මට සමාවෙන්න. ඔබට තේරෙනවා නේද අපට නොහිතූ විධියට මේ එල්ල වෙලා තියෙන හෙණ පහර?"

"හිතවත් නෝනා. හෝම්ස් මහත්මයා සමඟ පරීක්ෂණ වලට සහභාගී වෙමින් නොයෙක් පළාත්වල ඇවිදිමින්, නවතිමින් එවැනි ජීවිතයකට හුරු පුරුදු කෙනෙක් මම. එහෙම නොවුණත් මට තේරුම් ගන්න පුළුවන් මේ ඇති වී තිබෙන තත්ත්වය. සමාව

http://sherlockholmesinvestigations.blogspot.com

ඉල්ලීමක් අවශ්‍ය නෑ. ඔබට හෝ මගේ මිත්‍රයාට උදව්වක් කරන්න ඉඩක් ලැබුණොත් ඒක මට සතුටක්."

සීතල වී තිබුණු රාත්‍රී ආහාරය මේසයක් උඩ සූදානමින් තිබිණි. අපි ඒ කාමරයට ඇතුළුවෙද්දී ගෙහිමි කාන්තාව අප වෙත ප්‍රශ්නයක් ඉදිරිපත් කළාය.

"ෂර්ලොක් හෝම්ස් මහත්මයා. මං කැමතියි ඔබෙන් ප්‍රශ්නයක් දෙකක් අහන්න. මං ඔබෙන් ඉල්ලා හිටිනවා, ඒවාට එක එල්ලේ පැහැදිලිව පිළිතුරු දෙන්න කියල."

"සත්තකින්ම ඔව් නෝනා."

"ඔබේ පිළිතුර නිසා මගේ හිතට වේදනාවක් ඇතිවේවි කියල හිතන්න එපා. මං බොහොම සුළු දෙයකින් මොළේ හරස් කරගෙන ක්ලාන්ත වෙන කෙනෙක් නෙමෙයි. මට ඕනෑ කරන්නේ මේ ගැන අවංකවම ඔබේ අදහස් මොනවද කියල දැනගන්න."

"මොකක් ගැනද?"

"මට අවංකවම කියන්න. ඔබ හිතන්නේ නෙවිල් ජීවතුන් අතර ඉන්නවා කියලද?"

හිටිහැටියේ එල්ල වූ මේ යළු ප්‍රශ්නයෙන් ෂර්ලොක් හෝම්ස් බලවත් අපහසුවකට පත්වූ බව පෙනිණ.

"ඔබේ හිතට ඇතිවෙන අවංක හැඟීම මේ මොහොතෙම මට කියන්න මහත්මයා."

වේවැල් පුටුවේ අසුන්ගත් හෝම්ස්ගේ මුහුණට එබී බලමින් කාන්තාව යළිත් ඇසුවාය.

"ඔබ මගෙන් බලාපොරොත්තු වෙන්නේ අවංකවම මා හිතන දේද නෝනා? එහෙම නම් මං හිතන්නේ ඔහු ජීවතුන් අතර නැහැ."

"ඔබ හිතන්නේ ඔහු මියගිහින්?"

"ඔව්."

"මරා දමල?"

"මට ඒක හරියටම කියන්න අමාරුයි. බාග වෙලාවට එහෙම වෙන්න පුළුවනි."

http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙම නම් ඔහු මියගියේ නැවදද?"

"සඳුදා."

"හොඳයි හෝම්ස් මහත්මයා. එහෙම නම් මට මෙන්න මේ කාරණය පැහැදිලි කරන්න. ඔහු සඳුදා මියගියා නම්, මට ඔහුගෙන් ලියුමක් අද සිකුරාදා ලැබෙන්නෙ කොහොමද?"

ෂර්ලොක් හෝම්ස් වාඩිවී සිටි පුටුවෙන් උඩ පැන්නේ, ඔහුට විදුලි සැරයක් වැදුණාක් මෙනි.

"මොනවා?"

"ඔව්. අද ලැබුණා." ඇය සිනාසෙමින් කුඩා කඩදාසි කැබැල්ලක් අප දෙසට දිගු කළාය.

"මං ඒක බැලුවට කමක් නැහැ නේද?"

"මෙන්න බලන්න."

ලියුම එවා තිබූ කවරය බොහෝ රළු එකක් විය. තැපැල් මුද්‍රාව ග්‍රේව්ස් එන්ඩ් තැපැල් කාර්යාලයෙනි. එදිනම උදේ වරුවේ එය තැපැල් කොට තිබූ බව මුද්‍රාවේ සඳහන් විය. අප ලියුම කියවද්දී රාත්‍රී දොළහ පසුවී පැහෙන වේලාවක් ගතවී තිබුණු නිසා, එය තැපැල් කොට ඇත්තේ කලින් දිනයේ ලෙස සැලකීම නිවැරදිය.

"බොහොම රළු අත්අකුරු. මේ අත්අකුරු ඔබේ සැමියාගේ අත්අකුරු වෙන්න බැහැ නේන්නා?"

"නැහැ. නමුත් ඇතුළේ තියෙන ලියුමේ අත්අකුරු ඔහුගේ."

"මට තවත් කරුණක් කියන්න පුළුවනි. ලියුම් කවරයේ ලිපිනය ලියූ පුද්ගලයා නම ලියලා, ඊට පස්සේ මදකට නවත්වලා ගිහිං, ලිපිනය අහගෙන ඇවිත් එය ලියල තියෙන්නේ."

"ඔබ කොහොමද ඒක කියන්නේ?"

"ලියලා තියෙන්නේ කළු තීන්තෙන්. නම ලියුවාට පසු ඒ තීන්ත එහෙමම වියළී ගිහින් තද කළු පාටට තියෙනවා. නමුත් ලිපිනය ලියවී තියෙන්නේ අළු පාටට. ඒ මොකද ඒ ටික ලියලා තීන්ත පොවන කඩදාසියෙන් නොවෙච්චුණු තීන්ත ඉවත් කරලා.

නම ලියලා මඳ වෙලාවක් සිට ඉන්පසු ලිපිනය ලිවීමට පටන් ගත් එකෙන් පෙනෙන්නේ නම ලියූ තැනැත්තා ලිපිනය



151. "හෝම්ස් මහත්මයා. එහෙනම් මට මෙන්න මේ කාරණය පැහැදිලි කරන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

නොදන සිටි බවයි. ඒක ඉතින් බොහොම පුළු කරුණක්. දන් අපි බලමු ලියුම. හ හා! මේ කවරෙ ඇතුළේ මොකක් හරි දමල එවල තියෙනවා."

"ඔව් මුද්දක් තිබුණා. නෙවිල්ගේ අතේ පැළැඳ තිබ් මුද්ද."

"ඔබට හොඳටම විශ්වාසයි මේ ඔබේ සැමියාගෙ අත් අකුරු කියල?"

"ඔහුගේ අත් අකුරු වල එක් පිළිවෙළක්."

"එක් පිළිවෙළක්? මොකක්ද ඔබ එයින් අදහස් කරන්නේ?"

"ඔහු බොහොම කලබලයෙන් ලියන විට අත් අකුරු මේ විධියයි. ඔහු හොඳට විවේකයෙන් ලියන විට අත් අකුරු මේ වගේ නෙමෙයි. නමුත් මේ අකුරුත් මට හොඳට දකල පුරුදුයි."

*"සොඳුරිය භය වෙන්න එපා. හැමදෙයක්ම හරියාවි. සිදුවෙලා තියෙන්නෙ ලොකු වැරැද්දීමක්. එය නිවැරදි වීමට ටික දවසක් ගතවෙවි. එතෙක් ඉවසා සිටින්න.*

*නෙවිල්"*

"අච්චු පොතකින් ඉරාගත් පිටුකවරය ළහම ඇති හිස්, සුදුපාට පිටුව. මේක දිය සලකුණු මොකුත් නැති කඩදාසියක්. ලියල තියෙන්නෙ පැන්සලෙන් හ්ම්! ග්රේව්ස් එන්ඩ් වලින් තැපැල් කරල තියෙන්නේ අපිරිසිදු මහපටැඟිල්ලක් ඇති පුද්ගලයකු විසින්. කවරය ඇලවීමට මැලියම් පාවිච්චි කරල තියෙනවා. මට වැරැද්දීමක් නොවෙයි නම් මේ කටයුතු ටික කරලා තියෙන්නේ දුම්කොළ හපන තැනැත්තෙක්. නෝනා ඔබට කිසිම සැකයක් නැද්ද මේ ඔබේ සැමියාගේ අත්අකුරු බවට?"

"කිසි සැකයක් නෑ. මේ නෙවිල්ගෙ අකුරු."

"ග්රේව්ස් එන්ඩ් වලින් මේක අද උදේ තැපැල් කලා කියන්නේ, අප වසාගෙන තියෙන අන්ධකාර වලාකුළු ටිකෙන් ටික ඉවත්වී යනවා කියන එකයි. නමුත් අන්තරාදායක තත්ත්වය සම්පූර්ණයෙන්ම යහපත් අතට හැරුණා කියල මට කියන්න බැහැ."

"ඒ වුණත් හෝම්ස් මහත්මයා ඔහු ජීවතුන් අතර සිටිය යුතුයි නේද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. අපව මුළා කරල, වැරදි පාරක යවන්න වෙනත් කෙනෙක් නොලිව්ව නම්. මුද්දෙන් මොකුත්ම තීරණය කරන්න බැහැ. ඒක වෙන කෙනෙක් ඔහුගෙන් බලෙන් ලබාගත්තා වෙන්න පුළුවනි."

"නෑ නෑ. මේ නම් නෙවිල්ගේ අත් අකුරුමයි!"

"බොහොම හොඳයි. නමුත් මෙහෙම වෙන්නත් පුළුවන්. සෙන්ට් ක්ලෙයා මහත්මයා මේක සඳුදා ලියුවා. නමුත් ලියුම තැපැල් කළේ අද උදේ වෙන්න පුළුවනි."

"ඔව්. එහෙම වෙන්නත් පුළුවනි."

"ඒක එහෙම නම් ඒ සිදුවීම් දෙක අතර සෑහෙන තරම් දේවල් සිදුවුණා වෙන්නත් පුළුවනි."

"අනේ හෝම්ස් මහත්මයා. මාව අධෛර්යයට පත්කරන්න එපා. මං දන්නවා නෙවිල්ට කරදරයක් වෙලා නැහැ. ඔහු යහතින් ඉන්නවා. අපි දෙන්නා අතරේ තියෙන්නේ ඒ වගේ බැඳීමක්. ඔහුට මොකක් හරි අනතුරක් වෙලා නම් මට ඒක ඉවෙන් වාගෙ වැටහෙනවා. මං ඔහුව අන්තිමට දැක්කේ සඳුදා. ඔහු උඩ තට්ටුවේ නිදන කාමරයේ ඉඳිද්දි ඔහුගේ කැපුම් තුවාලයක් සිදුවුණා. මං එතකොට හිටියේ පහළ තට්ටුවේ කෑම කාමරයේ. නමුත් මට ඉවෙන් වගේ තේරුණා නෙවිල්ට මොකක් හරි කරදරයක් වෙලා බව. මං ඉක්මනට උඩතට්ටුවට දුවගෙන ආවා. ඒ වගේ සුළු දෙයක් වුණත් දැනෙන මට, ඔහු මරණයට පත්වෙනවා වගේ භයානක දෙයක් නොතේරී, නොදැනී තියේවි කියල ඔබ හිතනවද?"

"ලැබී ඇති සාක්ෂි අනුව, තර්කානුකූලව අපි යම් යම් නිගමන වලට එළඹෙනවා තමයි. නමුත් එයට ප්‍රතිවිරුද්ධ නිගමන කාන්තාවන්ගේ හිතේ හැඟීම් මත පහළ වෙලා, ඒවා නිවැරදි වූ අවස්ථා හරියට තියෙනවා. මේක මං අත්දුටු දෙයක්. ඔබේ අදහස නිවැරදියි කියල ඔප්පු කිරීමට මේ ලියමන ප්‍රබල සාක්ෂියක්. නමුත් ඔබේ සැමියා යහතින් ඉන්නවා නම්, ලියුමක් ලිවීමටත් හැකියාවක් තිබෙනවා නම්, ඇයි ඔහු ගෙදර එන්නෙ නැත්තෙ?"

"මට ඒක හිතාගන්න බෑ. ඔහු එහෙම කරාවි කියල මට විශ්වාස කරන්නවත් බෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

"එදා සඳුදා ගෙදරින් පිටවී යන්න කලින් ඔහු වැදගත් යමක් කිව්වද?"

"නැහැ."

"ස්වොන්ඩම් පටුමගේ නිවසේ ඔහු සිටිනවා දැකලා ඔබ අතිශයින්ම පුදුමයට පත්වුණා?"

"ඔව්."

"අර ඔහු ඔබට කෑගහන වෙලාවේ ජනේලය ඇරලයි තිබුණේ?"

"ඔව්."

"එහෙනම් ඔහු ඔබට එහි එන්න කියලා කැඳෙව්වා වෙන්න ඇති?"

"ඔව් එහෙම වෙන්න පුළුවනි."

"මට දැනගන්න ලැබුණු විධියට ඔහු කළේ යම් කෑගැසීමක් පමණයි. යමක් පැවසුවා නොමෙයි. එහෙම නේද?"

"ඔව්."

"ඔබට හිතුණේ ඒක උදව් ඉල්ලා කළ කෑගැසීමක් ලෙසට?"

"ඔව්. ඔහු කෑගසමින් දෑත් වැනුවා.

"නමුත් සමහර විට ඒක පුදුමයෙන් කළ කෑගැසීමක් වෙන්නත් පුළුවනි. බලාපොරොත්තු නැති විධියට හදිසියේම ඔබ පාරේ යනව දකින්න ලැබුණොම ඔහු මවිතයට පත්වෙලා, දෑත් වනමින් කෑගැසුවා විය හැකියි. එහෙම නේද?"

"ඔව්. එහෙම වීමටත් පුළුවනි."

"ඔබට හිතෙන්නේ කවුරු හරි ඔහුව පිටුපසට ඇදල ගත්තා කියලයි?"

"ඔහු නොපෙනී ගියේ එකවරම."

"ඔහුම ආපහු අහකට පැන්නා විය හැකියි. තවත් කවුරු හරි කාමරයේ ඉන්නා බවක් ඔබට දකින්න ලැබුණේ නැද්ද?"

"නැහැ. නමුත් අර විරූපී පුද්ගලයා එහි සිටි බව ඔහුම පිළිගත්තා. අනෙක ලස්කාරියා නාරප්පු පෙළ පාමුල සිට මට අවහිර කළා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. ඒක හරි. ඔබට පෙනුණු හැටියට ඔබේ සැමියා ඒ වෙලාවේ හැඳ සිටියේ සාමාන්‍ය ඇඳුම්?"

"ඔව්. නමුත් පැහැදිලිවම ඔහු ටයිපටියක් හෝ කොලරයක් පැළඳ සිටියේ නැහැ. ඔහුගේ නිරාවරණ බෙල්ල මට හොඳට පෙනුණා."

"ඔහු ස්වොන්ඩම් පටුමඟ ගැන මීට කලින් කවදා හරි ඔබ එක්ක කියල තියෙනවද?"

"කවදාවත් නැහැ."

"කවදා හරි ඔහු අබිං පානය කළ බවට ලකුණක් හෝ ඔබට දකින්න ලැබිල තියෙනවද?"

"ඒත් නැහැ. කිසි දවසක නැහැ."

"ඔබට ස්තූතියි. සෙන්ට් ක්ලෙයා නෝනා. මට හොඳින් පැහැදිලි කරගන්න උවමනා වෙලා තිබුණේ ඔන්න ඔය කාරණා කිහිපයයි. දැන් අපි කෑම ටිකක් කාල නින්දට යායුතුයි. හෙට දවස බොහොම වැඩ අධික කලබලකාරී දවසක් වෙනවා."

ඇඳන් දෙකක් සහිත විශාල සුවපහසු කාමරයක් අප වෙනුවෙන් වෙන්කොට තිබිණ. මට දැනුණු අධික විඩාව නිසා මම ඉක්මනින් ඇඳට වී පොරෝනා වලින් ආවරණය වීමි. ෂර්ලොක් හෝම්ස් මට වඩා හාත්පසින්ම වෙනස් පුද්ගලයෙකි. විසඳිය යුතු ගැටලුවක් හිසේ තිබියදී ඔහුට කිසිසේත් නින්දට යාමට නොහැක. නොවිසඳුණු ගැටලුවක් ඇතිවිට, ඔහු දින ගණනාවක් නොව සතියක් වුවත් නිදි නොලබා එය විසඳීමට උත්සාහ දරයි. කරුණු එකින් එක ගලපමින් යළි සකස් කරමින්, සෑම කෝණයකින්ම බලමින්, ගැටලුව විසඳෙන තෙක්ම තම උත්සාහය අත් නොහරියි. එසේත් නැත්නම් ගැටලුව විසඳීමට තරම් ප්‍රමාණවත් දත්ත නොමැති බව තේරුම් ගත් විට, එම උත්සාහය කල් තබයි.

එදා රාත්‍රි මගේ මිත්‍රයාගේ ඉරියව් වලින් මට පෙනී ගියේ, ඔහු සර්වරාත්‍රික කරුණු විශ්ලේෂණයකට සූදානම් වන බවයි. ඇඳේ තිබූ කොට්ට සියල්ල හා පුටුවල තිබූ කුෂන් ද එකතු කළ හෝම්ස්, ඒ සියල්ල බිම අතුරා සුවපහසු අසුනක් සාදා ගත්තේය. අනතුරුව ඔහු ඒ මත එරමිණියා ගොතාගෙන වාඩිවිය. මීළඟට දුම්කොළ අවුන්සයක් හා ගිනිපෙට්ටියක් ළඟට ගෙන, පයිප්පය

මුවේ රුවා ගත්තේය. ඉන්පසු මට දකින්නට ලැබුණේ ඔහුගේ දෑස් සිවිලිම වෙත යොමු කරගෙන සිටි ආකාරයයි. මට නින්ද යන විටත් හෝම්ස් ඒ ඉරියව්වෙන්ම වාඩිවී, පයිප්පයෙන් නිල් පැහැති දුම් වලලු පිටකරමින් සිටියේය.

උදෑසන මා අවදි වූයේ කුමන හේතුවක් නිසා දයි මට කිව නොහැක. උදා හිරු කිරණ යන්තමින් පොළෝ තලයට වැටෙන්නට පටන්ගෙන තිබිණ. මගේ මිත්‍රයා තවමත් පයිප්පය මුවේ රුවාගෙන දුම් වලලු පිටකරමින් සිටියි. කාමරයේ දුම් පිරී තිබිණ. ඔහු ඉදිරියේ තිබූ දුම්කොළ පොදිය නම් අතුරුදන් වී ගොසිනි.

"ඇහැරුණාද වොට්සන්?"

"ඔව්."

"උදේ පාන්දරින්ම වැඩකට යන්න කැමතිද?"

"සත්තකින්ම."

"එහෙනම් හැද පැළඳ ගන්න. ගෙදර කාටවත් තවම ඇහැරිලා නැහැ. ඉස්තාලයේ වැඩ කරන කොලුවා නිදාගන්න තැන මම දන්නවා. අපට ඉක්මනට අශ්වකරත්තය සූදානම් කරගන්න බැරි වෙන්නෙ නෑ."

හෝම්ස් සිටියේ ඉමහත් ප්‍රීතියෙනි. ඔහුගේ දස් බැබළුණු ආකාරයෙන් මම ඒ බව වටහා ගතිමි.

ඇඳුම් අඳිද්දී මම ඔරලෝසුව දෙස බැලුවෙමි. වේලාව හතරයි විසිපහය. ගෙදර කවුරුවත් තවමත් අවදිව නොසිටීමේ පුදුමයක් නැත. ඉස්තාලයේ කොලුවා, අශ්වයා කරත්තයට බඳිමින් සිටින බව කියමින් හෝම්ස් කාමරයට ආවේය.

"මගේ හිතේ ඇතිවුණු එක්තරා උපකල්පනයකින්, අත්හදා බැලීමක් කරන්නයි මගේ අදහස" ඔහු කීවේ පාවහන් පළඳිමිනි.

"මට හිතෙනවා වොට්සන්, ඔබ දන් ඉන්නේ යුරෝපයේ සිටින අංක එකේම මෝඩයෙක් ඉදිරිපිට. කවුරු හරි මාව චාරිංක්‍රොස් වලටම විසිවෙලා යන විදියේ පයින් පාරක් මගේ පස්සට දුන්නොත්, ඒකෙ පුදුම වෙන්න දෙයකුත් නෑ. එහෙම වුණත් මට නම් හිතෙන්නේ මේ ගැටලුව විසඳන යතුර මගේ අතේ ඇති බවයි."

"කෝ ඉතින් යතුර?" මා ඇසුවේ සිනාසෙමිනි.

http://sherlockholmestranslations.blogspot.com

"අන්න නාන කාමරේ තියෙනවා. විහිළු නොවෙයි." ඔහු කීවේ, මා ඔහුගේ වචන එතරම් විශ්වාස කළ බවක් නොපෙනුණු විටයි.

"මං මේ නාන කාමරේට ගිහිං ආව විතරයි. මං ඒක අරං ඇවිත් මගේ බෑගයට දමා ගත්තා. එහෙම නම් අපි පිටත් වෙමු මිත්‍රයා. බලමු ඒ යතුරෙන් අගුළ ඇරගන්න පුළුවන්ද කියලා."

අපි නිහඬවම පහළ තට්ටුවට බැස ගියෙමු. අශ්වයා බැඳි කුඩා කරත්තය සූදානමින් තිබිණ. අපි එයට නැගී ලන්ඩනය බලා වේගයෙන් ගමන් කළෙමු.

"එක් පැත්තකින් බැලුවාම මේක හරිම සුවිශේෂ ගැටලුවක්. මං පිළිගන්නවා මම මුලදී කටයුතු කළේ අන්ධයෙක් වගේ කියල. නමුත් පසුවෙලා හරි මොළේ පෑදෙන එක හොඳයි, හැමදාමත් මෝඩයෙක් වගේ ඉන්නෙ නැතුව."

හෝම්ස් කීවේ වේගවත් ගමනක් සඳහා අශ්වයාට කසයෙන් පහරක් දෙමිනි.

සරේ ප්‍රදේශයේ වීථි පසුකරමින් අප ගමන් කරද්දී පාන්දර තින්දෙන් මිනිසුන් අවදි වූවා පමණය. වෝටර්ලූ පාලම හා ගඟ පසුකොට අපි වෙලිංටන් වීථිය දිගේ පිම්මේ ගමන් කළෙමු. බෝ වීථියේ පොලිස් මූලස්ථානයට අප ළඟාවෙද්දී, හෝම්ස් හඳුනාගත් භටයෝ දෙදෙනෙක් ආචාර කොට අප පිළිගත්හ.

"කවුද මේ වෙලාවෙ රාජකාරියෙ?"

"පොලිස් පරීක්ෂක බ්‍රැඩ්ස්ට්‍රීට්" ඒ සමගම පොලිස් නිල ඇඳුමෙන් සැරසුණු උස නිලධරයෙක් පඩිපෙළ බැස බරාදයට පිවිසියේය.

"ආ . . . බ්‍රැඩ්ස්ට්‍රීට්, කොහොමද ඔබේ සුවදුක්? මට තියෙනවා ඔබත් එක්ක කතාකරගන්න පොඩි කාරණාවක්. දැන් පුළුවන්ද?"

"සත්තකින්ම ඔව් හෝම්ස් මහත්මයා. එන්න මගේ කාමරයට."

අපි එයට පිවිසුණෙමු.

"මොනවද ඔබට මගෙන් කෙරෙන්න ඕනැ?" පොලිස් නිලධරයා ඇසුවේ තම අසුනේ හිඳ ගනිමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මං මේ ආවේ අර නෙවිල් සෙන්ට ක්ලෙයාගේ අතුරුදන් වීම සම්බන්ධයෙන් පොලිස් අත්අඩංගුවට ගැනුණු බූන් - අර හිගන්නා ගැන කාරණයක් දැනගන්න."

"ඔව්. ඔහුව මෙහාට ගෙනාවා. වැඩිදුර ප්‍රශ්න කිරීම සඳහා අපි ඔහුව රක්ෂිත බන්ධනාගාරයේ රඳවා ගෙනයි ඉන්නෙ."

"ඔව්. ඒ බව මට අහන්න ලැබුණා. හොඳ, කොහේද ඔහු ඉන්නෙ?"

"කුඩුවේ."

"ඔහු මොකුත් කලබල එහෙම කරනවද?"

"නෑ. බොහොම නිශ්ශබ්දයි. ඒ වුණාට ඌ මහා අපිරිසිදු තක්කඩියෙක්."

"අපිරිසිදු?"

"ඔව්. ඌ අපට ඉඩ දෙන්නේ, උගේ අත්දෙක හෝදන්න විතරයි. කම්මල්කාරයෙකුගේ වගේ මුහුණ තාර කළුයි. නඩුව ඉවර වෙලා හිරේට නියම වුණාට පස්සෙ නම් මිනිහට නිතර නිතර නාන්න සිදුවේවි. ඔහුව දුටුවොත් ඔබට පෙනේවි ඔහුට අවශ්‍ය මොනවද කියල."

"ඔහුව දකින්න මං බොහොම කැමැතියි."

"හැබෑට? ඒක බොහොම පහසුවෙන් කරන්න පුළුවනි. ඔබේ බෑගය මෙහි දමා, එන්න මේ පැත්තෙන්."

"නෑ. මං බෑග් එකත් අරගෙන එන්නම්."

"ආ . . . කමක් නෑ. මේ පැත්තෙන් එන්න."

අප දිගු බරාඳයක් මැදින් කැඳවාගෙන ගිය බ්‍රැඩ්ස්ට්‍රීට්, යතුරු දමා තිබූ දොරක් විවෘත කළේය. ඉන්පසු රවුමට තිබූ තරප්පු පේළියක් දිගේ පහළට බසින්නට පටන් ගත්තේය. එතැනින් අප පිවිසුණේ බිත්ති වල හුනුහුණු ආලේප කර තිබූ කොරිඩෝවකටයි.

"මිනිහ ඉන්නේ දකුණු පැත්තේ තිබෙන තුන්වැනි කාමරයේ." පැවසූ නිලධාරියා දොරේ ඉහළ කොටසේ වූ තල්ලු කළ හැකි පියනක් ඉවත්කොට අප්ට සිරමැදිරිය ඇතුළත පෙන්වීය.

"මේ ඉන්නේ එකා. හොඳටම නිදි."

http://sherlockholmesinvestigations.blogspot.com

එම කවුළුවට මුහුණ යොමා අපි දෙදෙනා සිරකුටුව ඇතුළට නෙත් යොමු කළෙමු. සිරකරුවා නිදා සිටියේ අප සිටි දෙසට මුහුණ හරවාගෙනයි. ගැඹුරු නින්දකට වැටී සිටි ඔහු තදින් හුස්ම ඉහළ පහළ ගත්තේය. ඔහු මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් තිබූ අයෙකි. ඉරුණු කබායේ කඩතොළු වලින් තද පැහැති කමිසය එළියට පැන තිබිණි. නිලධරයා පැවසූ අයුරින්ම හිඟන්නා වෙතින් දිස්වූයේ අතිශයින්ම අපිරිසිදු බවකි. එහෙත් ඔහුගේ මුහුණේ තිබූ අප්‍රසන්න විරූපී භාවය, මුහුණ වසා තිබුණු අපද්‍රව්‍ය වලින් ආවරණය වූයේ නැත. එක් ඇසක සිට නිකට දක්වා කලකට පෙර ඇතිවූ කැපුම් තුවාලයක විශාල කැළලක් මුහුණේ පැත්තක් පුරා පිහිටා තිබිණි. එම තුවාලය සුවවීමේදී පිළියකර පටක හැකිළීයාම නිසා, උඩුතොල ඉහළට ඇදී ගොස් හොපිට්ට පෙරළී තිබුණේ අතිශය විරූපී බවක් ගෙනදෙමිනි. එයින් කටේ පැත්තක් විවෘත වී දත් තුනක් එළියට දිස්වීමෙන් "නිරතුරු විරිත්තීමක්" මුහුණේ ප්‍රදර්ශනය විය. ඔහුගේ දෑස් හා නළලේ පැත්තක් ආවරණය වන සේ රතු පැහැති හිසකෙස් වැටී තිබූ අයුරු ද අපි දුටුවෙමු.

"ඔහු බොහොම ලක්ෂණයි. එහෙම නේද?" බ්‍රැඩ්ස්ට්‍රීට් ඇසීය.

"ඇත්තෙන්ම ඔව්. මිනිහගේ මුහුණ සේදීමක් අවශ්‍යමයි" හෝම්ස් කීය. "මං දැනගත්තා මුහුණ සේදීමකට ඔහු කැමතිවේවි කියල. ඒ නිසා මෙහේ එද්දි මං උවමනා දේවලුත් අරගෙනමයි ආවේ" යයි පවසමින් හෝම්ස් තම බෑගය විවෘත කළේය. මා පුදුමයට පත්කරමින් ඔහු එයින් එළියට ගත්තේ විශාල මුදු හත්තක් හෙවත් ස්පොන්ජයකි.

"හේ! හේ! ඔබ හරිම විහිළුකාරයෙක් නේ." බ්‍රැඩ්ස්ට්‍රීට් කීවේ සිනාසෙමිනි.

"මිත්‍රයා. දැන් මේ දොර කරුණාකරලා ශබ්දයක් නොනැගෙන අයුරින් විවෘත කරන්න. ඔහුට බොහොම වැදගත් පෙනුමක් ඉක්මනින්ම ලබාදෙන්න අපට හැකිවේවි."

"ඔව් ඒක හරි. මේ විදියේ පෙනුමකින් ඉන්න එකා බෝ වීථියේ පොලිස්කුටු වලටත් අවනම්බුවක්." නිලධරයා දොර විවෘත කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

අපි නිහඬවම සිර මැදිරියට ඇතුළුවූයෙමු. පැත්තකට හැරුණු සිරකරුවා යළිත් වරක් නිදන්නට විය. වතුර ජෝගුව වෙත ගිය හෝම්ස් මුදු හන්ත එයින් තෙමාගෙන සිරකරුවාගේ මුහුණ හරහා එය තදින් ඇතිල්ලුවේය.

"මහත්වරුනි. මෙන්න මං ඔබට හඳුන්වා දෙන්නම්. කෙන්ට් ප්‍රාන්තයේ ලී නගරයේ නෙවිල් සෙන්ට් ක්ලෙයා මහත්මයා!"

මගේ ජීවිතයටම මා එවැනි දර්ශනයක් දක නැත. තෙත් කළ ස්පොන්ජය සමඟ හිඟන්නාගේ මුහුණේ මතුපිට තට්ටුව ගැළවී ගියේ ගසක පොත්තක් ගැළවී යන ආකාරයටයි. මුහුණ වසාගෙන තිබූ තද දුඹුරු පැහැති තට්ටුව අතුරුදන් විය. මුහුණේ පැත්තක් වසාගෙන තිබූ අප්‍රසන්න තුවාල කැළල ද මැකී ගියේය. තොපිටට පෙරළී මුහුණට ඉතා විකාර පෙනුමක් ගෙන දුන් තොල හරි පිටට පෙරළීමත් සමඟම අවලක්ෂණ භාවය ද තුරන්විය! එක්වරක් තදින් ඇදීමත් සමඟම තැඹිලි රතු පැහැති කොණ්ඩය ගැළවී ගියේය. විමතියෙන් මෙන් තමාගේ ඇඳේ වාඩිගත්තේ, කළු පැහැති හිසකෙස් හා සුදුමැලි මුහුණක් මෙන්ම වැදගත් පෙනුමක් ද තිබූ මහත්මයෙකි. නිදිබර දෑස් දෑතින් පිරිමදිමින් ඔහු අවදි විය. තමා පත්ව සිටි තත්ත්වය එක් ක්ෂණයකින් වටහාගත් ඔහු කෑගසමින් මුහුණ කොට්ටයේ සඟවා ගත්තේය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ! මේ අතුරුදන්වුණු මනුස්සයා තමයි හොඳටම. මං ඔහුගේ ඡායාරූපය දුටු නිසා මට පුළුවනි, ඔහුව හඳුනාගන්න." බ්‍රැඩ්ස්ට්‍රීට් කීය.

"ඔව් ඒක එහෙම වුණාවේ. දන් මොකක්ද මට විරුද්ධව ඇති චෝදනාව?" සිරකරුවා ඇසුවේ නොසැලකිලිමත් අයුරෙනි.

"නෙවිල් සෙන්ට් ක්ලෙයා මහත්තයාව අතුරුදන් කිරීමේ . . . ආ ඒ චෝදනාව ඔබට විරුද්ධව එල්ල කරන්නෙ කොහොමද, ඔබ දිවිහානි කරගැනීමට තැත්කළොත් මිස? මං අවුරුදු විසිහතක් පොලිස් සේවයේ රාජකාරි කරල තියෙනවා. මං දකල තියෙන අප්‍රමාණ සිද්ධීන් අතරින් විශිෂ්ටම එක මේකයි මහත්මයා." පොලිස් නිලධරයා කීවේ සිනාසෙමිනි.

"මම නෙවිල් සෙන්ට් ක්ලෙයා නම්, පැහැදිලි ලෙසම මෙතැන අපරාධයක් සිදුවෙලා නැහැ. ඒ නිසා මාව මෙහි රඳවාගෙන සිටීම නීතිවිරෝධියි. http://sherlockholmesinvestigations.blogspot.com

"අපරාධයක් නම් සිදුවෙලා නැහැ තමා. නමුත් ඔබ විශාල වැරැද්දක් කරලා තියෙනවා. ඔබේ බිරිඳගේ ආත්ම ගෞරවය ගැන නොසලකා මෙවැනි දෙයක් කිරීමෙන් ලැජ්ජාවට පත්වෙන්නේ ඇයයි"

"බිරිඳ නෙමෙයි මගේ දරුවෝ!" සිරකරුවාට කෙඳිරිගැව්ණි. "දෙවියන් වහන්සේ මට පිහිට වෙන සේක්වා. මවුන්ගේ පියා ගැන ඔවුනට ලැජ්ජා වෙන්න සිදුවෙන එක මං කොහොමද ඉවසන්නේ? දෙවියනේ! මොන තරම් ලැජ්ජාවක්ද? මං මේකට මොකද කරන්නෙ?"

ඔහු අසලින්ම ඇඳේ හිඳගත් හෝම්ස් කරුණාවන්ත අයුරින් සෙන්ට් ක්ලෙයාගේ පිටට තට්ටු කළේය.

"මේක උසාවියට ඉදිරිපත් වෙන්න ඉඩහැරියොත්, කරුණු රටපුරා ප්‍රසිද්ධ වෙන එක වළක්වන්න බෑ. නමුත් අනෙක් අතට ඔබට විරුද්ධව චෝදනා එල්ල කළ හැකි වරදක් ඔබ කර නොමැති බවට පොලීසියට ඒත්තු ගන්වන්න. එහෙම වුණොත් මේ විස්තර පුවත්පත් වලට යාවි කියල මං හිතන්නෙ නෑ. බ්‍රැඩ්ස්ට්‍රීට් මහත්මයා ඔබ කියන කරුණු සටහන් කරගෙන, ඒවා පොලිස් ප්‍රධානීන්ට ඉදිරිපත් කරාවි. එහෙම වුණොත් මේ චෝදනා, හිරභාරයට ගැනීම්, උසාවිය දක්වා ගෙනයන්න උවමනා වෙන්නෙ නෑ."

"ඔබට දෙවියන්ගේ ආශිර්වාද ලැබේවි මහත්මයා! මේ රහස එළිවෙලා මගේ පවුලට මගේ දරුවන්ට අවමානයක් වෙනවාට වඩා, මං කැමතියි හිරේ යන්න, නැත්නම් එල්ලුම් ගස් යන්න.

මගේ මේ කථාන්තරයට සවන්දෙන මුල්ම අය තමා ඔබ කිහිපදෙනා. මගේ තාත්තා චෙස්ටර්ෆීල්ඩ්හි පාසල් ගුරුවරයෙක්. මමත් එහිදී හොඳ ඉහළ අධ්‍යාපනයක් ලබාගත්තා. මං මුලින්ම දේශ සංචාරයේ යෙදුණා. ඊට පසුව වේදිකා නළුවෙක් ලෙස කාලයක් රංගන වෘත්තියේ යෙදුණා. ඊටත් පස්සේ ලන්ඩනයේ සවස පුවත්පතක වාර්තාකාරයෙක් ලෙස සේවයට බැඳුණා. එක දවසක් මගේ පුවත්පතේ කර්තෘට උවමනා වුණා, ලන්ඩනයේ යාචකයන් ගැන ලිපි පෙළක් පුවත්පතේ පළ කරන්න. ඒ ලිපි සකසන්න මං කොහොම කැමැත්තෙන් ඉදිරිපත් වුණා.

මගේ මේ වැඩකටයුතු පටන් ගැනුණේ එතැනින්. මගේ ලිපිවලට අවශ්‍ය කරුණු සොයාගන්න, මට හිතන්නෙක් ලෙස හිඟාකෑමේ යෙදෙන්න සිද්ධ වුණා. මං වේදිකා නළුවෙක් හැටියට සිටිද්දී වෙස්

http://sherlockholmesinvestigations.blogspot.com

ගැන්වීමේ රහස් හොඳ හැටි ඉගෙන ගත්තා. ඒ වගේම වෙස් ගැන්වීමේ ශිල්පයට මා දැක්වූ දක්ෂකම් නිසා අනෙක් අය අතර ප්‍රසිද්ධියටත් පත්වුණා. මගේ ඒ හපන්කම් වලින් ප්‍රයෝජන ගන්න මං තීරණය කළා. මගේ මුහුණ පාට කරගෙන, මහ යන එන මිනිස්සුන්ගේ සිත්වල අනුකම්පාව උපදින විධියට තුවාල කැළලක් වෙනමම සාදා එය මුහුණේ අලවාගෙන, ඇලවෙන පැලැස්තර කැබැල්ලක් තොලේ අලවා එය තොපිට්ට පෙරළා ඇලවීමෙන් මං අවශ්‍ය පෙනුම ලබාගත්තා. රෑළහව රතුපාට බොරු කොණ්ඩයක් හා ඉරුණු ඇඳුම් පැළඳුම් වලින් වෙස්වලාගැනීම සම්පූර්ණ වුණා. නගරයේ ව්‍යාපාරික කටයුතු සිදුවෙන ප්‍රදේශයේ මං හිඟාකෑම කළා. එදා දවසෙ මං හිඟාකෑමෙ යෙදුණ පැය 7ක කාලයක්. හිඟාකාල උපයාගත් මුදල හැන්දෑවෙ ගෙදර ඇවිත් ගණන් බැලුවා. සිලිං 26යි. පැන්ස 4ක් ලැබී තිබුණු බව දකලා මං පුදුමයට පත්වුණා.

මේ විධියට හිඟාකෑමේ යෙදිලා මගේ කර්තෘට අවශ්‍ය ලිපි පෙළ මං සම්පාදනය කළා. ඊට පස්සේ ඒ හිඟාකෑම අමතක කර දැම්මා. ටික කාලයකට පස්සේ, මගේ මිත්‍රයෙකු බැංකුවෙන් ලබාගත් ණයක ඇපකාරයෙක් වීම නිසා, මට පවුම් විසිපහක මුදලක් වහාම ගෙවන්න නියම වුණා. මහ හදිසියට මේ තරම් විශාල මුදලක් කොහොම හොයන්නද? කළයුතු දෙයක් හිතාගන්න බැරුව මම මහා අසරණ තත්ත්වයට පත්වුණා. නමුත් මට එක්වරම අදහසක් ආවා. මං ණය ගෙවීමට ණය හිමියන්ගෙන් දෙසතියකට කල් ඉල්ලා ගත්තා. ඊට පස්සේ රැකියාව කරන තැනින් නිවාඩු ලබාගෙන, වෙස්වලාගෙන, දවස පුරාම ලන්ඩන් නගරයේ හිඟාකෑමේ යෙදුණා. දින දහයකින් මට හැකිවුණා අවශ්‍ය මුදල හොයාගන්න.

පත්තර කන්තෝරුවේ උදේ ඉඳන් රෑ වෙනකම් බොහොම වෙහෙස මහන්සි වෙවී රැකියාවේ යෙදීමෙන් මට සතියකට ලැබුණේ පවුම් දෙකයි. නමුත් සායම් ටිකක් මුහුණේ තවරාගෙන නිකං වාඩිවෙලා ඉඳීමෙන් මට ඒ පවුම් දෙකේ මුදල එක දවසෙන් හොයා ගැනීමට හැකිවුණා. ඉතින් මේ කාරණය දන දනම මං කොහොමද පත්තර කන්තෝරුවේ රැකියාව කරන්න හිත හදාගන්නේ? ඔබට හිතාගන්න පුළුවන් නේද මහත්මයා මගේ සිතේ ඇතිවූ ප්‍රශ්නය. මගේ ගැටලුව වුණේ ආත්ම ගෞරවය රැකගෙන දුප්පත්ව සිටිය

යුතුද? එහෙමත් නැත්නම් ආත්ම ගෞරවය ගැන අමතක කර දමලා ධනවතෙකු විය නොයුතුද? අන්තිමට මුදල් ජයගත්තා. මගේ රැකියාවෙන් අස්වෙලා මං දිනපතාම හිඟාකන්න පටන් ගත්තා. නගරයේ පුරුදු තැනක වාඩිවෙලා අවලක්ෂණ, එහෙත් අනුකම්පා හිතෙන මුහුණක් මහජනයාට පෙන්වලා යදින්න පටන් ගත්තා. මගේ සාක්කු මාරු කාසිවලින් පිරුණා. මගේ රහස දන සිටියේ එකම මිනිහයි. ඒ තමයි ස්වොන්ඩම් පවුමගේ අබිං ගුහාව අයිතිකරුවා. මං උදේට එතැනට ගිහිං හිඟන්නෙක් ලෙස වෙස් මාරු කරගෙන රැකියාව කරලා, හැන්දෑවට හොඳින් හැද පැළඳ ගෙන මහත්මයෙක් වගේ ගෙදර ගියා. මේ රහස ආරක්ෂා කරනවාටත්, කාමරයටත් මං ලස්කාරියාට හොඳින් මුදල් ගෙව්වා. ඒ නිසා ඔහු මගේ රහස හොඳින් ආරක්ෂා කරන බවට මට විශ්වාසය තැබිය හැකි වුණා.

මෙහෙම දිනපතාම හිඟාකෑමෙන් මම විශාල මුදලක් උපයාගත්තා. සෑහෙන මුදලක් මා ළඟ ඉතිරි වී ඇති බව මට පෙනී ගියා. මං කියන්නේ නෑ ලන්ඩන් නගරයේ පාරෙ හිඟාකන හැම හිඟන්නෙකුටම අවුරුද්දකට පවුම් 700ක් උපයාගත හැකි කියල. නමුත් මං සාමාන්‍යයෙන් ඉපයූ මුදල ඊටත් විකක් වැඩියි. වෙස්ගැන්වීමට මා සතුව තිබූ දනුමෙන් මෙහිදී මට විශේෂ ප්‍රයෝජනයක් අත්වුණා. මට පැන්සෙ කාසි දවස පුරාම ලැබුණේ වතුර ගලන්න වගේ. අතරින් පතර රිදී කාසිත් ලැබුණා. මට පවුම් දෙකක් වත් නොලැබී ගියේ එහෙමත් දවසක තමයි.

මගේ වත්කම වැඩිවෙද්දී දියුණුවක් ලබන්න තිබුණු ආසාවත් වැඩිවුණා. මං ගම්බදට වෙන්න ගෙයක් මිලට ගත්තා. ඊට පස්සෙ කසාදයකුත් බැන්දා. නමුත් ඇත්ත වශයෙන්ම මා කළ රැකියාව මොකක්ද කියලා කිසිකෙනෙක් දන හිටියේ නැහැ. මගේ ආදරණීය බිරිඳ හිතාගෙන හිටියේ ලන්ඩන් නගරයේ මං වෙළඳ ව්‍යාපාරයක යෙදෙනවා කියලයි. නමුත් ඒ ව්‍යාපාරය මොකක්ද කියලා ඇය දන හිටියෙත් නැහැ.

පහුගිය සඳුදා හවස් වෙනකොට මගේ වැඩ රාජකාරි අවසන් කරලා, ගෙදර ඒම සඳහා අබිං ගුහාවේ උඩ තට්ටුවේ මම ඇඳුම් මාරු කරමින් හිටියා. ජනේලයෙන් එළිය බැලුවාම දකින්න ලැබුණු දෙයින් මං තිගැස්සීමටත්, මවිතයටත් පත්වුණා. මගේ බිරිඳ මහ

පාරේ හිටගෙන හිටියා. ඇය හිටියේ මං දිහා බලාගෙන. පුදුමයට පත්වුණු මට එක්වරම කැගැහුණා. මගේ දෑත් වලින් මං මුහුණ වසාගත්තා. ඉක්මනට මගේ හිතමිත්‍ර ලස්කාරියා වෙත දුවගිහින් ඔහුට කිව්වා කිසි කෙනෙකුට ඉහළ තට්ටුවට එන්න ඉඩදෙන්න එපා කියල. මගේ බිරිඳගේ කට හඬ මට ඇහුණා. පහළ තට්ටුව දෙසින්. නමුත් ඇයට ඉක්මනින් ඉහළට එන්න ඉඩ නො ලැබෙන බව මං දන හිටියා. ඉක්මනට මගේ ඇඳුම් ගළවා ඉවත්කරලා හිඟන ඇඳුම් ඇඳගත්තා. මුහුණේ සායම් තවරාගෙන බොරු කොණ්ඩෙත් දමාගත්තා. මං කොයිතරම් දක්ෂ ලෙස වෙස්මාරු කරගෙන හිටියාද කිවහොත් මගේ බිරිඳටවත් මාව හඳුනාගන්න බැරිවුණා. මට ඊළඟට මතක් වුණා කවුරු හරි කාමරය සෝදිසි කළොත් මගේ ඇඳුම් අහුවෙන බව. මං ඉක්මනට ජනේලය විවෘත කළා. එහෙම කරන්න ගිහිං එදා උදේ මගේ අතේ සිදුවුණු තුවාලයත් පෑරුණා. මගේ බෑගයේ දමා තිබූ මාරු කාසි අරගෙන ඉක්මනට මගේ කබායේ සාක්කු පුරවලා, ඒක ජනේලයෙන් වතුරට විසි කළා. එය තේම්ස් ගඟෙන් ගැඹුරු වඩදියේ නොපෙනී ගියා. මගේ අනික් ඇඳුම් ටිකටත් මං කරන්න බලාපොරොත්තු වුණේ එයයි. නමුත් ඊට පෙර පොලිස් නිලධරයන් කිහිප දෙනෙක් තරප්පුවේ උඩට නැග්ගා. ඊළඟට මාව නෙවිල් සෙන්ට් ක්ලෙයා කියා හඳුනා ගන්නවා වෙනුවට ඔහුව මරා දැමූ මිනීමරුවා කියල අත්අඩංගුවට ගත්තා.

මට තවත් තේරුම් කර දෙන්න දෙයක් ඇති කියල මං හිතන්නේ නෑ. මගේ වෙස්මාරු කරගැනීම හැකිතරම් කාලයක් සඟවා ගෙන සිටීමයි මගේ අරමුණ වුණේ. මේ සිද්ධියෙන් මගේ බිරිඳ ලොකු කණගාටුවකටත් කැළඹීමකටත් පත්වේවි කියල මට හිතුණා. ඉතින් පොලිස් භටයන් බලාගෙන නොසිටි වෙලාවේ ඇයට භයවෙන්න දෙයක් නැහැ කියල පොඩි ලියුම් කෑල්ලක් ලිව්වා. මගේ මුද්ද ගලවලා ඒකත් සමඟ ලියුම ලස්කාරියට දුන්නා තැපැල් කරන්න."

"ඒ ලියුම ඇයට ලැබුණේ ඊයෙ උදේ" හෝම්ස් කීය.

"දෙයියනේ! පහුගිය සතියම ඇයට මොන තරම් වේදනාකාරී එකක් වෙන්න ඇත්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ ලස්කාරියා ගැන පොලීසිය හොඳ සෝදිසියකින් හිටියේ." බ්‍රැඩ්ස්ට්‍රීට් කිය.

"අපට නොපෙනී ලියුම තැපැල් කරන්න. යන වැඩේ ඔහුට අපහසු වෙන්න ඇති. ඒ නිසා ලියුම තැපැල් කිරීම, අබිං ගුහාවට යන එන නාවික ගනුදෙනු කාරයෙකුට දෙන්න ඇති. ඒ මිනිහට ඒක දින කීපයක් අමතක වෙන්න ඇති."

"අන්න එහෙම තමා වෙන්න ඇත්තෙ. ඔබ හිතාකන එකට පොලීසියෙන් අල්ලාගෙන නැද්ද?" හෝම්ස් ඇසීය.

"පැහෙන්න අනුවෙලා තියෙනවා. නමුත් දඩයක් කියන එක මට පුළු දෙයක්."

"කොහොම වුණත් හිතාකැම නම් මෙතැනින් නැවැත්විය යුතුයි. මේ කාරණය යටගැසීමක් ඔබ පොලීසියෙන් අපේක්ෂා කරනවා නම් මීට පස්සේ හියු බූන් කෙනෙක් හිටින්න බෑ."

"මිනිහෙකුට දිවුරන්න පුළුවන් අන්තිම ඉහළම විධියෙන් දිවුරා මං ඒ බවට පොරොන්දු වෙනවා."

"ඉතින් හෝම්ස් මහත්තයා මේ ප්‍රශ්නය විසඳාදීම ගැන මං ඔබට අතිශයින්ම කෘතඥ වෙනවා. ඔබ මේ ප්‍රතිඵලය ලබාගත්තේ කොහොමද කියලා දනගන්න මං කැමතියි."

"මේ ගැටලුව විසඳීමට මං අමතවුණේ කොට්ට පහක් උඩ වාඩිවෙලා, දුම්කොළ අවුන්සයක් පයිප්පයට දමා ඉරීමෙන්. මට හිතෙන්නේ වොට්සන් අපි බේකර් වීථියට ගියොත් උදේ කෑමට යන්නමට වෙලා ඇතුව යාගන්න පුළුවන් වේවි."



http://sherlockholmesinvestigations.blogspot.com

# දෙවැනි ලේ පැල්ලම

Reading Purpose Only, Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# දෙවැනි ලේ පැල්ලම

මගේ හිතමිත්‍ර ෂර්ලොක් හෝම්ස් මහතා කළ අභිරහස් පරීක්ෂණ රාශියක්ම මම ඔබට ඉදිරිපත් කර ඇත්තෙමි. එයින් ඇබේ ග්‍රේන්ජ් මන්දිරය හා බැඳුණු, ගල් ආලමේ ඛේද වාචකය ඔබට මතක ඇතුවා නිසැකය. මගේ මිත්‍රයාගේ පරීක්ෂණ වාර්තා ඔබ වෙත ඉදිරිපත් කිරීම එතැනින් අවසන් කිරීමට මම අදහස් කරගෙන සිටියෙමි. මා එවැනි තීරණයක් ගැනීමට හේතුව, හෝම්ස්ගේ සිත්ගන්නා පරීක්ෂණ පිළිබඳ සටහන් මා සතුව නොමැතිවීම නොවේ. මා ඔබට තවමත් නමින් වත් සඳහන් නොකළ ඔහුගේ පරීක්ෂණ සියගණනක විස්තර මා ළඟ සුරැකිව ඇත. මා එවැනි තීරණයක් ගැනීමට හේතුව, මගේ පාඨකයන්ගෙන් සතුටුදායක ප්‍රතිචාරයක් නොලැබීම ද නොවේ. මේ සුවිශේෂ අපරාධ පරීක්ෂකයා අද්විතීය ක්‍රම මගින් කළ විශිෂ්ට පරීක්ෂණ කියවීමට පාඨකයෝ තවමත් දැඩි ආශාවක් දක්වති.

මා එසේ තීරණය කිරීමට එකම හේතුව ඔහුගේ පරීක්ෂණ පිළිබඳ තොරතුරු දිගින් දිගටම ප්‍රසිද්ධියට පත්කරනවාට හෝම්ස් දක්වන අකමැත්තයි. ඔහු ලන්ඩනයට වී අපරාධ පරීක්ෂණ වෘත්තියේ යෙදෙද්දී නම්, මේ කථා ප්‍රසිද්ධ කිරීමෙන් ඔහුට යම් ප්‍රයෝජනයක් අත්වීමට ඉඩ තිබිණි. නමුත් දැන් හෝම්ස් ලන්ඩන් නගරයෙන් ඉවත්වී සසෙක්ස් ප්‍රාන්තයේ පිටිසර ගම්මානයක පදිංචියට ගොස් සිටී. ඔහු විනෝදාංශයක් ලෙස මීමැසි ගොවිපොළක් පවත්වාගෙන යන අතර ඉතිරි වෙලාව පොත්පත් කියවීම සඳහා ගතකරයි. හෝම්ස් අන් අයගේ අවධානයට ලක්වීමටත්, ප්‍රසිද්ධියටත් දැන් දැඩි අකමැත්තක් දක්වයි. මෙම හේතුව නිසා ඔහුගේ උපදෙස් අකුරටම පිළිපැදිය යුතු බව මගේ මිත්‍රයාගේ මතය විය.

හෝම්ස්ට භාරවුණු ජාත්‍යන්තර වශයෙන් ඉතාම වැදගත් වූ සුවිශේෂම ගැටලුව මහජනයා වෙත ඉදිරිපත් කිරීමට එකල මට


http://sherlockholmesinvestigations.blogspot.com

අවස්ථාවක් නොලැබිණි. දැන් ඒ සඳහා කාලය පැමිණ ඇති බව මම ඔහුට මතක් කර දුනිමි. මගේ බලවත් ඉල්ලීම නිසා ඔහු එය ප්‍රසිද්ධ කිරීමට දැන් මට අවසර දී ඇත. එහෙත් රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා සමහර නම් ගම් හා කාල වකවානු මා හෙළි නොකරන බව පාඨකයා තේරුම් ගත යුතුය.

දශකය හා අවුරුද්ද කුමක්දැයි මා හෙළි නොකරන කාලයක අඟහරුවාදා දිනෙක උදෑසනකි. එක්තරා මහත්වරු දෙදෙනෙක් බේකර් වීථියේ අපේ නිවහන වෙත පැමිණ සිටියහ. යුරෝපය පුරා අතිමහත් කීර්තියට පත් මේ දෙදෙනාගෙන් එක් අයෙක්, දෙවරක්ම එංගලන්තයේ අගමැති තනතුරට පත්වූ බෙලිංගර් සාමිවරයාය. අනෙකා තවමත් මැදිවියට වත් නොපැමිණි, කඩවසම් සිරුරක් තිබූ බුද්ධිමතෙකි. ඔහු, යුරෝපීය කටයුතු පිළිබඳ ලේකම් ධුරය දරූ අතිගරු ට්‍රිලෝනි හෝප් මහතා ය. රාජ්‍යතන්ත්‍රයේ ඉහළටම ඉක්මනින් නැඟී ආ ඔහු, රටේ වඩාත්ම ජනප්‍රිය පුද්ගලයා ද වූ බව ප්‍රකට කරුණක් විය.

පුවත්පත් විසුරුවා තිබූ අපේ සෝෆාවේ එක ළඟ වාඩිවී සිටි මේ දෙදෙනාගේ මුහුණුවල, අතිශයින්ම කැලැඹීමට හා කම්පාවට පත් ලකුණු දිස්විය. එබැවින් ඔවුන් මෙහි පැමිණෙන්නට ඇත්තේ මහත් බැරෑරුම් ගැටලුවක් සම්බන්ධයෙන් බව මම සිතාගත්තෙමි. අගමැතිතුමා ඔහුගේ නිල් පැහැති නහර ඉලිප්පී තිබුණු අතින්, තම කුඩේ මිට තදින් අල්ලාගෙන හෝම්ස් හා මගේ මුහුණු දිහා මාරුවෙන් මාරුවට බැලූමි හෙළුවේය. අතිශය කැලැඹීමට පත්ව සිටි යුරෝපා කටයුතු ලේකම්තුමා සිටියේ තම උඩුරැවුලේ රැවුළු ගස් වලින් අදිමිනි.

"හෝම්ස් මහත්මයා. ඒක නැතිවී ඇති බව මං දැනගත්තේ අද උදේ අටට. මං ඒ වෙලාවේම අගමැතිතුමාට දැනුම් දුන්නා. එතුමාගේ යෝජනාව අනුවයි අපි දෙන්නා වහාම ආවේ ඔබව හමුවෙන්න."

"ඔබ පොලීසියටත් දැනුම් දුන්නද?"

"නැහැ මහත්මයා." අගමැතිතුමා පිළිතුරු දුන්නේය. "අපි පොලීසියට කිව්වෙත් නැහැ. එහෙම කියන්න විධියකුත් නැහැ. මේක පොලීසියට දැනුම් දෙනවා කියන්නේ ටික දවසකින් මහජනයාට

http://sherlockholmesinvestigations.blogspot.com



169. . . . . ලේකම්තුමා සිටියේ තම උඩුරැවුලේ රැවුල් ගස් වලින් අදිමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

දනුම් දීමක්. මේක මහජනයාගෙන් හංගාගෙන තබාගැනීම, අපට අත්‍යාවශ්‍යම දෙයක්."

"ඒ මොකක් නිසාද මහත්මයා?"

"මොකක් නිසාද කිව්වොත්, මේ ලියවිල්ලේ තිබෙන දේ එළිවුණොත්, මේ රටේ විතරක් නෙමෙයි, මුළු යුරෝපා මහාද්වීපය පුරාම මහා කලබලයක් ඇතිවේවි. ඒකෙන් සමහර විට දන් තිබෙන සාමය ඉවරවෙලා යුද්ධයක් පටන් ගන්නත් පුළුවන්. නැතිවුණු ලියවිල්ල හොයාගන්න වැඩේ කළ යුත්තේ අතිශයින්ම රහසිගතව. එහෙම බැරි නම් ඒක කවදාවත් හොයා නොගත්තත් කමක් නැහැ. මේක හොරකම් කරගත් අය අරමුණු කරගෙන ඇත්තේ, ඒ ලියවිල්ලේ අඩංගු දේ ප්‍රසිද්ධියට පත්කරන්න."

"මට තේරෙනවා. හොඳයි ට්‍රිලෝනි හෝප් මහත්මයා. දන් මට කියන්න ලියවිල්ල නැතිවුණේ කොහොමද කියලා."

"ඒක මට වචන කිහිපයකින් කියන්න පුළුවන් හෝම්ස් මහත්මයා. මේක ලියුමක් - විදේශයක රාජ්‍ය නායකයෙක් අපට එවූ ලියුමක්. ඒක අපට ලැබුණේ දවස් හයකට කලින්. ඒක කොයිතරම් වැදගත්, වටිනා ලියවිල්ලක්ද කිව්වොත්, මං කොයි වෙලාවකවත්, ඒය මගේ කාර්යාලයේ තිබෙන යකඩ සේප්පුවේ දමලා ගෙදර ගියේ නැහැ. හැමදාම හැන්දෑවට ගෙදර යනකොට, වයිට්හෝල් ටෙරසයේ තිබෙන මගේ ගෙදරට ගෙනගියා. ගෙදර ගෙනිහිං, මගේ නිදන කාමරයේ තිබෙන වැදගත් ලියවිලි තබන යකඩ පෙට්ටියේ දමලා, යතුරු අමලයි තිබුණේ. ඊයේ රාත්‍රිත් ඒක යකඩ පෙට්ටියේ තිබුණා. මට ඒ ගැන හොඳටම විශ්වාසයි. රෑ කෑම සඳහා යන්න හැඳපැළඳ ගනිද්දී මං ඇත්තටම යකඩ පෙට්ටිය ඇරලා බැලුවා. එතකොට ඒ ලියුම තිබුණු බව මං හොඳටම දක්කා. අද උදේ බලනකොට ඒක නැහැ. මේ පෙට්ටිය මුළු රාත්‍රිය පුරාම තිබුණේ, මගේ කාමරය තුළ ඇති කණ්ණාඩි මේසයේ වීදුරු තට්ටුව මත. මං ඒ තරම් තදින් නින්ද යන කෙනෙක් නෙමෙයි. මගේ බිරිඳත් එහෙමයි. කිසිම කෙනෙක් ඊයෙ රෑ අපේ නිදන කාමරේට ඇතුළු වුණේ නැහැ, ඒ ගැන අපි දිවුරන්න සූදානම්. ඒ වුණත් ලියුම අතුරුදන් වෙලා."

"ඔබ රෑ කෑම සඳහා ගියේ කීයටද?"

http://sherlockholmesinvestigations2.blogspot.com

"රෑ හතහමාරට."

"ඔබ නිදාගන්න යනවිට වෙලාව කීයද?"

"රෑ කෑමෙන් පස්සෙ මගේ බිරිඳ නාට්‍යයක් නරඹන්න නාට්‍යශාලාවට ගියා. මං ඇය එනතුරු බලාගෙන හිටියා. අපි නිදන කාමරයට යද්දි රෑ එකොළහමාරයි."

"ඒ කියන්නේ පැය හතරක කාලයක් යකඩ පෙට්ටිය ඔබේ කාමරයේ අනාරක්ෂිතව තිබුණා?"

"අපේ නිදන කාමරයට ඇතුළුවෙන්න අවසර තියෙන්නේ තුන්දෙනෙකුට විතරයි. ඒකත් සීමිත අවස්ථා කිහිපයකදී පමණයි. හැමදාම උදේට ගෘහසේවිකාව අපේ කාමරයට එනවා. දවසේ අනෙක් වෙලාවට මගේ බිරිඳගේ සේවිකාව හෝ මගේ සේවකයා එනවා. ඒ හැමදෙනාම හොඳ විශ්වාසදායක අය. සෑහෙන කාලයක් තිස්සේ ඉඳලයි අප ළඟ වැඩට ඉන්නේ. අනෙක් කාරණය මේකයි. මේ යකඩ පෙට්ටියේ මගේ සාමාන්‍ය රාජකාරි ලියවිලි වලට වඩා යමක් තිබෙන බව ඔවුන් දනහිටින්න විධියක් නෑ."

"යකඩ පෙට්ටියේ මේ ලියවිල්ල තිබෙන බව දනහිටියේ කවුද?"

"ගෙදර කිසිකෙනෙක් දන්නෙ නෑ."

"සැකයක් නෑ. ඔබේ බිරිඳ දනගෙන ඉන්න ඇති?"

"නැහැ මහත්මයා. ඇය දන්නෙත් නෑ. අද උදේ ලිපිය නැතිවුණාම, මං ඇයට කියනතුරු ඇය දනගෙන හිටියෙත් නෑ."

එය අනුමත කරමින් අගමැතිවරයා හිස සැලුවේය.

"මහජන සේවය සඳහා ඔබේ කැපවීම කොහොමද කියන එක, බොහොම කාලයක සිට මම දන්නවා හෝප්. මෙවැනි වැදගත් රාජ්‍ය රහසක්, පවුලේ කෙනෙකුටවත් නොකියා ඔබ ආරක්ෂා කරන බව මට හොඳටම විශ්වාසයි."

ලේකම්වරයා ඊට හිසනමා ආචාර කළේය.

"අද උදේ වනතුරු මගේ බිරිඳට මේ ගැන මං එක වචනයක් කියල තිබුණෙ නැහැ."

"ඇය මොකක් හර් අනුමාන කළා වත්ද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නැහැ හෝම්ස් මහත්මයා. කිසිදෙයක් අනුමාන කරන්න ඇයට විධියක් නැහැ. වෙන කිසිවෙකුට අනුමාන කරන්න හැකියාවකුත් නැහැ."

"මීට කලින් කවදාහරි ඔබෙ ලියකියවිලි නැතිවෙලා තිබෙනවාද?"

"නැහැ."

"මෙවැනි ලිපියක් ඔබේ ළඟ තිබෙන බව දන්නා කී දෙනෙක් මේ එංගලන්තයේ ඉන්නවද? ඔවුන් කවුද?"

"කැබිනට් මණ්ඩලයේ හැම කෙනෙකුටම ඊයේ අපි මේ ගැන දැනුම් දුන්නා. හැම කැබිනට් රැස්වීමකදී වගේම මෙකෙදිත් පුරුදු පරිදි රහස්‍ය බව ආරක්ෂා කරන්න කවුරුත් දිවුරුම් දුන්නා. ඊට අමතරව මේ ලියවිල්ල ගැන රහස විශේෂයෙන් සුරැකිය යුතු බවට අගමැතිතුමා අනතුරු ඇඟවීමක් කළා. එහෙම කරල පැය කීපයක් ඇතුළත, මගේ අතින්ම ලියවිල්ල නැතිවුණා නේද කියල හිතනකොට. . . . . . දෙවියනේ!"

ඔහුගේ කඩවසම් මුහුණ විරූපී වී ගියේ හිතට නැඟුණු හැඟීම් නිසා විය යුතුය. තමා කෙරෙහිම උපන් කෝපයෙන් ඔහු දකුණතේ ඇඟිලි හිසකෙස් අතරට යවා තදින් ඇද්දේය. මෙම රාජ්‍ය තාන්ත්‍රිකයාගේ නියම ස්වභාවය අපි එක් මොහොතකට දුටුවෙමු. ඊළඟට සුපුරුදු වෙස්මුහුණ යළිත් ආරූඪ විය. මෘදු කටහඬකින් කථාව යළි ඇරඹිණි.

"කැබිනට් මණ්ඩලයේ අය ඇරුණාම ආරක්ෂක අමාත්‍යංශයේ ඉහළම නිලධාරියන් දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් මේ ලියුම ගැන දන්නවා ඇති. මේ එංගලන්තයේ වෙනත් කිසිකෙනෙක් ලියුම ගැන දන්නෙ නැහැ. මට ඒ ගැන ඔබට සහතික වෙන්න පුළුවන් හෝම්ස් මහත්මයා."

"එංගලන්තයේ නැතිවුණත් පිටරටක කවුරුත් හෝ මේ ගැන දන්නවද?"

"මේ ලියුම ලියූ පුද්ගලයා හැරෙන්න පිටරටකවත් කිසිම කෙනෙක් ඒ ගැන දන්නවා ඇති කියල මං හිතන්නෙ නැහැ. මට හොඳටම විශ්වාසයි. ඒ පුද්ගලයා තමන්ගේ ඇමතිවරුන්ට වත් මේ ගැන කියල නැතුව ඇති."

http://...holmesinvestigations.blogspot.com

හෝම්ස් ස්වල්ප වේලාවක් නිහඬව කල්පනා කළේය.

"හොඳයි මහත්වරුනි. මම දැන් දැනගන්න කැමතියි මේ ලියවිල්ල මොකක්ද කියලා. ඒ වගේම එය නැතිවීමෙන් භයානක ප්‍රතිඵල ඇතිවිය හැක්කේ ඇයි කියලා?"

රාජ්‍ය තාන්ත්‍රිකයෝ දෙදෙනා මුහුණට මුහුණ බලාගත්හ. තම තලලෙ රැළි කරගත් අගමැතිතුමා මඳ වේලාවකට පසු හෝම්ස් ඇමතුවේය.

"හෝම්ස් මහත්මයා. ඒ ලියවිල්ල දමා තිබුණේ ලා නිල් පැහැති දිග ලියුම් කවරයක. ඒක බොහොම තුනී කවරයක්. සිංහයෙකුගේ ලාංඡනය ඇති මුද්‍රාවකින්, රතු ලාකඩ මත කවරය මුද්‍රා තබලයි තියෙන්නේ. ඒකෙ ලැබිය යුත්තාගේ නම ලියලා තියෙන්නේ ලොකු අකුරෙන්. . . ."

". . . . . මහත්මයා. ලියුමේ අන්තර්ගතය මොකක්ද? අත්‍යවශ්‍යයෙන්ම මා එය දැනගත යුතුයි. මේ අභිරහස විසඳීම අරඹන්න මට හැකිවන්නේ එවිටයි. මොකක් ගැනද මේ ලියුම?"

"ඒක වැදගත් රාජ්‍ය රහසක් හෝම්ස් මහත්මයා. අතිශයින්ම රහසිගතයි. එය ඔබට හෙළිකරන්න පිළිවෙළක් නෑ. ඒ වගේම ලියුම් හොයාගැනීම සඳහා ලියුමේ අඩංගු කාරණා ගැන ඔබ දැන සිටීම අත්‍යවශ්‍ය නෑ. ඔබ ළඟ තියෙනවා කියනව නේ අභිරහස් විසඳීමේ පුදුමාකාර බලයක්. එහි උපකාරයෙන් මා විස්තර කළ ලියුම් කවරය, එහි අඩංගු දේ සමග හොයල දෙන්න. එහෙම කළොත් ඔබ ඔබේ රටට විශාල සේවයක් කළා වෙනවා. ඊට අමතරව අපට ලැබී ඇති බලතල අනුව පිරිනමන වටිනා ත්‍යාගයකටත් ඔබ හිමිකාරයෙක් වෙනවා."

ෂර්ලොක් හෝම්ස් අසුනෙන් නැගිට්ටේ සිනාමුසු මුහුණෙනි.

"ඔබ දෙදෙනා මේ රටේ ඉන්න වැඩ රාජකාරී අධිකම දෙදෙනෙක්. සුළු සුළු වැඩවල යෙදෙන කෙනෙක් වුණත් මාත් සොයා බැලිය යුතු කාරණාවල් බොහොමයි. මට හරිම කණගාටුයි. මේ කාරණාව සම්බන්ධයෙන් ඔබට උදව් කරන්න මට හැකියාවක් නැහැ. ඉතින් තවදුරටත් මේ ගැන අප කතාබහ කිරීම, කාලය නාස්තිකිරීමක් පමණයි."

http://sherlockholmesinvestigations.blogspot.com

අගමැතිතුමා පුටුවෙන් නැගිට්ටේ කෝපයෙන් දලවන බැල්මක් දෑසට නගාගෙනයි. ඔහුගේ කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු, ඔහු මේ බැල්මෙන් දමනය කර ඇතුවා නිශ්චයය.

"මහත්මයා මට පුරුදු නැහැ. . . ."

යනුවෙන් යමක් කියන්නට පටන්ගත් අගමැතිතුමා එය ආයාසයෙන් නවත්වා ගත්තේය. ඉන්පසු ඔහු යළිත් පුටුවේ හිඳගත්තේය. මිනිත්තු කිහිපයක් යනතුරුත් අපි සියලු දෙනාම නිහඬව බලා සිටියෙමු. අනතුරුව වෙන කළ හැකි දෙයක් නොමැති බව හඟවමින් අගමැතිතුමා දෙඋර හැකිළුවේය.

"ඔබ දාන කොන්දේසිවලට අපට යටත්වෙන්න සිදුවෙනවා හෝම්ස් මහත්මයා. සැකයක් නෑ. ඔබ කියන දේ හරි. ඔබ වෙත සම්පූර්ණ විශ්වාසය තියන්නෙ නැතුව මෙහෙම වැඩක් ඔබ ලවා කරවාගන්නෙ කොහොමද?"

"මාත් ඊට එකඟයි" හෝප් මහතා කීය.

"හොඳයි. එහෙනම් මං කියන්නද? අප මේ හෙළිකරන තොරතුරු වල රහස්‍ය බව, ඔබත් දොස්තර වොට්සනුත් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ආරක්ෂා කරාවි කියල අපි විශ්වාස කරනවා. ඔබේ දේශප්‍රේමීත්වය ගැනත් සිහිකරලා මං කියන්න කැමතියි. මේ රහස එළිවුණොත් අපේ රටට වෙන්නේ මහා විනාශයක්."

"ඔබට පුළුවන් කිසි භයක් සැකක් නැතුව, අප දෙදෙනා ගැන විශ්වාසය තියන්න."

"හොඳයි. අපට මේ ලියුම එවලා තියෙන්නේ එක්තරා විදේශ රටක රාජ්‍ය නායකයෙක්. එංගලන්තයට අයත් යටත්විජිත වල මෑතකදී ඇතිවූ සිදුවීම් ගැන ඔහු කැළැඹීමට පත්වෙලා තියෙනවා. ඔහු මේ ලියුම බොහොම කලබලයෙන් ලියල තියෙන්නේ තමන්ගේ තනි කැමැත්තට. ඒ ගැන සම්පූර්ණ වගකීම පැවරෙන්නේ ඔහුගේ හිස මතට. වැඩිදුර සොයා බලද්දී අපට දැනගන්න ලැබුණා, ඔහුගේ ඇමති මණ්ඩලය වත් මේ ලියුම ගැන කිසි දෙයක් දන්නෙ නෑ. ඒ වගේම කිවයුතු තවත් කරුණක් තිබෙනවා. මේ රාජ්‍ය නායකයා මේ ලියුම ලියද්දී යොදාගෙන තිබෙන සමහර වචන සහ වාක්‍ය බොහොම සැරයි. ඒකෙන් මේකට අදාල පුද්ගලයින් තරහෙන් කුපිතවෙන්න පුළුවන්. එම කාරණා එළිවුණොත් යුරෝපා මහාද්වීපය

http://[illegible].blogspot.com

තුළ උද්ගත වෙන්නේ මහා භයානක තත්ත්වයක්, මහත්මයා. මේ ලියුමේ අඩංගු කරුණු ප්‍රසිද්ධියට පත්වුණොත් සතියක් ඇතුළත මේ රට අති භයානක යුද්ධයකට ඇටළෙනවා නියතයි!"

හෝම්ස් කඩදාසි හැබැල්ලක යමක් ලියා අගමැතිතුමා අතට දුන්නේය.

"හරියට හරි. ඒ පුද්ගලයා තමා. ඔහුගේ ඒ ලියමන තමා දැන් අතුරුදන්වෙලා තියෙන්නේ. මනුස්ස ජීවිත ලක්ෂ ගණනක්, පවුම් කෝටි, ප්‍රකෝටි ගණනක දේපොළ දැන් භයානක අනතුරකට මුහුණපාල තියෙන්නේ ඔන්න ඔය ලියුම නිසා."

"ලියුම එවූ තැනැත්තාට ඒක නැතිවූ බව ඔබ දැනුම් දුන්නද?"

"ඔව් මහත්මයා. ආරංචිය රහස් සංඥා ක්‍රමයකින් සැකවූ විදුලි පුවතක් මගින් දැන්නුවා."

"ලියුමේ විස්තර ප්‍රසිද්ධ වෙනවට බාගවෙලාවට ඔහු කැමැති ඇති?"

"නැහැ මහත්මයා. තමන් බොහොම කේන්තියට පත්වෙලා වැඩිදුර හිතා නොබලා ලියූ මේ ලියමනේ මරපතලකම ගැන ඔහුටත් දැන් වැටහී ඇති බවයි අපට ආරංචි. මේකෙ කාරණා එළිවුණොත් අපටත් වඩා මහා විනාශයක් වෙන්නේ ඔහුට සහ ඔහුගේ රටට."

"හොඳයි ඇත්ත තත්ත්වය ඒක නම් කාටද මේකෙ තියෙන කරුණු වලින් වාසි සැලසෙන්නෙ? අගමැතිතුමනි. මේක හොරකම් කරන්න නැත්නම් ප්‍රසිද්ධ කරන්න කාටහරි උවමනා ඇයි?"

"මං ඒක ඔබට පහදා දෙන්නම්. නමුත් ඒ සඳහා ජාත්‍යන්තර දේශපාලනයේ ඉහළම කරුණු ගැන ඔබට කියන්න මට සිදුවෙනවා. මුළු යුරෝපයම දැන් ආයුධ සන්නද්ධ වෙලා, සටනකට සූදානමින් තියෙන යුදපිටියක් කිව්වොත් නිවැරදියි. අප හැර සියලුම රටවල් දැන් පක්ෂ දෙකකට බෙදිලා. ඔවුන්ගේ යුද්ධ බලය දැන් තියෙන්නේ තම සමව, සමබරව. ඒක නිසා එක් පක්ෂයකට අනෙක නොපරදින තරට කර තත්ත්වයක් තමයි තියෙන්නේ. මෙතැන තීරණාත්මක සාධකය තමා අපේ රට- මහා බ්‍රිතාන්‍යය. හොඳින් තේරුම් ගන්න. මහා බ්‍රිතාන්‍යය සම්බන්ධ වෙන්නේ කොයි පැත්තටද, ඒ පැත්තට විශිෂ්ට ජයක් ලැබෙනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව් බොහොම පැහැදිලියි. එතකොට අපට මිතුරු රාජ්‍ය නායකයා එවල තිබෙන ලියුමේ කරුණු ප්‍රසිද්ධ කරලා, ඒ රටත් අපත් අතර ඇති හොඳහිත පළුදු කිරීමයි, ඔහුගේ සතුරු රටක රාජ්‍ය නායකයාගේ අරමුණ?"

"ඔව් මහත්මයා" අගමැතිතුමා පිළිතුරු දුන්නේය.

"මේ ලිපිය සතුරා අතට පත්වුණොත් ඔහු ඒක කාටද යවන්නේ?"

"යුරෝපයේ සිටින ඉහළම පෙළේ රාජ්‍යයකින් ඔහු කෙනෙකුට. බාගවෙලාවට මේ මොහොතේත් ඒ ලියුම එවැනි තැනක් බලා වේගයෙන් ගමන් කරමින් ඇති."

ට්‍රිලෝනි හෝප් මහතාගේ හිස පහතට නැමුරු විය. ඔහුට කෙඳිරිගෑවිණ. ඔහුගේ උරහිස මත අගමැතිතුමා අත තැබුවේ කාරුණික අයුරෙනි.

"මගේ හිතවත් මිත්‍රයා. මේක ඔබේ අවාසනාවට වුණු වැඩක්. මේ ගැන ඔබට දොස් කියන්න කාටවත් බෑ. ඔබ කොතැනකවත් නොසැලකිලිමත් ලෙස කටයුතු කරලා නැහැ. ඉතින් හෝම්ස් මහත්මයා කරුණු සියල්ලක්ම දැන් ඔබට හෙළිකරලයි තියෙන්නෙ. අප ගතයුත්තේ මොන ක්‍රියාමාර්ගයක්ද?"

"මහත්මයා ඔබ කියන්නෙ, මේ ලියුම හොයා නොගත්තොත් මහා යුද්ධයක් පටන් ගන්නු එක ස්ථිර බවයි?"

"මං හිතනවා බොහොම දුරට, ඊමට ඉඩ ඇත්තේ එයයි."

"එහෙනම් සූදානම් වෙන්න, යුද්ධයකට!"

අමුත්තෝ දෙදෙන එක් නිමේෂයක්ට තැතිගත් මුහුණෙන් අප දෙස බලා සිටියහ.

"ඒක බොහොම දරුණු කතාවක් නෙ හෝම්ස් මහත්මයා?"

"සිද්ධ වෙලා තියෙන දේවල් ගැන හිතාබලන්න මහත්මයා. මේක රෑයෙ 11 එකොළහමාරට පසුව ගත්තා වෙන්න බෑ. ඒ මොකද හෝප් මහතාගෙත්, මහත්මියගෙත් දෙදෙනාම ඒ වෙලාවේ ඉඳන් අද උදේ වනතුරු දිගටම කාමරයේ හිටියා. එහෙම නම් ලියුම ගන්න ඇත්තෙ රෑයෙ 7 හතහමාරත් 11 එකොළහමාරත් අතරේ. බොහොම වෙලාවට හතහමාරට කිට්ටුව. ඒ මොකද ගත්ත

http://sherlockholmesinvestigations.blogspot.com

පුද්ගලයා දන හිටියා මෙවැනි ලියුමක් තිබෙන බව. ඒ නිසා එහෙම දෙයක් කල්තබා අරගත්තු තරමට හොඳයි.

මේ කියන වෙලාවෙ කාගෙ හරි අතට රහස් ලියවිල්ල පත්වුණා නම් දන් ඒක කොහේද ඇත්තෙ? කාටවත් වුවමනාවක් නෑ ඒක හංගලා ගෙදර අරන් තියාගන්න. ඒක මෙලහකටත් ලියුමෙන් ප්‍රයෝජනයක් තිබෙන කෙනෙකුට යවලා ඇති. එය පසුපස එළවාගෙන ගිහින්, ඒක අපේ අතට අරගන්න නම්, එය ගියෙ කොහේටද කියල දනගන්න උවමනායි. නමුත් ඒව හොයන්න දන අපට තියෙන ඉඩකඩ මොනවාද? දන් ලියවිල්ල අපට අල්ලාගත හැකි දුරින් එපිටට ගිහින්."

අගමැතිතුමා අසුනෙන් නැගිට්ටේය.

"හෝම්ස් මහත්මයා. ඔබ කියන දේ තර්කානුකූලයි. මටත් හිතෙනවා දන් මේක අපේ ග්‍රහණයෙන් ගිලිහිලා ගිහින් කියල."

"උපකල්පනයකට ඒම සඳහා අපි මෙහෙම හිතල බලමු. අපි නිකමට හිතමු ඔබේ සේවකයා හෝ සේවිකාව ලියමන ගත්තා කියල."

"ඔවුන් දෙදෙනාම බොහොම පැරැණි විශ්වාස කටයුතු අය."

"ඔබ කිව්වා ඔබේ නිදන කාමරය තියෙන්නේ දෙවැනි තට්ටුවේ කියලා. එයට එළියෙන් ඇතුළුවිය හැකි දොරටුවක් නොමැති බවත් කිව්වා. අනෙක සේවකයන්ට නොපෙනී කාටවත් උඩ තට්ටුවට යන්න පිළිවෙළක් නැති බව කීවා. එහෙම නම් ලියුම අරගන්න ඇත්තේ ඔබේ ගෙදර ඉන්න කෙනෙක්. එය ගත්තු තැනැත්තා එය ගිහින් දෙන්න ඇත්තේ කාටද? මට නම් කිසිම සැකයක් නෑ කා ළඟටද කියලා.

ලන්ඩන් නගරයේ පදිංචිව ඉන්නවා විදෙශ රටවලින් ඔත්තු බැලීම සඳහා යෙදවූ චරපුරුෂයෝ කිහිපදෙනෙක්. ලියුම යන්න ඇත්තේ එයින් එක් අයෙක් ළඟට. ඔවුන්ගේ නම් මට හොඳට හුරුපුරුදුයි. චරපුරුෂ සේවයේ ඉහළින්ම ඉන්නවා තුන්දෙනෙක්. මගේ වැඩකටයුතු පටන් ගැනීමේදී ම මං ගිහින් හොයල බලන්නම් මේ පුද්ගලයින් තුන්දෙනා තවමත් ඔවුන්ගේ වාසස්ථානවල රැඳී ඉන්නවද කියලා. මෙයින් එක්කෙනෙක් හරි අතුරුදන් වෙලා නම් - විශේෂයෙන්ම ඊයේ රාත්‍රී ඉඳල. එහෙනම් ඒක හොඳ ලකුණක්.

http://sherlockholmesinvestigations.blogspot.com

ලියමන ගිහිං තියෙන්නේ මොන හැන්දෑවටද කියල ඒකෙන් අපට පුළු හෝඩුවාවක් ලැබේවි."

"ඇයි ඔහු අතුරුදන් වෙන්නේ?" යුරෝපීය ලේකම්වරයා ඇසීය.

"ඔහු ලන්ඩනයේ තිබෙන තමන්ගේ තානාපති කාර්යාලයට ලියුම ගෙනිහිං භාරදේවි. එහෙම නේද?"

"මං හිතන්නේ නෑ ඔහු එහෙම කරාවි කියල. චරපුරුෂයෝ ඔවුන්ගේ ඔත්තු සෙවීමේ වැඩ කරන්නේ ස්වාධීනව, බොහොම වෙලාවට තානාපති කාර්යාල සමඟ ඔවුන්ගේ විරසක තියෙනවා."

මෙයට තම එකඟතාවය පළකරමින් අගමැතිතුමා හිසසැලීය.

"ඔබේ කතාව ඇත්තයි කියල මටත් හිතෙනවා හෝම්ස් මහත්මයා. මේ තරම් වටිනා ඔත්තුවක් ඔහු තමන්ගේ දැතින්ම හළු නිලධරයන්ට ගෙනිහිං භාරදේවි. ඒක කවුරුවත් අතේ යවන උකස් නැහැ. ඔබ දන් කටයුතු කරන්න බලාපොරොත්තු වෙන පිළිවෙළ ඉතාම හොඳයි.

ඉතින් හෝප්, මේ අවාසනාවන්ත සිද්ධිය නිසා අපෙන් රැකගෙන්න තියෙන අනෙකුත් වැඩකටයුතු නොසලකා හරින්න පුළුවන් කමක් නැහැ. අද දවස ඇතුළත මොනවා හරි සිද්ධවුණොත්, නැත්නම් දැනගන්න ලැබුණොත් අපි වහාම ඔබට දන්වන්නම් හෝම්ස් මහත්මයා. ඒ අතරේ ඔබේ පරීක්ෂණවලින් ලැබෙන ප්‍රතිඵල මොනවද කියලා අපටත් කියන්න."

දේශපාලනඥයින් දෙදෙනා අපට හිසනමා ආචාරකොට, නිවසින් පිටවී ගියේ ශෝකාකුල් මුහුණුවලිනි.

අපේ සුප්‍රසිද්ධ අමුත්තන් පිටවී ගිය පසු පයිප්පය දල්වාගත් හෝම්ස් හාන්සිපුටුවේ වාඩිවී ගැඹුරු කල්පනාවක වෙළුණේය. මම උදෑසන පුවත්පත දිගහැරගතිමි. කලින් දා රාත්‍රියේ ලන්ඩනයේ සිදුවී ඇති බිහිසුණු මිනීමැරුමක් ගැන, එහි සඳහන් විස්තරය කියවීමට ගත් මට, අනෙක් සියල්ල අමතක විය. එක්වරම පුටුවෙන් නැගී සිටි මගේ මිතුයා පයිප්පය පැත්තකින් තබා, අතිශයින් සන්තෝෂයට පත් හඬක් නැගුවේය.

"මට මේක කරන්න තියෙන හොඳම පිළිවෙළ ඒකයි. මේ ඇතිවෙලා තිබෙන තත්ත්වය නම් බොහොම දරුණුයි. ඒත් සුළු බලාපොරොත්තුවක් ඇතිකරගන්න බැරිකමකුත් නෑ. දන් වුණොත්

තමක් නෑ. අපට දනගන්න පුළුවන් නම් ලියවිල්ල ගත්තෙ කොයි එකාද කියල. ඒ මොකද ඕනෑම වෙලාවක ඒක තවමත් ඔහු ළඟ තියෙන්න පුළුවන්. මේ මිනිස්සු මුදලට ගතහැකි අය. මං වෙනුවෙන් ඕනෑම මුදලක් වියදම් කරන්න බ්‍රිතාන්‍ය භාණ්ඩාගාරය සූදානම්. ලියවිල්ල විකුණන්න තිබුණොත් මං සල්ලි දීල ගන්නවා. එතකොට සමහර විට සාගෙත් ආදායම් බදු තව පැන්සයකින් විතර වැඩිකරන්න සිදුවේවි.

බොහොම වෙලාවට මේ ලියවිල්ල ගත්තු තක්කඩියා, ඒක කොහේටවත් දෙන්නෙ නැතුව බලාගෙන ඉන්නවා වෙන්නත් පුළුවනි, ඒකට තිබෙන ඉල්ලුම කොහොමද කියල බලන්න; ඒකට මේ පැත්තෙ අය කීයක් ගෙවන්න සූදානම්ද කියලා දනගන්න. කිසි භයක් නැතුව ඔය වැඩේට අතගහන්න පුළුවන් මිනිස්සු ඉන්නේ තුන්දෙනයි වොට්සන්. ඔබර්ස්ටයින්, ලා රෝතියර් හා එඩුවාඩෝ ලූකස් පමණයි. මං යනවා ඔය තුන්දෙනාවම හමුවෙන්න."

මම උදෑසන පුවත්පතේ පුවෘත්තිය දිහා බැලීමි.

"හෝම්ස් ඔබ කියන්නේ ගොඩොල්ෆින් වීථියේ එඩුවාඩෝ ලූකස්ද?"

"ඔව්."

"එයාව නම් ඔබට හමුවෙන්න ලැබෙන්නේ නෑ."

"නෑ? ඒ ඇයි?"

"ඊයේ රාත්‍රී ඔහුගේ ගෙදරදී ඔහුව මරාදමලා!"

මගේ මිත්‍රයා ඔහුගේ අභිරහස් පරීක්ෂණ වලදී මා මවිතයට පත්කළ අවස්ථා බොහෝය. ඔහු සම්පූර්ණයෙන්ම මවිතයට පත්කිරීමට මෙදා මට හැකිවිය. එයින් මගේ සිතේ ජයග්‍රාහී හැඟීමක් ද පහළවිය. අතිශය පුදුමයෙන් ගල්ගැසී මෙන් මොහොතක් මා දෙස බලා සිටි හෝම්ස් පුවත්පත මගේ අතෙන් උදුරා ගත්තේය.

## වෙස්ට්මින්ස්ටර්හි මිනීමැරුමක්

ඊයේ රාත්‍රී සිදුවූ අද්භූත ආකාරයේ මිනීමැරුමක් ගැන ගොඩොල්ෆින් වීථියෙන් වාර්තා වෙයි. මෙය සිදුවී ඇත්තේ

වෙස්ට්මින්ස්ටර්හි පාර්ලිමේන්තු මන්දිරයට සමීප, දහඅටවැනි සියවසේ තැනූ පැරණි ගොඩනැගිල්ලක නිවසකයි. එය පිහිටියේ තේම්ස් ගඟටත්, වෙස්ට්මින්ස්ටර් ඇබේ දේවස්ථානයටත් අතර පෙදෙසේයි.

අවුරුදු ගණනාවක් තිස්සේම මෙහි නිවැසියා වූයේ එඩුවාඩෝ ලූකස් නම් මහතෙකි. ඉහළ පෙළේ සමාජයේ ජනප්‍රිය පුද්ගලයෙකු වූ ඔහු, ආධුනික ගායකයෙකු ලෙස ද ප්‍රසිද්ධියක් ඉසිලුවේය. අවිවාහකයකු වන ලූකස් මහතා තිස්හතර හැවිරිදි විය. ඔහුගේ නිවසේ වාසය කරන අනෙක් අය වන්නේ, වයස්ගත ගෘහසේවිකාව වන ප්‍රින්ගල් මහත්මිය සහ මිටන් නම් පෞද්ගලික මෙහෙකරුවායි. ගෘහ සේවිකාව කල්තබා නින්දට යන අතර, ඇයගේ කාමරය පිහිටියේ නිවසේ ඉහළම මහලේය. මෙහෙකාර ළමයා, හැමර්ස්මිත්හි වසන ඔහුගේ මිතුරෙකු හමුවීමට, ඊයේ හවස් වරුවේ සිටම ගොස් සිටි බව පවසයි. මේ අතර කාලයේ සිදුවූයේ කුමක්ද යන්න තවමත් අභිරහසකි.

රාත්‍රි දොළහට කාලක් තිබියදී බැරට් නම් පොලිස් භටයා ගොඩොල්ෆින් වීථියේ, රාත්‍රී මුර සංචාරයේ යෙදී සිටියේය. ඔහුට අංක 16 දරන නිවසේ අසාමාන්‍ය දෙයක් දකින්නට ලැබී ඇත. එනම් එහි ඉදිරිපස දොර බාගෙට විවෘතව ඇති බවයි. ඔහු දොරට තට්ටු කළත් පිළිතුරක් නොලැබිණි. ඉදිරිපස කාමරයක ආලෝකයක් දුටු ඔහු නිවසේ බරාදයට ඇතුළු වී නැවත වරක් තට්ටු කළේය. එයට ද පිළිතුරක් නොලැබිණ. එවිට ඔහු කාමරයේ දොර තල්ලුකරගෙන එයට ඇතුළුවී ඇත. මුළු කාමරයම අවුල් ජාලයක් වී තිබුණු අතර, ලී බඩු සියල්ල කාමරයේ මුල්ලක ගොඩගසා තිබිණි.

(රු) කාමරය මැද එක් පුටුවක් බිම පෙරළී තිබෙනු දක්නා ලදී. පුටුවේ කකුලක් ද ග්‍රහණය කරගෙන, මැරී වැටී සිටියේ ගෙහිමියා වූ එඩුවාඩෝ ලූකස් මහතාය. ඔහුගේ පපුවට පිහි පහරක් එල්ල වී තිබුණු අතර, එය ක්ෂණිකව මරු කැඳවන්නට ඇතැයි අනුමාන කළ හැක. අපරාධය සඳහා යොදාගත් ආයුධය, මදක් වකුටු ඉන්දියානු කිණිස්සකි. මෙය ලූකස් මහතා සතුව, බිත්ති අලංකාරය සඳහා සකසා තිබූ පෙරදිග ආයුධ හා අරුමෝසම් බඩු එකතුවෙන් ලබාගත් එකක් බව පැහැදිලිය. මෙය සිදුකරන්නට ඇත්තේ, මුදල් හෝ වටිනා දේ සොරකම් කරන්නට පැමිණි සොරෙකු විසින් යයි සිතිය නො හැක. ඒ මක්නිසාද යත්, කාමරයේ තිබූ වටිනා දේවල් සමූහයක් එලෙසම ඉතිරිව තිබීමයි. කවුරුත් දන්නා හඳුනන පුද්ගලයෙකු වූ එඩුවාඩෝ ලූකස්



181. "වෙස්ට්මින්ස්ටර්හි මිනීමැරුමක්?"

Reading Purpose Not for Print

http://sherlockholmesinvestigations.blogspot.com

මහනාගේ මේ ඛේදජනක අභිරහස් මරණයෙන් ඔහුගේ හිතවත් මිතුරු කැල ඉමහත් කම්පාවට පත්වනු නියතය."

"ඉතින් වොට්සන්? මොකක්ද ඔබට මෙහෙන් අනුමාන කරන්න පුළුවන්?"

"හරිම පුදුමයක්! ඔබ සැකකරන පුද්ගලයෙක්ම ඊයෙ රෑ අහම්බෙන් වගේ මැරුම් කාලා!"

"අහම්බෙන් වගේ? නෑ වොට්සන්. මේ තැනැත්තා තමයි ලියවිල්ල සොරකම් කළා කියන නාටකයේ රඟපෑවා කියල. අපේ සැකයට භාජනය වුණු තුන්වන්ගෙන් කෙනෙක්. නාටකය රඟදක්වුණා කියල අපි හිතන වෙලාවෙදිම, ඔහු බොහොම කිහිපුණු විධියට මැරුම් කනවා. මේක අහම්බෙන් වුණු සිදුවීමක් කියල සලකන්න කොහොමටවත් බෑ, මගේ හිතවත් වොට්සන්. මේ සිදුවීම් දෙක එකට සම්බන්ධයි. ඒ සම්බන්ධය මොකක්ද කියල හොයාගැනීම අපේ රාජකාරියක්."

"ඒත් ඉතින් අපි පොලිසියට භාරගන්න හිටි තොරතුරු හැම එකක්ම එළිකරන්න වෙනවා නේද?"

"කොහොමටවත් නෑ. ගොඩොල්ෆින් වීථියේ සිදුවෙලා තියෙන හැම දෙයක්ම ඔවුන් දුටුවා. ඒ නිසා ඒ ගැන ඔවුන් හොඳින් දන්නවා. වයිට්හෝල් ටෙරසයේ සිදුවුණු කිසිදෙයක් ඔවුන් දන්නෙ නෑ. මේ දෙක ගැනම දන්නෙ අපි විතරයි. ඒ නිසා ඒ දෙක අතර සම්බන්ධය මොකක්ද කියල හොයන්න පුළුවනුත් අපට විතරයි. ඔය ලූකස් ගැන මගේ හිතේ සැකයක් ඇතිවෙමින් තිබුණා, අනෙක් චරපුරුෂයන්ට වඩා. ඒ මොකද ගොඩොල්ෆින් වීථියත්, වයිට්හෝල් ටෙරසයත් එකිනෙකට බොහොම ළඟින් පිහිටි තැන් දෙකක්. මං කිව්ව අනික් රහස් ඔත්තුකරුවන් දෙදෙනාම ඉන්නේ ලන්ඩනයේ බටහිර කෙළවරට වෙන්න. ඒ නිසා ට්‍රීලෝනි හෝප්ගේ ගෙදර සමඟ සම්බන්ධයක් ඇතිකරගන්න, පණිවුඩයක් ලබාගන්න, අනික් හැමදෙනාටම වඩා ලූකස්ට පහසුයි. ඒක එතරම් වැදගත් දෙයක් හැටියට නොපෙනෙන්න පුළුවන්. නමුත් කෙටි කාලයක් ඇතුළත මේ වගේ විශාල වැඩක් කරගන්න උවමනා වුණාම, ඒකෙ ලොකු වාසියක් තියෙනවා. ඔහෝ! මේ මොනවද හඩ්සන් මහත්මිය අපට අරගෙන එන්නේ?"

http://sherlockholmesinvestigations.blogspot.com

හඩ්සන් මහත්මිය බන්දේසියක් මත තබා කාන්තාවකගේ ආගන්තුක පත්‍රය අප වෙත ගෙන ආවාය. එය අතට ගෙන කියවා බලා ඇහිබැම් ඉහළට නැංවූ හෝම්ස්, එය මා අතට දුන්නේය.

"හිල්ඩා ට්‍රිලෝනි හෝප් ආර්යාවට කරුණාකර මෙහාට එන්න කියන්න."

අපේ දුප්පත් නිවහනට උදේ සිට මේ වගතුරු පුහු රාජ්‍යතාන්ත්‍රිකයන් දෙදෙනෙකු පැමිණීමේ ගෞරවය ලැබ තිබිණි. මෙවර එහි සැපත්වූණේ, රූපශෝභාව අතින් ලන්ඩනයේ අග්‍රස්ථානයක සිටින්නියක ලෙස ප්‍රසිද්ධියට පත් තරුණ කාන්තාවකි. බෙල්මින්ස්ටර් ආදිපාදවරයාගේ බාලම දියණිය අතිශයින්ම ශෝභාසම්පන්න තරුණියක බව මට බොහෝ වර අසන්නට ලැබී තිබිණ. එහෙත් ඒ කිසිම විස්තරයකින් හෝ ඡායාරූපයකින් ඇය මේ තරම් රූමත් කාන්තාවක බවට මට තොරතුරු ලැබී තිබුණේ නැත. එහෙත් මේ දීප්තිමත් උදෑසන ඇය දකින්නෙකුගේ අවධානය එක්වරම යොමුවූයේ ඇගේ සුන්දරත්වය වෙත නොවන බව පැහැදිලිය. ඇගේ දෙකම්මුල් අලංකාර නමුත් ඒවා භීතියෙන් සුදුමැලි වී තිබිණි. දෙනෙත් වලින් ප්‍රකාශ වූයේ කාන්සිය නොව භීතියයි. අපේ අමුත්තාගෙන් විදමාන වූයේ ශෝභාව නොව නැතිගැන්මයි.

"මගේ ස්වාමිපුරුෂයා මෙහේ ඇවිත් ගියාද හෝම්ස් මහත්මයා?"

"ඔව් ආර්යාවෙනි. ඔහු ඇවිත් ගියා."

"හෝම්ස් මහත්මයා. මං ඔබට ආයාචනා කරනවා මං මෙහේ ආව බව ඔහුට කියන්න එපා කියල."

ඇයට හිස නමා ආචාර කළ හෝම්ස් ඇයට අසුන්ගන්නා මෙන් සංඥා කළේය.

"ඔබතුමිය මාව පත්කරන්නේ හරි අපහසුවකට නේ. කරුණාකරල මෙහෙන් වාඩිවෙලා මට කියන්න ඔබේ ප්‍රශ්නය මොකක්ද කියල. හැබැයි මට කිසිදෙයක් පොරොන්දු වෙන්න බෑ."

විසිත්ත කාමරය හරහා ඇවිද ගිය ඇය ජනේලයට පිටුපා හිඳගත්තාය. ඇගේ පැමිණීම අපේ විසිත්ත කාමරයට ගෙන ආවේ තේජවන්ත මහා ජීනකගේ සම්ප්‍රාප්තිය වැනි තත්ත්වයකි.

"හෝම්ස් මහත්මයා. මං ඔබට හැම දෙයක්ම අවංකව කියන්නම්. එකතොට ඔබත් මට අවංකවම සිළිතුරු දෙව් කියල මං

විශ්වාස කරනවා. මගේ ස්වාමිපුරුෂයාත් මාත් අතරේ කිසිම රහසක් නැහැ, එක දෙයක් ගැන හැරෙන්නට. ඒ දේ තමා දේශපාලනය. රාජ්‍යතන්ත්‍රයේ කටයුතු ගැන ඔහු මට එක වචනයක දෙයක් හෙළිකරන්නේ නෑ. දැන් මට දැනගන්න ලැබිලා තියෙනවා, ඊයේ රාත්‍රි අපේ නිවසේ මහ නින්දා සහගත දෙයක් සිදුවී ඇති බව. මට ආරංචියි මොකක් දෝ වැදගත් ලියවිල්ලක් නැතිවෙලා. මේක ඔහුගේ ඒකියාව - දේශපාලනය සම්බන්ධ දෙයක්. ඒ නිසා සිද්ධවෙලා තියෙන්නේ මොකක්ද කියලා, මගේ සැමියා මට කිසිම දෙයක් හෙළි කරන්නේ නැහැ. නමුත් මේක මොකක්ද කියලා දැනගැනීම මට අත්‍යාවශ්‍යයි. මං ඔබට යළිත් කියනවා මහත්මයා, මෙතැන සිදුවෙලා තියෙන හැම දෙයක්ම මං දැනගත යුතුමයි. දේශපාලනඥයො හැරුණාම මේකෙ ඇත්ත හොඳින් දන්න අනිත් එකම පුද්ගලයා ඔබයි. ඒ නිසා හෝම්ස් මහත්මයා මං ඔබට බැගෑපත්ව ආයාචනා කර සිටිනවා, කරුණාකරල මට කියන්න සිදුවෙලා තියෙන්නෙ මොකක්ද? ඒකෙන් ඇතිවෙන ප්‍රතිඵලය මොකක්ද? මට හැම දෙයක්ම කියන්න හෝම්ස් මහත්මයා. ඔබේ අනුග්‍රාහකයාගේ යහපත වෙනුවෙන් කියල හිතල නිශ්ශබ්ද වෙන්න එපා. සිද්ධිය මට හරිහැටි හෙළිකළොත්, මං කාරණය ටික දැනගත්තොත්, මගේ සැමියාට වෙන්නේ යහපතක්මයි. මොකක්ද හෝම්ස් මහත්මයා මේ අතුරුදන්වුණු ලියවිල්ල?"

"ආර්යාවෙනි, ඔබ මගෙන් අහන්නේ මට හෙළි කරන්න බැරි රහසක්."

ඇයට කෝපිරගැටිණි. ඇය දෑතින් මුහුණ වසා ගත්තාය.

"ඔය කාරණාව ගැන මෙහෙම හිතල බලන්න ආර්යාවනි. ඔබේ සැමියා හිතන්නේ මේ රහස ඔබට වත් හෙළිකිරීම සුදුසු නැහැ කියල. මමත් ඔහුගෙන් එය අසා දැනගත්තේ, ඒක කාටවත් හෙළිනොකරන බවට දිවුරා පොරොන්දු වෙලයි. ඉතින් මං කොහොමද ඒක ඔබට කියන්නේ? වඩාත්ම සුදුසු ක්‍රමය ඔබ ඒක ඔහුගෙන්ම අසා දැනගන්න එකයි."

"මං ඔහුගෙන් ඇහුවා හෝම්ස් මහත්තයා. හරි ගියේ නැහැ. මං මේ ඔබ ළඟට ආවේ බැරිම තැන. ඔබ කැමැති නැත්නම් ඔය කථාව මුළුමනින්ම මට නොකිව්වට කමක් නැහැ. එකම එක දෙයක් ගැන ඔබ පැහැදිලි කරන්න."

blogspot.com

"ඒ මොකක්ද ආර්යාවනි?"

"මේ සිද්ධිම නිසා මගේ ස්වාමියාගේ දේශපාලන ජීවිතය අවසන් වේවිද?"

"ඔව්. මෙතැන සිදුවෙලා තියෙන්නේ බරපතල වැරැද්දක්. ඒක නිවැරදි කරගත්තේ නැත්නම්. . . . හැමදෙයක්ම ඉතාම අවාසනාවන්ත විධියට තමයි කෙළවර වෙන්නේ."

"ආහ්!" ඇය හුස්මක් ඉහළට ඇද්දේ තම සැකය දුරු කරගත් අයුරෙනි.

"තවත් එක ප්‍රශ්නයක් තියෙනවා හෝම්ස් මහත්මයා. මේ ලියුම නැතිවුණු වෙලාවෙ මගේ සැමියාගේ කටින් පිටවුණු වචන කිහිපයක් මට ඇහුණා. මේ විනාශකාරී සිද්ධිම ගැන මහජනයා දැනගත්තොත් රටේ මහා බරපතල කැලඹීමක් ඇතිවෙන්න පුළුවන්ද?"

"ඔහු එහෙම කිව්වාද? එහෙම නම් මං කොහොමද ඒක බොරු කියල කියන්නේ?"

"ඔබ කියන්නේ මේකෙන් ඇතිවෙන ප්‍රතිඵල මොන වගේ වේවි කියලද?"

"ආර්යාවෙනි, ඔබ ආයෙමත් අහන්නෙ මට පිළිතුරු දෙන්න බැරි ප්‍රශ්නයක්."

"එහෙම නම් මං තවත් ඔබේ කාලය නාස්තිකරන්න බලාපොරොත්තු වෙන්නෙ නෑ. ඒ ගැන මම ඔබට දොස් කියන්නෙ නැහැ හෝම්ස් මහත්මයා. මීට වඩා යමක් නිදහසේ හෙළිකරන්න, ඔබට හැකියාවක් නැති බව මට තේරුම් ගන්න පුළුවන්. ඉතින් මා ගැන වැරැදි හැඟීමක් ඇතිකරගන්න එපා. මගේ සැමියා ඔහුගේ රහස් මට හෙළිකරන්න කැමැති නැති වුණත්, මගේ අරමුණ වුණේ ඔහුගේ සිත්වේදනාව ඔහු සමග බෙදාහදාගන්නයි. යළිත් මං ඔබෙන් ඉල්ලා සිටිනවා, මා මෙසේ පැමිණීම ගැන මගේ ස්වාමියාට දන්වන්න එපා කියලා."

දොර අසල දී අප දෙදෙනා දෙස එක මොහොතක් බලා සිටි ට්‍රිලෝනි හෝප් ආර්යාව කාමරයෙන් පිටවී ගියාය.

දිගු සායේ රැලි "සර සර" හඬින් එකට ගැටෙන හඬ ක්‍රමයෙන් අඩුවී ගියේය. ඉන්පසු එය, ඉදිරි දොර වසන ශබ්දයත් සමගම නැතිවී ගියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඉතින් වොට්සන්. කාන්තා ආශ්‍රය ගැන මට වඩා හොඳින් දන්නේ ඔබයි." හෝම්ස් කීවේ සිනාමුසු මුහුණෙනි.

"මේ ගැනි මොකාටද මේ එන්න හදන්නෙ? මොකක්ද ඇයට ඇත්තටම උවමනා වෙලා තියෙන්නෙ?"

"ඇගේ කටින්ම කිව්වෙ උවමනා වෙලා තියෙන දේ. මේ විධියට ඇය නොසන්සුන් වෙලා තියෙන එකේ පුදුමයක් නෑ."

"හ්ම්. බලන්න වොට්සන් ඇගේ සෙනුම; ඇය කථා කළ, හැසිරුණු විලාසය; ඇගේ නැතිගැන්ම, ජීවිතය යටපත් කරගෙන හිටි හැටි. මතක තියාගන්න ඇය ආදිපාදවරයෙකුගේ දියණියක්. මේ වගේ පවුල්වල අය ඔවුන්ගේ සිත්වල ඇතිවන ප්‍රශ්න, වේදනා ලේසියෙන් පිට අයට පෙන්වන පුද්ගලයින් නෙමෙයි."

"ඇය බොහොම සංවේදී කෙනෙක් වෙන්න ඇති. ඇත්තෙන්ම ඇය හරිම කම්පාවකට පත්වෙලා ඉන්නේ."

"ඔබට මතක නේද වොට්සන් ඇය කිව්වා, ඇය හැම දෙයක්ම හොඳින් දන සිටීම, ඇගේ සැමියාගේ යහපතට හේතුවන බව. ඇය ඒක අවංකව කියූ හැටි. ඊළඟට ඔබ දකින්න ඇති වොට්සන්, ඇය පුටුවේ හිඳගත් ආකාරය - ඇගේ මුහුණට හොඳ ආලෝකයක් නොවැටෙන සේ, ඇගේ මුහුණේ ඇලවෙන හැඟීම් අපට බලාගන්න බැරිවෙන විධියට ඉඳගත් හැටි."

"ඔව් ඒක ඇත්ත. මුහුණට එළියක් නොවැටෙන විධියට වාඩිවෙන්න පුළුවන් එකම පුටුවයි මේ කාමරේ තියෙන්නේ. ඇය ඒකම තෝරාගත්තා වාඩිවෙන්න."

"ගැහැනුන්ගේ අරමුණු සහ අපේක්ෂා කියන ඒවා හරිම අබිරහස් දේවල් වොට්සන්. අපට ඒවා තේරුම්ගන්න හරි අමාරුයි. ඔබට මතකද මේ විධියටම මගේ සැකයට භාජනය වුණු අර ගැහැනිය -අර මාගේට්හි ගැහැනිය. ඇගේ නාසයේ පමණක් පියරු ආලේප කර තිබුණේ නැහැ. ඒකෙන්ම නේද ගැටලුව විසඳුණේ? ඇතුළට ගිලා බහින්න පුළුවන් බොල් පොළොවක් මත ගොඩනැගිල්ලක් හදන්න බැරුව වගේ ගැහැනුන්ගේ ප්‍රකාශ මත අපි කොහොමද උපකල්පනයක් ගොඩනගන්නේ? ඔවුන්ගේ ඉතාම සුළු ක්‍රියාවකින් කියවෙන දේ ලියන්න සමහර විට පොත් ගණනාවක් උවමනා වේවි. ඒ වගේමයි ඉතාම සුළු දෙයක් නිසා ඔවුන් මහ

http://sherlockholmesinvestigations.blogspot.com

පුදුමාකාර විධියට හැසිරෙන්න ඉඩතියෙනවා. සමහර විට ඒක කොණ්ඩෙට ගහලා තියෙන කොණ්ඩ කටුවකින් හිසට ඇතිවෙන සුළු තෙරපීමක් වෙන්නත් පුළුවනි. ඔබට සුබ දවසක් වේවාසන්!"

"මොනවා? ඔබ දන්නම පිටත්වෙලා යන්නද හදන්නෙ?"

"ඔව්. අපේ නිල රහස්පරීක්ෂකයාත් සමඟ ටික වෙලාවක් මං ගොඩොල්ෆින් වීථියේ ගතකරලා එන්න බලාපොරොත්තු වෙනවා. අපේ ගැටලුවට විසඳුම තියෙන්නේ එඩුවාඩෝ ලූකස් ළඟ. ඒ වුණත් මං පිළිගන්න සුදානම් ඒක මොන ආකාරයේ එකක්ද කියන එක ගැන මට අල්පමාත්‍රයක වැටහීමක් නැති බව. සෑහෙන තරම් සාක්ෂි හා නිරීක්ෂණ ලැබෙන්න කලින් උපකල්පන ගොඩනංවන්න හදන එක සම්පූර්ණයෙන්ම වැරැදියි. ඔබ එහෙනම් නිවසේ රැඳී ඉන්නවද මගේ හිතවත් මිත්‍රයා? මා හමුවන්න තවත් අමුත්තො ආවොත්, ඔවුන් පිළිගන්න වේවාසන්. පුළුවන් වුණොත් මං දවල් කෑමට එන්නම්."

එදා සම්පූර්ණ දිනයත්, ඊට පසුව එළැඹි දින දෙකේත් හෝම්ස් අමුතුම ස්වභාවයකට පත්ව සිටියේය. ඔහු කිසිවකු නුරුස්සන කිසිවක් කතාබහ කිරීමට අකමැති තත්ත්වයකට පැමිණ සිටි බව මම දුටුවෙමි. දවසට කිහිපවරක්ම නිවසින් එළියට ගිය ඔහු වැඩි ප්‍රමාදයක් නොවී ආපසු ආවේය. පයිප්ප ළං කරගෙන නොනවත්වාම දුම්පානය කරමින් කල්පනා කළේය. වරෙක වයලීනය අතට ගෙන එය වාදනය කිරීමේ යෙදුණේය. තවත් විටෙක මගේ මිත්‍රයා දවල් සිහින දකින්නෙකු මෙන් උඩ බලාගෙන ඔහේ කල්පනා කළේය. ඔහු කෑම කන පිළිවෙළේ ද වෙනසක් දකින්නට ලැබිණි. හෝම්ස් වෙලාවක් අවේලාවක් නොබලා "සැන්ඩ්විච්" විශාල ප්‍රමාණ ආහාරයට ගත්තේය. මා ඔහුගෙන් ඉදහිට ඇසූ ප්‍රශ්නයකට පවා සතුටුදායක පිළිතුරක් නොලැබිණි. මෙයින් මට වටහාගත හැකිවූයේ හෝම්ස්ගේ පරීක්ෂණ කටයුතු සාර්ථක අයුරින් සිදුනොවන බවයි. එයින් ඔහු මහත් කලකිරීමට පත්වී ඇති අයුරක් ද දිස්විය. එඩුවාඩෝ ලූකස් මහතාගේ මිනීමැරුම ගැන පවා කිසි දෙයක් මට හෝම්ස්ගෙන් දැනගන්නට නොලැබිණ. අශ්වාත් මරණ පරීක්ෂණය හා ඒ සම්බන්ධ විස්තර මා දැනගත්තේ පුවත්පතෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

ලූකස්ගේ සේවකයා වූ ජෝන් මිට්න් මුලදීම අත්අඩංගුවට ගත් බවත්, පසුව නිදහස් කරන ලද බවත් පත්‍රයේ සඳහන් විය. මරණ පරීක්ෂකවරයාගේ ජූරිය, මෙය සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් බවත්, එය නාඳුනන මිනීමරුවකු හෝ මිනීමරුවන් විසින් සිදුකරන ලද්දක් බවටත් නිගමනය කොට තිබිණි. මිනීමැරුමට හේතුව කුමක්දැයි සිතාගැනීමට අපහසු වී ඇත. එම කාමරයේ තිබී වටිනා භාණ්ඩ රාශියක් හමුවී තිබිණි. අපරාධකරු විසින් වටිනා කිසිවක් රැ ගෙන ගොස් නැති බව එයින් පැහැදිලි විය. මියගිය තැනැත්තාගේ ලිපි ලේඛන හෝ පෞද්ගලික ලියවිලි කිසිවක් අවුස්සා හෝ සොරකම් කර නොමැති බව පොලීසිය විසින් නිරීක්ෂණය කොට ඇත.

ලූකස් මහතාගේ එම ලිපිලේඛන වටිමත් ලෙස ඉතා සියුම්ව පරීක්ෂණ වලට ලක්කරන ලදී. එයින් පෙනී ගොස් ඇත්තේ, ඔහු ඉතා උද්‍යෝගයෙන් ජාත්‍යන්තර දේශපාලනය හැදෑරීමේ යෙදී ඇති බවයි. මීට අමතරව ඔහු අනුන්ගේ ඕපාදූප හාරා අවුස්සන්නෙකු බවත්, භාෂා ගණනාවක් පිළිබඳ විශේෂඥ දැනුමක් ඇත්තෙකු බවත්, අනලස්ව ලියුම් හුවමාරු කරගන්නෙකු බවත් හෙළිවිය. එහෙත් ඔහුගේ ලිපිලේඛන තුළ තිබී වැදගත් කිසිවක් හමුනොවීය. ඔහු කාන්තාවන් රාශියක් ඇසුරුකර ඇතත් ඒවා මතු පිටින් තිබූ සබඳතා මිස, ගැඹුරෙන් නොතිබූ බව පැහැදිලි විණි. මේ කාන්තාවන් අතර තරමක් සමීපව ආශ්‍රය කළ කිහිප්පදෙනෙකු සිට ඇත. නමුත් ඔවුන්ගෙන් කිසිවෙකු ලූකස් ගේ ආදරය දිනාගැනීමට සමත් වී නොමැති බව පැහැදිලිය. ඔහු හැමදාමත් දවස ගෙවා තිබුණේ එක්තරා නියවිත පිළිවෙළකටය. එය සාටවත් හිරිහැරයක් කරදරයක් ඇතිවූ එකක් නොවේ. ඒ නිසාම මේ මරණය අභිරහසක් වූ අතර අනාගතයේදී ද එය හෙළිකරගත හැකිවේ යයි සිතිය නොහැක.

ඔහුගේ සේවකයා වූ ජෝන් මිටන් පොලීසිය විසින් මුලින්ම අත්අඩංගුවට ගන්නා ලදී. ඒ ඔවුන් මිනීමැරුම සඳහා යමක් කරන බව පෙන්වීමටයි. ඔහුට විරුද්ධව කිසිම සාක්ෂියක් නොතිබූ නිසා මිටන් නිදහස් කරන ලදී. එදා රාත්‍රියේ ඔහුගේ මිත්‍රයෙකු හමුවීමට මිටන් හැමර්ස්මිත් බලා ගොස් සිටි බව සැකයකින් තොරව ඔප්පු විය. ඔහු ආපසු ඒම සඳහා හැමර්ස්මිත් වලින් පිටත්වී ඇත්තේ කල්වේලා ඇතිවයි. පොලිස් භටයා මළසිරුර සොයාගැනීමට කලින්

http://sherlockholmesinvestigations.blogspot.com

මිට්න්ට ගොඩොල්ෆින් වීථියේ නිවසට ළඟාවීමට හැකියාව තිබිණ. එහෙත් එසේ වී නැත. රාත්‍රිය ඉතා සුන්දර එකක් වූ නිසා තමා ගමනෙන් කොටසක් පයින් ඇවිදගෙන ඒමට තීරණය කළ බව මිට්න් කීවේය. එය පොඟවා කාලගුණයක් තිබූ රාත්‍රියක් බවට ඔහු පැවසූ කථාව සත්‍යයකි. ඔහු ලූකස් නිවසට ළඟාවී ඇත්තේ රාත්‍රී දොළහටයි. බලාපොරොත්තු නොවූ මෙම සිද්ධිය දකීමෙන් ජෝන් මිට්න් අපමණ කැලැඹීමකට පත්වී ඇත. ඔහු තම ස්වාමියාට දඩි ගිතවත්කමක් මෙන්ම පක්ෂපාතී බවක් ද දැක්වූ සේවකයෙකි. මියගිය ලූකස් මහතාට අයත්ව තිබූ දේවල් රැසක්, මිට්න්ගේ බඩු පෙට්ටිවල තිබී පොලීසියට හසුවිය. දලි පිහියා කිහිපයක් අඩංගු පෙට්ටියක් ද ඒ අතර විය. මේ සියල්ල ලූකස් මහතාගෙන් තමාට තෑගි වශයෙන් ලැබුණු ඒවා බව මිට්න් පොලීසියට පැවසුවේය. එය සත්‍යයක් බව ගෘහසේවිකාව විසින් පොලීසියට දෙන ලද කටඋත්තරයෙන් ඔප්පු විය. මිට්න් අවුරුදු තුනක් ලූකස් මහතා ළඟ සේවය කොට තිබිණ. කෙසේ වෙතත් ලූකස් යුරෝපා සංචාර සඳහා ගිය අවස්ථාවන්හිදී ඔහු තම සේවකයා වූ මිට්න් ඒ සඳහා කැඳවාගෙන ගොස් නැත. ලූකස් සමහර විට එක දිගට තුන්මසක කාලයක් පැරිසියේ ගතකළත්, මිට්න් ගොඩොල්ෆින් වීථියේ නිවස භාරව එහි රැඳී සිටියේය. අපරාධය සිදුවූ රාත්‍රියේ කුමක් සිදුවූවාද යන්න කීමට ගෘහසේවිකාව කිසිවක් දැන නොසිටියාය. ස්වාමියා හමුවීමට අමුත්තෙකු පැමිණ ඇත්නම්, දොර හැර ඔහු නිවස තුළට කැඳවාගන්නට ඇත්තේ ස්වාමියා විසින්ම විය යුතු බව ගෘහ සේවිකාව කීවාය.

මේ සිද්ධිය පිළිබඳව දින තුනක් තිස්සේ පුවත්පත් වල පළවූ තොරතුරු මම කියෙව්වෙමි. එහෙත් අභිරහස හෙළිවන අන්දමේ කිසිදු ලකුණක් දකින්නට නොලැබිණ. සමහර විට හෝම්ස් මීට වඩා තොරතුරු දැනසිටින්නට ඇත. එහෙත් ඔහුගේ නිහඬතාවය නිසා මට ඒ කිසිවක් දැනගන්නට නොලැබිණි. මගේ මිත්‍රයාගෙන් මට දැනගන්නට ලැබුණේ මෙම පරීක්ෂණය මෙහෙයවීම ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ අප මිත්‍ර ලෙස්ට්‍රේඩ්ට භාරවී ඇති බවයි. සිදුවන හැම දෙයක් ගැනම ඔහු තම අවධානය යොමු කරගෙන සිටි බැව් මම දැන සිටියෙමි. හතරවැනි දිනයේ උදෑසනයේ පැරිස් නුවර සිට ලන්ඩනයට ලැබුණු දීර්ඝ විදුලිපුවතකි. එයින් මේ

පැටලුනු අවුල ලිහෙන ලකුණු මතුවිය. මේ ඩේලිටෙලිග්‍රාෆ් පුවත්පතේ පළවූ එම පුවෘත්තියයි.

"පසුගිය සඳුදා රාත්‍රී ගොඩොල්ෆින් වීථියේ නිවසේදී ඛේදජනක ලෙස මියගිය එඩුවාඩෝ ලූකස් මහතාගේ මරණයේ අභිරහස හෙළිවන හෝඩුවාවන් සොයා ගැනීමට පැරිස් පොලීසිය සමත්වෙයි. ලූකස් මහතා ඔහුගේ කාමරය තුළ පිහියෙන් ඇණ මරාදමා තිබී හමුවූ බව අපේ පාඨකයනට මතක ඇතුවා නිසැකය.

පැරිස් නුවර ඔස්ටර්ලිට්ස් මාවතේ කුඩා නිවසක පදිංචිව සිටි හෙන්රි ෆුනායේ මහත්මිය, සිහිවිකල් භාවයට පත්වී ඇතැයි ඇගේ සේවකයින් විසින් පොලීසියට දැනුම් දී ඇත. වැඩිදුර පරීක්ෂණ කිරීමේදී පෙනී ගියේ මෙම කාන්තාව සුවකළ නොහැකි අන්දමේ බරපතල උමතු තත්ත්වයකට පත්වී ඇති බවයි. තවදුරටත් සොයා බැලීමේදී හෙන්රි ෆුනායේ මහත්මිය පසුගිය අඟහරුවාදා ලන්ඩන් නගරයේ සිට ආපසු පැරිසියට පැමිණ ඇති බව පොලීසියට හෙළිවිය. මීට අමතරව වෙස්මින්ස්ටර්හි සිදුවූ අපරාධයට ඇය සම්බන්ධ බව හෙළිකරන සාක්ෂි ද හමුවී ඇත.

ඇගේ ස්වාමිපුරුෂයා වන හෙන්රි ෆුනායේ මහතාගේ ඡායාරූප ද පොලීසියේ අවධානයට ලක්විය. හෙන්රි ෆුනායේ සහ මියගිය එඩුවාඩෝ ලූකස් යනු එකම පුද්ගලයා බව ඡායාරූප වලින් ඉතා පැහැදිලි ලෙස ඔප්පු වේ. මියගිය තැනැත්තා කුමන හේතුවක් නිසා හෝ වෙනස් පුද්ගලයින් දෙදෙනෙකු ලෙස පැරිසියේ හා ලන්ඩනයේ ජීවත්වී ඇත.

ෆුනායේ මහත්මිය යුරෝපීය හා නීග්‍රෝ මිශ්‍ර සම්භවයක් ඇති කාන්තාවකි. ඇය ස්වභාවයෙන්ම දරුණු, සුළු දෙයින් පවා අතිශයින්ම කෝපයට පත්වෙන තැනැත්තියක බව අසන්නට ලැබේ. පසුගිය කාලයේදී ඇය, තදබල ඊර්ෂ්‍යාව නිසා ඇතිවන මානසික රෝගයකට ගොදුරු වී, සිහිවිකල් ගතියෙන් පසුවූ බවට සාක්ෂි ඇත. මුළු ලන්ඩනයම කැළඹූ මේ දරුණු අපරාධය ඇය අතින් සිදුවී ඇත්තේ එවැනි උන්මත්තක තත්ත්වයකින් යයි විශ්වාස කෙරේ.

සඳුදා රාත්‍රියේ ඇයගේ ක්‍රියා කලාපය කෙබඳු මගක් ගත්තේ දැයි තවමත් හරිහැටි සොයාගෙන නොමැත. එහෙත් ඇගේ පෙනුමට සැසඳෙන කාන්තාවක් අඟහරුවාදා උදේ චාරිං ක්‍රොස් දුම්රිය පොළේදී

http://sherlockholmesinvestigations.blogspot.com

හැසිරුණු පිළිවෙළ නිසා කාගේත් විමසුමට ලක්ව ඇත. එක්කෝ ඇය සිහිවිකල් ගතියෙන් මෙ අපරාධය සිදු කළා විය යුතුය. එසේත් නැත්නම් මෙ අපරාධය තමා අතින් සිදුවීම නිසා ඇයගේ සිහි විකල් වූවා විය යුතුය. සිදුවූයේ කුමක්ද යන්න විස්තර කිරීමට තරම් යහපත් මානසික තත්ත්වයක් තවමත් ඇයට නොමැත. ඇයගේ ස්වභාවය සුව අතට හැරේවි යයි වෛද්‍යවරුන්ගේ විශ්වාසයක් ද නැත. සඳුදා රාත්‍රි ගොඩොල්ෆින් වීථියේ නිවස ගැන සෝදිසියෙන් සිටි ස්ත්‍රියක් ගැන ඇසින් දුටුවන්ගේ සාක්ෂි ද ලැබී ඇත. මේ ෆුනායේ මහත්මිය යයි විශ්වාස කෙරේ."

"ඔබ මොනවද හෝම්ස් මේ ගැන කියන්නෙ?" මා ඇසුවේ මේ විස්තරය මගේ මිත්‍රයාට ඇසෙන සේ ශබ්ද නගා කියවීමෙන් පසුවයි. මගේ විස්තරයට සවන් දෙන අතරේ හෝම්ස් උදේ ආහාරය ගනිමින් සිටියේය.

"මගේ හිතවත් වොට්සන්. සිද්ධවෙලා තියෙන්නේ මොකක්ද කියල දැනගන්න ඔබ ඉන්නේ හරිම නොඉවසිල්ලෙන්. ඒ බව මං හොඳාකාරවම දන්නවා. පහුගිය දවස් තුනේදීම මං ඔබට කිසිම දෙයක් නොකිව් බව ඇත්තයි. ඒ මොකක් වත් නිසා නෙමෙයි. ඇත්තෙන්ම ඔබට කියන්න තරම් වැදගත් කිසිම දෙයක් තිබුණෙ නැහැ. පැරිසියෙන් ලැබිල තියෙන මේ වාර්තාවෙනුත් අපට ඒ හැටි ප්‍රයෝජනයක් නෑ."

"ඒ වුණත් ලූකස්ගේ මරණය සිදුවුණු ආකාරය ගැන නම් මේකෙන් අවසන් තීන්දුවක් ලැබෙනවා. එහෙම නේද?"

"ලූකස් ගේ මරණය කියන්නේ, මේ සිදුවීම් දාමයේ එක් සිදුවීමක් පමණයි. ඒක සුළු සිද්ධියක්. මං එහෙම කියන්නේ ඇයි කියල දන්නවද වොට්සන්? යුරෝපා මහාද්වීපය හරහා පැතිර යා හැකි මහා සංග්‍රාමයක් - ලක්ෂ සංඛ්‍යාත මනුෂ්‍යයින් ඝාතනයට ලක්විය හැකි මහා විනාශයක් වැළැක්වීමේ කාර්යය අපේ පිට පැවරී තියෙනවා. ඒ සඳහා අපි ලියවිල්ල සොයා ගත යුතුයි. ඒ හැරුම් රාජකාරියේ අතරමග දකින්න ලැබෙන සුළු සිදුවීමක් තමයි ලූකස්ගේ මරණය. පසුගිය දවස් තුනේදීම සිදුවූ වැදගත්ම දෙය තමා කිසිදෙයක් සිදුනොවීම. රජයේ ඉහළම බුද්ධි අංශයෙන් මා වෙත පැයෙන් පැයට රහස්‍ය වාර්තා ලැබෙනවා. මා වෙත ඒ

වීටියට දන්වන්නේ යුරෝපය පුරා රට රටවල, ප්‍රධාන නගරවල අලුත්ම තත්ත්වය. ඒ නොහේවත් මොන අන්දමක හෝ කලබලයක් ඇති බවට සලකුණක් නැහැ; යුද්ධයක් ඇතිවීමේ කිසිම පෙරනිමිත්තක් නැහැ.

මේ රහස් ලියමන, එය ගත් පුද්ගලයාගේ ග්‍රහණයෙන් නිදහස් වුණාද? නෑ. ඒක නිදහස් වුණා වෙන්න බෑ. එහෙම නොවුණා නම් ඒක තියෙන්න ඕන කොහේද? කවුරු ළඟද තියෙන්නෙ? ඇයි ඒක නිදහස් කරන්නෙ නැතුව හංගාගෙන ඉන්නෙ? ඔන්න ඔය ප්‍රශ්න වලට විසඳුම් හොයාගන්න බැරිව තමයි මං මේ දුකට්විඳින්නෙ. ඔය ප්‍රශ්න ගැන හිතන්න හිතන්න ඒවා ආපසුත් කුරුගෙඩි පහරවල් වගේ මගේ මොළේට එල්ල වෙනවා. ලියුම අතුරුදන් වුණු දවසේ, එම රාත්‍රියේම ලූකස් මැරුම්කෑව එක අහම්බෙන් සිද්ධවුණු දෙයක්ද? ලියුම ඔහු අතට ලැබුණාද? එහෙනම් ඇයි ඒක ඔහුගේ කඩදාසි අතර නැත්තේ? ඔහුගේ මේ පිස්සු බිරින්දෑ ඒ ලියුම අරගෙන ගියාවත්ද? එහෙම නම් ඒක ඇත්තෙ ඇගේ පැරීසියෙ ගෙදරද? ප්‍රංශ පොලීසියේ සැකයට ලක්නොවී මං කොහොමද ඒ ගෙදර සෝදිසියට ලක් කරන්නෙ?

මේක හරියට සංකීර්ණ, ඒ වගේම සුවිශේෂ පරීක්ෂණයක් වොට්සන්. මේකෙදි නීතිය අපරාධකරුවන්ට විරුද්ධයි. ඒ වගේම අපටත් විරුද්ධයි. හැම තැනකින්ම අත් එසවෙන්නේ අපට එරෙහිව; අපට බාධාකරන්න. නමුත් කෙසේ හෝ මේ අභියෝගය ජයගත හැකි නම්, ඒක මහ යෝධ ජයග්‍රහණයක්. මේ ගැටලුව මං සාර්ථක ලෙස විසඳුවොත්, ඒක මගේ වෘත්තියේ මගේ ඔටුනු පැළඳීම වෙනවා. . . . . . ආ. . . . . . මෙන්න යුද පෙරමුණෙන් මට ලැබෙන අලුත්ම ආරංචි."

ඔහුට ලැබුණු කෙටි පණිවුඩය හෝම්ස් ඉක්මනින් කියෙව්වේය.

"හෝ හෝ! ලෙස්ට්‍රේඩ් වැදගත් යමක් නිරීක්ෂණය කරල වගෙයි. හිස්වැස්ම දාගන්න වොට්සන්. අපි වෙස්ට්මින්ස්ටර් පැත්තට ටිකක් ඇවිදල එමු."

අපරාධය සිදුවූ තැනට මා ගිය මුල්ම වතාවයි ඒ. බුල්ඩෝග් සුනඛයෙකුගේ පෙනුම තිබූ ලෙස්ට්‍රේඩ් ජනේලයෙන් අප එන දෙස බලා සිටිනු දුටුවෙමු. උස මහත පොලිස් භටයෙකු අප වෙනුවෙන්

http://sherlockholmesinvestigations.blogspot.com

දොර විවෘත කළේය. අප ඇතුළට පිවිසුණු පසු ලෙස්ට්‍රේඩ් පැමිණ, ආචාර කොට අප පිළිගත්තේය.

මිළඟට අපරාධය සිදු වූ කාමරය වෙත අප කැඳවාගෙන යන ලදී. එක් සලකුණක් හැරෙන්නට, මිනීමැරුමක් සිදු වූ බව හඟවන කිසිදු ලකුණක් කාමරයේ ඉතිරි වී නොතිබිණ. තවමත් ඉතිරිව තිබූ ලකුණ වූයේ, එළා තිබූ බුමුතුරුණේ වූ විශාල ලේ පැල්ලමයි. මේ තරමක් ලොකු බුමුතුරුණු කැබැල්ල එළා තිබුණේ කාමරයේ මැදට වන්නටයි. පොළොව නැනීමට යොදාගත්, හොඳින් ඔප දැමූ සමචතුරශ්‍රාකාර දව කැබලි, බුමුතුරුණෙන් නොවැසුණු කොටසේ දකිය හැකි විය. ගිනි උදුනට ඉහළින් බිත්තිය පුරා, නොයෙක් රටවල භාවිත කෙරෙන, නොයෙක් ආකාරයේ ආයුධ ප්‍රදර්ශනය කෙරිණි. එදා රාත්‍රියේ මිනීමැරුම සඳහා යොදාගෙන තිබුණේ ද මින් එකකි.

ජනේලය සමීපයේ විශාල ලියන මේසයක් විය. මෙම නිවසේ තිබූ සෑම චිත්‍රයක්ම, කලාල, තිරරෙදි ආදී සෑම සැරසිල්ලක්ම සුඛෝපභෝගී දිවියක ලක්ෂණ පෙන්නුම් කළේය. එපමණක් නොව නිවස සරසා තිබූ ආකාරය කෝපමණ අලංකාර හා විචිත්‍ර වීද යත්, ඒවා කාන්තා අතකින් සැලසුම් කළ අයුරක් දිස්විය.

"පැරිසියෙන් ආව, ප්‍රවෘත්තිය කියවන්න ලැබුණද?" ලෙස්ට්‍රේඩ් ඇසීය.

හෝම්ස් හිස සෙලවූයේ, එය දුටු බව හඟවමිනි.

"අපේ ප්‍රංශ මිත්‍රයො මේ සැරේ නම් හරි පොට අල්ලාගෙන, කිසිම සැකයක් නෑ. ඔවුන් කියන විධියටම තමයි මේක සිදුවෙන්න ඇත්තෙ. ඇය දොරට තට්ටු කළා. ඇය ආවේ කලින් නොදන්වා හදිසියේම. ඔහුට හංගගන්න ක්‍රමයක් තියෙන්න නැහැ. ඇයට පාරේ ඉන්න අරින්න විධියකුත් නැති නිසා, ඔහු ඇයව ගේ ඇතුළට ගත්තා. ඇය කියන්න ඇති ඇයට දැනගන්න ලැබුණු කාරණය. ඒ ගැන ඔහුට බනින්න ඇති; තර්ජනය කරන්න ඇති, අපහාස කරන්න ඇති. කථාව දුරදිග ගියා. ඇය බිත්තියේ තිබුණු කිණිස්සක් ඇදල අරගෙන ඔහුට අනින්න ඇති. මේක එක මොහොතකින් සිදුවුණු දෙයක් වෙන්න බෑ. ඒ මොකද අප පුටු ඔක්කොම කාමරයේ එක් කෙළවරකට අයින් කරලයි තියෙන්නේ.

ඇය පිහිය අරගෙන අනින්න එනකොට, ඒක වළක්වන්න මහු පුටුවක් ඔසවලා අරගෙන තියෙනවා. නමුත් ඒකෙන් ප්‍රයෝජනයක් වෙලා නැහැ. දන් අපට කාරණා ඔක්කොම පැහැදිලිව ලැබිල තියෙනවා. සිද්ධිය බලාගෙන හිටිය වගේ විස්තරේ කියන්න පුළුවනි."

හෝම්ස් මහුගේ දෙබැම ඉහළට එසවූයේ විස්මිය පළකරන්නාක් මෙනි.

"ඒ වුණත් ඔබ මට එන්න කියල පණිවුඩයක් එවා තිබුණා?"

"ආ ඔව්. ඒ තවත් දෙයක්. ඒක නම් බොහොම සුළු එකක්. අර ඔබේ සිත්ගන්නා, ඔබ හරි අපුරුයි කියල හඳුන්වන තාලේ එකක්. නමුත් ප්‍රධාන සාක්ෂිවලට මේකෙන් කිසිම බලපෑමක් නෑ."

"මොකක් ගැනද ඔබ මේ කියන්නෙ?"

"ඔබ දන්නවා අපරාධයක් සිදුවුණු තැනක තිබුණු දේවල් ඒ හැටියටම තබාගන්න අපි හුඟාක් පරෙස්සම් වෙනවා. මෙතැන කිසිම දෙයක් අපි එහාට මෙහාට කළේ නෑ. ඊයේ රෑ දවල් දෙකේම පොලිස් භටයෙක් මෙතැන මුරට හිටියා. අද උදේ ලූකස්ගේ මළසිරුර භූමදාන කළා. මේ කාමරයට අදාළව පරීක්ෂණයත් එතැනින් අවසන් වුණා කියමුකො. ඉතින් අපි හිතුවා මේ කාමරය ටිකක් පිරිසිදු කර දමන්න. ඔබට පෙනෙනවා නේද මේ බුමුතුරුණ. මේක ඇණ ගසා ලෑලි පොළොවට සවිකරලා නැහැ. ඉතින් අපි බුමුතුරුණු කැබැල්ල පොළොවෙන් ඉහළට එසෙව්වා. අපට දකින්න ලැබුණේ. . . ."

"මොනවා? මොනවද ඔබට දකින්න ලැබුණේ?" හෝම්ස්ගේ මුහුණේ පළවූයේ අතිශය කැලැඹීමට පත් ස්වභාවයකි.

"හෝම්ස් මහත්මයා. ඔබ අවුරුදු සීයක් තිස්සේ කල්පනා කළත් අපි හොයා ගත්තේ මොකක්ද කියලා නම් හිතාගන්න වත් බැරිවේවි.

ඔබට පෙනෙනවා නේද මේ බුමුතුරුණ මත ලොකු ලේ පැල්ලමක් තිබෙනවා. විශාල ලේ ප්‍රමාණයක් මේ බුමුතුරුණට උරාගෙන, ලේ කොටසක් එහා පැත්තට පෙරෙන්න ඇති. එහෙම නේද?"

"කිසි සැකයක් නෑ. බුමුතුරුණ හරහා පෙරුණු ලේ වලින් යටින් තිබූ ලෑල්ලත් පෙඟී යන්න ඇති."

http://....blogspot.com



195. "ඔබට පෙනෙනවා නේද මේ බුමුතුරුණ මත ලොකු ලේ පැල්ලමක්?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නමුත් ඔබ පුදුමවේවි මේක අහලා. බුමුතුරුණේ ලේ පැල්ලමට හරියට යටින් තියන සුදු පාට ලෑල්ලේ කිසිම ලේ පැල්ලමක් නැහැ."

"කිසිම පැල්ලමක් නැහැ? ඒක වෙන්නෙ කොහොමද? ලේ පැල්ලමක් ලෑල්ලේ තිබිය යුතුමයි. . . ."

". . . .ඔබ එහෙම කියාවි. නමුත් ඇත්තටම එවැනි කිසිවක් නැහැ. ඔන්න බලන්න."

බුමුතුරුණ එක් කෙළවරකින් එසවූ ලෙස්ට්‍රේඩ්, තමා පැවසූ කරුණ සම්පූර්ණ සත්‍යයක් බව අපට පෙන්වා දුන්නේය.

"නමුත් බුමුතුරුණේ යටපැත්තෙත්, උඩපැත්තෙ වගේම උරාගත් ලේ විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒකෙන් බිම් ලෑල්ල මත වූ පැල්ලමක් අනිවාර්යයෙන්ම තිබිය යුතුමයි."

හෝම්ස් පැවසුවේ ප්‍රහේලිකාවකට මැදිවූ අයුරෙනි.

මේ සුප්‍රසිද්ධ රහස් පරීක්ෂකයාට ගැටලුවක් මතු කිරීමට තමන් සමත්වීම ගැන ලෙස්ට්‍රේඩ් හඬනගා සිනාසුණේය.

"හොඳයි හෝම්ස් මහත්මයා. දැන් මම පෙන්වන්නම් ඒකට හේතුව. ලෑලි පොළොව මත ලේ පැල්ලමක් තිබෙන බව ඇත්තයි. නමුත් ඒක තිබෙන්නේ බුමුතුරුණේ ලේ පැල්ලම තිබෙන තැනට හරියටම යටින් නොවෙයි; ඊට අනුරූප තැන නොවෙයි. වෙනත් තැනක. ඔබම බලන්න."

එසේ කිව ලෙස්ට්‍රේඩ් බුමුතුරුණ වෙනත් කෙළවරකින් ඉහළට එසෙව්වේය. ඔහු පැවසූ අයුරින්ම, සුදු පැහැති ලෑල්ලට ලේ උරාගැනීමෙන් ඇතිවූ රතු පැහැති පැල්ලමක් තවත් තැනක තිබිණි.

"හෝම්ස් මහත්මයා. ඔබට ඒකෙන් හිතාගන්න පුළුවන් මොකක්ද?"

"ඒක බොහොම සරල දෙයක් ලෙස්ට්‍රේඩ්. මේ බුමුතුරුණ සම චතුරශ්‍රාකාර, ඒ කියන්නේ හරි හතරැස් එකක්. මුලින් මිනීමැරුම සිද්ධවුණු වෙලාවෙ බුමුතුරුණට උරාගත් ලේ, ඒකෙන් යටට පෙරිලා, ලෑල්ලට උරාගෙන ඒ මත සලකුණක් ඇතිවුණා. නමුත් බුමුතුරුණේ ලේ වියළුණාට පස්සේ ඒක ඉවතට අරගෙන, ආයෙමත් බිම එලලා තිබෙනවා. මේක හරිහතරැස් එකක් නිසා, දෙවැනි වර එළද්දී,

http://sherlockholmesinvestigations.blogspot.com

කලින් තිබුණු ආකාරයට නෙමෙයි වෙනත් අයුරකින් වැටිල තියෙන්නේ."

"බුමුතුරුණ ඒ විධියට කැරකිලා වැටුණු බව පොලීසියට කියන්න, ඔබතුමා අවශ්‍ය නැහැ හෝම්ස් මහත්මයා. ඒක බොහොම පැහැදිලි කරුණක්. නමුත් මට දැනගන්න උවමනා, කවුද මේ විධියට බුමුතුරුණ වෙනස් විධියට එළෙව්වේ? ඇයි එහෙම කළේ, මොන අරමුණකින්ද?"

අලුත් සොයාගැනීම නිසා ඇතිවූ අප්‍රමාණ අදහස්වලින් හෝම්ස්ගේ සිත සසල වී ඇති බැව් මම වටහාගතිමි.

"මේ අහන්න ලෙස්ට්‍රේඩ්. කවුද මෙතැන රාජකාරි කළ පොලිස් භටයා? ඔහු මෙතැන් හරියට මුර කළාද ය දවල් දෙකේම?"

"ඔව්?"

"මගේ මේ අවවාදෙ පිළිඅරගෙන ඔහුගෙන් හොඳින් ප්‍රශ්න කරල බලන්න ලෙස්ට්‍රේඩ්. ඒක අපි දෙන්න ඉදිරියේ කරන්න එපා. අපි මේ කාමරයේ මෙහෙම ඉන්නම්. ඔබ ඒ මිනිහට ගේ පිටුපස කාමරයකට අරගෙන ගිහිං තදින් ප්‍රශ්න කරන්න. අවට වෙන කවුරුත් නැත්නම්, ඔහුගෙන් පාපෝච්චාරණයක් ගතහැකි වේවි. අහන්න, ඔහු භය නැතිව පිට මිනිසුන්ට මේ කාමරේට එන්න ඉඩඇරල අහකට ගියේ ඇයි කියල. මෙතැනට කවුරු හරි ඇවිත් ගිය බව ඔබ හොඳාකාරවම දන්නව කියන්න. ඔහුට බුරුලක් දක්වන්න එපා. ඔහුට සමාවක් ලබාගන්න තියෙන එකම ක්‍රමය, සම්පූර්ණ පාපෝච්චාරණයක් කිරීම බව අවධාරණය කරන්න. කිසි වෙනසක් නැතිව මං කියූ අයුරින් මේක වහාම කරන්න!"

"දෙයියම්පා! උං මොනවා හරි දන්නවා නම් මං දන්නවා ඔක්කොම උගෙන් එළිකරගන්න හැටි." කියූ ලෙස්ට්‍රේඩ් කාමරයෙන් පිටවිය. මීළඟට ඔහු උස් හඬින් පොලිස් භටයාගෙන් ප්‍රශ්න කරන අයුරු නිවසේ පිටුපස කාමරයක් දෙසින් අපට අසන්නට ලැබිණි.

"ඉක්මන් කරන්න වොට්සන්, ඉක්මන් කරන්න!" හෝම්ස් කෑගැසුවේ නොඉවසිල්ලෙනි.

පොළොව දෙසට පහත් වූ ඔහු බුමුතුරුණ ඉවත් කළේය. මීළඟට බිම දණගසාගෙන පොළොව සැදීමට යොදා තිබූ, හතරැස් හෝ හතරැස් අඩි කැබලි, ඇඟිලිතුඩු වලින් ඉවතට අදිමින්, ගැලවීමට

උත්සාහ කලේය. එක් ලෑල්ලක් ඉවතට පැන්නේ දුන්නෙන් සවිකළ පියනක් විවෘත වන ආකාරයටයි. එවිට පොළොවේ අඳුරු පැහැති කුඩා කුටියක් දක්නට ලැබිණි. ඒ තුළට අත දමා, හෝම්ස් ඒ මේ අත පහුරු ගෑ නමුත් ඔහුට කිසිවක් හසුනොවීය. එය හිස් කුටියක් විය. හෝම්ස්ගේ මුවෙන් නිකුත් වූයේ බලාපොරොත්තු කඩවූ හඬකි.

"ඉක්මනට ඒක ආපහු දාමු වොට්සන්!"

ලෑලි පියන එපා දමා බුමුතුරුණු ආපසු සකස් කළා පමණි. බරාඳය දෙසින් ලෙස්ට්‍රේඩ්ගේ කටහඬ ඇසිණි.

"ඔබ රස්තියාදු කරන්න සිදුවීම ගැන මට කණගාටුයි හෝම්ස් මහත්මයා. මිනිහා පාපොච්චාරණයක් කළා නොවැ. . . . . . මෙහෙට එනවා මැක්ෆර්සන්. තමුසෙගෙ ක්‍රියාකලාපය නම් කිසිසේත් සමාවක් දෙන්න බැරි එකක්. මේ මහත්තුරුන්ටත් ඇහෙන්න කියනවා තමුසෙ කරපු දේ."

කළ වැරැද්දක් නිසා ලැජ්ජාවෙන් පසුතැවිලි වන බවක් පෙන්වූ උස මහත පොලිස්භටයා, කාමරය තුළට ආවේ බයාදු ගතියෙනි.

"ඒකෙන් වැරැද්දක් වේවි කියලා මං හිතුවෙ නැහැ මහත්මයා. මේ ඇත්තමයි. ඊයෙ හැන්දෑවෙ තරුණ ගෑනු කෙනෙක් මේ ගෙදර දොර ළඟට ආවා. ඈය වෙන ගෙදරක් හොයාගෙන යන ගමන්, එතැන හොයම්මරේ වැරදිලයි මෙහාට ආවෙ. ඇවිත් මා එක්ක කතාවට වැටුණා. දවස තිස්සෙම මෙතැන ඉන්නකොට හරි පාළුවක් දැනෙනවනෙ මහත්මයා. . . ."

". . . . ඉතින්? ඉතින් මොකද වුණේ?"

"ඈයට උවමනා වුණා මිනීමැරුම සිද්ධවුණේ කොහේද කියල බලන්න. ඈය කිව්වා, ඈය පත්තරේ කියෙව්වලු මේ අපරාධය ගැන. ඈය බොහොම වැදගත් පවුලක නෝනා කෙනෙක් වගෙයි පේනුණේ. කතාබහ කළ හැටියෙනුත් මට ඒක හොඳට වැටහුණා. ඉතින් ඈයට පොඩ්ඩක් කාමරේට එබිලා බලන්න ඉඩදීමේ වරදක් නැහැ කියලයි මට හිතුණේ.

ඈය කාමරේ ඇතුළට ඇවිත් ලේ පැල්ලම දක්කා විතරයි ක්ලාන්ත වෙලා බිම ඇද්දගෙන වැටුණා. මං බලන කොට මේ ගෑනි මැරිලා වගෙයි. කිසිම හැළ හොල්මනක් නෑ. මං ඉක්මනට ගේ පිටිපස්සට දුවලා ගිහින් වතුර වීකක් අරගෙන ඇවිත් මුහුණට



 ලැල්ලක් ඉවතට ඇන්නේ දුන්නෙන් සවිකළ පියනක් මෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

ඉස්සා. කිසි වැඩක් වුණේ නෑ. ඇයට සිහිය ආවෙ නෑ. ඉතින් මං ඉක්මනට ගෙයින් එළියට බැහැලා අර "අයිවි ප්ලාන්ට්" කියන තැබෑරුමට දිව්වා, බ්‍රැන්ඩි ටිකක් ගේන්න. මං බ්‍රැන්ඩි ටික අරගෙන මෙහෙට එද්දි ඒ නෝනට සිහිය ඇවිත්. ඇයට හරි ලැජ්ජයි. කොච්චර ලැජ්ජද කියනව නම් මට මුහුණවත් හරි හැටි පෙන්වන්නෙ නැතුව යන්න ගියා."

"මේ බුමුතුරුණු එහා මෙහා කළේ ඇයි?" හෝම්ස් ඇසීය.

"මං බ්‍රැන්ඩි අරගෙන ආපහු ඇවිත් බලනකොට බුමුතුරුණු රැළි ගැහිලයි තිබුණෙ. බුමුතුරුණු ඇණ වලින් ලෑල්ලට සවිකරලා නැහැනෙ. අර නෝනා සිහිනැතුව වැටෙද්දි ඒක ඔපදැමූ ලෑල්ල උඩ ලිස්සා යන්න ඇති. ඒකෙන් බුමුතුරුණු රැළිවැටිලා තිබුණා. ඉතින් මං ඒක හරි ගැස්සුවා."

"මේක තමුසෙට හොඳ පාඩමක් මැක්පර්සන්. කාව රැවැට්ටුවත්, මාව රවට්ටන්න බැරි බව තේරුම් ගන්නවා."

ලෙස්ට්‍රේඩ් කීවේ ආඩම්බරයෙනි. "තමුසෙ හිතුවේ තමුසෙ රාජකාරිය නියම විධියට නොකළ බව මට අහුවෙන එකක් නැහැ කියල නේද? තමුන් බුමුතුරුණු දිහා බැලූ ඒක බැල්මෙන්ම මට තේරුම් ගන්න පුළුවන් වුණා කවුරු හරි මේ කාමරයට ඇවිත් තියෙන බව. මෙතැනින් මොකවත් අතුරුදන් වෙලා නැත්තේ තමුසෙගෙ හොඳ වාසනාවකට කියල හිතාගන්නවා. එහෙම වුණා නම් තමුසෙ ලොකු අමාරුවක වැටෙනවා. මේ වගේ සුළු ප්‍රශ්නයක් ගැන ඔබට කරදර කරන්න සිදුවීම ගැන මට කණගාටුයි හෝම්ස් මහත්මයා. මං හිතුවේ බුමුතුරුණේ පළමුවැනි පැල්ලම, පොළොවේ දෙවැනි පැල්ලමට අනුරූපව නොතිබීම, ඔබේ සිත් ඇදගන්නා කරුණක් වේවි කියලයි."

"සත්තකින්ම එයාම තමයි. ඒක හරිම සිත් ඇදගන්නා කරුණක්. මේ කාන්තාව මෙතැනට ආවේ එකම වාරයක් විතරද මැක්පර්සන්?"

"ඔව් මහත්මයා. එකම සැරයක් පමණයි."

"ඇය කවුද?"

"මම ඇගේ නම නම් දන්නෙ නෑ මහත්මයා. යතුරු ලියන වැඩකටයුතු සඳහා කාන්තාවක් සොයන බවට දැන්වීමක්

තිබුණාලු. ඒ ලිපිනය සොයමිනුයි ඇය ආවේ. ඇයට ඒ ගෙදර අංකය වැරදිලා. පෙනුමෙන් හැඩයි. තරුණ ගැහැනු කෙනෙක්."

"උසයි? හොඳ ලක්ෂණයි?"

"ඔව් මහත්මයා. හැදුණු වැඩුණු ගැහැනියක්. ඔබ කියන්න වගේ ලක්ෂණයි කියලත් කිව්ව හැකි. බාගවෙලාවට කවුරු හරි කියාවි බොහොම ලස්සණයි කියල. ඇය කිව්වා. . . .

"අනේ පොලිස් කොස්තාපල් මහත්තයෝ, මට පොඩ්ඩක් ඒ කාමරේට එබිල බලන්න ඉඩදෙන්න" කියල.

ඇගේ තිබුණා බොහොම හරි තමුන්ගේ අරමුණ ඉටුකරගන්නා ගතියක්. ටිකක් කපටියි කිව්ව හැකි. ඉතින් මං හිතුවා ඇයට ටිකක් කාමරේට ඔලුව දාල බලන්න ඉඩදීමේ වරදක් නැහැ නේද කියලා."

"ඇය කොහොමද හැඳ පැළඳ ගෙන හිටියේ?"

"බොහොම වාම් දිග ඇඳුමක්."

"මේක වුණේ කීයට විතරද?"

"ඇඳිරි වැටීගෙන එන වෙලාවෙයි මහත්මයා. මං බ්‍රැන්ඩි ටික අරගෙන එද්දී කැබැරුමේ අය පහන් දල්වන්න සූදානම් වෙනවා."

"බොහොම හොඳයි" හෝම්ස් පිළිතුරු දුන්නේය. "එහෙනම් අපි යමු වොට්සන්. අපටත් අප්‍රමාණ වැඩ තියනවා ගත කරන්න."

අප එම නිවසින් පිටත්වීමට සූදානම් වෙද්දීත් ලෙස්ට්‍රේඩ් අපරාධය සිදුවූ කාමරය තුළම රැඳී සිටියේය. දොර විවෘතකොට අපට පිටත්ව යෑමට ඉඩ සැලසීමට ඇම්නීයේ තරමත් පසුතැවෙමින් සිටි පොලිස් භටයාය.

දොර විවෘත කළ සනු පහළ අරප්පුවට අඩියක් තැබූ හෝම්ස් ආපසු හැරුණේය. සාක්කුවෙන් යමක් අතට ගත් ඔහු, එය පොලිස් භටයා දෙසට හැරෙව්වේය. මැක්ෆර්සන් ඒ දෙස දෑස් විශාල කරගෙන බලා සිටියේ මවිතයෙනි.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ!" ඔහුට පුදුමයෙන් කෑගැසිණ.

තම මුව හරහා දබරැඟිල්ල තබා සංඥාවක් කළ හෝම්ස්ගේ දුරත ගියේ නැවතත් එම සාක්කුව වෙතයි.

වීපීයේ මඳක් දුර අප ඉදිරියට යද්දී මගේ මිත්‍රයා කොක්හඬලා සිනාසීමට පටන්ගත්තේය.

"අති විශිෂ්ටයි! වොට්සන් මගේ මිත්‍රයා. නාට්‍යයේ අවසන් ජවනිකාව රහදක්වීමට දන් සියල්ල සූදානම්. මන්න ඒ සඳහා සීනුව නාද වෙනවා මට ඇහෙනවා. ඔන්න තිරය විවෘත වෙන්නයි යන්නේ.

යුරෝපයේ ඇරඹීමට ඉඩ තිබූ මහා සංග්‍රාමය ඇති නොවන බවට සහතිකයි. ඒක අහන එකත් ඔබට ලොකු සැනසීමක් වේවි. අතිගරු ට්‍රිලෝනි හෝප් මහතාට ඔහුගේ වෘත්තියේ ඉහළට යන්න බාධාවක් ඇතිවෙන්නෙත් නෑ. බ්‍රිතාන්‍යයට අර ලියුමක් එවූ රාජ්‍ය නායකයාට හිරිහැරයක් වෙන්නෙත් නෑ. අගමැතිතුමා විසින් විසඳිය යුතු උග්‍ර ප්‍රශ්නයක් යුරෝපා මහාද්වීපයේ ඇතිවෙන්නෙත් නෑ. බොහොම අප්‍රසන්න සිදුවීමක් විය හැකිව තිබූ දෙයක්, අපි ටිකක් උපක්‍රමශීලී වුණොත් විසඳන්න පුළුවනි, කාටවත් එක පැන්සයක් හෝ පාඩු නොවෙන විධියට."

මේ විශිෂ්ට ගණයේ අපරාධ පරීක්ෂකයාගේ ක්‍රියා ශූරත්වය පිළිබඳව මගේ සිතට නැඟුණේ වචනයෙන් විස්තර කළ නොහැකි ගෞරවයකි.

"ඔබ ඒක විසඳුවා එහෙනම්?"

"තවමත් ඉවර නෑ වොට්සන්. ඒ හැටි පැහැදිලි නැති, අඳුරු තැන් කීපයක් තවමත් තියෙනවා. කොහොම වුණත් අපි දන්නා ප්‍රමාණයේ හැටියට ඉතුරු ටික විසඳාගන්න බැරිවුණොත් ඒක අපේ වැරැද්ද. අපි කෙළින්ම යමු වයිට්හෝල් ටෙරසයට. ගිහින් මේක කෙළවරක් කරමු."

අපි යුරෝපීය ලේකම්වරයාගේ මන්දිරය වෙත ළඟාවීමු. එහෙත් සීනුව නාද කළ හෝම්ස් දන්වා සිටියේ, තමාට හිල්ඩා ට්‍රිලෝනි හෝප් ආර්යාව දකීමට අවශ්‍ය බවයි. උදෑසන කාමරය වෙත අප කැඳවාගෙන යන ලදී.

"හෝම්ස් මහත්මයා!" අප වෙත පැමිණි ආර්යාව කීවේ කෝපයෙන් රතුවුණු මුහුණෙනි.

"මේක හරිම අකරුණාගාවන්ත, අසාධාරණ වැඩක් මහත්මයා. මං ඔබට එදා කිව්වා, මං ඔබ හමුවෙන්න ආ බව රහසක් ලෙස

තියාගන්න කියලා. නැත්තම් මගේ සැමියා හිතාවි මං එයාගේ රාජකාරි වලට ඇඟිලි ගහනවා කියල. ඒ වුණත් ඔබ මේ මොකක්ද කළේ? ඔබ මෙහේට ආවා මාව හමුවෙන්න. කාටහරි හිතේවි අප දෙදෙනා අතරේ මොකක් හරි ගනුදෙනුවක් තියෙනවා කියල."

"අවාසනාවකට වගේ මට කරන්න වෙන කිසිම දෙයක් තිබුණේ නෑ ආර්යාවෙනි. අර නැතිවුණු ලියවිල්ල සෙවීමේ කටයුත්ත මට රජයෙන් භාරදීල තියෙනවා. ඉතින් මං මේ ආවෙ ඒ ලියවිල්ල මගේ අතට දෙන්න කියලා ඔබෙන් ඉල්ලා හිටින්නයි."

කාන්තාව වාඩිවී සිටි පුටුවෙන් ඉහළට එසැවුණේ විදුලි සැරයක් වැදුණාක් මෙනි. ඇගේ රෝස පැහැති මුහුණ එක්වරම සුදුමැලි විය. කොයි මොහොතේ හෝ ක්ලාන්ත වීමට ඉඩ ඇති අයුරින් ඇගේ සිරුර එහාට මෙහාට පැද්දෙන අයුරක් මම දුටුවෙමි. මා සිතුවේ ඇය සිහි විසඥ වෙතැයි කියාය. එහෙත් දඩි උත්සාහයක් දරා, තත්පර කිහිපයකින් තම ප්‍රකෘති ස්වභාවයට පත්වීමට ඇය සමත්වූවාය.

"ඔබ. . . . ඔබ මට අපහාස කරනවා හෝම්ස් මහත්මයා."

"ආර්යාවෙනි. ඕව කියල වැඩක් නෑ. ලියුම මගේ අතට දෙන්න."

හුනස්නෙන් නැගී සිටි ඇය සීනුව නාදකිරීමට ඒ දෙසට ගියාය.

"මගේ සේවකයා කැඳවන්නම්. ඔහු දමාවි ඔබව ගෙයින් එළියට!"

"හිල්ඩා ආර්යාව. මං ඔබෙන් ඉල්ලා හිටිනවා සීනුව නාද කරන්න එපා! ඔබ මහා අපකීර්තියකට පත්වෙන ආන්දෝලනයක් වළක්වන්න මං මගේ සම්පූර්ණ උත්සාහය යෙදුවා. ඔබ දැන් සීනුව නාද කළොත් ඒ ඔක්කොම ඉවරයි.

ලියුම දෙන්න මා අතට. එතකොට මං හැමදෙයක්ම නිවැරදි කරන්නම්. ඔබ මා සමග එකතුවෙලා මං කියන පිළිවෙළට වැඩ කළොත්, මට පුළුවනි හැමදෙයක්ම නිසි පිළිවෙළට සකස් කරන්න. මං කියන දේ අහන්නෙ නැතුව ක්‍රියා කළොත්, මං ඔබේ රහස් හැම එකක්ම එළිකරනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

ඇය පුටුවෙන් නැගිට බලාසිටියේ මහාරාජිනියකගේ තේජාන්විත විලාසයෙනි. ඇය මගේ මිත්‍රයාගේ මුළු ආත්මයම දමනය කිරීමට මෙන් ඔහු දෙස ඇසිපිය නොහෙළා බලා සිටියාය. ඇගේ අත සීනුව මත තිබුණත් ඇය එය නාද නොකළාය.

"ඔබ හදන්නේ මාව භයකරගන්නද? ගෙදරට ඇවිත් මේ විධියට කාන්තාවක් භයකරන්න උත්සාහ කිරීම, පිරිමියෙකුට සුදුසු දෙයක් නොවෙයි හෝම්ස් මහත්මයා. ඔබ කියන්නේ ඔබ යමක් දන්නව කියල නේ. හොඳයි මොනවද ඔබ දන්නේ?"

"ආර්යාවෙනි, කරුණාකර ඔබ මය පුටුවේ වාඩිවෙන්න. ඔබ බිම ඇද වැටුණොත් ඔබට තුවාල සිදුවේවි. ඔබ ඔතැන වාඩිවෙනතුරු මං කථාකරන්නෙ නෑ. . . . හා . . . , අන්න හොඳයි."

"හෝම්ස් මහත්තයා. මං ඔබට දෙන්නේ මිනිත්තු පහයි."

"මට එක මිනිත්තුවක් ඇති. හිල්ඩා ආර්යාවෙනි, මං දන්නවා ඔබ එඩුවාඩෝ ලූකස් හමුවෙන්න ගිය ගමන ගැන. ඊළඟට අර රහස් ලියවිල්ල ඔහුට දුන්නු බව. ඊට පස්සේ ඊයේ රාත්‍රී ඔබ යළිත් ඔහුගේ ගෙදර ඒ කාමරයට ගිය බව. ගිහින් අතිදක්ෂ අයුරින් බුමුතුරුණ යට හංගලා තිබුණු ලියවිල්ල ගත්තු පිළිවෙළ."

පිළිමයක් මෙන් නොසැලී, ඇය ඇසිපිය නොහෙළා හෝම්ස් දෙස බලා සිටියාය. ඇගේ මුහුණ අළුපැහැයට හැරිණි. කථා කිරීමට උත්සාහ කළත් ඇගේ උගුරෙන් එක්වරම ශබ්දයක් පිටනොවිණි. දඩි උත්සාහයක් දරා ඇය මොහොතකින් කථා කළාය.

"ඔහේට පිස්සු! හෝම්ස් මහත්තයො ඔහේට පිස්සු!" ඇයට කෑගැසිණ.

තම කබායේ උඩ සාක්කුවට අත දැමූ හෝම්ස් එයින් කුඩා කාඩ්බෝඩ් කෑල්ලක් එළියට ගත්තේය. ඒ ඡායාරූපයකින් කපාගත් කාන්තාවකගේ මුහුණයි.

"මං මේක යන එන තැන අරං ගියේ මේක මට ප්‍රයෝජනවත් වේවි කියල හිතූ නිසා. මේක දුටු හැටියෙම පොලිස් භටයා ඔබව අඳුනාගත්තා."

අමාරුවෙන් හුස්මක් ඉහළට ගත් හිල්ඩා ට්‍රිලෝනි ආර්යාව පුටුව මතට ඇදවැටුණාය.

http://sherlockholmesinvestigations.blogspot.com



205. "ඔහේට පිස්සු හෝම්ස් මහත්තයෝ! ඔහේට පිස්සු!!"

http://sherlockholmesinvestigations.blogspot.com

"ආර්යාවෙනි. ඔබ ළඟ තියෙනවා ඒ ලියුම. හැම දෙයක්ම කලින් තිබුණා වගේ හරිගස්සන්න මට පුළුවනි. ඔබව අමාරුවේ දාන්න මට කිසිම උවමනාවක් නෑ. නැතිවුණු ලියුම ඔබේ ස්වාමිපුරුෂයාට භාරදුන්නට පස්සේ මගේ රාජකාරිය අවසන් වෙනවා. මං දෙන උපදෙස පිළිපදින්න. මං කියන වචනය අහන්න. ඔබට ගැළවෙන්න තියෙන එකම මග මේකයි."

ඇය සතුව තිබූ ධෛර්යය අප විසින් අගය කළ යුතු තරමේ නොසැලෙන එකක් විය. පරාජය පෙනි පෙනීත් එය පිළිගැනීමට ඇගේ සූදානමක් තිබුණේ නැත.

"මං ඔබට තවත් සැරයක් කියනවා හෝම්ස් මහත්මයා. ඔබ මය කථාකරන්නේ මහ විකාර අදහසක් හිතේ මවාගෙනයි."

හෝම්ස් තම අසුනෙන් නැගිට්ටේය.

"මට බොහොම කණගාටුයි හිල්ඩා ආර්යාවෙනි. ඔබව ආරක්ෂා කරන්න මං ලොකු උත්සාහයක් දැරුවා. නමුත් දැන් මට පෙනෙනවා ඒ හැම දෙයක්ම අපතේ ගිය බව."

හෝම්ස් සීනුව නාද කළේය. මෙහෙකරුවා අප සිටි කාමරයට ඇතුළු විය.

"ට්‍රිලෝනි හෝප් මහත්මයා ගෙදර ඉන්නවද?"

"අනේ මහත්මයා දැනට ගෙදර නැහැ. එතුමා ගෙදර එන්නෙ දවල් එකට කාලක් වෙද්දි."

හෝම්ස් ඔහුගේ ඔරලෝසුව දෙස බැල්මක් හෙළීය.

"තවත් පැය කාලක් තියෙනවා. හොඳයි මං එතුමා එනතුරු රැඳී ඉන්නම්."

මෙහෙකරුවා දොර වසාගෙන කාමරයෙන් පිටවී ගියා පමණි. හිල්ඩා ට්‍රිලෝනි හෝප් ආර්යාව හෝම්ස් ඉදිරියට පැමිණ ඔහු ඉදිරියේ දණින් වැටුණාය. ඇගේ සුන්දර මුහුණ තෙත් කරමින් කඳුළු නොනැවතී කඩා හැලෙන්නට පටන් ගත්තේය. ඇය හෝම්ස්ට ආයාචනය කිරීමට පටන් ගනිමින් දෑත් ඉදිරියට දිගු කරමිනි.

"මට අනුකම්පා කරන්න හෝම්ස් මහත්මයා! මට අනුකම්පා කරන්න! මගේ ගැළවීම තියෙන්නේ ඔබේ අතේ. දෙවියන්ගේ නාමයෙන්

ඔහුට කිසිදෙයක් කියන්න එපා. මං ඔහුට කොපමණ ආදරය කරනවද කියල ඔබට හිතාගන්නවත් බැහැ. ඔහුගේ හිතට පුළු වේදනාවක්වත් දෙන්න මං කැමති නැහැ. මේක දැනගත්තොත් ඔහුගේ හදවතට දරාගන්න බැරි වේදනාවක් වේවි."

හෝම්ස් ඇය ඉහළට එසවූයේය.

"ඔබට ස්තුතියි ආර්යාවෙනි. අන්තිම මොහොතේදි හරි ඔබට මොළේ පෑදුණා. අපට ප්‍රමාද වෙන්න එක මොහොතක්වත් නෑ. කෝ ලියුම?"

කාමරය හරහා වේගයෙන් දිව ගිය ඇය, එහි කෙළවරේ වූ ලියන මේසයේ යතුරු දමා තිබූ ලාච්චුවක් විවෘත කළාය. එහි තිබී ඇය එළියට ගත්තේ නිල් පැහැති ලියුම් කවරයකි.

"මෙන්න හෝම්ස් මහත්මයා ඒක."

"අපි කොහොමද මේක ආපහු ඔහු අතට ලැබෙන්න සලස්වන්නෙ? ඉක්මන් කරන්න! මොනවා හරි ක්‍රමයක් අපි යොදාගත යුතුයි. කෝ ඔහුගේ ලියුම් දමා තබන යකඩ පෙට්ටිය?"

"තවමත් ඒක තියෙනවා නිදන කාමරයේ."

"ඒක අපේ වාසනාවක්! ඉක්මනට ගිහිං එය මෙහේට අරගෙන එන්න ආර්යාවනි. ඉක්මනට!"

මොහොතකින් ඇය රතු පැහැති පැතලි පෙට්ටියක් රැගෙන ආවාය.

"කොහොමද ඔබ මේක කලින් පැරේ විවෘත කළේ? ආ ඔබ ළඟ අමතර යතුරක් තියෙනවා? හරි එහෙනම් ඉක්මනින් මේක අරින්න."

ඇගේ හැට්ටය තුළට අත දැමූ හිල්ඩා ආර්යාව කුඩා යතුරක් එළියට ගත්තාය. පෙට්ටියේ පියන වහා විවෘත කරන ලදී. ඒ තුළ ලියකියවිලි රාශියක් තිබිණි. හෝම්ස් නිල් පැහැති කවරය ඒ ලියවිලි මැදට දැම්මේය. ඉන්පසු පෙට්ටිය වසා යතුරු දමා, එය ආර්යාව අතේම නිදන කාමරය වෙත යවනලදී.

"යුරෝපීය කටයුතු පිළිබඳ ලේකම්තුමා පිළිගන්න දැන් අපි සූදානම්. තවත් මිනිත්තු දහයක් තියෙනවා. ඔබව ආරක්ෂා කරන්න

මම ලොකු වෙහෙස මහන්සියක් අරකුවා. ඒ නිසා මට අවංකව කියන්න, මේ අද්භූත සිද්ධිය පිටිපස හැංගුණු කථාව මොකක්ද කියලා?"

"මං ඔබට හැම්දෙයක්ම කියන්නම් හෝම්ස් මහත්මයා." ආර්යාව පැවසුවේ හැඬූ කඳුළෙනි.

"මගේ සැමියාගේ හිතට වේදනාවක් දෙනවාට වඩා, මං කැමතියි හෝම්ස් මහත්මයා මගේ දකුණු අත කපල දාන්න. මං වගේ තමන්ගේ ස්වාමියාට අවංකව ආදරය කරන වෙනත් ගැහැනියක් මුළු ලන්ඩන් නගරයේම නැතුව ඇති. ඒ වුණත් මං කළ දේ දැන ගත්තොත්. . . . මට කරන්න සිදුවුණු දේ දැනගත්තොත්. . . . ඔහු මට ජීවිතේටම සමාව දෙන එකක් නැහැ. ඔහු තමන්ගේ පණට වඩා, අවංකකම අගය කරන කෙනෙක්. එයට ගෞරව කරන කෙනෙක්. ඒ නිසා තවත් කෙනෙකුගෙන් සිදුවෙන සුළු අඩුපාඩුවක් වත් ඔහුට ඉවසන්න බෑ. ඔහු ඉවසන්නෙත් නෑ. මාව බේරාගන්න හෝම්ස් මහත්මයා. මගේ සතුට ඔහුගේ සතුටයි. ඒ විතරක් නෙමෙයි අපේ ජීවිත පවා අවදානමට ලක්වුණු මොහොතක් මේ!"

"ඉක්මන් කරන්න ආර්යාවනි, ඉක්මන් කරන්න. අපට කථාව කියන්න. ඉතිරි වෙලා තියෙන්නෙ සුළු වෙලාවයි."

"මේ හැම දේකටම මුල් වුණේ මා අතින් ලියවුණු ලියුමක් හෝම්ස් මහත්මයා. මගේ මේ විවාහයට බොහොම කාලයකට පෙර, ලාබාල වයසේදී ආදරවන්තියක් හැටියට මං ලියූ මෝඩ ලියුමක්. මං කළ වැරැද්දක් හෝ නරක දෙයක් ඒකෙ සඳහන් වෙලා නැහැ. නමුත් ඒ වගේ සුළු දෙයක් පවා ඔහු සලකන්නෙ මහ බරපතල දෙයක් හැටියට. ඔහුට මගේ ලියුම කියවන්න ලැබුණා නම්, ඔහු මා ගැන තබා තිබෙන විශ්වාසය සම්පූර්ණයෙන්ම විනාශවෙලා යනවා. මං ඒක ලියලා අවුරුදු ගණනාවක් වෙනවා. මං හිතුවා ඒ හැමදෙයක්ම නාටත් අමතක වෙලා ගිහිං කියලා.

නමුත් එහෙම වෙලා නැහැ. මට මේ මිනිහා ලූකස්ගෙන් පණිවුඩයක් ලැබුණා. මං ගියා ඔහු හමුවෙන්න. ඔහු කිව්වා ඔහුට මගේ ඒ ලියුම ලැබිලා තියෙනවා. ඒක ඔහු මගේ ස්වාමිපුරුෂයාට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා කියලා.

http://sherlockholmesinvestigations.blogspot.com

මං ලූකස්ට බැගෑපත්ව ආයාචනා කළා; මට අනුකම්පා කරන්න, ඒ ලියුම මගේ සැමියා අතට පත්කරන්න එපා කියල. එවිට ඔහු කිව්වා මගේ ලියුම මගේ සැමියා අතට නොදිය යුතු නම්, ඒ වෙනුවට ගාස්තුව වශයෙන් ඔහුට යමක් අවශ්‍ය බව. ඒක මොකක්ද කියල ඔහු විස්තර කළා.

මගේ සැමියාගෙ වැදගත් ලියුම් දමන යකඩ පෙට්ටියේ තැන්පත් කර ඇති ලියවිල්ලක් ගැනයි ඔහු කිව්වෙ. ඔහුට ඒක ගෙනැවිත් දුන්නොත්, මගේ ලියුම ආපසු මා අතට දෙන බවට ඔහු පොරොන්දු වුණා. මේ වැදගත් ලියවිල්ල ගැන, විදේශ කටයුතු කාර්යාලයේ ඉන්න ඔහුගේ මිත්‍රකාරයෙකුගෙන් ඔහුට දැනගන්න ලැබිල තියෙනවා. හිතල බලන්න හෝම්ස් මහත්මයා. මං පත්වුණු තත්ත්වයට ඇද වැටුණාම වෙන මොනාව කරන්නද?"

"ඔබේ සැමියාට හැමදෙයක්ම හෙළිකරලා, ඔබට ඔහුගේ විශ්වාසය දිනාගන්න තිබුණා."

"මට එහෙම දෙයක් කරන්න හැකියාවක් තිබුණේ නැහැ හෝම්ස් මහත්මයා. එක පැත්තකින් මේ කියන ලියවිල්ල ලූකස්ට ගෙනිහිං නුදුන්නොත් ඔහු අපේ විවාහය විනාශ කරන බව සහතිකයි. ලියවිල්ල මොකක් ද කියල මම දන හිටියෙ නැහැ. ඒක නැතිවුණොත් දේශපාලන කරලියේ ඇතිවෙන ප්‍රතිඵල මොන වගේ වේවිද කියල මං දන හිටියෙත් නෑ. ඉතින් මං ඒ දේ කළා මහත්මයා. මං සැමියාගේ ලියවිලි පෙට්ටියේ, යතුරේ අච්චුවක් අරගෙන එය ලූකස්ට ගෙනිහිං දුන්නා. ඔහු මට යතුරක් කප්පවා දුන්නා. එයින් පෙට්ටිය ඇරලා, අවශ්‍ය ලියවිල්ල අරගෙන මං එදා රාත්‍රියේ ගොඩොල්පින් වීථියේ ඔහුගේ නිවසට ගෙනගියා."

"ආර්යාවෙනි. මොකක්ද එතැනදී සිද්ධවුණේ?"

"කලින් කතා කරගෙන තිබුණු හැටියට, එදා රාත්‍රියේ ගිහින් මං ඔහුගේ ගෙදර දොරට තට්ටු කළා. ලූකස් ඇවිත් දොර ඇරියා. මං ගෙට ඇතුළුවෙලා ඔහු සමග ඔහුගේ කාමරයට ගියා. මේ මිනිහා සමග තනිවෙන්න මගේ හිතේ භයක් තිබුණා. ඒ නිසා ඇතුළුවුණු දොරවල් කිසිවක් මං වැහැව්වේ නැහැ. අඩවන්ව තැබුවා.

මං ඉදිරි දොරෙන් ගෙට ඇතුළුවෙද්දී, ගේ අසලම, එළියේ ගැහැනියක් රැඳී හිටි බව මං දුටුවා. අපේ ලියුම් ගනුදෙනුව බොහොම

http://sherlockholmesinvestigations.blogspot.com

ඉක්මනින් අවසන් වුණා. මා ගෙනගිය ලියවිල්ල ඔහු අතට දුන්නා. ඔහුගේ මේසය මත තබා තිබුණු මගේ ලියුම ඔහු මට භාරදුන්නා. මේ මොහොතේ ඉදිරි දොර දෙසින් ශබ්දයක් ඇහුණා. බරාඳය පැත්තෙන් කාගෙදෝ අඩිශබ්දයක් වගෙයි ඇහුණේ. ලූකස් බිම ඒලා තිබුණු බුමුතුරුණේ එක් කෙළවරක් ඉහළට ඔසවා ඒ හරිය පැත්තකට පෙරළුවා. ඊට පස්සේ මා ගෙනගිය ලියවිල්ල බිම තිබුණු තැනක සඟවලා ආපහු බුමුතුරුණ තිබුණු හැටියට දිගහැරියා.

ඊට පස්සේ සිද්ධ වුණ දේ මහා භයානක හීනයක් වගෙයි. කළු පාට මුහුණක් තිබූ ගැහැනියක් ප්‍රංශ භාෂාවෙන් කෑගසමින් කාමරයට කඩාවැදුණු හැටි මට මැවී පෙනෙනවා. මේකයි ඒ ගැනි කිව්වෙ:

"මං පාරට වෙලා හුඟක් රස්තියාදු වුණා. ඒත් ඒ මහන්සිය අපතේ ගියේ නැහැ. කොහොම හරි අන්තිමට ඒකිත් ඉඳිද්දිම උඹ මට අහුවුණා!"

මෙහෙම කිව් ඇය වියරුවෙන් මෙන් ඔහු වෙත කඩාගෙන පැන්නා. ඔවුන් දෙදෙනා අතර පොර බැදීමක් ඇතිවුණා. ඔහු ඇයට පහර දීමට පුටුවක් ඔසවලා ගත්තා. නමුත් ඇගේ අතේ තිබුණා දිලිසෙන පිහියක්. මං වහාම එතැනින් එළියට බැහැලා වහාම ගෙදර දිව්වා. සිදුවෙලා තියෙන දේ ගැන සම්පූර්ණ විස්තරය මං දැනගත්තේ පහුවදා උදේ පුවත්පතෙන්. එදා රෑ මට ලොකු සතුටකුත් දැනුණා. ඒ මොකද මගේ ආදර හසුන ආපසු ලබාගන්න හැකිවුණු නිසා. නමුත් අර ලියවිල්ලෙන් සිදුවෙන්න තිබුණ දේ ගැන මට වැටහීමක් තිබුණේ නැහැ.

සිදුවෙලා තියෙන දේ බරපතළ බව මං තේරුම් ගත්තෙ පහුවදා උදෙයි. මං එක කරදරයකින් බේරිලා තියෙන්නේ තවත් ප්‍රශ්නයක් ඇතිකරගෙන. ලියවිල්ල නැතිවීම නිසා මගේ ස්වාමියා අත්වුණු කනගාටුව දැකලා මං දැඩි කණගාටුවකට පත්වුණා. ඔහු ළඟ දණගහලා, ඇඳවැටිලා, මං ඔහුට කළ වැරැද්ද ගැන පාපෝච්චාරණයක් කරන්න මට හිතුණු වාර ගණන අනන්තයි. මම එයින් වැළකී හිටියේ කොහොම අමාරුවෙන්. මං එහෙම නොකළෙ, එහෙම කළා නම් ඒක මගේ අතීතය ගැන පාපෝච්චාරණයක් වෙනවා ඉඩ තිබ...

http://sherlockholmesinvestigations.blogspot.com

එදා උදේ මං ඔබව හමුවෙන්න ආවෙ, මා අතින් සිදුවී ඇති වැරැද්දේ බරපතල කම මොන වගේද කියලා අවබෝධයක් ලබාගැනීමේ අදහසින්. ඒ මොහොතේ ඉඳල මගේ හිතේ පහළවුණු එකම අධිෂ්ඨානය වුණේ, මගේ සැමියාගේ නැතිවුණු ලියවිල්ල ආපහු ලබාගැනීමයි.

ලූකස් ඒක හැංගුවේ කොහේද කියල මං දක්කා. තවමත් එය එතැන තිබිය යුතුයි. එදා රෑ අර යක්ෂ ගැහැනිය ගෙට ඇතුළු නොවෙන්න, ඔහු ඒක සඟවන තැන බලාගන්න මට ඉඩක් ලැබෙන්නෙ නැහැ. ඒ වුණත් මිනීමැරුමෙන් පස්සෙ මං කොහොමද ඒ කාමරයට ඇතුළුවෙන්නෙ? දවස් දෙකක් තිස්සේ මං ඒ ගේ ගැන සෝදිසියෙන් හිටියා. නමුත් එහි දොර නිතරම වහල දමලයි තිබුණේ. ඊයේ රෑත් මං උත්සාහ කරල බැලුවා. දන් ඉතින් ඔබ දන්නවා, මං කළේ මොකක්ද, සාර්ථක ප්‍රතිඵල ලබාගත්තෙ කොහොමද කියලා. මම ලියවිල්ල ආපහු ගෙනැත් ඒක විනාශ කර දමන්නත් හිතුවා. ඒ මොකද මගේ අතින් වුණු වැරැද්ද හෙළි නොකර ඒක මගේ සැමියට ආපහු භාර දෙන්න ක්‍රමයක් නොතිබුණු නිසා. . . . දෙවියනේ! තරප්පුවේ මට ඇහෙනවා ඔහුගේ අඩිශබ්දය!"

යුරෝපීය කටයුතු පිළිබඳ ලේකම්තුමා, කාමරය තුළට පැමිණියේ ආවේගශීලී මනසකිනි.

"මොනව හරි ආරංචියක්ද හෝම්ස් මහත්මයා? සුභ ආරංචියක්ද?"

"ප්‍රතිඵල සාර්ථක අතටයි කියල මගේ යම් විශ්වාසයක් තියෙනවා."

"දෙවියන්ට ස්තුතිවේවා! අද මා සමග දවල් කෑමට අගමැතිතුමා මෙහේට ආවා. ඔබේ සතුටුදායක ආරංචිය ඔහුටත් දැනුම් දුන්නට කමක් නැහැ නේද? ඔහුට තියෙන්නේ ලේසියෙන් කම්පනයට පත්වෙන හිතක් නොමෙයි. ඔහුගේ හිත වානේ වගේ දැඩි හිතක්. ඒ වුණත් මං දන්නවා මේ බිහිසුණු, අවාසනාවන්ත සිද්ධිය වුණු දවසෙ ඉඳල, අගමැතිතුමාට එක දවසක්වත් හරි හැටි නින්ද ගියේ නැහැ. ජේකබ්ස්. අගමැතිතුමාට මෙහෙට එන්න කියනවා."

හිල්ඩා, මගේ ප්‍රියාවිය. අපි මෙතැන කතාබස් කරන්න යන්නෙ දේශපාලනය. ඔයා ගිහින් කෑම කාමරෙන් ඉන්න. අපි මිනිත්තු කිහිපයක් ගතවෙද්දී කෑම කාමරයේදී ඔබව හමුවෙන්නම්."

අගමැතිතුමා ද අප සිටි කාමරය වෙත පැමිණියේය. ඔහු එතරම් කලබලයකට පත්ව සිටියේ නැත. එහෙත් හෝප් මහතාගේ සිතේ ඇතිවී තිබුණු සතුට, අගමැතිතුමාට ද දැනී තිබෙනු මම දුටුවෙමි.

"මං හිතන්නේ අපට දැනුම් දීමට මොනවා හරි ආරංචියක් ඔබ සතුව ඇති. එහෙම නේද හෝම්ස් මහත්මයා?"

"ඔව්. ඒ ලියවිල්ල යන්න ඉඩතියෙන හැම තැනකින්ම මං හොයල බැලුවා. නමුත් ඒක කිසිම තැනකට ගිහිං නැහැ. මං හිතන්නේ අපට භයක් ඇතිකරගන්න කිසිම හේතුවක් නැහැ කියලයි."

"ඒක මේ ප්‍රශ්නයට විසඳුමක් නෙමෙයි හෝම්ස් මහත්මයා. අපට හැමදාම, කොයි වෙලේ පුපුරයිද කියල දන්නෙ නැති ගිනිකන්දක් උඩ ඉන්නව වගේ ඉන්න හැටියක් නෑ. මේක ගැන ස්ථිර යමක් අප දැනගත යුතුමයි."

"එහෙම යමක් අහඳිම ලැබේවි කියල මං බලාපොරොත්තු වෙනවා." හෝම්ස් කීය. "ඒ නිසයි මං ඔබව හමුවෙන්න ආවෙ. මං ඔය ලියවිල්ල ගැන හිතන්න හිතන්න, ඒක මේ ගෙදරින් පිටතට ගියේ නැහැ කියලමයි මට හිතෙන්නේ."

"මොනවා හෝම්ස් මහත්මයා?"

"එහෙම ගියා නම් මේ වෙලාව වෙනකොට ලියුමේ අඩංගු කරුණු ප්‍රසිද්ධියට පත්වෙලා තිබිය යුතුමයි."

"නමුත් තමන්ගේ ගේ ඇතුළෙ සඟවා තබාගන්නා අරමුණෙන්, කවුරු හරි ඒ ලියවිල්ල අරගන්නෙ මොකටද හෝම්ස් මහත්තයා?"

"මම නම් හිතන්නෙ නෑ කවුරුවත් ඒක අරගත්තා කියල."

"එහෙම නම් ඒක මගේ ලියවිලි පෙට්ටියෙන් අතුරුදන් වුණේ කොහොමද?"

"මම නම් හිතන්නේ නෑ ඒක ඔබේ ලියවිලි පෙට්ටියෙන් එළියට ගියාවත් කියල."

"හෝම්ස් මහත්මයා. මේක විහිළු කරන්න සුදුසු වෙලාවක් නෙමෙයි. ඒක මගේ ලියවිලි දාපු පෙට්ටියේ නැති බව මමයි කියන්නේ."

"අඟහරුවාදා උදේට පසු ඔබ ඒ පෙට්ටිය පරීක්ෂා කරල බැලුවද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නැහැ. එහෙම බලන්න උවමනාවක් තිබුණෙ නැහැ."

"බාගවෙලාවට ඔබ ඒ පෙට්ටියේ ඇතුළත හරියට සෝදිසි කළේ නැද්ද දන්නෙ නෑ?"

"කොහොමටවත් වෙන්න බැහැ."

"ඒ වුණත් මට හිතෙන්නෙ එහෙමයි. ඒ විදියෙ දේවල් මීට ඉස්සර සිදුවෙලා තියෙනවා. ඔයබ ඔය පෙට්ටියේ තවත් ලියවිලි තියෙනවා නේද? මං හිතන්නේ එවැනි ලියවිල්ලක කඩදාසි තුළට මේ ලියුම මිශ්‍ර වෙලා ඇති."

"ඒක තිබුණේ අනික් ලියවිලි ඔක්කොටම උඩින්, මුදුනේ. ඉතින් කොහොමද මිශ්‍ර වෙන්නේ?"

"කාගෙ හරි අතින් පෙට්ටිය සෙලවිලා ඒක අඩියට ගියාද දන්නෙ නෑ."

"නෑ. නෑ. මං ඔක්කොම එළියට ඇදල බැලුවා."

මෙහිදී අගමැතිතුමා කථාවට මැදිහත් විය.

මේක අපට බොහොම පහසුවෙන් විසඳගන්න පුළුවන් හෝප්. අපි ඔබේ ලියවිලි පෙට්ටිය මෙහාට ගෙන්වාගෙන බලමු."

හෝප් මහතා සීනුව නාද කර ලියවිලි පෙට්ටිය ගෙන එන මෙන් සේවකයාට අණකළේය.

"මේක කාලය නාස්ති කරන වැඩක්. කමක් නෑ. ඔබ සෑහීමකට පත්වෙන්නේ ඒක සෝදිසි කරල බැලුවොත් විතරයි නේ. ස්තූතියි ජේකබ්ස්. මෙහෙන් තියන්න. මේකෙ යතුර මං හැම විටම තියාගෙන ඉන්නේ මගේ ඔරලෝසු දම්වැලට ගැටගහලා.

ඔන්න හොඳින් බලාගන්න. මේ තියෙන්නේ මෙරෝ සාමිවරයාගෙන් ලැබුණු ලියුම. මේ සර් චාල්ස් හාඩිගේ වාර්තාව. මේක බෙල්ග්‍රේඩ් නගරයෙන් ලැබුණු සන්දේශයක්. මේක රුසෝ - ජර්මන් ධාන්‍ය බද්ද ගැන වාර්තාවක්. මේක මැඩ්‍රිඩ් නගරයෙන් ලැබුණු වාර්තාවක්. මේක ෆ්ලවර්ස් සාමිගෙන් මට ලැබුණු ලියුමක්. දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! මේ මොකක්ද? බෙලිංගර් සාමි! බෙලිංගර් සාමි!"

http://sherlockholmesinvestigations.blogspot.com

අගමැතිතුමා හෝප් මහතා අතින් නිල් පැහැති කවරය උදුරා ගත්තේය.

"ඔව් ඒක තමා. කවරය ඇතුළේ ලියුම තියෙනවා. හෝප් මගෙන් ඔබට ශුභපැතුම්."

"ස්තුතියි. ස්තුතියි. මගේ හිතෙන් විශාල බරක් නිදහස් වුණා. මේක මට විශ්වාස කරන්නත් බැරි දෙයක්. හෝම්ස් මහත්මයා ඔබ මායාකාරයෙක් වගෙයි. ඔබ නම් ඉන්ද්‍රජාලිකයෙක්. ලියුම පෙට්ටිය ඇතුළෙම තියෙන බව ඔබ කොහොමද දැනගත්තේ?"

"ඒ මොකද ඒක වෙන කොහේවත් නොතිබුණු නිසා."

"මගේ දෑස් මට අදහාගන්නවත් බෑ."

හෝප් මහතා දොර දෙසට දිව ගියේය. "කෝ මගේ බිරිඳ? මං ඇයට කියන්න ඕන ප්‍රශ්නෙ ඔක්කොම විසඳුණා කියල.

"හිල්ඩා! හිල්ඩා!! හිල්ඩා!!!"

ඔහු නිවස තුළට දිවයමින් කෑගසන හඬ අපට අසන්නට ලැබිණි.

අගමැතිතුමා මගේ මිතුයා දෙස ඇසිපිය නොහෙළා බලා සිටියේය.

"හෝම්ස් මහත්මයා මට කියන්න. මේ අපට ඇහැට පෙනෙනවාට වැඩි යමක් මෙතැන තියෙනවා. ලියුම කොහොමද ආයෙමත් පැරයක් පෙට්ටියෙන් මතුවුණේ?"

හෝම්ස් ඉවත බලාගත්තේ සිනාමුසු මුහුණෙනි.

"අගමැතිතුමනි, අපෙත් තියෙනවා නොවැ රාජ්‍යතාන්ත්‍රික මට්ටමේ රහස්!" මෙසේ කියමින් හිස්වැස්ම අතට ගත් හෝම්ස් නිවසින් පිටවී යාමට දොර දෙසට ගමන් කළේය.



http://sherlockholmesinvestigations.blogspot.com



215. "හෝප්. මගෙන් ඔබට ශුභ පැතුම"

Reading Purpose Only. Do Not Print.

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only.. Not For Print

# තිත් වැටුණු පටිය

http://sherlockholmesinvestigations.blogspot.com

# තිත් වැටුණු පටිය

පසුගිය අවුරුදු අට මුළුල්ලේ ෂර්ලොක් හෝම්ස් සමග එක්ව යෙදුණු පරීක්ෂණ වල සටහන් මම පෙරළා බැලුවෙමි. එයින් බොහොමයක් ඛේදජනක සිදුවීම් හා බැඳුණු ඒවා විය. සමහරක් හාස්‍ය ජනක වූ අතර තවත් සමහරක් අද්භූත ඒවා විය. ඒ කිසිවක් සාමාන්‍ය තත්ත්වයේ පරීක්ෂණ නොවූ බව නම් මට ඉඳුරාම කිවහැකියි. මගේ මිත්‍රයා මෙම පරීක්ෂණ වල යෙදුණේ මහා ධනස්කන්ධයක් උපයා ගැනීමේ අරමුණෙන් නොවේ. ඔහු මෙම ක්ෂේත්‍රයේ නිරත වූයේ අපරාධ පරීක්ෂණ වෘත්තිය සඳහා තිබූ දැඩි ඇල්ම නිසයි. යම්කිසි අද්භූත හෝ අසාමාන්‍ය බවක් නොතිබුණු පරීක්ෂණ භාරගැනීම පවා හෝම්ස් ප්‍රතික්ෂේප කළේය. මෙවැනි විවිධ පරීක්ෂණ අතුරින් ඉතාම සුවිශේෂී බවක් පෙන්වූ එකක් ඔබට විස්තර කිරීමට මම කැමැත්තෙමි. ඒ සරේ ප්‍රාන්තයේ ස්ටෝක් මොරාන්හි රෝයිලොට්ස් පවුලේ කථාන්තරයයි.

මෙය ඇත්ත වශයෙන්ම සිදුවූයේ බොහෝ කලකට පෙරයි. එනම් මගේ විවාහයට පෙර මා ෂර්ලොක් හෝම්ස් සමග බේකර් වීථියේ නිවසෙහි නේවාසිකව සිටි කාලයේදියි. සිද්ධිය සම්බන්ධ කරුණු හෙළිදරව් නොකිරීමට අප පොරොන්දු වී සිටි බැවින් මේ කථාව ඔබ වෙත ගෙන ඒමෙන් වැළකී සිටියෙමි. එහෙත් ගිවිසුම ඇතිකරගත් කාන්තාව ගිය මාසයේ අකාලයේ මියගියෙන් කථාන්තරය ලොවට හෙළිකිරීමට මට නිදහස ලැබී ඇත. එක් අතකින් සිදුවූයේ කුමක්ද කියා සත්‍ය සිද්ධිය මහජනයාට හෙළිකිරීම වඩාත් හොඳ යයි මම සිතමි. ඊට හේතුව දොස්තර ග්‍රයිම්ස්බි රොයිලොට්ගේ මරණය සිදු වූ ආකාරය පිළිබඳව එංගලන්තය පුරා පැතිරී ගියේ සත්‍ය සිදුවීමටත් වඩා බිහිසුණු කටකතාවකි.


http://sherlockholmesinvestigations.blogspot.com

ඒ 1883 අප්‍රේල් මාසයේ මුල සතියේ දිනකි. මා උදෑසන අවදි වෙද්දී මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස්, මගේ ඇඳ අසල සිටගෙන සිටියේය. ඔහු සාමාන්‍යයෙන් උදෑසනින් අවදිවන්නෙක් නොවේ. ගිනි උදුන් පඩිය මත තිබූ ඔරලෝසුවේ වෙලාව උදෑසන හතයි කාල වූවා පමණි. හෝම්ස් බැහැර යාමට සූදානමින් මෙන් සම්පූර්ණ ඇඳුමෙන් සැරසී සිටියේය. මේ පුදුමය කුමක්දැයි දැස් පිය දමමින් මම ඔහු දෙස බැලීමි.

"ඔබව ඇහැරවන්න සිදුවීම ගැන මට කණගාටුයි වොට්සන්. ඒ වුණත් අද උදේ පාන්දර චාරිත්‍රය වෙලා තියෙන්නේ ඒකයි. හඩ්සන් මහත්මියව අවදිකරලා. ඇය මාව අවදි කළා. දැන් මං ඔබව නැගිට්ටවනවා."

"මොකද කලබලේ . . . .ගින්නක්ද?"

"නැහැ. අප හමුවීමට තරුණ කාන්තාවක් ඇවිත් ඉන්නවලු. ඇය ඉන්නේ අතිශයින්ම කැලඹීමට පත්වෙලාලු. වහාම මාව හමුවෙන්න ඕනෙ කියල ඇය කරදර කරනවා කියන්නේ. අප හමුවෙන්න සූදානමින් ඇය විසිත්ත කාමරයේ බලාගෙන ඉන්නවා. තරුණ කාන්තාවක් මේ උදේ ලන්ඩන් නගරයට ඇවිල්ලා, නිදාගෙන ඉන්න මිනිස්සු අවදි කරනවා නම්, මොකක්ද අපට ඒකෙන් තේරුම් ගන්න පුළුවන්? ඇය ඇවිත් ඉන්නේ මොකක් හරි බරපතල කාරණයකට. ඒක අප්‍රමාදව අපට දැනුම්දෙන්න ඇය ලොකු නොඉවසිල්ලකින් ඉන්නේ. බාගදා මේක හුඟක් සිත් ඇදගන්නා පරීක්ෂණයක් වෙන්නත් පුළුවන්. එහෙම නම් ඔබ කැමැති වේවි මුල ඉඳලම කතන්දරය අහගන්න. කොහොම වුණත් මේකට හවුල් වෙන්න ඔබට අවස්ථාව සලසා දෙන්න ඕනෑය කියල මට හිතුණා."

"මගේ හිතවත් මිත්‍රයා. ඕකට හවුල් නොවී පාඩුකර ගන්න මං කොහොමටවත් කැමැති නෑ."

හෝම්ස් අපරාධ පරීක්ෂණ වල යෙදුණු ආකාරය නැරඹීම මිස වෙනත් කිසිම විනෝදාංශයක් මට නොතිබිණ. ඔහු සියුම් ලෙස නිරීක්ෂණ කළ හැටි; ඒ අනුව සිදුවීමට ඉඩ ඇත්තේ කුමක්දැයි ඉවෙන් මෙන් වටහා ගත් හැටි; අනතුරුව තර්කානුකූලව නිගමනයන්ට පැමිණි හැටි ආදී දේ මගේ සිත තදින්ම ඇදගැනීමට සමත් විය. එම නිගමනයන් හා උපකල්පනයන් මගින් ඔහුට

http://sherlockholmesinvestigations.blogspot.com

ලැබුණු ගැටලු විසඳීමට හෝම්ස් හැමවිටම සමත් විය. මම ඉක්මනින් ඇඳුම් මාරු කරගෙන මගේ මිත්‍රයාට එකතු වුණෙමි.

විසිත්ත කාමරයේ ජනේලය සමීපයේ කාන්තාවක් හිඳගෙන සිටියාය. කළු පැහැති ඇඳුමකින් සැරසී, හිස ආවරණය වන සේ කළු වේලයක් පැළැඳ සිටි ඇය, අප ඇතුළුවෙද්දී අසුනෙන් නැගී සිටියාය.

"සුභ උදෑසනක් හෝනා. මගේ නම ෂර්ලොක් හෝම්ස්. මේ මගේ හිතවත්ම මිත්‍රයා සහ උදව්කාරයා ඉදොස්තර වොට්සන් මා ඉදිරියේ ඔබට කීමට ඇති හැම දෙයක්ම ඔහු ඉදිරියේත් කියන්න පුළුවනි. හ හා! සීතල නැති කරගන්න, ගිනි උදුන දල්වීමට හඩ්සන් මහත්මියට මතක්වෙලා. ඒ බව දකින්නත් සතුටුයි. කරුණාකර ඔබේ පුටුව ගිනි උදුන සමීපයටම ගන්න. මම ඔබට ඉක්මනින් උණු කෝපි කෝප්පයක් ගෙන්වා දෙන්නම්. මට පෙනෙනවා ඔබ සීතලේ වෙවුලන හැටි."

"මාව වෙවුලන්නේ සීතල නිසා නෙමෙයි මහත්මයා" තරුණිය පහත් හඬකින් පැවසුවේ ගිනි උදුනට සමීපවෙමිනි.

"එහෙනම් මොකක් නිසාද?"

"මාව වෙවුලන්නේ ප්‍රාණ භයෙන් හෝම්ස් මහත්මයා. ඒක මහා භයානක දෙයක්."

ඇගේ මුහුණේ ස්වභාවය දුටු අපට ඇය බලවත් කැලැඹීමකට පත්වී ඇති බව එක්වරම වැටහිණි. උගුලකට අසුවූ සතෙකුගේ මෙන් අසරණ වූ දෑසත්, අළුපැහැ ගැන්වුණු මුහුණත් කියාපෑවේ එම ගිහියේ ස්වභාවයයි. පෙනුමෙන් ඇගේ වයස අවුරුදු තිහක් වන්නට ඇත. ඇගේ හිසකෙස් තැනින් තැන අකාලයේ සුදු වී තිබුණු අතර මුහුණෙන් පිළිබිඹු වූයේ භය නිසා ඇතිවූ කම්පනයයි.

"ඔබට තවදුරටත් භයවෙන්න කාරණාවක් නැහැ. අපි ඔබේ ගැටලු ඔක්කොම ඉක්මනින් විසඳා දෙන්නම්. ඒ ගැන කිසිම සැකයක් නෑ."

හෝම්ස් ඉදිරියට නැමී, ඇගේ අතට තට්ටු කරමින් කීවේ කාරුණිකව අයුරෙනි.

"මට පෙනෙන හැටියට අද උදේ ඔබ මෙහේ ඇවිත් තියෙන්නෙ දුම්රියෙන්. එහෙම නේද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"මහත්මයා ඔබ මාව අඳුනනවාද එහෙනම්?"

"නැහැ නමුත් ඔබේ වම් අත්වැස්මේ දුම්රියෙන් ආපසු යෑමට යොදා ගත යුතු ප්‍රවේශ පත්‍රයේ, අනෙක් කොටස තිබෙන බව පෙනෙනවා. ඔබ බොහොම පාන්දරින්ම පිටත්වෙන්න ඇති. දුම්රියපොළට ඒම සඳහා රෝද දෙකේ කුඩා අශ්වකරත්තයක නැගලා, බොහොම දුෂ්කර මාර්ගයක පැමිණි බවත් මට කියන්න පුළුවනි."

තරුණිය එක්වරම තිගැස්සුණාය. ඇය මගේ මිත්‍රයා දෙස බැලුවේ ඉමහත් පුදුමයෙනි.

"මගේ හිතවත් නෝනා. ඒකෙ මොකුත් අබිරහසක් නැහැ. ඔබේ හැට්ටයේ, වම් හැට්ට අතේ තැන් හතකට නො අඩු ගණනකට මඩ ඉහී තිබෙනවා. ඒවා පැය ගණනාවකට පෙර ඇති වූ ලකුණු. මෙ විධියට මඩ ඉහෙන්න පුළුවන් එකම වාහනය රෝද දෙකේ කුඩා අශ්වකරත්තයක් පමණයි. ඒකත් ඔබ රියැදුරාගේ වම් පැත්තේ වාඩිවෙලා ආව නම්"

"ඔබ ඉදිරිපත් කරන හේතු මොනවා වුණත්, ඔබ කී දේ නම් සම්පූර්ණයෙන්ම ඇත්තයි මහත්මයා. මං උදේ හයට කලින් ගෙදරින් පිටවුණා. ලෙදර්හෙඩ් දුම්රියපොළට එනවිට හයයි විස්සයි. එතැනින් ලන්ඩනයට එන්න තිබුණු පළමුවැනි දුම්රියෙන්ම ඇවිත්, වෝටලූ දුම්රියපොළෙන් බැස්සා.

මට මුහුණ දෙන්න වෙලා තිබෙන තත්ත්වය කොහොමටවත් තවත් ඉවසාගෙන ඉන්න හැටියක් නැහැ මහත්මයා. තව තවත් මේවා මේ විධියට ගියොත් මට පිස්සු හැදේවි. මගේ මේ කරදර ගැන කියන්න කිසිකෙනෙක් නෑ. මා වෙනුවෙන් සොයන්න බලන්න එක් අයෙක් හැර වෙනත් කවුරුවත් නෑ. ඒත් ඒ අසරණයා මේ ප්‍රශ්නයේදි මොනවා කරන්නද? මං ඔබ ගැන අහල තියෙනවා හෝම්ස් මහත්මයා, මට ඔබ ගැන කිව්වෙ ෆැරින්ටොෂ් මහත්මිය. ඇයට උදව් ඕන වෙලා අන්තිම අසරණ තත්ත්වයට පත්වුණු වෙලේ ඔබ ඇයගේ පිහිටට ආවලු. ඔබේ ලිපිනය මට ලැබුණේ ඇයගෙන්. මහත්මයා ඔබට බැරිද මටත් උදව් කරන්න? මාව වසාගෙන තිබෙන මේ මහා අන්ධකාරයක් වැනි අබිරහසෙන් එළියට ගෙනෙන්න? ඔබේ ඒ සේවය වෙනුවෙන් මුදලක් ගෙවන්න

http://sherlockholmesinvestigations.blogspot.com



221. "මහත්මයා ඔබ මාව අඳුනනවාද එහෙනම්?"

http://sherlockholmesinvestigations.blogspot.com

දැනට නම් මට වත්කමක් නෑ. නමුත් මාසෙකින් හෝ මාස එකහමාරකින් මං විවාහ වෙනවා. එතකොට මට හැකිවේවි මගේම මුදල් වලින් ඔබට සලකන්න. එවිට ඔබට පෙනේවි මා කළගුණ සලකන කෙනෙක් බව."

හෝම්ස් ලාච්චුව හැර කුඩා සටහන් පොතක් එළියට ගත්තේය.

"ෆැරින් ටොෂ්? . . . . ආ දැන් මට මතකයි. මැණික් ඇල්ලූ හිස් පළඳනාවක් සම්බන්ධයෙන් තමා මං ඒ පරීක්ෂණය කළේ. මං හිතන්නෙ වොට්සන් ඒක, මට ඔබව හමුවෙන්න කලින් කළ පරීක්ෂණයක්. හොඳයි නෝනා. මට කියන්න ඔබේ ගැටලුව. ඔබේ මිතුරියට උදව් කළා වගේ මට හැකිවේවි ඔබේ ප්‍රශ්නය වෙනුවෙනුත් මගේ කාලය යොදවන්න. ඒ සඳහා කළ යුතු ගෙවීම ගැන හිතන්න එපා. ගැටලුව විසඳීමම මට ලැබුණු පරිත්‍යාගයක් ලෙස මං සලකනවා. කොහොම වුණත් මට සිදුවූ වියදම් ඔබට කැමැති නම් ආපහු ගෙවන්න පුළුවනි. ඒකත් ඔබ කැමැති කාලෙක. දැන් මං ඔබෙන් ඉල්ලා හිටිනවා මේ ගැටලුව ගැන හොයා බැලීමට නම් ඔබ දන්නා හැම දෙයක්ම අපට හෙළිකරන්න කියල."

"හරිම අවාසනාවක්!" තරුණිය කීවාය. "ඒක හරිම අවාසනාවන්ත තත්ත්වයක් මහත්මයා. මං මුහුණදීලා තියෙන්නේ ඉතාම බිහිසුණු තත්ත්වයකට. ඒක පදනම් වෙලා තිබෙන කාරණා නම් කිසිවක් හරි හැටි පැහැදිලි නෑ. මගේ හිතේ බරපතල සැකයක් ඇතිකරන මේ හේතු, අනෙක් අයට නම් ඒ හැටි බැරෑරුම් විධියට පෙනෙන්නේ නැහැ. ඔවුන් හිතන්නේ මං ඉතා සුළු දෙයින් පවා බියට පත්වෙන ගැහැනියක් කියලයි; හැම දෙයක්ම මං හිතේ මවා ගත් බහුබූත කියලයි. මං අවවාදයක් උදව්වක් පතා මේ ගැන පැමිණිලි කළ හැම කෙනෙකුගේම සිත්වල ඇතිවුණේ ඒ හැඟීම බව මට තේරුම් ගන්න පුළුවනි. ඔවුන් තුළ ඇරලා එහෙම තිබ්බේ නැහැ. නමුත් මාව සනසවන්නට දුන් පිළිතුරු වල හැටියටත්, මගේ දෑස්, මඟ හැරලා කියා කළ හැටියටත්, මට ඒක තේරුම් ගන්න පුළුවනි. නමුත් හෝම්ස් මහත්මයා මං අහල තියෙනවා, ඔබට පුළුවන් කියලා, මිනිස් හදවතේ සැඟවුණු රැඳුණු බව විනිවිද දකින්න. එහෙනම් මාව වටකරගෙන තියෙන අන්තරායයන්ගෙන් ගැලවී, ඉදිරියට යන්න කොහොමද කියල මට තේරුම් කරල දෙනවද

http://sherlockholmesinvestigations.blogspot.com

"මං ඒ හැමදේකටම සූදානම් නෝනා."

"මගේ නම හෙලන් ස්ටෝනර්. මං ජීවත්වෙන්නෙ මගේ සුළු පියාත් සමග ඔහුගේ නිවසේ. සරේ ප්‍රාන්තයේ බටහිර සීමාව අසල ස්ටෝක් මොරාන් ගම ගැන ඔබ අහල ඇති. බාප්පගේ පරම්පරාව ඈත අතීතයේ ඉඳන් එංගලන්තයේ වාසය කළ, සැක්සන් වරුන්ගෙන් පැවත එන්නක්. ඔහු තමා රෝයිලොට්ස් පරපුරෙන් මෙලොවට ඉතිරි වෙලා ඉන්න අන්තිම පුරුක."

"මේ නම මං අහල පුරුදුයි."

"රොයිලොට්ස් පරපුර එංගලන්තයේ වාසය කළ මහා ධනවත්ම පෙළපතක්. ඔවුන් සතුව තිබූ වතුයාය ඉතා විශාල ප්‍රදේශයක් හරහා විහිදුණා. එහි උතුරු සීමාව වුණේ බර්ක්ෂයර් ප්‍රාන්ත සීමාව. බටහිරින් හැම්ෂයර් ප්‍රාන්තය. පහුගිය ශතවර්ෂය රොයිලොට්ස් පරපුරට නරක කාලයක් වුණා. රොයිලොට්ස් පවුලේ ධනය උරුමවුණු සාමාජිකයන් හතර්දෙනෙක්ම මනුස්ස ගුණ ධර්ම නොදත්, මිලමුදල් නාබාසිනියා කළ, නාස්තිකාරයින් වුණා. ඊළඟට 1810 - 20 අරාජික කාලේ, පවුලේ ඉතිරිව තිබුණු හැම දෙයක්ම විනාශ කර දමන්න සූදු අන්තුවෙකු වූ රොයිලොට් කෙනෙක් සමත්වුණා. දැන් ඉතිරි වෙලා තියෙන්නේ ඉඩම් අක්කර කිහිපයක් සහ අවුරුදු දෙසීයක් පැරණි රොයිලොට්ස් මන්දිරය පමණයි. ඒකත් විශාල උකසකට හිරවෙලයි තියෙන්නේ. මෙහෙ ජීවත්වුණු අන්තිම ප්‍රභූවරයා, මගේ බාප්පගේ තාත්තා. ඔහු තමට වලව්කාරයෙක් වුණත්, ජීවත්වුණේ ඉතාම දුකසේ, අන්තිම හිඟන්නෙක් වගේ. ඔහුගේ එකම පුතා වුණේ මගේ බාප්පා. තමන්ට මුහුණ දීමට වී ඇති තත්ත්වය තේරුම් අරගෙන, ඒ වෙනුවෙන් යමක් කළ යුතු යයි බාප්පා සිතුවා. ඔහු ඥාතියෙකුගෙන් විශාල මුදලක් ණයට අරගෙන වෛද්‍යවිද්‍යාලයට ඇතුළුවුණා. එහිදී වෛද්‍යවරයෙකු ලෙස සමත්වුණු බාප්පා ඉන්දියාවේ කල්කටාව බලා පිටත්වී ගියා. ඔහු පෞද්ගලික වෛද්‍යවරයෙකු ලෙස කල්කටා නගරයේ වෙදකම පටන්ගත්තා. වෘත්තීය දක්ෂකම් නිසාත් චරිතයේ ස්වභාවය නිසාත්, වෙදකම ඉතා සාර්ථක කරගෙන විශාල මුදලක් උපයාගන්න දොස්තර රොයිලොට් සමත්වුණා.

මේ අතරේ ඔහුගේ ගෙදර සිදුවුණු යම් හොරකම් වගයක් ගැන කෝපයට පත්වුණු ඔහු, නම් ප්‍රධාන ගෘහසේවකයාට තදින

ලෙස පහරදී තිබෙනවා. ඒම පහරදීම නිසා ඒ ස්වදේශික සේවකයා මරණයට පත්වුණා. ඒ චෝදනාවට සිරභාරයට ගැනුණු මගේ බාප්පා, මරණ දඬුවම නොලබා ඉතා යාන්තමින් බේරුණා. නමුත් ඔහුට දීර්ඝ සිරදඬුවමක් ලැබුණා. සිරෙන් නිදහස් වූ පසු ඔහු එංගලන්තයට ආවේ අමුතුම චරිතයක් වෙලා. කිසිකෙනෙකුට නොරිස්සූ ඔහු බලාපොරොත්තු කඩවූ මිනිසෙකු බවට පත්වී තිබුණා.

මගේ නාන්නා බෙංගාලයේ කාල්තුවක්කු හමුදාවේ සේවය කළ මේජර් ජනරාල් ස්ටෝනර්. මාත් මගේ නිවුන් සොහොයුරිය ජූලියාත් ළදරුවන් කාලයේම අපේ පියා මිය ගිහින් තිබෙනවා. තරුණ වයසේ සිටි මගේ අම්මා දොස්තර රොයිලොට් සමග විවාහ වෙනවිට අපට වයස අවුරුදු දෙකයි. මේ විවාහය සිදුවෙන කාලයේත් අම්මාට සෑහෙන ධනයක් තිබුණා. ඇයට අවුරුද්දකට ලැබුණු ආදායම පවුම් 1000ක් පමණ වුණා. ඇය මේ ආදායම සම්පූර්ණයෙන්ම දොස්තර රොයිලොට්ගේ නමට හැරෙව්වා. ඒ එක කොන්දේසියක් උඩ. එනම් අප දෙදෙනා විවාහ වෙද්දී මෙයින් යම්කිසි මුදලක් අවුරුදු පතා අප දෙදෙනාටම දිය යුතුයි යන පොරොන්දුව මත.

අප එංගලන්තයේ පදිංචියට ඇවිත් කෙටි කාලයකදී අපේ අම්මා මියගියා. අවුරුදු අටකට කලින් ඇය මියගියේ ක්‍රෙවේ නගරය අසල සිදුවූ දුම්රිය අනතුරකින්. ඒ වන විට දොස්තර රොයිලොට් ලන්ඩනයේ වෛද්‍ය චිකිත්සාගාරයක් පටන් අරගෙන, වෛද්‍යකමක් ගොඩනගා ගන්න උත්සාහ දරමිනුයි සිටියේ. අම්මාගේ මරණයත් සමඟම ඔහු එය අත්හැර දැමුවා. ඊළඟට බාප්පා අප දෙදෙනාත් රැගෙන ස්ටෝක් මොරාන්හි ඔහුගේ පැරණි වලව්වේ පදිංචියට ගියා. අපේ අම්මා අප වෙනුවෙන් ලැබීමට සලස්වා තිබූ මුදල, ජීවත්වෙන්න හොඳටම ප්‍රමාණවත් වුණා. ඒ නිසා අපේ සන්තෝෂයට බාධා වියහැකි යමක් පෙනෙන්න තිබුණේ නැහැ.

නමුත් මේ කාලයේ බාප්පාගේ ස්වභාවය ඉතා දරුණු ලෙස වෙනස් වුණා. අසල්වාසීන් සමඟ හිතවත් වෙලා, ඔවුන් සමඟ සුහද ආශ්‍රයක් පවත්වාගෙන යනු වෙනුවට බාප්පා ඔවුන් සමඟ සණ්ඩුවුණා. ඇත්තෙන්ම අප මේ පැරණි වලව්වේ පදිංචියට ඒම ගැන අසල්වාසීන් මුලින් සතුටට පත්වුණා. පාළුවට ගොස් තිබුණු රොයිලොට්ගේ මන්දිරයට ඒ පරපුරේම කෙනෙකු ඒම ඔවුන්ගේ

සැනසීමට හේතුවුණා. නමුත් බාප්පා අසල්වාසී කිසිවෙකුගේ නිවසකට යාම්එම් කළේ නැහැ. කිසිවෙකුට ගෙදරට ආරාධනා කළෙත් නැහැ. කවුරුන් හෝ ඔහුගේ අදහස්වලට නොගැළපෙන යමක් කිව්වොත් ඔවුන් සමඟ ඉතා දරුණු ලෙස සණ්ඩු සරුවල් කරන්න පටන්ගන්නා. සුළු දේකින් පවා කෝපාවිෂ්ට වෙලා, කෝපයෙන් වියරු වීම, රොයිලොට්ස් ජරපුරුෂ් පිරිමින්ගේ ලේ වල තිබුණු දෙයක්. නමුත් ඒ බිහිසුණු ගතිය අන් හැම දෙනෙකුගේ ප්‍රමාණයට වඩා බාප්පා ළඟ දෙගුණ තෙගුණ වී තිබුණා. මං හිතන හැටියට ඒකට හේතුව ඔහු දීර්ඝ කාලයක් උෂ්ණ කලාපයේ රටක වාසය කිරීමයි. අප හරිම ලැජ්ජාවට පත්වෙන ආකාරයේ සණ්ඩු ගණනාවක්ම සිද්ධවුණා. එයින් දෙකක් සමථයකට පත් නොවී පොලිස් උසාවිය දක්වාම ගියා. කොහොම හරි අන්තිමට බාප්පා ගමේ බිහිසුණුම පුද්ගලයා බවට පත්වුණා. ගමේ මිනිස්සු ඔහු දුටු ගමන් පැන දිව්වා. ඒකට හේතු වුණේ බාප්පා දැඩි ශරීර ශක්තියක් තිබුණු, කේන්ති ගියාම එය පාලනය කරගන්න බැරි පුද්ගලයෙකු වීමයි.

ගිය සතියේ ඔහු ගමේ කම්මල්කාරයා ඔසවලා පාලමකට උඩින් විසිකළා! ඒ වෙලාවේ ගෙදර තිබුණු තරමක් මුදල් එකතු කරලා කම්මල්කරුවාට ගෙවලයි උසාවි නොයන තත්ත්වයට ඒක සාමදාන වෙන්න පුළුවන් වුණේ. බාප්පාට වැදගත් යාළුමිත්‍රයන් කිසිකෙනෙක් නැහැ. ඔහුට සිටින එකම මිත්‍රයන් තමා, ස්ථිර වාසස්ථානයක් නැති අහිගුණ්ඨික මිනිස්සු. අපට අයත් ඉඩමේ කැලෑබද කොටසක මේ මිනිස්සුන්ට කඳවුරක් සාදාගන්න බාප්පා ඉඩදී තියෙනවා. එයට ගාස්තුව වශයෙන් ඔහු එක දිගට සති ගණන් ඒ මිනිසුන්ගේ කඳවුරට ගිහින් ඒ කුඩාරම් වල දවස ගතකරනවා. ඒ වගේම බාප්පා ඉන්දියානු සතුන්ටත් ලොකු කැමැත්තක් දක්වනවා. මේ සතුන් ගෙන්වා ගන්නේ ඉන්දියාවේ සිටින ඔහුගේ නියෝජිතයෙක් මගින්ලු. මේ දිනවල බාප්පා චීටා වර්ගයේ කොටියෙකු සහ බැබූන් වඳුරෙකු ගෙන්වා ගෙන වත්තේ ඇවිදවීම කරනවා. උන් ගෙවත්තේ නිදහසේ සැරිසරන නිසා ගම්වාසීන් අපේ වත්තට ඇතුළුවෙන්නත් පණ භයයි.

මං මේ දක්වා කියූ දෙයින් ඔබට තේරෙනවා ඇති මගේ සොයුරිය ජූලියාට වත් මට වත් ජීවිතේ කිසිම සන්තෝෂයක්



226. "ගමේ කම්මල්කාරයා ඔසවලා තාප්පයකට උඩින් විසිකළා."

http://sherlockholmesinvestigations.blogspot.com

නොතිබුණු හැටි. මොනම් සේවකයෙක් වත් වැඩි දවසක් අපේ ගෙදර රැඳී හිටියෙ නෑ. ගෙදර කරන්න තිබුණු හැම වැඩක්ම අපි දෙන්නාට කරන්න සිදුවුණා. ඇය මියයනකොට වයස තිහයි. ඒ වුණත් මගේ වගේම ඇගේ කෙසුත් සුදුවෙන්න පටන් අරගෙනයි තිබුණේ.

"ඇය මියගිහින් එහෙනම්?"

"ඔව්. හරියටම අවුරුදු දෙකකට පෙර ඇය මියගියා. මං ඔබ හමුවෙලා මෙහෙම කතාබහ කරන්න ආවේත් ඇගේ මරණය ගැනයි. අප ගතකළ ජීවිතයේ හැටියට, අපේ වයසේ හෝ අපේ තත්ත්වයේ වෙනත් කෙනෙක් හමුවෙන්න අපට අවස්ථාවක් තිබුණේ නැහැ. ඒ බව ඔබට පැහැදිලිවම පෙනෙනවා ඇති. කොහොම වුණත් අපට එක නැදෑයෙක් හිටියා. ඇය මගේ අම්මාගේ අවිවාහක සොහොයුරියක්. ඇගේ නම හොනෝරියා වෙස්ට්ෆේල්. ඇය ජීවත්වුණේ හැරෝ නගරයට කිට්ටුව. මේ පුංචි අම්මාගේ නිවසට යන්නට අපට ඉඳහිට අවසර ලැබුණා. එවා වුණත් දින ගණනක් නතර වී සිටිය හැකි ඒවා නොවෙයි. අපට නියම කරලා තිබුණේ බොහොම කෙටි කාලයක් එහි ගතකරලා, ඉක්මනින් ආපසු එන්නයි. අවුරුදු දෙකකට කලින් නත්තලට අපි එහේ ගිය වෙලාවේ නාවිකයෙකු ලෙස රැකියාව කළ තරුණයෙකු ජූලියාට මුණ ගැහුණා. ඇය ඔහු සමඟ ඉක්මනින් විවාහ ගිවිසගත්තා. ගෙදර ආවට පස්සේ මේ විවාහ ගිවිසගැනීම ගැන ජූලියා, තාත්තට දැනුම් දුන්නා. එහෙම විවාහවෙන්න තීරණය කිරීම ගැන තාත්තා විරුද්ධත්වයක් දැක්වුවේ නැහැ. විවාහයට දින නියම කෙරුණා. නමුත් විවාහ මංගල්‍යයට සති දෙකක් තිබියදී ඒ ඛේදජනක සිද්ධිය වුණා. මට සිටි එකම හිතවතියත්-එයින් මට අහිමිවුණා.

ෂර්ලොක් හෝම්ස් මෙතෙක් වේලාවක් සිටියේ හාන්සි පුටුවේ පිටුපසට හේත්තු වී දෙනෙත් පියාගෙනයි. අනුග්‍රාහිකාවගේ අවසන් වැකියට ඔහු දෙනෙත් යන්තමින් විවර කොට ඇය දෙස බැල්මක් හෙළීය.

"කරුණාකරල සිද්ධිය වුණු ආකාරය සම්පූර්ණ විස්තර සහිතව මට කියන්න."

"එහෙම විස්තරයක් ඔබට කියන එක මට අපහසු නෑ. ඒ මොකද ඒ බිහිසුණු සිද්ධියේ හැම මොහොතක් පාසාම මගේ

මතකයේ සටහන් වෙලා තිබෙන්නේ රත්වූ යකඩයකින් පිලිස්සුවාක් මෙන්.

මං ඔබට කලින් කිව්වා වගේ රොයිලොට්ස් වලව්ව ඉතාම පැරණි මහ විශාල මන්දිරයක්. අපි පදිංචිය සඳහා යොදාගෙන තිබෙන්නේ ඒකෙ එක කොටසක් පමණයි. මේ කොටසේ නිදන කාමර පිහිටා තිබෙන්නේ බිම් මහලේ. උඩ තට්ටුවේ නොවෙයි. විසිත්ත කාමරය තියෙන්නේ ඊට ඇතින් ප්‍රධාන ගොඩනැගිල්ලෙයි. මෙම නිදන කාමර වලින් පළමුවෙනි එක දොස්තර රොයිලොට්ගේ දෙවැනි කාමරය ජූලියාගේ. තුන්වැන්න මගේ. මේ කාමර ඇතුළතින් එකිනෙකට සම්බන්ධ වෙන්නෙ නෑ. නමුත් කාමරයෙන් පිටවෙන දොරවල් විවෘත කළාම, කාමර තුනම විවෘත වෙන්නේ එකම බරාඳයට. මං කියන දේ ඔබට පැහැදිලිද?"

"ඇත්තෙන්ම ඔව්."

"කාමර තුනේම ජනේල විවෘත වෙන්නේ තණකොළ වවා තිබෙන මිදුලකට. මේ අවාසනාවන්ත රාත්‍රියේ දොස්තර රොයිලොට් වෙනදාටත් කලින් ඔහුගේ කාමරයට ගියා. නමුත් ඒ ඉක්මනින්ම ඔහු නින්දට ගියේ නැතිබව අපි තේරුම් ගත්තා. ඔහු සිරිතක් වශයෙන් දුම්පානය සඳහා යොදාගත්තේ ඉන්දියන් සුරුට්ටු වර්ගයක්. ඒයින් නැඟුණු දුර්ගන්ධය නිසා මගේ සොයුරිය හරි අපහසුවකට පත්වුණා. එම ගඳ ඇගේ කාමරයට වැඩිපුර දැනුණු නිසා, ඇය තමන්ගේ කාමරයෙන් පිටවී මගේ කාමරයට ආවා. ඇය මගේ කාමරයේ වාඩිවී, ළඟ එන විවාහ මංගල්‍යය ගැන කතාබහ කරමින් සිටියා. රෑ එකොළහ වෙද්දී ඇය මගේ කාමරයෙන් පිටවී යන්න සූදානම් වුණා. දොර ළඟදී නැවතුණු ඇය ආපසු හැරී මා දෙස බැලුවා.

"මට කියන්න හෙලන්. දෙගොඩහරි ජාමෙත් පහුකරලා මහ රෑ, කවුරු හරි සිවුරුහන් කරන හඬක් ඔබට ඇහිල තියෙනවද?" ඇය ඇහුවා.

"මට නම් කවදාවත් ඇහිල නෑ."

"ඔයා නින්දෙන් සිවුරුහන් කළා වෙන්න බෑ. එහෙම නේද?"

"ඒක නම් කොහොමටවත් වෙන්න බෑ. ඇයි ජූලී එහෙම ඇහැව්වෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"පහුගිය දවස් කීපයක්ම, මට මහ රෑ එහෙම දෙයක් අහන්න ලැබුණා. ඒ කියන්නේ පාන්දර තුනට විතර, කවුරු හරි බොහොම සියුම් හඬකින් සිවුරුහන් කරන බව මට පැහැදිලිවම ඇහුණා. මට තදින් නින්ද යන්නේ නෑ. ඒ නිසා මේ ශබ්දයෙන් මට ඇහැරෙනවා. ඒ ශබ්දය ආවෙ කොහෙන්ද කියල මම දන්නෙ නෑ. බාගවෙලාවට බාප්පා ඉන්න අල්ලපු කාමරයෙන් වෙන්නත් පුළුවනි. මට හිතුණා ඔයාගෙන් අහන්න ඕනෙ කියලා, ඔයාටත් ඇහුණද බලන්න."

"නෑ මට නම් ඇහුණෙ නෑ. ඔය අර වත්ත පහළ පදිංචි වෙලා ඉන්න කාලකණ්ණි මිනිස්සු, අහිගුණ්ඨිකයො වෙන්න ඇති."

"ඔව්. බොහොම වෙලාවට උන් වෙන්න ඇති. ඒ වුණත් උන් මිදුලේ ඉඳගෙන සිවුරුහන් කළා නම් මට පුදුමයි ඔයාට නෑහුණේ කොහොමද කියලා?"

"ආ . . . . මට ඔයාට වඩා තදින් නින්ද යනවා."

"මේක වැදගත් කමක් ඇති මහ ලොකු ප්‍රශ්නයක් නොවෙයි." එහෙම කිව් ඇය මා සමඟ හිනාවෙලා මගේ දොර වසාගෙන පිටවෙලා ගියා. මොහොතකට පසු මට ඇහුණා, ඇය ඇගේ කාමරය ඇතුළෙන් වසාගෙන යතුරු දමාගන්නා හඬ."

"ඔබේ කාමර වල දොරවල් සිරිතක් වශයෙන් හැමදාම රෑට ඇතුළෙන් අගුළු දමා වසාගන්නවාද?"

"ඔව්. හැමවිටම."

"ඒ මොකක් නිසාද?"

"මං ඔබට සඳහන් කළා බාප්පා චීටාවෙකු සහ බැබුනයෙකු ඇති දැඩි කරන බව. දොරවල් අගුළු දමා වැහුවේ නැත්නම්, අපේ පරෙස්සම ගැන විශ්වාසයක් තබන්න බැහැ."

"ඔව්. ඒක හරි. ඉතින් දිගටම කතාව කියන්න."

"මට එදා රෑ නින්ද ගියේ නෑ. ළඟදීම අප වෙත එල්ල විය හැකි මහ භයානක ඉරණමක් ගැන මගේ හිතේ හැඟීමක් ඇතිවුණා. මං ඔබට කිව්වා මගේ සහෝදරියත් මමත් නිවුන්නු බව. ඔබ දන්නවා ඇති නිවුන් අය දෙදෙනෙක් අතරේ, ආත්මීය වශයෙන් කොයිතරම් සමීප බැඳීමක් තියෙනවද කියලා.

http://sherlockholmesinvestigations.blogspot.com

එදා මහ අයහපත් කාලගුණයක් තිබුණු රාත්‍රියක්. ඒ පලාතම දෙදරවන මහා හඬක් නංවමින් කුණාටුවක් හමන්න පටන්ගෙනයි තිබුණේ. කුණාටුවත් එක්කම ධාරානිපාත වර්ෂාවකුත් කඩා හැළුණා. සුළං පාරට, වැස්ස මගේ ජනේලයට වේගයෙන් වදින්න පටන් ගත්තා. කුණාටුවේ මහා ශබ්දය මැද්දේ එක්වරම ගැහැනියකගේ විලාප හඬක් මට ඇහුණා. මං දනගත්තා ඒ මගේ සොයුරියගේ කටහඬ බව. මං ඇඳෙන් බිමට පැනලා, සළුවක් ඇඟේ ඔතාගෙන, දොර ඇරලා බරාඳයට දිව ආවා.

මගේ කාමරයේ දොර අරිද්දිම සිවුරුහත් හඬ මගේ කනට ඇහුණා. ඒක මගේ සොහොයුරිය විස්තර කළ විධියේ හඬක්. ඒ ඉක්මනින්ම යම්කිසි ලෝහ උපකරණයක් බිම වැටෙනවා වගේ ශබ්දයකුත් ඇහුණා. මං බරාඳයේ ඉදිරියට දිව ගියා. මගේ සොයුරියගේ කාමරයේ දොර අගුළු ඇරිලා; දොර හෙමින් හෙමින් විවෘත වුණා.

මං ඒ දිහා බලාගෙන හිටියේ භයෙන් ගල්ගැහිලා. මේ දොරෙන් එළියට එන්නේ කුමන දෙයක්දැයි නොදැන මං බලාහිටියේ අප්‍රමාණ කැළැඹීමකින්. නමුත් දොරෙන් එළියට ආවේ මගේ සොයුරිය - ජූලියා. බරාඳයේ දල්වුණු ලාම්පුවෙන් මට ඇයව පෙනුණා. ඇගේ මුහුණ භීතියෙන් සුදුමැලි වෙලා. ඈ අත්දෙක ඉදිරියට දිගු කළේ මගෙන් උදව් ඉල්ලාගෙන. මුළු ශරීරයම එහා මෙහා විසිවෙමින් ඇය ඉදිරියට ආවේ හරියට මත්පැන් බී වෙරිවුණු මිනිහෙක් වගේ. මං ඉදිරියට දුවලා මගේ දෑතෙන් ජූලියාව බදා ගත්තා. නමුත් ඒ මොහොතේම ඇගේ දෙපා අප්‍රාණික වෙලා ඇය බිම ඇද වැටුණා. ඉවසන්න බැරි දැඩි වේදනාවකින් පීඩා විඳින්නයක මෙන් ඇගේ මුළු සිරුරම ඇඹරුණා. ඇගේ අත්පා වරින්වර හිගැස්සුණේ හරියට අපස්මාර රෝගියෙකුගේ වගේ.

මට මුලින් හිතුණේ ඇයට මාව හඳුනාගන්න බැරිවුණා කියලයි. මං පහත්වෙලා ඇය දෙසට මුහුණ ළං කරද්දී ඇය වේදනාවෙන් මරලතෝනි දුන්නා. ඒ ශබ්දය මට ජීවිතේටම අමතක කරන්න බෑ.

"අනේ දෙවියනේ! හෙලන්! ඒ අර පටිය. තිත් වැටුණු පටිය!"

තවත් මොනවා හරි කියන්න ඇයට උවමනාව තිබුණා. ඇය දබරැඟිල්ල දොස්තර රොඩ්‍රිගෝගේ කාමරය දෙසට දිගුකරලා

ඒක කියන්න නැත් කළා. නමුත් මිළඟට අත් පා තිගැස්සෙමින් මුළු ශරීරයම ගැහෙන්න පටන්ගත්තා. ඒ නිසා ඒ වචන කටින් පිටවුණේ නැහැ.

මං බාප්පා අමතා කෑගසමින් කාමරයෙන් එළියට දිව ආවා. ඔහුත් නම පිටකබාය අඳිමින් කාමරයෙන් එළියට එමිනුයි හිටියේ. බාප්පා මගේ සොයුරිය ළඟට එද්දී ඇයට සිහි තිබුණේ නෑ. ඔහු ඇයට බ්‍රැන්ඩි ටිකක් පෙව්වා. ගමේ වෛද්‍යවරයා කැඳවාගෙන එන්න කියලා වහාම පණිවුඩයක් යැව්වා. නමුත් එයින් පලක් වුණේ නැහැ. සිහි නැතිව හිටි ජූලියාගේ තත්ත්වය තවත් අසාධ්‍ය අතට හැරුණා. ඇය සිහි නොලබාම මියගියා. හෝම්ස් මහත්මයා මගේ සොයුරියගේ ඛේදජනක අවසානය සිද්ධවුණේ අන්න ඒ විදියටයි."

"මොහොතක් ඉන්න." හෝම්ස් කීය. "මේ සිවුරුහන් තිරිංම හඬ ගැනත් ලෝහ යමකින් සිදුවූ ශබ්දය ගැනත් ඔබට හොඳටම විශ්වාසද? ඒ ගැන ඔබට දිවුරන්න පිළිවන්ද?"

"ජූලියාගේ හදිසි මරණ පරීක්ෂණයේදී මරණ පරීක්ෂකයා මගෙන් ඇහුවෙත් ඔය ටිකමයි. ඒ ආකාරයේ ශබ්ද ඇහුණ කියල මගේ ලොකු විශ්වාසයක් තිබෙනවා. නමුත් ඒ වෙලාවෙ පැවතුණු කුණාටුව නිසාත්, සුළඟෙත් ගෙයි නැත් තැන් වල ඇතිවූ ශබ්ද නිසාත්, බාග වෙලාවට මට ඇහුණේ වෙනත් ශබ්දයක් වෙන්නත් පිළිවන්."

"ඔබේ සොයුරිය කාමරයෙන් එළියට එන විධියට හැඳ පැළඳ ගෙනද සිටියේ?"

"නැහැ. ඇය සැරසිලා හිටියේ ඇගේ රාත්‍රි ගවුමෙන්. ඇගේ දකුණු අතේ, දල්වී, පසුව නිවී ගිය ගිනිකූරක කැබැල්ලක් සහ වම් අතේ ගිනිපෙට්ටියක් තිබී අපට පසුව හමුවුණා."

"ඒකෙන් පෙනෙන්නේ අනතුරුදායක ශබ්දයක් ඇහුණාම ඇය ගිනිකූරක් දල්වලා පරීක්ෂා කර බැලූ බවයි. අන්න ඒ කාරුණ වැදගත්. මරණ පරීක්ෂකවරයා ඒකෙන් ගත්ත තීරණය මොකක්ද?"

"ඔහු මේ මරණය ගැන, ඉතාම උනන්දුවෙන් කරුණු පරීක්ෂා කර බැලුවා. ඊට ප්‍රධානම හේතුව වුණේ දොස්තර රොයිලොට් ගේ දරුණු ස්වභාවය ගැන අපේ ගම් ප්‍රදේශයේ ප්‍රචලිතව තිබීමයි. කොහොම වුණත් මරණය සිද්ධවුණු ආකාරය ගැන සෑහීමකට පත්වෙන්න තරම් සාධාරණ

හේතුවක් සොයාගන්න මරණපරීක්ෂකවරයාට බැරිවුණා. ඇගේ කාමරයේ දොර ඇතුළතින් වසා තිබුණු බවත්, යකඩ පොලු සහිත ජනේල පරණ තාලේ ජනෙල් පියන් වලින් වසා තිබුණු බවත්, මගේ සාක්ෂි වලින් තහවුරු වුණා. මේ ජනෙල් පියන් හැමදාම රෑට අමතක නොකර වසා දමනු ලැබූ ඒවා. ජුලියාගේ කාමරයේ බිත්ති වල සහ පොළොවේ බිඳී ගිය තැන් තිබේද කියල පරීක්ෂා කර බැලුවා. නමුත් ඒවායේ කිසිම අඩුපාඩුවක් හෝ පළුද්දක් නොමැති බවත්, හොඳින් ශක්තිමත් බවත් පෙනී ගියා. කාමරයෙන් එළියට දුම් යන කවුළුව හුඟක් පුළුල් එකක්. නමුත් ඒකත්, ඇතුළතින් යකඩ පොලු හතරකින් අවහිර කර තියෙන්නේ. ඒ නිසා මගේ සොයුරිය මිය යද්දී ඇය කාමරයේ සිටියේ තනිවම බව හොඳටම විශ්වාසයි. අනෙක ඇයට තුවාලයක් හෝ වෙනත් වධහිංසාවක් කළ බවට, ශරීරයේ කිසිම සලකුණක් තිබුණේ නෑ."

"ශරීරයට විෂ ඇතුළුකිරීමක් එහෙම සිදුවෙලාද කියල පරීක්ෂා කර බැලුවද?"

"වෛද්‍යවරු ඒ ගැනත් පරීක්ෂා කළා. නමුත් එයින් සාර්ථක ප්‍රතිඵල ලැබුණේ නෑ."

"මේ අවාසනාවන්ත නෝනා මියගියේ කොහොම කියලද ඔබ හිතන්නෙ?"

"මගේ විශ්වාසය නම්, ඇය මියගියේ දැඩි භීතියකට පත්වීමෙන් හා එයින් ස්නායු පද්ධතියට ඇතිවූ කම්පනයෙන්. නමුත් ඇය මේ තරම් භයකට පත්වුණේ කොහොමද කියලා මට නම් හිතාගන්නවත් බෑ."

"මේ කියන දවසේ මේ වෙලාවේ අර අහිගුණ්ඨික මිනිස්සු වත්තේ නතර වෙලා හිටියද?"

"ඔව්. හැමදාකම වගේ ඒ මිනිස්සු කවුරු හරි වත්තේ ඉන්නවා."

"ඔබේ සොහොයුරිය කිව්වාගේ තීත් වැටුණු පටියක් ගැන? මෙකෙන් ඔබ තේරුම් ගත්තේ මොකක්ද?"

"මට වෙලාවකාට හිතිලා තියෙනවා, මේක ඇය මරුවිකල්පෙන්, කටට ආ නිසා කිව් දෙයක් කියල. එහෙමත් නැත්නම් අර අහිගුණ්ඨික මිනිසුන් පාවිච්චි කරන පටියක් ගැනකත් කියවන්, ඔවුන් හිසේ

බඳින්න තිත් වැටුණු ලේන්සු පාවිච්චි කරනවා. හීනියෙන් හිටි ඇයට එහෙම දෙයක් මතක් වුණාද දන්නෙත් නෑ."

හෝම්ස් තම හිස සෙලවූයේ එම පිළිතුරෙන් ඔහු සෑහීමට පත්නොවූ බව පෙන්වමිනි.

"මේක අපට තේරුම් කරන්න අමාරු ගැටලු සහගත තත්ත්වයක්. ඉතින් ඔබේ කථාව දිගටම කියන්න."

"එම අවාසනාවන්ත සිද්ධිය වෙලා අවුරුදු දෙකක් ගතවුණා. මෑතක් වෙනතුරු මං ගෙව්වේ මහ පාළුවක්, තනිකමක් දැනුණු ජීවිතයක්. මාසෙකට විතර කලින් යම් ධනයක් සිද්ධවුණා. අවුරුදු ගණනාවක් තිස්සේ මා හඳුනන මිතුරෙක්, මට විවාහ යෝජනාවක් ගෙනාවා. ඔහුගේ නම ආමිටේජ්, පර්සි ආමිටේජ්. ඔහු, රෙඩිංහි ක්‍රේන්වෝටර් ගම්මානයේ ආමිටේජ් මහත්මයාගේ දෙවැනි පුතා. මගේ බාප්පාට මං මේ ගැන දැනුම් දුන්නා. ඒකට ඔහුගේ විරුද්ධත්වයක් නෑ. ඉතින් අපි ළඟදීම අතිනත ගන්නයි ඉන්නේ.

දින දෙකකට කලින් අපේ නිවසේ බටහිර කොටසේ ගොඩනැඟිලි අලුත්වැඩියා කටයුතු ටිකයක් පටන් ගැනුණා. එයින් මගේ නිදන කාමරයේ බිත්තියේ ලොකු කපොල්ලක් සෑදුණා. ඒ නිසා මට මගේ කාමරයෙන් ඉවත්වෙලා, මගේ සොයුරිය පාවිච්චි කළ නිදන කාමරයට යන්න සිද්ධවුණා. ඇය මියගියේත් ඒ කාමරයේදියි. මට නිදාගැනීම සඳහා ලැබුණේ එම ඇඳමයි.

ඊයේ රෑ මං නින්දට ගිය වෙලාවේ, නැවත නැවතත් මගේ හිතට ආවේ මගේ සොහොයුරියට අත්වූ භයානක ඉරණමයි. ඊළඟට මැදියම් රැයත් පහුවෙලා, ගේ හතර වටේම නිශ්ශබ්දතාවයේ වෙළී තිබියදී මටත් ඒ ශබ්දය ඇහුණා! මගේ ආදරණීය සොයුරියට මරණයේ පණිවුඩය ගෙන ආ ඒ බිහිසුණු සිවුරුහන් හඬ මටත් ඇහුණා. මගේ හිතේ ඇතිවූ භීතිය ඔබට හිතාගන්න පුළුවන්ද හෝම්ස් මහත්මයා? මං එසැවරම ඇඳෙන් නැගිටලා පහන දල්වුවා. කාමරය ඇතුළත නම් කිසිම අමුත්තක් පෙනුණේ නෑ . . කොහොම වුණත් මට නවත් නිදාගැනීමට හැකියාවක් තිබුණේ නැහැ. ඉතින් මං හැඳ පැළඳගෙන එළිය වැටෙන තුරු බලා සිටියා. එළිය වැටෙද්දීම ගෙදරින් පිටවී ඇවිත්, ගේ ඉස්සරහ තියෙන "ක්‍රවුන් ඉන්" තානායමෙන් අශ්වකරත්තයක නැගලා, ලෙදර්හෙඩ් දක්වා

http://sherlockholmesinsinhala.blogspot.com

පැමිණියා. මං මේ විදියට ආවේ ඔබේ ආධාරය හා උපදෙස් පතාගෙන."

"ඔබ බොහොම ඥානාන්විත ලෙස කටයුතු කර තිබෙනවා. නමුත් ඔබ ඔක්කොම තොරතුරු මට කිව්වද?"

"ඔව්?"

"ස්ටෝන්හර් මෙනෙවිය. ඔබ ඔක්කොම කිව්වෙ නෑ. ඔබ ඔබේ බාප්පාට එරෙහිව කරුණු කියන්නේ නෑ නේද?"

"ඇයි ඔබ එහෙම කියන්නේ?"

තරුණියගේ හැට්ටේ අත් වැලමිට සිට පහළට කළු පැහැති රේන්ද වලින් ලිහිල්ව නිම වී තිබුණි. ඇගේ ප්‍රශ්නයට පිළිතුරක් ලෙස හෝම්ස්, එම රේන්ද සහිත කොටස ඉහළට තල්ලු කළේය. ඇගේ සුදු පැහැති මැණික් කටුව ප්‍රදේශයේ රතු පැහැති සලකුණු පහක් විය. ඒ මහපටැඟිල්ල සහ අනෙක් ඇඟිලි හතරකින් දැඩිව කළ ග්‍රහණය නිසා ඇතිවූ ලකුණු බව හඳුනාගත හැකිවිය.

"ඔහු ඔබට සලකා තිබෙන්නේ බොහොම දරුණු විදියට."

කාන්තාවගේ මුහුණ රතු පැහැයට හැරිණි. ඇය ඉක්මනින්ම අතින් ඒ පෙදෙස ආවරණය කරගත්තාය.

"බාප්පා බොහොම සැරපරුෂ කෙනෙක්. වෙලාවකට ඔහුම දන්නෙ නැහැ, තමන්ට තිබෙන ශක්තිය කොපමණද කියලා."

මින්පසු පැවතියේ දිගු නිහඬතාවයකි. දෑතේ නිකට රඳවාගත් හෝම්ස්, ගිනි උදුනේ දල්වෙන ගිනි අඟුරු දෙස බලාගෙන කල්පනා කළේය.

"මේක බොහොම ගැඹුරු ප්‍රශ්නයක්. මොනවා හරි පියවරක් ගන්න කලින් සොයා බැලිය යුතු කාරණා දහසකුත් එකක් තියෙනවා. ඒ වුණත් අපට මොහොතකවත් ප්‍රමාද වෙන්න හැටියක් නෑ. අපට අදම ස්ටෝක් මොරාන් වෙත එන්න පුළුවනි. එහෙම ආවොත් ඔබේ බාප්පාට නොදැනෙන්න, ඔබේ නිදනකාමරය පරීක්ෂා කර බලන්න පුළුවන්ද?"

"ආ . . . අද ඔහුට මොකක් හරි වැදගත් වැඩකට ලන්ඩන් නගරයට පැමිණෙන්න තියෙන බව කිව්වා. බොහොම වෙලාවට ඔහු මුළු දවසම ගෙදර නොසිටින්න ඉඩ තියෙනවා. මං හිතන්නේ

ඔබේ වැඩ කටයුතුවලට බාධා වෙන යමක් තිටින එකක් නැහැ. අපට දැන් ගෘහ සේවිකාවක් ඉන්නවා. නමුත් ඇය හරි වයසයි. ඒ වගේම බෙඩයි. මට බොහොම පහසුවෙනම පුළුවන් ඇයව අයින්කරල තියන්න."

"විශිෂ්ටයි. මේ ගමනට ඔබෙන් විරුද්ධත්වයක් නැහැ නේද වොට්සන්?"

"කිසිසේත් නැහැ."

"එහෙනම් අපි දෙදෙනාම එනවා. දැන් ඔබ මොනවද කරන්න බලාපොරොත්තු වෙන්නෙ, ස්ටෝනර් මෙනෙවිය?"

"මට නගරයෙන් කරගන්න යුතු වැඩ කිහිපයක් තිබෙනවා. ලන්ඩනයට ආව නිසා මං කැමතියි ඒවත් ඉවරයක් කරගෙන ආපහු යන්න. කොහොම වුණත් දවල් දොළහට මෙහෙන් යන දුම්රියෙන් මං ස්ටෝක් මොරාන් වෙත යනවා. ඔබ එහි එද්දී එහි සිටීමට කල්වේලා ඇතිව මං යන්නම්."

"එහෙනම් වැඩිය හැන්දෑවෙන්න කලින් අපව බලාපොරොත්තු වෙන්න. මටත් තියෙනවා යෙදිය යුතු පොඩි කටයුත්තක්. ඔබ අප සමග උදේ ආහාරය ගන්න නවතින්නෙ නැද්ද?"

"නැහැ. මං ඉක්මනින් යන්න ඕන. මගේ ප්‍රශ්න ඔක්කොම ඔබට කිව්වට පස්සේ මගේ හිතට ලොකු සැහැල්ලුවක් දැනෙනවා. එහෙනම් සවස්වරුවේ මං ඔබව බලාපොරොත්තුවෙන් ඉන්නවා."

කථාව අවසන් කළ ස්ටෝනර් මෙනෙවිය කළු වේල් රෙදි තැබැල්ලෙන් හිස ආවරණය කරගෙන අපේ නිවසෙන් පිටවී ගියාය.

"මේ සිද්ධිය ගැන ඔබට මොකක්ද හිතෙන්නෙ වොට්සන්?" හෝම්ස් ඇසුවේ යළිත් හාන්සි පුටුවේ පිටුපසට හේත්තු වෙමිනි.

"මට පෙනෙන හැටියට බොහොම දුෂ්ට ඒ වගේම බිහිසුණු කටයුත්තක් තමයි සිද්ධ වෙන්නෙ."

"සෑහෙන්න දුෂ්ට, සෑහෙන්න බිහිසුණු වැඩක්."

"ඒ වුණත් මේ තරුණිය අපට කිව්වෙ බිත්ති වල හෝ පොළොවේ කිසිම පළුද්දක් නැහැ කියල. ජනෙල් වලින් හෝ දුම්කවුළුවෙන් කිසිවෙකුට යන්න එන්නත් බැහැලු. ඒ කතාව ඇත්ත නම්, ඇගේ මරණය සිදුවෙද්දී තරුණිය ඉන්න ඇත්තෙ තනියම."

"අර රැට ඇහෙන සිවුරුහන් හඬ සහ තරුණිය මරණාසන්නව කියූ වචන ගැන ඔබට මොනවද හිතෙන්නෙ?"

"මට මොකුත් හිතාගන්න බෑ."

"රාත්‍රියේ පමණක් අහන්න ලැබෙන සිවුරුහන් කිරීමේ ශබ්දය; දොස්තර සමග බොහොම හිතවත් අභිගුණ්ඨිකයන් එන්නේ රැඳී සිටීම; මේ කාරණා දෙක අප සැලකිල්ලට ගතයුත්තේ එකට බැඳුණු කාරණා හැටියටයි. සොහොයුරියගේ විවාහය වළක්වන්න දොස්තරට ලොකු උවමනාවක් ඇති බව හිතාගන්න පුළුවනි. එහෙම හිතන්න සාක්ෂි රැසක් තියෙනවා. ජූලියා ස්ටෝනර් මෙහෙවිය මරණ මොහොතේදී තිත් වැටුණු පටියක් ගැන කිව්වා. හෙලන් ස්ටෝනර්ට අහන්න ලැබුණෙ බර ලෝහමය දෙයක් නිසා ඇතිවුණු ශබ්දයක්. ඒක බාගවෙලාවට, අර යකඩ පොයිබ සහිත ජනෙල් පියන් ආපසු වැහෙද්දී, සොයිබ වල බර යකඩ කූරු අහනට වැටීම නිසා ඇතිවූ ශබ්දයක් වෙන්නත් පිළිවන්. මං හිතනවා අභිරහස විසඳීම සඳහා අප යන්න ඕනෙ ඒ මාර්ගයෙයි; ඒ පැත්තට අපව යොමු කරවන සාධාරණ හේතු තියෙනවා."

"නමුත් මෙතැනදී අර අභිගුණ්ඨිකයන් මොනවද කරල තියෙන්නෙ."

"ඒක නම් මට හිතාගන්න අමාරුයි."

"ඔවුන් මේකට සම්බන්ධවුණෙ කියල මට නම් හිතෙන්නෙ නෑ."

"මාත් හිතන්නෙ එහෙමයි. අන්න ඒ කාරණාව නිසාම තමයි. අපි අදම ස්ටෝක් මොරාන් වෙත පිටත්වෙලා යන්නෙ. මට දැනගන්න ඕන . . . . . . . . යක්ෂ වැඩක් නේ මේක.!"

මගේ මිත්‍රයාට එක්වරම කෑ ගැසුණේය. ඊට හේතු වූයේ, පා පහරකින් විවෘත වූවාක් මෙන් විසිවුන කාමරයේ දොර මහත් ශබ්දයක් නංවමින් විවෘත වීමය.

දොරටුවේ අපට දකින්නට ලැබුණේ යෝධයෙකු මෙන් දවැන්ත මිනිසෙකි. ඔහු හැඳ සිටියේ කුඹුරු වැඩ කරන ගොවියෙකුගේ ඇඳුමටත් වැදගත් වෘත්තියක යෙදෙන්නෙකුගේ ඇඳුමටත් අතරමැදි එකකි. ඔහුගේ අතේ ඒ මේ අත වනමින් තිබූ දඬයම් කසයක් විය.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගේ උස කොපමණද වුවාද කිවහොත්, ඔහුගේ හිස්වැස්මේ මුදුන අපේ උළුවස්සේ වැදෙන සැටි මම දුටුවෙමි. උළුවස්සේ ඉඩකඩ සම්පූර්ණයෙන්ම, ඔහුගේ තරබාරු සිරුරෙන් ඇහිරී ගියේය. මේ අමුත්තාගේ මුහුණේ හැම තැනකම රැළි වැටී තිබූ අතර අව්වෙන් පිලිස්සීම නිසා කහපැහැයකට හැරී තිබිණි. ඔහුගේ කුරිරු, බිහිසුණු බව පැහැදිලිවම පෑවෙන, කොට වූ උල් නාසයක් ගිලුණු කහපැහැති දෙනෙතකුත් ඔහුට තිබිණ.

"තමුසෙල දෙන්නගෙන් කොයි එකාද හෝම්ස් කියන්නෙ?"

"මහත්මයා, ඒ මගේ නම . . . . . ඊළඟට මොනවද ඔබට කෙරෙන්න උවමනා?" මගේ මිත්‍රයා ඇසුවේ ශාන්ත ස්වරයෙනි.

"මම තමයි ස්ටෝක් මොරාන් හි දොස්තර ග්‍රිම්ස්බි රෝයිලොට්."

"හැබෑටම? දොස්තර මහත්තයා, කරුණාකරල ඔහොම වාඩි වෙන්න."

"වාඩිවීමෙන් මට ඇති වැඩක් නෑ. මගේ ඥාති දියණිය මෙහේ ඇවිත් ගිහින් තියෙනවා. මට පුළුවන් වුණා ඒ බව සොයාගන්න. ඒකි මොනවද තමුසෙට කිව්වෙ?"

"මෙක සීත සෘතුව නොවුණට, මේ කාලෙ හරිම සීතලයි කිව්වා." හෝම්ස් පිළිතුරු දුන්නේය.

"මොනවද මිනිහො ඒකි කිව්වෙ? ඒකයි මං ඇහුවේ!" කෝපාවිෂ්ට වූ අමුත්තා ගිගුරුවේය.

"කොච්චර සීතල වුණත් කහ වැව්වොත් නම් පලදාව සරුයිලු" හෝම්ස් පිළිතුරු දුන්නේ කිසිම ගණනකට නැතිවයි.

"හෑ! උඹ මාව ගණන් ගන්නෙ නෑ එහෙනම්?" අමුත්තා කිපී පියවරක් ඉදිරියට තබා දඬුයම් කසය ලෙලවමිනි.

"ඒයි තක්කඩියා. මං දන්නවා උඹ කවුද කියලා. මං උඹ ගැන මීට කලින් අහල තියෙනවා. උඹ තමයි අනුන්ගේ වැඩ වලට ඇඟිලි ගහන හෝම්ස්."

මගේ මිත්‍රයා හොඳ හඬලා සිනාසුණේය.

"තමන්ට අයිති නැති වැඩට හොස්ස දාන පොලිස්කාරයා හෝම්ස්."

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ මිත්‍රයාගේ හිනාව තවත් වැඩිවිය.

"මහා ලොක්කෙක්, පණ්ඩිතයෙක් කියල හිතාගෙන ඉන්න හෝම්ස්."

"ඔහේගේ සාකච්ඡාව හරිම විනෝද ජනකයි." මගේ මිත්‍රයා තව තවත් සිනාසෙමින් කීවේය. "ඊත් ඔබේ ගෞරවනාට ඔය දොරත් වහගෙන යන්න. ඒ මොකද ඔය පැත්තෙන් හමා එන වාතය හරි අපිරිසිදුයි."

"මට කියන්න තියෙන දේවල් ඔක්කොම කියල මිසක් මං මෙතනින් යන්නෙ නෑ. තේරුණාද? හොඳට මතක තියාගන්නවා. මගේ වැඩවලට ඇඟිලි ගහන්න එන්න එපා. ස්ටෝනර් මෙනෙවිය ආවෙ මෙහාට බව මං දන්නවා. මට පුළුවන් වුණොත් ඒක හොයාගන්න. මගේ තේවාසි අවුස්සා ගත්තොත් මං බොහොම දරුණු මිනිහෙක්. මේ බලනවා."

ගිනි උදුන වෙතට පා නැඟූ ඔහු, ගිනි අඟුරු ඇල්ලීමට ගන්නා බර යකඩ අඩුව අතට ගත්තේය. මීළඟට ඔහුගේ යෝධ ඇඟිලි පැහැති දැතෙන් එය චක්‍රාකාර වනසේ නමා දැම්මේය.

"මට අනුවෙන්න එපා! අන්න ඒක මතක තියාගන්නවා" පැවසූ අමුත්තා, නැමූ අඩුව ගිනි උදුනට විසිකොට කාමරයෙන් පිටවිය.

"බොහොම මිත්‍රශීලී කෙනෙක් වගෙයි පෙනෙන්නෙ." හෝම්ස් පැවසුවේ සිනාසෙමිනි. "මිනිහ තරම් යෝධ ශරීරයක් නම් මට නැහැ. හැබැයි ඔහු තවත් ටික වෙලාවක් හිටියා නම්, මට පෙන්වන්න තිබුණා ශක්තියෙන් මම ඔහුට වඩා ඒ තරමම දුර්වල නැති බව." එසේ කී හෝම්ස් එක්වරම බලයක් යොදා, ගිනි අඟුරු අල්ලන අඩුව කලින් තිබූ ආකාරයටම දිගහැරියේය.

"මිනිහා මාව බාල්දු කරල කථාකළා නේ, මම පොලීසියට සම්බන්ධ කෙනෙක් කියල. ඒ අපහාසෙ නමයි වොට්සන් මට ඉවසන්නම බැරි. ඔහුගේ මේ පැමිණීමත් හැසිරීමත් නිසා, මේ පරීක්ෂණය කොහොම හරි කළ යුතුමයි කියලා මට ලැබෙනවා අමුතු උද්‍යෝගයක්. ස්ටෝනර් මෙනෙවිය මෙහේ ආ බව අර මැරවරයාට දනගන්න ලැබුණු එක ඇයට ලොකු අවාසියක්. මං විශ්වාස කරනවා ඇය ඊකෙන් තවත් වධ හිංසා වලට ගොදුරු

http://sherlockholmesinvestigations.blogspot.com



239. "මගේ තේන්ති අවුස්සා ගත්තොත් මං බොහොම දරුණු මිනිහෙක්."

Reading Purpose Only. FreeForPrint

http://sherlockholmesinvestigations.blogspot.com

වෙන එකක් නැහැ කියල. එහෙම නම් වොට්සන් අපි උදේ කෑම ගේන්න කියල දනුම් දෙමු. ඊට පස්සේ මං යනවා වෛද්‍ය විවේකාගාරය පැත්තෙ ගිහින් එන්න. මං බලාපොරොත්තු වෙනවා මේ සිද්ධියේදී අපට ප්‍රයෝජනවත් විය හැකි තොරතුරු ටිකක් ලබාගන්න."

* * * *

සිය කටයුත්ත නිම වී ෂර්ලොක් හෝම්ස් ආපසු එනවිට උදේ නවයට ලංවී තිබිණි. ගණන් හිලව් සටහන් කල නිල්පැහැති කඩදාසියක් ඔහුගේ අතේ විය.

"මියගිය රොයිලොට් මහත්මියගේ, ඒ කියන්නේ ස්ටෝනර් සොයුරියන්ගේ අම්මාගේ අන්තිම කැමැති පත්‍රය කියවා බලන්න මට අවස්ථාවක් ලැබුණා. ඇය මියයන දිනවලදී, ආයෝජනවලින් ඇයට ලැබුණු වාර්ෂික ආදායම පවුම් 1100 ක්ව තිබිල තියෙනවා. නමුත් කෘෂිකාර්මික නිෂ්පාදනවල මිල අඩු වැටීම නිසා දන් ඒ ආදායම පවුම් 750 යි. එක දියණියක් විවාහ වෙද්දී ඇයට පවුම් 250 ක් වෙන් කල යුතු බව අන්තිම කැමැති පත්‍රයේ සඳහන් වෙනවා. ඒකෙන් අපට එක් කාරණයක් ඉතාම හොඳින් පැහැදිලි වෙනවා. ඒ මොකක්ද; මේ ගැහැනු ළමයි දෙදෙනා විවාහවුණා නම්, මේ සුන්දර බාප්පාට ඉතිරිවෙන්නේ ඉතාම සුළු මුදලක් පමණයි. ඒක යන්තමින් පණ ගැටගහගන්න ප්‍රමාණවත් නැති සුළු මුදලක්. ගැහැනු ළමයි දෙදෙනාගෙන් එක් අයෙක් විවාහ වුණත් ඔහුට අහිමි වන මුදල ඉතා විශාලයි. අවුම 250 ක් ඉවත් වුණොත් ඒක ඔහුගේ පැවැත්මට බරපතල පහරක්. මං උදේ කාලය පුරා වුණු වෙහෙස මහන්සිය අපතේ ගියේ නැහැ. ඒ මොකද ඒකෙන් අපට පෙනෙනවා, තරුණියන්ගේ විවාහ වලට මේ පුද්ගලයා අකුල් හෙලන්න හේතුව මොකක්ද කියලා.

දන් ඉතින් වොට්සන් අපට හැරී හැරී ඉන්න කාලයක් නෑ. නාකියා දන් දන්නවා අපි ඔහුගේ වැඩකටයුතු වලට ඇඟිලි ගහන්න පටන් අරගෙන බව. ඒ නිසා ඔබ සූදානම් නම් කුලීරියක් කැඳවාගෙන අපි වහාම වෝටලූ දුම්රිය ස්ථානයට යමු. ඒ සමඟම ඔබේ රිවොල්වරයත් සාක්කුවට දාගත හැකි නම් මං ඔබට කෘතඥ වෙනවා. වෙඩි උණ්ඩ වර්ගයද? ඊලිගේ නොම්මර දෙකේ වෙඩි උණ්ඩ [illegible] හදන්න

පූර්වන් මහත්වරුන්ට තේරුම් ගන්න පූර්වන් භාෂාවත් ඒකයි. ඊට අමතරව දත්බුරුසුවකුත් සාක්කුවට දමා ගත්තොත් ප්‍රමාණවත් වේවි."

පමාවකින් තොරව අපි වෝටලූ දුම්රිය පොළෙන්, ලෙදර්හෙඩ් බලා යන දුම්රියකට නැඟුණෙමු. එතැනදී දුම්රියෙන් බැස, කුලීරියකින් ගමන් ඇරඹුවෙමු. සරේ ප්‍රාන්තයේ නොත්කලු පටු මංමාවත් හරහා සැතපුම් හතරක හෝ පහක දුරක් අපට ගමන් කිරීමට සිදුවිය. තෙත් සහිත පොළොවෙන් නිකුත් වූ නැවුම් වාතයත් සමඟම, ගස්වැල්. අතුරිකිලි වලින් ලා කොළ පැහැති දළු දමීමට පටන්ගෙන තිබිණි. දීප්තිමත්ව හිරු පායා තිබූ එදින මගේ නෙතට දිස්වූයේ මේ මනරම් දර්ශනයි. අප පරීක්ෂණයේ යෙදී සිටින බිහිසුණු සිදුවීම හා මේ පරිසරයේ ඇත්තේ මොන තරම් වෙනසක්ද?

මගේ මිත්‍රයා අශ්වකරත්තයේ ඉදිරිපසම අසුනේ වාඩිවී සිටියේය. මුහුණ සම්පූර්ණයෙන්ම ආවරණය වන සේ හිස්වැස්ම පහත දමා ගෙන, ඔහු ගැඹුරු කල්පනාවක වෙළී හුන්නේය. එහෙත් ඔහු එක්වරම තිගැස්සී එම දහැනින් අවදිවිය. මගේ උරහිසට තට්ටු කළ හෝම්ස් පාළු තණබිම් වලට ඉහළින් ඇති යමක් මට පෙන්වා දුන්නේය.

"අර බලන්න."

විශාල වෘක්ෂයන්ගෙන් සැදුම් ලත් උද්‍යානයක් විය. එය හරහා විහිදුණු බෑවුම් හා වංගු සහිත පාරක් අපි දුටුවෙමු. ගස්වල අතු අතරින් ඉතාම පෞරාණික අළු පැහැති මන්දිරයක් දක්නට ලැබිණ.

"අර ස්ටෝක් මොරාන්ද?" හෝම්ස් ඇසිය.

"ඔව් මහත්මයා. ඔය තියෙන්නේ දොස්තර ග්‍රිම්ස්බි රොයිලොට්ගේ ගෙදර." රියැදුරා පිළිතුරු දුන්නේය.

"අර අතෙක් පැත්තෙත් ගොඩනැගිලි වගයක් තියෙනව නේ. අප යන්නේ එතැනට." හෝම්ස් කීවේය.

"ඒක තමයි ගම්මානය." රියැදුරා කීවේ මදක් වම්පසට වන්නට, ඈතින් තිබූ නිවාස රැසක් පෙන්වමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"නමුත් ඔබට ඕන කරන්නේ අර ගෙදරට යන්න නම්, මෙතැනින් බැහැලා, අතන තියෙන කඩුල්ලට නැගලා එහා පැත්තට යන්න. එතැන සිට වැටිලා තියෙන අඩිපාර තියෙන්නේ තුඹුරු මැදින්. ඒකෙන් යන එක කිට්ටුයි. අර නෝනා කෙනෙක් ඇවිදගෙන යන්නේ ඒ අඩිපාරේ තමයි."

"ඒ නෝනා මං හිතන්නේ ස්ටෝනර් මෙනෙවිය." හෝම්ස් මට කොඳුරා කීවේය.

"ඔව්, මට හිතෙන්නේ ඔබ කියූ විධියට යන එක වඩා හොඳයි." ඔහු රියැදුරා අමතා කීවේය.

අපි අශ්වකරත්තයෙන් බැස මුදල් ගෙව්වෙමු. එය ආපසු ලෙදර්හෙඩ් බලා ගමන් ඇරඹුවේය.

"හොඳ වෙලාවට මං ඒ විධියේ අදහසක් ඔහුට දුන්නෙ." හෝම්ස් කීවේ එහා වත්තට යෑම සඳහා වූ උස් කඩුල්ල මතට නගිමිනි. "ඒ මිනිහා හිතාවි අපි මෙහෙ ඇවිත් තියෙන්නෙ ගෘහ නිර්මාණ ශිල්පියො හැටියට හරි වෙනත් රාජකාරියකට කියලා. ඔහු අපට හානිදායක ඕපාදූප කථාවක යෙදෙන්න තියෙන ඉඩකඩ එයින් නැතිවෙනවා."

"සුභ සන්ධ්‍යාවක් ස්ටෝනර් මෙනෙවිය. මන්න අපි පොරොන්දු වුණු හැටියටම ඔබ හමුවෙන්න ආවා."

උදෑසන අප හමුවීමට ආ තරුණිය දැන් අප පිළිගත්තේ සන්තෝෂය උතුරා ගිය මුහුණකිනි.

"ඔබ එනතෙක් මං හිටියේ හරිම නොඉවසිල්ලෙන් මහත්මයා."

ඇය පැවසුවේ අතට අත දී අප පිළිගනිමිනි.

"හැමදෙයක්ම සාර්ථක අයුරින් සිදුවුණා. දොස්තර රොයිලොට් ලන්ඩන් නගරයට ගියාලු. හැන්දෑවෙන්න කලින් ඔහු ආපහු එවි කියල හිතන්න අමාරුයි."

"දොස්තර මහත්මයා දත හඳුනා ගැනීමේ වාසනාව අපටත් උදාවුණා ස්ටෝනර් මෙනෙවිය." පැවසූ හෝම්ස් අප මුහුණදුන් සම්පූර්ණ අත්දැකීම විස්තර කළේය. එය අසා සිටි හෙලන් ස්ටෝනර් බියෙන් සුදුමැලි වූවාය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ! ඔහු එහෙනම් මා පසුපස ඇවිත්?"

http://sherlockholmesinvestigations.blogspot.com



243. අපි අශ්ව කරත්තයෙන් බැස මුදල් ගෙවමු.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ වගෙයි පෙනෙන්නෙ."

"ඔහු හරිම කෙරාටිකයෙක්. ඔහුගෙන් බේරිලා ඉන්නෙ කොහොමද කියල මට නම් තේරෙන්නෙ නැහැ. ආපහු ආවම බාප්පා මට මොනවා කියාවිද මම දන්නෙ නෑ."

"ඔහුට බොහොම ප්‍රවේසම් වෙන්න සිදුවේවි. ඔහුට පෙනේවි ඔහුට වඩා කෙරාටික මිනිස්සු, ඔහුගේ වැඩ ගැන සෝදිසි කරන්න එන බව. අද රෑට ඔහුට අහුනොවී බේරෙන්න, ඔබ ඔබේ කාමරය ඇතුළෙන් යතුරු දමාගන්න. ඔහුගේ පිළිවෙළ බොහොම දරුණු නම්, අපි ඔබව හැරෝවල ඔබේ පුංචි අම්මා ළඟට එක්ක යන්නම්. දැන් ඉතින් අපට ඉතිරි වෙලා තියෙන කාලයෙන් සම්පූර්ණ ප්‍රයෝජනය ගන්න ඕන. ඒ නිසා කරුණාකරල අප සෝදිසි කළ යුතු කාමර වෙත අපව එක්ක යන්න."

රොයිලොට් වාසභවනය බොහෝ පැරණි, ගල් වලින් තැනූ මන්දිරයක් විය. ගල්බිත්ති වල හතු සහ පුස් වර්ග වැවී දුර්වර්ණ වී තිබිණි. කකුළුවෙකුගේ චක්‍රාකාර අඬු දෙකක් මෙන් පිහිටි අංශ දෙකකින් නිවසේ ඉදිරිපස නිම විය. මෙයින් එක් අංශයක ජනේල වල වීදුරු කැඩීගොස් තිබූ නිසා ඒවා ලෑලි වලින් ආවරණය කොට තිබිණි. අනෙක් අංශයේ වහල කැඩී ඇතුළට පහත් වී තිබුණේ, ගරා වැටීමේ ලක්ෂණ මැනැවින් පෙන්වමිනි. මැදුරේ මධ්‍යම කොටස වඩාත් හොඳ තත්ත්වයක තිබූ අතර දකුණු පැත්තේ වූයේ මෑතකදී ගොඩ නංවන ලද කොටසකි. එහි ජනේල වල තිර ආවරණ තිබූ අතර, දුම් කවුළු වලින් නිල්පැහැති දුම්ගුලි නිකුත් විය. පවුලේ අය ජීවත්වූයේ එහි බව එයින් අපට සිතාගත හැකි විය.

බිත්තිය කෙළවර පලංචියක් සාදා තිබූ අතර, බිත්තියේ කොටසක් ද කඩාදමා තිබූ සැටි අපි දුටුවෙමු. කෙසේ වෙතත් අප එහි යන වේලාවේ, පෙදරේරුවන් හෝ වෙනත් කාර්මිකයන් වැඩෙහි යෙදී සිටිනු අපට දක්නට නොලැබිණි. කාමර වල ජනේල විවෘත වූයේ, තණකොළ වවා තිබූ මිදුලකටයි. එය තණකොළ පිළිවෙළට කපා, අලංකාරව තබා ගත් මිදුලක් නොවීය. එහි පොළොව හෝම්ස්ගේ දැඩි පරීක්ෂාවට ලක්විය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මෙන්න මේ කාමරය මං හිතන හැටියට ඔබ කලින් නිදාගත් කාමරය. අරක ඔබේ සොහොයුරියගේ කාමරය. අන්තිම එක දොස්තර රොයිලොට් ගේ කාමරය හරිද?"

"හරියටම හරි. නමුත් දැන් මං නිදාගන්නේ මැදින් තියෙන කාමරයේ."

"මං හිතන්නේ ඒ අර අලුත්වැඩියා කටයුතු අවසන් වෙන තුරු . . . . . නමුත් මට නම් පෙනෙන්නේ නැහැ අර බිත්තියට මොකක් හරි අලුත්වැඩියාවක් අවශ්‍යයි කියලා."

"මොකුත් අවශ්‍යතාවයක් තිබුණෙ නෑ හෝම්ස් මහත්මයා, මං හිතන්නේ නම් ඒක මං නිදාගනිපු කාමරය වෙනස් කරන්න කිව් නිදහසට කරුණක්."

"අහා! ඒකෙන්ම අපට යමක් පැහැදිලි වෙවී. දැන් මේ ගොඩනැගිල්ලේ අනෙක් පැත්තේ තියෙන්නේ දිග බරාදයක්. කාමර තුනේම දොරවල් විවෘත වෙන්නේ ඒකටයි. ඒ පැත්තටත් ජනෙල් තියෙනව නේද?"

"ඔව්. බොහොම කුඩා ඒවා. කිසිකෙනෙකුට ඒවායින් රිංගන්න අමාරුයි."

"ඔබ දෙදෙනාම රාත්‍රියට දොරවල් ඇතුළතින් යතුරු දමා වසාගන්නවා. ඒ නිසා ඒ පැත්තෙන් කාමරවලට ඇතුළුවෙන්න ක්‍රමයක් නෑ. ස්ටෝනර් මෙනෙවිය. දැන් ඔබට කරුණාකර ඔබේ කාමරයට යන්න පුළුවන්ද? ගිහින් එහි ජනේලය සම්පූර්ණයෙන් වහගන්න."

ඇය තම කාමරයට ගොස් ජනේලය සම්පූර්ණයෙන්ම වසා ගත්තාය. ජනේලය හොඳින් පරීක්ෂා කළ හෝම්ස්, එය විවෘත කිරීමට දැඩි උත්සාහයක් දැරුවේය. එහෙත් එය අසාර්ථක විය. ජනේලය වැසූ පසු පිහිතලයක් යැවිය හැකි තරම් විවරයක්වත් ඉතිරිව නොතිබිණි. මීළඟට තම උත්තල කාචය අතට ගත් හෝම්ස් ජනෙල් පියන් සවිකර තිබූ සරනේරු හා අගුළු හොඳින් පරීක්ෂා කළේය. ඒ සියල්ල වාත්තු යකඩයෙන් තනා, නිසිලෙස බිත්තියට හාවද්දා තිබිණි. එමෙන්ම ඒවා ශක්තිමත් බව ද පැහැදිලි විය.

"හ්ම්" හෝම්ස් කීවේ නිකට කසමිනි. "මේ දේවල් සිද්ධ වෙන්න ඇති කියල මං හිතාගෙන හිටි විධිය වැරැද්දක් වගේ දැන් පෙනෙන්නෙ." http://sherlockholmesinvestigations.blogspot.com

නිදන කාමර තුනෙන්ම දොරවල් විවෘතවූයේ සුදු හුණු ආලේප කර තිබූ බරාඳයකටයි. හෙලන් ස්ටෝනර් මෙනෙවිය මුලින් පාවිච්චි කළ තුන්වැනි කාමරය පරීක්ෂා කිරීම හෝම්ස් ප්‍රතික්ෂේප කළේය. එහෙයින් අපි කෙළින්ම, ඇය දැන් නිදාගැනීම සඳහා යොදා ගත් දෙවැනි කාමරයට පිවිසියෙමු. අවාසනාවන්ත ජූලියා ස්ටෝනර් ඛේදජනක ඉරණමකට ගොදුරු වූයේ මෙතැනයි.

එය ඉතා ප්‍රසන්න කුඩා කාමරයක් විය. එහි සිවිලිම තරමක් පහත වූ නමුත් පැරණි ගම්බද නිවාස වලට පිළිවෙළට විශාල ගිනි උදුනක් විය. කාමරයේ එක මුල්ලක ලාච්චු සහිත දුඹුරුපාට අල්මාරියකි. තවත් මුල්ලක තිබුණේ සුදු පැහැති ඇඳ ඇතිරිල්ලකින් ආවරණය කොට තිබූ ඇඳයි. ජනේලයට වම්පසින් කණ්ණාඩි මේසයක් විය. කාමරයේ පොළොව එළා තිබූ හතරැස් බුමුතුරුණු කැබැල්ලක් සහ වේවැල් පුටු දෙකක් ද එහි විය. කාමරයේ තිබූ ගෘහ භාණ්ඩ වූයේ එපමණකි. බිත්ති හා පොළොව ආවරණය කිරීමට යොදා තිබූ ඕක් ලෑලි ගුල්ලන් විසින් ආහාරයට ගෙන විනාශයට පත්කර තිබිණි. මේවා ශතවර්ෂ කිහිපයක් පැරණි ඒවා විය යුතුය. වේවැල්පුටුව කාමරයේ කෙළවරකට ඇදගත් හෝම්ස්, එහි හිඳගත්තේය. අනතුරුව ඔහු සෑම බිත්තියකම ඉහළ සිට පහළටත්, කාමරය පුරා බිත්ති සියල්ලමත් නිහඬව පරීක්ෂාවට ලක් කළේය. අනතුරුව සිවිලිමේ සෑම තැනක්ම සියුම් ලෙස සෝදිසි කළේ කිසිදු තැනක් මඟ නොහැරෙන අයුරිනි.

"මේ ලනුව ඇදල සීනුව නාද කළාම, කොහේ තියෙන සීනුවද වදින්නෙ?"

හෝම්ස් ඇසුවේ, ඇඳ අසලම බිත්තියෙන් පහළට එල්ලී තිබුණු ගනකම් සීනු ලනුව පෙන්වමිනි. එම ලනුවේ ලිහිගිය කෙළවර ඇත්තෙන්ම තිබුණේ ඇඳේ කොට්ටය මතයි.

"ලනුව සම්බන්ධ වෙන්නේ ප්‍රධාන ගෘහසේවිකාවගේ කාමරයට."

"ලනුව නම් ගෙදර අනිත් ඒවාට වඩා අලුත් වගෙයි?"

"ඔව්. ලනුව සවිකරලා අවුරුදු කිහිපයකට වඩා ගතවුණේ නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

"මං හිතන්නෙ ඔබේ සොයුරිය ඉල්ලා හිටින්න ඇති සීනුවක් සවිකරන්න කියල?"

"නැහැ. නැහැ. ඇය ඒක පාවිච්චි කළ බවක් මට කවදාවත් අහන්න ලැබිල නැහැ. හැමදාවත් අපේ වැඩකටයුතු අපිම කරගත්තා."

"ඇත්තෙන්ම මේ වගේ සීනුව නාද කිරීමේ ලනුවක් කොහොමටත් අනවශ්‍ය බවයි මට නම් පෙනෙන්නෙ. මට සමාවෙන්න. මේ පොළොව ටිකක් හොඳින් සෝදිසි කරන්න, මට මිනිත්තු කිහිපයක් ගත කරන්න සිදුවේවි."

මුහින් අතට බිම දිගාවුණු හෝම්ස් කාචය අතට ගෙන, පොළොව තැනීමට යෙදූ ලෑලි අතර වූ සියුම් හිඩැස් පරීක්ෂා කළේය. මීළඟට ඇඳ වෙත ගිය ඔහු ඒ දෙස ඇසිපිය නොහෙළා බලා සිට, ඇඳ අසල බිත්තිය ද සෝදිසියට ලක් කළේය. අනතුරුව සීනුව සඳහා වූ ලනුවෙන් අල්ලාගත් හෝම්ස් එය එකවරම පහළට ඇද්දේය.

"කෝ? මේක සීනුවකට සම්බන්ධ කරල නැහැනෙ?"

"ඇයි සීනුව නාද වෙන්නෙ නැද්ද?"

"නැහැ. සීනුවකට තියා, මේක සීනුවට ඇදෙන කම්බියකට වත් සම්බන්ධ කරල නැහැ. මේක බොහොම සිත්ගන්නා සුළු කාරුණක්. ඔබට පෙනෙනවා නේද ලනුව, අර හුළං කවුළුව සඳහා වූ විවරයට මදක් උඩින් තිබෙන කොක්කට ගැටගහලා තියෙන හැටි."

"මේක මහ විකාරයක් නේ. මං ඒ බවක් මීට කලින් දැන හිටියේ නැහැ."

"හරිම පුදුමාකාරයි" හෝම්ස් සීනුව යළිත් වරක් ලනුව අදිමින්.

"මේ කාමරය සම්බන්ධයෙන් මට පෙනී ගිය හරිම අසාමාන්‍ය කාරුණු ගණනාවක් තියෙනවා. බලන්න මේ කාමරයට මේ විදියේ හුළං කවුළුවක් තැබූ පෙදරේරුවා මොන තරම් මෝඩයෙක්ද කියලා. හුළං කවුළුවෙන් සම්බන්ධ වෙන්නේ ඒ කාමරය සහ මේ කාමරය. ඒ මහන්සියම වෙලා ඔහුට තිබුණා ඒ හුළං කවුළුව, මේ කාමරය, ගෙයින් එළියට සම්බන්ධ වන සේ තබන්න. එහෙම කළා නම් එළියෙන් පිරිසිදු වාතය මේ ඇතුළට ලැබෙනවා."

"ඔය බැඳි නම් මේ [illegible]"

"ඒ කියන්නේ අර සීනුවක් සඳහා කියල ලනුවක් සවි කළ දවස්වලමද?" හෝම්ස් ඇසුවේය.

"ඔව්. ඒ කාලෙ ඔය විධියේ පුරු පුරු වෙනස් කම් හුඟක් කළා."

"ඒවා බොහොම පුදුමාකාර වෙනස්කම් බවයි පෙනෙන්නෙ. සීනුවකට කවදාවත් සම්බන්ධ නොකළ සීනු ලනුවක්. කාමරයට සුළං ගෙනෙන්න බැරි සුළං කවුළුවක්. ස්ටෝනර් මෙනෙවිය. ඔබෙන් අවසර ලැබෙනවා නම් දැන් මං කැමැතියි දොස්තර මහත්මයාගේ කාමරය පරීක්ෂා කරල බලන්න."

දොස්තර ග්‍රයිම්ස්බි රොයිලොට් ගේ කාමරය, ඔහුගේ දෝනි දියණියගේ කාමරයට වඩා ප්‍රමාණයෙන් විශාල විය. එහෙත් එහි ද ගෘහ භාණ්ඩ තිබුණේ ඉතා ස්වල්ප වශයෙනි. හකුළා තැබිය හැකි ඇඳක්, පොත්පත් අඩංගු පොත් රාක්කයක්, බිත්තියට හේත්තු කළ ලෑලි පුටුවක්, රවුම් මේසයක් සහ විශාල වානේ අල්මාරියක් ද ගෘහභාණ්ඩ අතර විය. හෝම්ස් එකින් එකට ඇවිද යමින් ඒවා දඩි පරීක්ෂාවකට ලක් කළේය.

"මේක ඇතුළෙ තියෙන්නෙ මොනවද?" හෝම්ස් ඇසුවේ වානේ අල්මාරියට තට්ටු කරමිනි.

"තාත්තාගෙ ව්‍යාපාරික ලියකියවිලි"

"ආ ඔබ එහෙනම් මේක ඇතුළෙ තියෙන්නෙ මොනවද කියල, දැකල තියෙනවා?"

"ඔව්. අවුරුදු ගණනාවකට කලින් එකම එක් වතාවක් මං ඔය අල්මාරියෙ ඇතුළ දැකල තියෙනවා. ඕක ලියකියවිලි වලින් පිරී තිබුණා මට මතකයි."

"මේක ඇතුළෙ බළලෙක් එහෙම පදිංචි වෙලා නැද්ද?"

"නැහැ! ඔබට මහ පුදුමාකාර අදහසක් නේ පහළවුණේ"

"ඒ වුණත් බලන්න මේ දිහා!" හෝම්ස් අල්මාරියේ උඩම තට්ටුවෙන් අතට ගත්තේ කිරි පුරවා තිබූ පීරිසියකි.

"මේ ගෙදර බළලෙක් නම් අපි ඇතිකරන්නේ නැහැ. ඒ වුණත් චීටාවෙකු සහ බැබුන් වඳුරෙකු නම් ඉන්නවා.

"ආ ඔව් ඒක හරි. චීටාවත් කොටියෙකු වගේ බළල් වර්ගයට අයත් සතෙක් නේ. ඒ වුණත් කිරි පීරිසියකින් උගේ බඩගින්න

http://sherlockholmesinvestigations.blogspot.com

සංසිඳුවන්න පුළුවන්ද කියල මං දන්නෙ නෑ. කොහොම වුණත් සැක හැර පැහැදිලිව මා දැනගත යුතු කාරණයක් තිබෙනවා."

එසේ කියූ හෝම්ස් ලැලි පුවරුව උඩ දිගෑදී බිම ඇණ තබාගෙන හිඳ ගත්තේය. කාචය අතටගත් ඔහු අඳුන් ගැනීම සඳහා වූ ලැලි කැබැල්ල හොඳින් පරීක්ෂා කළේය.

"බොහොම ස්තූතියි. මට අවශ්‍ය ප්‍රමාණය මම බලාගත්තා" හෝම්ස් කීවේ කාචය නම සාක්කුවේ දමා ගනිමිනි.

"ඔහෝ! මේ මොකක්ද? බොහොම සිත් ඇදගන්නා සුලු යමක් වගෙයි."

ඔහුගේ අවධානය යොමු වී තිබුණේ ඇඳ මත දකින්නට ලැබුණු යම් දෙයක් වෙතයි. ඒ කුඩා කසයකි. එහි සිහින් කෙළවර තොණ්ඩුවක් සැදෙන සේ ආපසු නමා ගැටගසා තිබිණි.

"වොට්සන් ඔබට හිතෙන්නේ මේක මොකක් කියලද?"

"මේක සාමාන්‍ය කසයක් තමයි. ඒ වුණත් ඒකෙ කෙළවරේ තොණ්ඩුවක් හදල තියෙන්නෙ ඇයි කියල මට හිතාගන්න බැහැ."

"එවැන්නක් සාදා තිබීම නම් හරිම අසාමාන්‍යයයි. එහෙම නේද? අනේ දෙවියනේ! මොන තරම් කුරිරු ලෝකයක්ද? බුද්ධිමත් මිනිහෙක් තමන්ගේ මොළය අපරාධ වලට යොදවවාම භයානකවයේ කෙළවරක් නෑ. සෑහීමකට පත්වෙන්න පුළුවන් තරම් දේවල් මට දකින්න ලැබුණා. ස්ටෝනර් මෙනෙවිය. ඔබෙත් අවසර ලැබෙනවා නම් දැන් මං කැමතියි මිදුලට යන්න."

මෙම පරීක්ෂාවෙන් පසු හෝම්ස්ගේ මුහුණේ පළවූ හැනීම් මා මීට පෙර කිසි දිනෙක දැක නැත. තීක්ෂණය හා භයානකත්වය දැක ඒ නිසා සිත් කම්පාවට පත් ලක්ෂණයි හෝම්ස්ගේ මුහුණෙන් ප්‍රකාශ වුණේ.

අපි මිදුලේ ඉහළ පහළ කිහිපවිටක්ම ඇවිද්දෙමු එහෙත් නිහඬව කල්පනා කළ මගේ මිත්‍රයාගේ සිතුවිලිදාමය බිඳීමට, ස්ටෝනර් මෙනෙවියගේ හෝ මගේ කැමැත්තක් නොතිබිණි. අවසානයේ ඔහුම එයින් අවදිවිය.

"ස්ටෝනර් මෙනෙවිය. මං ඔබට කිවයුතු කාරණයක් තියෙනවා. එනම් මං දැන් ඔබට දෙන අවවාද ඒ හැටියෙන්ම අකුරටම පිළිපැදිය යුතුයි. ඒක අත්‍යවශ්‍යයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"පත්තසින්ම ඔව්. මං ඒවා ඔබ කියන ආකාරයකට පිළිපදින්නම්."

"මේ කාරණය බොහොම බැරෑරුම් එකක්. පසුබට වෙන්න අවස්ථාවක් නෑ. ඔබේ ජීවිතය රැඳී තිබෙන්නේ මම මේ දෙන උපදෙස් හරිහැටි පිළිපදිනවාද නැද්ද කියන එක මතයි."

"මං ඔබට සහතික වෙන්නම් මහත්මයා. ඔබ කියන හැටියකටම මං කරන්නම්."

"පළමුවෙනි කරුණ මේක. මගේ මිතුරයාත් මමත් අද රාත්‍රිය ගතකළ යුත්තේ ඔබේ කාමරය තුළයි."

ස්ටෝනර් මෙනෙවිය සහ මම අතිශයින් විස්මයට පත්වී ඔහු දෙස බැලුවෙමු.

"ඔව්. ඒක ඒ විධියටම සිදුවිය යුතුයි. අහගෙන ඉන්න. මං ඔබට හැම දෙයක්ම විස්තර කරන්නම්. පාරෙ අර පැත්තට වෙන්න තානායමක් තියෙනවා නේද?"

"ඔව්. ක්‍රවුන් ඉන් තානායම."

"බොහොම හොඳයි. එතැන සිට බැලුවාම ඔබේ ජනේලය හොඳින් පෙනෙනවාද?"

"ඇත්තෙන්ම ඔව්."

"ඔබේ බාප්පා නගරයේ ඉඳල ආපහු ආවම, හිස කකියනවා කියල ඔබ කාමරය ඇතුළෙම රැඳී ඉන්න. ඊළඟට හොඳට කල්පනාවෙන් ඉඳලා, බාප්පා නිදාගන්න ඇඳට ගියාම, ඔබේ ජනේලයේ පියන අරින්න. ඊට පසු අපට සංඥාවක් ලෙස ඔබේ ලාම්පුව ජනෙල් පඩිය උඩින් තියන්න. ඊළඟට ඔබට රාත්‍රියට උවමනා වෙන්න ඉඩතියෙන හැමදෙයක්ම අරගෙන, නිශ්ශබ්දවම ඔබ කලින් පදිංචිව සිටි කාමරයට යන්න. ඒකෙ සමහර අලුත්වැඩියා කටයුතු තිබුණත්, අදට ඔබට රාත්‍රිය ගතකිරීමට හැකි තත්ත්වයක් එහි තිබේවි කියල මං විශ්වාස කරනවා."

"ඔව්. ඔව්. ඒකෙ අපහසුවක් නෑ."

"හොඳයි. ඉතිරි වැඩකටයුතු හැම එකක්ම අපි බලාගන්නම්."

"මොනවාද ඔබ හොයන්න බලාපොරොත්තු වෙන්නෙ?"



251. "දෙවියන්ගේ නාමයෙන් කියන්න. මගේ සොඳුරිය මිතුරියගේ කොහොමද?"

http://sherlockholmesinvestigationz.blogspot.com

"අපි ඔබේ කාමරයේ රාත්‍රිය ගතකරනවා. ඔබේ සියත් කැලැඹීමත් ඇති කළ ශබ්දය කුමක්ද කියල හොයන්නයි අපි බලාපොරොත්තු වෙන්නෙ."

"හෝම්ස් මහත්මයා. මට විශ්වාසයි, මේ හැමදෙයක්ම ඔබ දැනටමත් තේරුම් අරගෙන කියල." ස්ටෝනර් මෙනෙවිය පැවසුවේ මගේ මිත්‍රයාගේ කබා අතෙන් අල්ලා ගනිමිනි.

"බාගවෙලාවට එහෙම වෙන්නත් පුළුවනි."

"එහෙනම් දෙවියන්ගෙ නාමයෙන් කියන්න මගේ සොයුරිය මියගියේ කොහොමද?"

"ඒක කියන්න කලින් ඊට අදාළ පැහැදිලි සාක්ෂි එකතුකරගෙන හිටින්න මං කැමැතියි."

"එහෙනම් ඔබට කියන්න පුළුවන්ද මං හිතන දේ හරිද කියල. ඇය මියගියේ සිතේ ඇතිවූ ක්ෂණික භීතිය නිසා?"

"නැහැ. මං හිතන්නෙ නැහැ මරණයට හේතුව ඒක කියල. මට හිතෙනවා මෙතැන ඊට වඩා තේරුම් හේතුවක් ඇති කියල. ස්ටෝනර් මෙනෙවිය. දැන් නම් අපි මෙතනින් යා යුතුයි. දොස්තර රොයිලොට් ආපසු ඇවිත්, අපි මෙහේ ඉන්නවා දුටුවොත් අපේ මහන්සිය ඔක්කෝම අපතේ යනවා. නිර්භයව කටයුතු කරන්න. මං කිව් විධියට ඔබේ වැඩ කොටස ඉටු කළොත්, ඔබට බියගන්වන අන්තරායන් පළවා හරින්න අපට පුළුවනි. ආයුබෝවන්."

"ක්‍රවුන් ඉන්" තානායමේ විසිත්ත කාමරයක් සහිත නිදන කාමරයක් වෙන්කරවා ගැනීමට අපට අපහසුවක් වූයේ නැත. අපට ඒවා ලැබුණේ උඩුමහලෙහි. එහෙයින් අපේ ජනේල තුළින්, රොයිලොට්ස් මන්දිරය වෙත වැටී ඇති පාර, ගේට්ටුව හා එහි නිවැසියන් පදිංචිව සිටි අංගය පැහැදිලිව දකගත හැකිවිය.

අපි එම නිවස වෙත අවධානයෙන් සිටියෙමු. ඇඳිරි වැටීගෙන එද්දී දොස්තර ග්‍රයිම්ස්බි රොයිලොට් නිවස වෙත පැමිණෙන ආකාරය අපි දුටුවෙමු. ඔහු පැමිණියේ අශ්වකරත්තයකයි. රිය පැදවූ කුඩා සිරුරක් තිබූ කොලු ගැටයාට දුරින් රොයිලොට්ගේ යෝධ ශරීරය දිස්විය. මැදුරේ දවැන්ත යකඩ ගේට්ටුව විවෘතකර ගැනීම කොලුවාට තරමක් අපහසු විය. රොයිලොට් ඒ ගැන කොලුවාට ගෝරනාඩු කළ හැටි අපට පැහැදිලිවම ඇසිණි. ඔහු ඝෝෂා කරද්දී අත් මිට

මෙහලොවා තර්ජනය කිරීමට ද අමතක නොකෙළේය. මඳ වේලාවකින් රිය ඉදිරියට ඇදී ගියේය. මැඳුරේ විසිත්ත කාමරයක පහන් දල්වූ බව ගස් අතරින් වැටුණු ආලෝකයෙන් අපි තේරුම් ගත්තෙමු.

හෝම්ස් කථාව ඇරඹුවේ, අප අඳුරේ අසුන්ගෙන, මැඳුර දෙස නෙත් යොමු කරගෙන සිටියදීය.

"ඔබට කියන්න වොට්සන්, මේ වැඩේට ඔබවත් එක්ක කරගෙන යන්න සිදුවුණු එක මගේ හිතට හරිමදි. කිසිම සැකයක් නෑ, අපට අද රෑට ලොකු භයානක තත්ත්වයකටයි මුහුණ දෙන්න තියෙන්නෙ."

"මගේ පැමිණීමෙන් ඔබට මොකක් හරි ප්‍රයෝජනයක් තියෙනවද?"

"ඔබ එහි ඉඳීම නම් ඉතාම ප්‍රයෝජනවත් විය හැකියි. ඒකෙ වටිනාකම වචනයෙන් කියල නිමකරන්න බැහැ."

"එහෙම නම් මා එන එක ස්ථිරයි."

"අන්තරායක් තියෙන බව දන දනත්, මගේ සහයට එන්න කැමැතිවීම, හරිම කරුණාවන්ත ක්‍රියාවක්."

"මොකක්ද ඔබ මේ කියන අන්තරාය? රොයිලොට්ස් මැඳුරේ කාමරවල මං නුදුටු දේවල් රාශියක් ඔබ දැක ඇති බවයි මට නම් පෙනෙන්නෙ?"

"නැහැ. නමුත් මට හිතෙනවා, අප දුටු දේවල් වලින් ඔබට වඩා නිගමනවලට පැමිණීමට මට හැකිවුණා කියල. මං දුටු හැම දෙයක්ම ඔබත් දුටුවා."

"අර සීනුව සඳහා සවිකර තිබූ ලණුව ඇරෙන්න, කිසිම වැදගත් දෙයක් මං දැක්ක කියල මං හිතන්නෙ නෑ. ඒ වගේම ඒ සීනු ලණුවෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද කියල මට හිතාගන්නත් බැහැ."

"වාතාශ්‍රය සඳහා සාදා තිබුණු කවුළුවත් ඔබ දකින්න ඇති?"

"ඔව්. ඒකත් හරිම අස්වාභාවික තාලේ පුංචි කවුළුවක්. එක කාමරයක සිට අනෙක් කාමරයකට, බිත්තියේ ඇති සිහින් සිදුරකින් ලැබෙන යහපත් වාතාශ්‍රය මොකක්ද? මේ තරම් කුඩා සිදුරකින් මං හිතන්නෙ නෑ මීයෙකුටවත් ගමන් කරන්න පුළුවන් කියලා."

"ස්ටෝක් මොරාන් වලට එන්න කලින්ම මං දැන හිටියා වායු කවුළුවක් අපට දකින්න ලැබෙන බව."

http://sherlockholmesinvestigations.blogspot.com

"අනේ හැබෑට හෝම්ස්?"

"ඇත්තෙන්ම ඔව්! ඔබට මතකද හෙලන් ස්ටෝනර් අපට කිව් කරුණක්? දොස්තර රෝයිලොට් දුම්පානය කරද්දී ඉරූ සුරුට්ටු වල ගඳ ඇගේ පොයුරියට ආඝ්‍රාණය කරන්න හැකිවුණු බව? මේකෙන් අපට පැහැදිලිවම හිතාගන්න පුළුවන් කාමර දෙක අතර සම්බන්ධයක් ඇති බව. මේක ඉතාම කුඩා එකක් විය යුතුයි. ඒ මොකද විශාල එකක් වුණා නම් හදිසි මරණ පරීක්ෂණයේදී ඒ ගැන අවධානය යොමු වෙනවා. ඒ නිසා මං හිතුවා ඒක වායු කවුළුවක් විය යුතුයි කියලා."

"නමුත් එහෙම එකක් තිබීමේ ඇති වැරැද්ද මොකක්ද?"

"බැලූ බැල්මට නම් වැරැද්දක් නෑ තමයි. නමුත් අහඹු සිදුවීම් කිහිපයක් ඉතා පුදුමාකාර විධියට ඉතාම ළඟ ළඟම සිදුවුණා. මැදුරේ අලුත්වැඩියා කටයුතු පටන් අරගෙන, කාමර දෙක අතර බිත්තියේ වායු කවුළුවක් සාදනු ලැබුවා. ඊළඟට සීනුවක් සවිකිරීමේ අරමුණෙන් සීනු ලණුවක් සවිකළා. මේ සීනු ලණුව අර සුළං කවුළුවට හොඳටම සමීපයි. ලණුවේ පහළ කෙළවරට කිට්ටුවෙන් නිදා සිටින තරුණියක් මියයනවා. මේ කරුණු සමූහයේ යම් ආකාරයක බැඳීමක් ඇති බව ඔබට හිතෙන්නේ නැද්ද?"

"මට නම් ඒවල කිසිම සම්බන්ධයක් පෙනෙන්නේ නැහැ."

"ඇගේ ඇඳ ගැන මොනවා හරි විශේෂ ලකුණක් ඔබට පෙනුණේ නැද්ද?"

"නැහැ."

"ඇඳ පොළොවට සවිකරලයි තිබුණේ. මේ විධියට ඇඳක් පොළොවට සවිකර ඇති අවස්ථාවක් මීට කලින් ඔබ කවදාවත් දැකලා තියෙනවද වොට්සන්?"

"එහෙම දකපු අවස්ථාවක් මට මතක් කරන්න අමාරුයි."

"අර තරුණියට ඇගේ ඇඳ කොහේටවත් වෙනස් කරන්න හැකියාවක් තිබුණේ නෑ. හැමදාමත් ඇඳ තියෙන්න ඇත්තෙ, සුළං කවුළුවටත්, සීනු ලණුවටත් මේ විධියටම සමීපව. අපි සීනු ලණුවක් කීවත්, පැහැදිලිවම ඒක, සීනුවක් සවිකිරීමේ අරමුණෙන් සවිකළ ලණුවක් නොවෙයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවා හෝම්ස්!" මට කෑගැසිණ. "මට තේරෙනවා හෝම්ස් ඔබ ඉඟිකරන්නේ මොකක් ගැනද කියලා. මං හිතන්නේ ඉතාම භයානක ඒ වගේම සූක්ෂමව සැලසුම් කළ අපරාධයක් සිදුවෙන්නයි යන්නෙ. ඒක වළක්වාගැනීමට, යන්තමට වෙලා ඇතුව අපි ආවා, එහෙම නේද?"

"බොහොම සූක්ෂමයි. බොහොම භයානකයි. වෛද්‍යවරයෙක් අපරාධකරන්න ගත්තාම අතිශයින්ම භයානකයි. ඔහු ඉතාම දරුණු අපරාධකාරයෙක් බවට පත්වෙනවා. ඒ මොකද වෛද්‍ය විද්‍යාඥයා දැනුමෙන් ලැබෙන සියුම් බුද්ධියත්, නිර්භීතකමත් දෙකම ඔහුට තියෙනවා. ඒකයි පාමර් සහ ප්‍රිචාඩ් දෙන්නාම මිනීමැරූ දොස්තර ලාගෙ ලේඛනයේ ඉහළටම ගියේ. මේ මිනිහා ඊටත් වඩා කෛරාටිකයෙක්. බොහොම ගැඹුරටම සැලසුම් කරලයි වැඩකරන්නේ. ඒ වුණත් අපට පුළුවනි වොට්සන් පරීක්ෂණය ඊටත් වඩා ගැඹුරට මෙහෙයවන්න. හෙට එළිවෙන්න කලින් අපට මහ බිහිසුණු සිදුවීම් රැසකට මුහුණදෙන්න සිදුවේවි. ඒ නිසා දැන් අපේ හිත්වලට පැය කිහිපයක පොඩි විවේකයක් දෙමු

* * * *

රොයිලොට්ස් මැදුරේ විසිත්ත කාමරයේ දල්වන ලද ආලෝකය සැඟෙන වෙලාවක් යන තුරු ගස් අතරින් අපට දකින්නට ලැබිණි. රෑ නවය පමණ වෙද්දී එය නිවී ගියේ මැදුර අවට පෙදෙසට ඝන අඳුරක් උදා කරවමිනි. තවත් පැය දෙකක් ඉතා සෙමින් ගෙවී ගියේය. රාත්‍රී එකොළහ නාද වෙනවාත් සමඟම එක්වරම රොයිලොට්ස් මැදුර දෙසින් ආලෝකයක් දැල්විණි.

"අන්න අපේ සංඥාව. ඒක දල්වන්නේ මැදින් තියෙන කාමරයේ ජනේලයෙන්."

හෝම්ස් කීවේ අසුනෙන් නැගී සිටිමිනි. තානායමෙන් පිටවීමට සූදානම්ව අපි එහි භාරකරු හමුවූයෙමු.

"අපි යනවා මේ ළඟ පදිංචි අපේ හිතවතෙක් හමුවෙන්න. සමහර වෙලාවට අපි ඔහුගේ ගෙදර රාත්‍රිය ගත කරන්නත් පුළුවන් තියෙනවා. එහෙම වුණොත් අපි ආපහු එන්නෙ හෙට උදේ."

මොහොතකින් අපි තානායමේ සිට ඉවත්ව මහාමාර්ගයට පිවිසුණෙමු. අපේ මුහුණු සිප ගනිමින් හමාගියේ ඉතා සීතල සුළඟකි.

http://sherlockholmesinvestigations.blogspot.com

රොයිලොට්ස් මැදුර පිහිටා තිබූ වත්තට ඇතුළුවීම අපහසු කරුණක් නොවීය. මැදුර වටා තිබූ තාප්පයේ බිඳී ගොස් තිබුණු තැන් තවමත් අලුත්වැඩියා කර නොතිබීම එයට හේතුවයි.

දවැන්ත රුක්ස ගස් වල සෙවණැලි වල ආවරණය ලබාගනිමින් ඉදිරියට ගමන්කොට, අපි තණකොළ වවා තිබූ මිදුල වෙත ළඟාවීමු. එය හරහා අප ගමන්ගත්තේ බොහෝ පරෙස්සමිනි. අනතුරුව අප ජනේලයෙන් ස්ටෝනර් මෙනෙවියගේ කාමරයට ඇතුළුවීමට සූදානම්වූවා පමණි. විරූපී පෙනුමක් සහ විකෘති ස්වභාවයට පත් කොලු ගැටයෙකු වැනි තැනැත්තෙක් මල් පඳුරක් තුළ සැඟවී සිට එක්වරම තණබිම වෙතට පැන්නේය.! තණ බිම මත දිගාවී කකුල්වල හිරි ඇරීමට මෙන් ඒවා ඒමේ අතට දිගු කොට ඇඹරූ ඔහු මිදුල හරහා වේගයෙන් දිව්ගොස් අඳුරු සෙවණැලි අතරේ සැඟවුණේය.

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ! ඔබ දක්කද හෝම්ස් ඒකා?"

මා මෙන්ම මගේ මිත්‍රයා ද තැතිගත් බවක් පෙනිණ. එහෙත් ඒ එක් මොහොතකට පමණි. අනතුරුව මඳ සිනාවක් නැඟූ හෝම්ස් මගේ කනට කෙඳුරුවේය.

"ඒ අර බැබුන් වඳුරා. මේක නම් අපූරු ගෙදරක් නේද?"

වෛද්‍යවරයා ඇති කළ සුරතල් සතුන් ගැන මේ දක්වා මට අමතක වී තිබිණ. ඔහුගේ අනෙක් සුරතලා කොටි පවුලට අයත් චීටා සතායි. ඌ අඳුරේ සැඟවී සිට කොයි මොහොතේ අපේ ඇඟට පනින්නේදැයි අපි නොදනිමු. ඉක්මන් ගමනින් ඉදිරියට ගිය හෝම්ස් ජනේලය අසල නැවතී වටපිට බැලුවේය. අනතුරුව පාවහන් ඉවත්කළ ඔහු ජනේලයෙන් කාමරයට ඇතුළු විය. මම ද ඔහු අනුගමනය කළෙමි. චීටා ගැන බියෙන් තැතිගෙන සිටි මගේ ඇඟට ලේ පොදක් ඉනුවේ, කාමරයට ඇතුළුවී ජනේලය වසාගත් පසුයි.

ශබ්දයක් නොනැඟෙන සේ ජනෙල් පියන වැසූ හෝම්ස්, එතැන තිබූ පහන ආවරය ඇතුලත මේසය උඩින් තබා, කාමරයේ අනුමූලු දෙස පරීක්ෂාවෙන් බැලීය. සියල්ල අප දිවා කාලයේ දුටු අයුරින්ම තිබිණ. ඊළඟට මා වෙත ළංවූ ඔහු මඳ ශබ්දයක් හෝ පිටතට නොයන සේ මුව යමින් කීමට සූදානම් විය. දෑත් රවුම් කර මගේ කනට තබා ඉතා සෙමින් කෙඳිරූ වචන, මට ඇසුණේ යන්තමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"කොයි තරම් සුළු ශබ්දයකින් වුණත් අපේ වැඩපිළිවෙළ සම්පූර්ණයෙන්ම විනාශ වෙන්න පුළුවනි."

එය ඇසුණු බව පෙන්වීමට මම හිස සැලීමි.

"අපට කිසිම ආලෝකයක් දල්වන්න විධියක් නෑ. යන්තමින් හරි එළියක් තිබුණොත්, අර වාතාශ්‍රයෙන් ඔහුට එය පෙනේවි."

මම යළිත් හිස සෙලවීමි.

"නිදාගන්න එපා වොට්සන්. ඔබේ ජීවිතේ රැඳී තියෙන්නෙ අවදියෙන් සිටීම මතයි. ඔබේ පිස්තෝලය සූදානමින් තියාගන්න. අපට එය කොයි මොහොතේ හරි උවමනා වෙන්න පිළිවන්. මම ඇඳේ මේ පැත්තෙන් වාඩිවෙලා ඉන්නම්. ඔබ අර පුටුවෙන් වාඩිවෙන්න."

හෝම්ස් රැගෙන ආ බඩු අතර සිහින් දිගු වේවැලක් විය. ඔහු තමා අසලින් ඇඳ මත එය තැබුවේය. ඒ අසලම ගිනිපෙට්ටියක් සහ ඉටිපන්දම් කැබැල්ලක් ද තැබීය. අනතුරුව ලාම්පුවේ දල්ල සම්පූර්ණයෙන්ම අඩු කළේ මුළු කාමරයම අන්ධකාරයේ ගිලෙමිනි.

එදා ඒ රාත්‍රියේ භයෙන් හා සංත්‍රාසයෙන්, දැඩි අවධානයකින් සිටි හැටි මා කෙසේ නම් අමතක කරන්නද? කිසිදු ශබ්දයක් මගේ දෙසවණට නොවැටිණි. අප හුස්මගන්නා හඬවත් නොඇසිණි. අන්ධකාරයේ කිසිත් නොපෙනිණි. එහෙත් මගේ මිත්‍රයා විවෘත මනසින් මෙන්ම විවෘත දෑසින් ඇඳ මත හිඳ සිටි බව මම දැන සිටියෙමි. මට නොපෙනුණත් ඔහු ද මා මෙන්ම සංත්‍රාසයට පත්ව සිටි බවට සැකයක් නැත. පිටතින් ලැබුණු මඳ ආලෝකය පවා ජනෙල් පියන් වලින් ආවරණය වූ නිසා, ඝන අන්ධකාරයේ අපි නොඉවසිල්ලෙන් බලා සිටියෙමු.

රෑ නිහඬතාව බිඳිමින් නියාවර කුරුල්ලෙකු නගන හඬක් වරින්වර පිටතින් අසන්නට ලැබිණි. එක් වරක් අපේ ජනේලය අසලම සතෙකු ගොරවන හඬක් විය. චීටා ගෙයින් පිටත නිදහසේ සැරිසරමින් සිටි බව එය අපට සිහි කළේය. බොහෝ ඈතින් පිහිටි දේවස්ථානයක ඔරලෝසුවකින් පැය කාලකට වරක් නිකුත් වූ නාදය අපට වරින්වර අසන්නට ලැබිණි. රාත්‍රී දොළහ නාද විය. ඉන්පසු රාත්‍රී එක, දෙක සහ තුන නාදවෙද්දී අප අවදියෙන් සිටියේ මීළඟට කුමකින් කුමක් සිදුවේදෝයි අවධානයෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

එක්වරම ආලෝක කිරණක් ඇතිවී, නැතිවී ගියේය. ඒ සුළං කවුළුව දෙසිනි. මොහොතකින්, දල්වෙන ලාම්පුතෙල් වල සැර ගඳත් හා රත්වූ ලෝහයකින් නිකුත් වෙන ගඳ අපේ නාස්වලට දැනිණි. අල්ලපු කාමරයේ කිසිවෙකු අන්තැරුමක් දල්වූ බවට සලකුණකි ඒ. යම් සෙලවීමක් වැනි සියුම් හඬක් ඇසුණත් සියල්ල යළිත් නිශ්චල විය. එහෙත් කලින් දැනුණු ගඳ වඩාත් ප්‍රබලව දැනෙන්නට පටන්ගත්තේය. මඳක් හෝ නොසෙල්වී තවත් පැය බාගයක්ම, මම දෙසවන් යොමුකරගෙන සිටියෙමි. ඊළඟට තවත් සියුම් ශබ්දයක් ඇසෙන්නට විය. එය කේතලයකින් වතුර උතුරද්දී වාෂ්ප පිටවෙන විට නැගෙන ශබ්දයකට සමාන විය. ඒ සමඟම හෝම්ස් ඇඳෙන් බිමට පැන්නේය. එක් ක්ෂණයකින් ගිනිකූරක් දල්වූ ඔහු අතේ තිබූ වේවැලෙන් සීනු ලණුවට වේගයෙන් පහර දෙන්නට පටන් ගත්තේය.

"ඔබට පෙනෙනවාද වොට්සන්? ඔබට පෙනෙනවාද ඒක?"

එහෙත් මම කිසිවක් නුදුටුවෙමි. හෝම්ස් ගිනිකූර දල්වූ වෙලේ තුම් සිවුරුහන් කරන්නාක් වැනි හඬක් මට ඇසිණි. අඳුරේ සිටියදී, ගිනිකූර දල්වීම නිසා එක්වරම ආලෝකයට දැස් නොපෙනී ගියේය. මට කිසිවක් පැහැදිලිව දැකගැනීමට නොහැකි විය. ඒ නිසා මගේ මිත්‍රයා වියරුවෙන් මෙන් වේවැලෙන් සීනු ලණුවට පහරදුන්නේ කුමක් නිසා දැයි මට නොතේරිණි. එහෙත් මම හෝම්ස්ගේ මුහුණේ ස්වභාවය හොඳින් දුටුවෙමි. ඔහුගේ මුහුණ මළමිනියක් මෙන් සුදුමැලිය. ඒ සමඟම භයංකර හැඟීම නිසා මතුවූ භීතිය හා පිළිකුල ද ප්‍රකාශ විය.

මඳ වේලාවක් යද්දී සීනු ලණුවට පහරදීම නැවැත්වූ හෝම්ස් සුළං කවුළුව දෙස බලාගෙනම සිටියේය. එක් ක්ෂණයකින් සියල්ල වෙනස් විය. දොස්තර රොයිලොට්ගේ කාමරය දෙසින් අපට අසන්නට ලැබුණේ බිහිසුණු මර ලතෝනියකි. රාත්‍රියේ නිශ්ශබ්දතාවය බිඳ දමමින් ඇසුණු ඒ භයංකර විලාපය වැන්නක් මා කිසි දිනෙක අසා නැත. ක්‍රම ක්‍රමයෙන් වැඩිවූ එම ලතෝනියෙන් පැවසුණේ භීතිය, වේදනාව හා මුසුවූ දැඩි කෝපයයි. මෙම භයානක විලාපය, ගමේ සෑම කෙළවරකටම පමණක් නොව ඈතින් පිහිටි දෙවිගැති නිවසට ද ඇසුණු බව පසුව අපට අසන්නට ලැබිණි. මෙම බියකරු හඬින්, මගේ [illegible] ගියේය. කිසිත් කර



259. මගේ මිත්‍රයා වියරුවෙන් මෙන් වේවැලෙන් පහර දුන්නේය.

http://sherlockholmesinvestigations.blogspot.com

කියාගත නොහැකිව මම හෝම්ස් දෙස බලා සිටියෙමි. ඔහු ද ගල්ගැසුණෙක් මෙන් නොසෙල්වී, මා දෙස බලා සිටියේය. ශබ්දය ක්‍රමයෙන් අඩු වී ගොස් සම්පූර්ණයෙන්ම නවතින තුරු අපි එලෙසම සිටියෙමු.

"දෙවියනේ! මොකක්ද ඒ ශබ්දේ?" අපහසුවෙන් හුස්මක් අල්ලමින් මම ඇසුවෙමි.

"ඒ ශබ්දෙන් කියන්නෙ ඔක්කොම ඉවරයි කියන එකයි. කොයි දේ වෙන්නෙත් හොඳටයි කියන කතාව බොහෙවෙලාවට මෙතැනදිත් නිවැරදි ඇති. වොට්සන් ඔබේ පිස්තෝලය සූදානම් කරගන්න. අපි යමු දොස්තර රොයිලොට්ගේ කාමරයට."

කැලැඹුණු මුහුණෙන් ලාම්පුව දල්වූ හෝම්ස් පෙරමුණ ගත්තේය. අපි බරාඳය දිගේ ඉදිරියට ගියෙමු. ඔහු රොයිලොට්ගේ කාමරයට දෙවරක්ම තට්ටු කළත් ඇතුළතින් පිළිතුරක් නොලැබිණි. ඉන්පසු හෝම්ස් තමාම දොරහැරගෙන ඇතුළු විය. පිස්තෝලය සූදානමින් තබාගෙන මම පිටුපසින් ගියෙමි.

අපට දකින්නට ලැබුණේ අද්භූත දර්ශනයකි. මේසය උඩ තබා තිබූ ලන්තෑරුමෙන් වැටුණු දීප්තිමත් ආලෝකයෙන් යකඩ අල්මාරිය පැහැදිලිව දිස්විය. එහි දොර අඩක් විවෘතව තිබිණි. මේසය අසල වූ පුටුවේ හිඳගෙන සිටියේ දොස්තර ග්‍රිම්ස්බි රොයිලොට්ය. අළු පැහැති පිටකබායකින් සැරසී සිටි ඔහුගේ නිරාවරණ දෙපා රැඳී තිබුණේ, රතු පැහැති සෙරෙප්පු දෙකක් තුළයි. එදා දහවල් අප දුටු කෙටි මිටක් සහිත දිග කසය ඔහුගේ උකුල මත විය. ඔහුගේ නිකට මදක් ඉහළට එසැවී තිබුණු අතර, සිවිලිම දෙසට හැරවුණු ඔහුගේ දෙනෙත් භීතියෙන් ගල්ගැසී හොඳින් විවෘතව තිබිණි. ඔහුගේ නළල වටා එතී තිබුණේ දුඹුරු පැහැති තිත් වැටුණු කහපැහැති පටියකි. එය ඔහුගේ හිස වටා තදින් බැඳ තිබුණු අපූරන් දිස් විය. අප කාමරයට ඇතුළුවූවත් දොස්තර රොයිලොට් මදක් හෝ නොසෙල්වුණු අතර කිසිදු ශබ්දයක් නොනැගුවේය.

"අන්න පටිය! තිත් වැටුණු පටිය!"

හෝම්ස්ට කියැවිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

මම අඩියක් ඉදිරියට තබා අවධානයෙන් බැලීමි. එක් මොහොතකින් ඒ පටිය සෙලවෙන්නට පටන්ගත්තේය. නළලෙන් ඉවතට ඇදී ගිය පටිය හිසකෙස් මතට ගියේය. මිළඟට රොයිලොට්ගේ හිස කෙස් අතරින් සර්පයෙකුගේ දියමන්තාකාර හිසක් ඉහළට එසවෙනු අපි දුටුවෙමු.

"ඒ වගුරු පොළඟා" හෝම්ස් කීය.

"ඉන්දියාවේ ඉන්න භයානකම සර්පයා. ඌ දෂ්ට කර තත්පර දහයක් ඇතුළත ඔහු මිය ගියා. අනුන්ට බිහිසුණු අපරාධ කරන පුද්ගලයින්ට ඒවාට බිහිසුණු විපාක ලැබෙනවා. අනුන්ට හාරන වළේ තමන් වැටෙනවා. ඉස්සර වෙලා අපි මේ සතා උගේ ගුහාවට දමල ඉඳිමු. ඊට පස්සේ අපට පුළුවනි ස්ටෝනර් මෙනෙවිය ආරක්ෂා සහිත තැනකට යවන්න. ඊටත් පස්සේ මේ සිද්ධ වෙලා තියෙන දේ ගැන මේ පළාතේ පොලීසියට දැනුම්දෙමු."

රොයිලොට්ගේ උකුලේ තිබූ කෙළවර තොණ්ඩුවක් සහිත කසය ගත් හෝම්ස්, සර්පයා වලිග කෙළවරෙන් තොණ්ඩුවට ඇතුළුකරගෙන, ඌ එයට හිරකරගත්තේය. අනතුරුව ඔහු ඌ යකඩ අල්මාරිය තුළට දමා එහි දොර වසා දැමීය.

* * * *

ස්ටෝක් මොරාන්හි දොස්තර ග්‍රිම්ස්බි රොයිලොට්ගේ මරණය සිදුවූ ආකාරය පිළිබඳ සත්‍යය එයයි.

භීතියට පත්ව සිටි ස්ටෝනර් මෙනෙවියට කණගාටුදායක පුවත දන්වා, ඇය හැරෝ හි ජීවත්වූ ඇගේ ඥාතිවරිය වෙත යැවීමට අපි පියවර ගත්තෙමු. මරණ පරීක්ෂණයේ කටයුතු සිදුවූයේ ඉතා සෙමිනි. මාරාන්තික විෂ සහිත සර්පයෙකු සමග නොසැලකිලිමත් ලෙස සෙල්ලම් කිරීමට යාම නිසා, දොස්තරවරයා මරණයට පත්වූ බව මරණ පරීක්ෂණයේදී තීන්දු විය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් මට තේරුම් ගැනීමට අපහසු වූ කාරණා දුම්රියෙන් ආපසු යද්දී මට හෝම්ස්ගෙන් දැනගන්නට ලැබිණි.

"මං ඇවිත් හිටියේ වැරදි නිගමනයකටයි වොට්සන්, නිගමනවලට පෙනෙනවා ප්‍රමාණවත් තරම් දත්ත නොමැතිව, නිගමනයකට පැමිණීම මොන තරම් අන්තරායදායකද කියලා.

http://sherlockholmesinvestigations.blogspot.com

ගෙදර වත්තේ අහිගුණ්ඨිකයන් සිටිම එකක්. අනෙක අර අසරණ ගෑනු ළමයා හිනිකුරේ එළියෙන් දුටු දෙය පටියක් යන වචනයෙන් විස්තර කළා. ඒ කාරණා දෙකෙන් මාව සම්පූර්ණයෙන්ම වැරදි මාර්ගයකට වැටුණා. නමුත් එක් දෙයක් ගැන මට ඉක්මනටම නිගමනයකට එන්න පුළුවන් වුණා. ඒක තමයි, කාමරය ඇතුළේ සිටි තැනැත්තියට භයානක ඉරණමක් ගෙන ආවේ දොර වත් ජනේලය හරහා වත් නොවෙන් බව. එතකොට මං මුලින් ගිය මාර්ගය වැරදි බව මට අවබෝධ වුණා. ඒ ගැන යළි සලකා බලන්න සිදු වුණා.

එතකොට මගේ අවධානය කෙලින්ම යොමු වුණේ කාමර දෙක සම්බන්ධ කරමින් තිබූ සුළං කවුළුවට සහ ඒ අසලින් ගමන් කළ සීනු ලණුවට මේ සීනු ලණුව කාමරය ඇතුළෙදි අවසන් වුණේ ඇඳ මතින්. මේ ලණුව ඇත්තෙන්ම සීනුවකට සම්බන්ධ නැති බවත්, ඇඳ පොළොවට සවිකර ඇති බවත් දුටුවාම මගේ හිතේ ලොකු සැකයක් ඇතිවුණා. මේ සීනු ලණුව සවිකරලා තියෙන්නේ ජෝතක් හෝ භයානක දෙයක් ඇයගේ කාමරයටත්, එතැනින් ඇඳටත් එවන්න දෝ කියන සැකය මගේ හිතේ ඇතිවුණා. මේ භයානක දේ සර්පයෙක් වියහැකියි යන හැඟීම මට කල්පනා වුණා. ඊළඟට වෛද්‍යවරයාට ඉන්දියාවෙන් සතුන් ලැබෙනවා කියල දැනගත්තාම මගේ සැකය තහවුරු වුණා. මිනිමැරීමක් සැලසුම් කරන, ඉතාම කුරිරු ඒ වගේම කෛරාටික කෙනෙක්. ඒක සියුම්ව හිතාබලනවා. රසායනික පරීක්ෂණයක් මගින් හොයාගන්න බැරි විධියේ විෂක් යොදාගන්න ඔහු තීරණය කළේ ඒ නිසයි. ඒක වඩාත් හොඳින් කල්පනා වෙන්නේ පෙරදිග රටවල ජීවත්වෙලා පළපුරුදු කෙනෙකුටයි. මෙවැනි උග්‍ර විෂක් ඉතාම කෙටි කාලයක් ඇතුළත ක්‍රියාකාරී වෙලා, ජීවිතයක් විනාශ වීම ඔහුගේ පැත්තෙන් බැලුවාම වාසි සහගතයි. බොහොම සියුම් ලෙස මළ සිරුර පරීක්ෂා කරන පරීක්ෂකයෙකුට විතරයි, සර්පයාගේ විෂ දළ පහර නිසා ඇතිවූ කළු පැහැති කුඩා ලකුණු දෙක දකින්න ලැබෙන්නේ.

ඊළඟට මට මතක්වුණේ සිවුරුහන් හඬ. රාත්‍රී කාලයේ අර කාමරයට යවන සර්පයා, ඔහු එළිය වැටෙන්න කලින් ආපහු කැඳවා ගත යුතුයි. නැත්නම් අර තරුණිය සතාව දකිනවා. ඔහු ඒ සඳහා සර්පයාව පුරුදු කරගෙනයි සිටියේ. බාගවෙලාවට ඒ අර

http://[illegible].blogspot.com

කිරි පීරිසියේ පිහිටෙන් වෙන්න ඇති. ඔහු අර සීනු ලණුව දිගේ නැම්දාම ඒ වෙලාවට වගුරු පොළඟා කාමරයට එව්වා. ඔහු දන සිටියා ඌ ලණුව දිගේ ඇවිත් ඇඳ මතට බසින බව. සමහර විට ඌ දින ගණනාවක් යනතුරු ඇඳේ නිදා ඉන්න තරුණියට දෂ්ට කරන්නත් පුළුවනි නොකරන්නත් පුළුවනි. නමුත් දින කිහිපයක් ගතවෙලා හරි ඌ කාමරයේ නිදා ඉන්න තරුණියට අනිවාර්යයෙන්ම දෂ්ට කරනවාමයි.

මං රොයිලොට්ගේ කාමරයට ඇතුළුවෙන්න කලින්ම මේ නිගමන වලට ඇවිල්ලයි හිටියේ. කාමරයේ තිබූ ලෑලි පුටුව පරීක්ෂා කළ මට තවත් කරුණක් පෙනී ගියා. ඒ තමයි ඔහු යම් කටයුත්තක් සඳහා මේ පුටුව උඩට නැගීමට පුරුදුව සිටි බව. ඒ මොකද සුළං කවුළුව පිහිටි තැනට ළංවීමට ඔහු පුටුව උඩට නැගීම අවශ්‍යයි. යකඩ අල්මාරියක් තිබීම, කිරි පීරිසිය, කපයේ කෙළවර තිබූ තොණ්ඩුව ආදී කරුණු ඉතාම සුවිශේෂයි. මගේ සිතේ සැකයක් තිබුණා නම්, මේ කරුණු නිසා ඒකත් ඉවත් වෙනවා. යකඩ තහඩු ශබ්ද වෙන හඬක් ස්ටෝනර් මෙනෙවියට ඇහිලා තිබුණා නේද? ඒ තමයි ඇගේ බාප්පා කලබලයෙන් සර්පයා යකඩ අල්මාරිය තුළට දමා දොර වැසූ හඬ. කාරණා සියල්ල හොඳින් වටහා ගත්තට පස්සේ ඒවා ඔප්පු කිරීමට මා යොදාගත් ක්‍රියාමාර්ගය ඔබ දුටුවා. සර්පයා පිඹින ශබ්දය මට හොඳට ඇසුණා. සැකයක් නෑ ඔබටත් ඇහෙන්න ඇති. මං වහාම එළියක් දල්වලා ඌට පහරදුන්නා.

ඒ මගින් ඌ ආව පාරෙන්ම ආපහු රොයිලොට්ගේ කාමරයට ගියා. සීනු ලණුවට මා එල්ල කළ වේවැල් පහරින් සර්පයා අතිශයින්ම කෝපයට පත්වෙලයි හිටියේ. ඌ ආපහු ගිහින් ඌට දකින්න ලැබුණු පළමුවැනි මනුස්සයාගේම ඇහට පැනලා දෂ්ට කළා. එහෙම බැලුවාම සැකයක් නෑ, දොස්තර රොයිලොට් මරණයට පත්වීම ගැන, කෙළින්ම නොවුනත් වක්‍රව මා වගකිව යුතුයි. ඒ වුණත් ඒකෙන් මගේ හිතට කිසිම දුකක් හෝ වේදනාවක් ඇතිවන්නේ නෑ.



http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com



# දියමන්ති ඔටුන්න

## ෂර්ලොක් හෝම්ස්ගේ වික්‍රමාන්විත පරීක්ෂණ

**අතුරුදන් වූ ව්‍යාපාරිකයා**

"මං අදහස් කෙළේ මළ සිරුරු තමයි හොයන්නේ. ඔය අබිං ගුහාවේ මැරෙන කඩ ... මිනිසුන්ට පවුම් දාහ ගණනේ ... හෝම්ස් තං ඉදිරි අවට තිබෙන ... උත්තරේ මේකයි...."

**දියමන්ති ඔටුන්න**

"උඹ මහා තක්කඩි හොරෙක් උඹට ලැජ්ජා නැද්ද මිනිහෝ මේ ඔටුන්න අරගන්න? කාලකණ්ණියා! උඹ මේ ඔටුන්න විනාශ කරලා මගේ මූණෙ දැලි තැවරුවා නේ උඹ මේකෙන් කොටසක් කළ මැණික් ටික?"

**දෙවැනි ලේ පැල්ලම**

"මේ කාරණා එළිදරව්වුණොත් යුරෝපා මහද්වීපය පුරා මහා භයානක අර්බුදයක් උද්ගත වෙනවා.... හෝම්ස් මහත්මයා අපේ රට අති භයානක යුද්ධයකට පැටලෙනවා නියතයි"

"අගමැතිතුමනි..... විශාලතම පුළුලම වෙන්න යුද්ධයකට"

**තිත් වැටුණු පටිය**

"එදා රාත්‍රියේ පළාතම දෙදරවන මහා සද්දයක් නංවමින් ගුගුරමින් ආවා ඒ වස්සානේ ධාරානිපාත වර්ෂාවක් තමා හැඩුණා. ඒ මහා ශෝකය මැද්දේ වස්සානෙ...."

"....අපට ආසන්නව දැනුනේ විහිලුවක් ... ඒ වගේ භයානක විලාපයක් මා කිසිදිනක අසා නැත. එයින් මගේ ආත්ම සීතල වී ගියේය."

**ඉංජිනේරුවෙකුගේ ඇඟිල්ලක්**

"දෙවියන්ට ඔප්පු වේවා මේක මරණීය තුවාලයක්. ලොකු ලේ ගලා යන්න ඇති. මොන ආයුධයකින් ද මේක සිදු කළේ?"

"....මස් කැපීමට ගන්නා කෝට පිහියකින් සිතා මතා එල්ල කළ ම්ලේච්ඡ ප්‍රහාරයක්!"

සහ

**අතුරුදන් වූ සිද්ධියක්**

රු 195/-

## චන්දන මෙන්ඩිස්ගේ පරිවර්තනයකි